2022

වාර්ෂික වාර්තාව
ஆண்டறிக்கை
ANNUAL REPORT

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය
தேசிய அபாயகர ஔடதங்கள் கட்டுப்பாட்டுச் சபை
National Dangerous Drugs Control Board

මහජන ආරක්ෂක අමාත්‍යාංශය
பொதுமக்கள் பாதுகாப்பு அமைச்சு
Ministry of Public Security

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය

වාර්ෂික වාර්තාව - 2022

පටුන

පිටු අංකය

1. හැඳින්වීම 1

2. දැක්ම සහ මෙහෙවර 2

3. සභාපතිගේ සමාලෝචනය 3

4. මණ්ඩලයේ බලතල 5

5. මණ්ඩලයේ තොරතුරු සැකැස්ම 6

6. මණ්ඩලයේ සංයුතිය 7

7. මණ්ඩලයේ සංවිධාන ව්‍යුහය 9

8. ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය දූර්භාවිතය ආශ්‍රිත කාලීන ප්‍රවණතා 15

9. සංස්ථා පාලනය 18

10. මූල්‍ය හා කාර්යසාධනය විශ්ලේෂණය 18

11. ක්‍රියාකාරීත්වය පිළිබඳ සමාලෝචනය 19

12. කාර්ය මණ්ඩල පුහුණු වාර්තාව 123

13. විගණන හා කළමනාකරණ කමිටුවේ වාර්තාව 125

14. ආදායම් ප්‍රකාශය 127

15. ශේෂ පත්‍රය 128

16. විශේෂ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් 129

17. විගණකාධිපති වාර්තාව 135

18. දස වසරක මූල්‍ය උදාහරණයන් 145

19. තිරසාර සංවර්ධන ඉලක්ක පිළිබඳ සාරාංශය 147

ඇමුණුම I - ගිණුම්කරණ සටහන් 148

01. හැඳින්වීම



අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය 1984 අංක 11 දරන අන්තරායදායක ඖෂධ පාලනය කිරීමේ ජාතික මණ්ඩලය පනත යටතේ පිහිටුවන ලද ව්‍යවස්ථාපිත මණ්ඩලයක් වන අතර මෙම පනත 1986 අංක 41 හා 1990 අංක 21 දරන පනත්වලින් සංශෝධනය වී ඇත. තවද මෙම මණ්ඩලය 2022 වසරේ ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ද 2022.10.06 වන දින සිට මහජන ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ද ක්‍රියාත්මක විය.

ඖෂධ අයුතු ලෙස භාවිතා කරන්නන්ට අදාළව වැළැක්වීමේ හා පාලනය කිරීමේ, ප්‍රතිකාර කිරීමේ හා පුනරුත්ථාපනය කිරීමේ ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම හා සමාලෝචනය කිරීම හා එම ප්‍රතිපත්තියට අදාළව අමාත්‍යවරයාට නිර්දේශ ඉදිරිපත් කිරීම භාර ප්‍රධාන ජාතික ආයතනය අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය වේ.

02. දැක්ම සහ මෙහෙවර

දැක්ම

"මත්ද්‍රව්‍යවලින් තොර සෞඛ්‍ය සම්පන්න සහ සුරක්ෂිත ජාතියක් ගොඩනැගීම"

මෙහෙවර

"අදාල සියලු ආයතන, ප්‍රජාව සහ පුද්ගලයින් බල ගැන්වීමෙන් ප්‍රතිපත්ති සංවර්ධනය කිරීම හා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම තුළින් මත්ද්‍රව්‍ය භාවිතයෙන් තොර සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් සහ සාමකාමී සමාජයක් සහතික කිරීමට නායකත්වය ලබා දීම"

03. සභාපතිගේ සමාලෝචනය



අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය 2022 වර්ෂය තුළ මත්ද්‍රව්‍ය දුර්භාවිතය නිවාරණය හා පාලනය සඳහා වන ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්තිය ප්‍රකාරව සහ මත්ද්‍රව්‍ය දුර්භාවිතය ආශ්‍රිත කාලීන ප්‍රවණතා සම්බන්ධයෙන් ද ආමන්ත්‍රණය කරමින් ප්‍රමුඛතාගත ඉලක්ක ඔස්සේ විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. තිරසාර සංවර්ධන ඉලක්ක සාධනය සම්බන්ධයෙන් ද අවධානය යොමු කරමින් නිවාරණ වැඩසටහන් හරහා ප්‍රජා මට්ටම තුළ මත්ද්‍රව්‍ය භාවිතය අවම කිරීම සඳහාත් ප්‍රතිකාර හා පුනරුත්ථාපන සේවාවන් අවශ්‍ය පුද්ගලයින් සඳහා අදාළ සේවාවන් සඳහා ඇති ප්‍රවේශය තහවුරු කරමින් නේවාසික හා ප්‍රජා පාදක ප්‍රතිකාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහාත් 2022 වර්ෂය තුළ ප්‍රමුඛතාවය ලබාදී ඇත.

විශේෂයෙන්ම මෙතැම්පිටමින් භාවිතය සම්බන්ධයෙන් උද්ගතවෙමින් පවතින ප්‍රවණතා සහ භාවිතයේ වැඩිවෙමින් පවතින ව්‍යාප්තිය සැළකිල්ලට ගනිමින් සහ ඖෂධමය පෙති වර්ග අවභාවිතය සම්බන්ධයෙන් පාලනයක් ඇති කිරීමේ අරමුණින් සාක්ෂි මත පදනම් වූ විද්‍යාත්මක නිර්දේශ ලබාදෙමින් මත්ද්‍රව්‍ය පාලනය සම්බන්ධයෙන් පවතින ප්‍රධාන නෛතික ප්‍රතිපාදන කාලීන අවශ්‍යතාවය අනුව සංශෝධනය කිරීමට පියවර ගෙන ඇත. 1984 අංක 13 දරන විෂ වර්ග අබිං සහ අන්තරායදායක ඖෂධ සංශෝධන පනතට ඉහත කාරණා සම්බන්ධ නෛතික ප්‍රතිපාදන ඇතුළත් කරමින් 2022 අංක 41 දරන සංශෝධන පනත යටතේ වඩාත් ප්‍රායෝගික මත්ද්‍රව්‍ය පාලන යාන්ත්‍රණයක් තහවුරු කිරීම සඳහා නීතිය ක්‍රියාත්මක කරන ආයතනවලට අවකාශය සලසා දී ඇත. එය ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය පාලනය කිරීම සම්බන්ධයෙන් ගෙන ඇති සාධනීය පියවරක් වශයෙන් සැළකිය හැකිය.

විවිධ අභියෝග සහ සීමාකම් යටතේ වුවද පාසල් ප්‍රජාව සහ තරුණ ප්‍රජාව ඉලක්ක කරගනිමින් නිවාරණ අධ්‍යාපන හා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරමින් මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවීම කෙරෙහි බලපාන වැරදි පරිකල්පනයන්, මිථ්‍යා විශ්වාස සහ වැරදි සංජානනයන් නිවැරදි කිරීමට කටයුතු කර ඇත. විවිධ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවල සහයෝගය ඇතිව ප්‍රජා මට්ටම තුළ මත්ද්‍රව්‍ය නිවාරණය කිරීම සඳහා සහ මත්ද්‍රව්‍ය නිවාරණය උදෙසා ප්‍රජාව බලගැන්වීම සඳහා විවිධ ක්‍රියාකාරකම් සිදුකර ඇත.

මත්ද්‍රව්‍ය දුර්භාවිතය ආශ්‍රිත විවිධ තේමාවන් යටතේ පර්යේෂණ සිදුකරන පර්යේෂණ ආයතන, ස්වාධීන පර්යේෂකයින්, විශ්වවිද්‍යාල ප්‍රජාව සහ වෙනත් අදාළ ආයතන එවැනි පර්යේෂණ සම්බන්ධයෙන් තවදුරටත් දිරිමත් කිරීම සඳහා සහ පර්යේෂණ අනාවරණ සහ ඒ මත පදනම්ව නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා ජාත්‍යන්තර මට්ටමේ වේදිකාවක් නිර්මාණය කිරීමේ අරමුණිනින් අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩල ඉතිහාසයේ පළමු වරට මත්ද්‍රව්‍ය දුර්භාවිතය ආශ්‍රිත

ජාත්‍යන්තර පර්යේෂණ සැසියක් පවත්වන ලදි. ජාතික හා ජාත්‍යන්තර පර්යේෂකයින් රැසක් සහ විද්වතුන් මෙම අවස්ථාව සඳහා සිය පර්යේෂණ සහ ඒ ආශ්‍රිත විශේෂඥ දැනුම එක් කරමින් සහභාගි විය. එය 2022 වර්ෂය තුළ ළඟාකරගත් වඩාත් ඵලදායී ප්‍රතිඵලයකි.

මත්ද්‍රව්‍ය නිවාරණය ප්‍රතිකාර හා පුනරුත්ථාපනය තාක්ෂණික විෂයයක් වන බැවින් ඒ සඳහා මනා දැනුමක් සහ කුසලතාවයක් අවශ්‍ය වේ. රාජ්‍ය නිලධාරීන්, ප්‍රජා නායකයින්, නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් ඇතුළු විවිධ ඉලක්ක කණ්ඩායම් සඳහා තාක්ෂණික පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරමින් අදාළ පාර්ශවවල ධාරිතාවය ඉහළ නැංවීමට කටයුතු කර ඇත. ප්‍රාදේශීය මට්ටමේ පරිපාලන ව්‍යුහය සමඟ ඒකාබද්ධ වෙමින් ප්‍රාදේශීය මට්ටම තුළ මත්ද්‍රව්‍ය භාවිතයෙන් තොර ප්‍රජාවක් නිර්මාණය කිරීම උදෙසා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

සියලු අංශ ආවරණය කරමින් වැඩසටහන් ක්‍රියාත්මක කරමින් 2022 වර්ෂය තුළ අපේක්ෂිත ඉලක්ක සාධනය සඳහා අන්තාරයකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය කටයුතු කර ඇත. ඒ වෙනුවෙන් දායකත්වය දක්වන ලද සියලු පාර්ශ්වයන් වෙනුවෙන් කෘතවේදීත්වය පළ කරමි.

ශාක්‍ය නානායක්කාර
සභාපති

04. මණ්ඩලයේ බලතල

1984 අංක 11 දරන අන්තරායදායක ඖෂධ පාලනය කිරීමේ ජාතික මණ්ඩලය පනතේ, 7වන වගන්තිය ප්‍රකාරව මණ්ඩලය සතු බලතල පහත පරිදි වේ.

අ) අන්තරායදායක ඖෂධ අයුතු ලෙස භාවිතා කිරීම වැළැක්වීමට සහ පාලනය කිරීමට අදාළ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම, ඒ ප්‍රතිපත්තිය සමාලෝචනය කිරීම සහ ඒ ප්‍රතිපත්තිය පිළිබඳව අමාත්‍යවරයාට උපදෙස් දීම සහ නිර්දේශ කිරීම;

ආ) මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීම පිණිස සාධාරණව අවශ්‍ය විය හැකි තොරතුරු සහ විස්තර පුද්ගලයන්ගෙන්, සංවිධානවලින්, ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවලින් සහ රාජ්‍ය සංස්ථාවලින් ඉල්ලා සිටීම;

එසේ වුවද මේ ඡේදයේ විධිවිධාන යටතේ ලබාගන්නා ලද යම් තොරතුරක් හෝ විස්තරයක් සාමාජිකයකු විසින් හෙළිදරව් කිරීම, අධිකරණයක් විසින් එසේ කරන ලෙස නියම කරනු ලැබ ඇත්තා වූ අවස්ථාවක හෝ මේ පනතේ වෙනත් යම් විධිවිධානයක් අනුව කටයුතු කිරීම සඳහා වූ අවස්ථාවක හෝ මිස කරනු නොලැබිය යුතුය;

ඇ) මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා දේශීය සහ විදේශීය ප්‍රභවයන්ගෙන් පරිත්‍යාග සහ ප්‍රදාන ලබා ගැනීම;

ඈ) අන්තරාදයක ඖෂධ වැළැක්වීමෙහි සහ පාලනයෙහි නිරත නියෝජිතායතනවල කටයුතු ඒකාබද්ධ කිරීම;

ඉ) ඖෂධවලට වහල් වූ තැනැත්තන් සඳහා ප්‍රතිකාර සහ පුනරුත්ථාපන ක්‍රියාමාර්ග නංවාලීම සහ ඖෂධ අයුතු ලෙස භාවිත කිරීම හා වැළැක්වීමේ ජාතික අධ්‍යාපන වැඩ පිළිවෙලවල් ළමයින් සහ වැඩිහිටියන් සඳහා පවත්වා ගෙන යාම;

ඊ) අන්තරාදායක ඖෂධ අයුතු ලෙස භාවිත කිරීමේ පැවැත්ම, හේතුසාධක සහ නීතිමය, වෛද්‍ය, සමාජ, සංස්කෘතික සහ ආර්ථික බලපෑම් පිළිබඳව පර්යේෂණාත්මක අධ්‍යයන භාරගැනීම හා පවත්වාගෙන යාම ; සහ

උ) ඖෂධ පාලන කටයුතුවලට සම්බන්ධ ජාතික, ප්‍රාදේශීය සහ ජාත්‍යන්තර සංවිධාන සහ නියෝජිතායතන සමඟ සම්බන්ධතා පවත්වාගෙන යාම ;

05. මණ්ඩලයේ තොරතුරු සැකැස්ම

ආයතනයේ නම	:	අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය
නෛතික ව්‍යුහය	:	1986 අංක 41 හා 1990 අංක 21 දරන පනත්වලින් සංශෝධිත 1984 අංක 11 දරන අන්තරායදායක ඖෂධ පාලනය කිරීමේ ජාතික මණ්ඩලය පනත යටතේ පිහිටුවන ලද ව්‍යවස්ථාපිත මණ්ඩලයකි.

තොරතුරු ලබාගැනීම සඳහා

ලිපිනය	:	අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය අංක 383, කෝට්ටේ පාර, රාජගිරිය
දුරකතන අංකය	:	011 2868794 - 6
ෆැක්ස්	:	011 2868791/2, 011 2869805
විද්‍යුත් තැපෑල	:	mail@nddcb.gov.lk
ජාල අඩවිය	:	www.nddcb.gov.lk
විද්‍යුත් ජාල	:	facebooknddcb.gov.lk
විගණනය	:	විගණකාධිපති - ජාතික විගණන කාර්යාලය
නිල බැංකුව	:	ලංකා බැංකුව

06. මණ්ඩලයේ සංයුතිය

1986 අංක 41 දරන පනතින් සංශෝධනය වූ 1984 අංක 11 දරන අන්තරායදායක ඖෂධ පාලනය කිරීමේ ජාතික මණ්ඩලය පනතේ 3(1) වගන්තිය පරිදි මණ්ඩලයේ සංයුතිය පහත පරිදි වේ.

අ. අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු, මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු එක් සාමාජිකයෙකුගෙන් සහ වෙනත් සාමාජිකයන් තිදෙනෙකුගෙන් ;

ආ. අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් හෝ ඔහුගේ නාමිකයාගෙන් ;

ඇ. පොලිස්පතිවරයාගෙන් හෝ ඔහුගේ නාමිකයාගෙන් ;

ඈ. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් හෝ ඔහුගේ නාමිකයාගෙන් ;

ඉ. ප්‍රධාන රේගු අයකැමිවරයාගෙන් හෝ ඔහුගේ නාමිකයාගෙන් ;

ඊ. ආණ්ඩුවේ රස පරීක්ෂකවරයාගෙන් හෝ ඔහුගේ නාමිකයාගෙන් ;

උ. ආයුර්වේද කොමසාරිස්වරයාගෙන් හෝ ඔහුගේ නාමිකයාගෙන් ;

සහ

* භාණ්ඩාගාර නියෝජිතයෙකු ද මණ්ඩලයේ රැස්වීම සඳහා සහභාගී වේ.

මාණ්ඩලීය සාමාජිකයන්

01. ශාක්‍ය නානායක්කාර මහතා
සභාපති
අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය
383, කෝට්ටේ පාර,
රාජගිරිය

02. මහාචාර්ය අනුලා විජේසුන්දර මහත්මිය
142/2 ඒ,
විජයකුමාරතුංග මාවත,
කොළඹ 05
(පත්කළ සාමාජික)

03. නියෝජ්‍ය පොලිස්පති වරුණ ජයසුන්දර මහතා
නීතීඥ
අණදෙන නිලධාරි
විශේෂ කාර්ය බලකාය
කොළඹ 07
(පත්කළ සාමාජික)

04. සමන් දිසානායක මහතා
අතිරේක ලේකම් (සිවිල් ආරක්ෂක හා සංවර්ධන)
ආරක්ෂක අමාත්‍යාංශය
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය
බත්තරමුල්ල
(පත්කළ සාමාජික)

05. සාමන්ත විජේසේකර මහතා
ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි
අධ්‍යක්ෂ, පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය
කොළඹ 01
(නිල බලයෙන් පත් වූ සාමාජික)

06. වෛද්‍ය එස්. සී. වික්‍රමසිංහ මහත්මිය
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්,
බෝ නොවන රෝග ඒකකය
සෞඛ්‍ය අමාත්‍යාංශය
කොළඹ 10
(නිල බලයෙන් පත් වූ සාමාජික)

07. ජී.ඩබ්.පී. විජේවර්ධන මහතා
ජ්‍යෙෂ්ඨ රේගු අධ්‍යක්ෂ,
සමාජ ආරක්ෂණ ඒකකය
ශ්‍රී ලංකා රේගුව
40, කෙලින් වීදිය, කොළඹ 11
(නිල බලයෙන් පත් වූ සාමාජික)


08. සන්ධ්‍යා රාජපක්ෂ මහත්මිය
නියෝජ්‍ය රජයේ රස පරීක්ෂක
රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව
31, ඉසුරු මාවත, පැලවත්ත,
බත්තරමුල්ල
(නිල බලයෙන් පත් වූ සාමාජික)

09. ආචාර්ය ධම්මික අබේගුණවර්ධන මහතා
ආයුර්වේද කොමසාරිස්
ආයුර්වේද දෙපාර්තමේන්තුව
පරණ කොට්ටාව පාර,
නාවින්න, මහරගම
(නිල බලයෙන් පත් වූ සාමාජික)

10. එස්. කේ. කුලතුංග මුදලි මහත්මිය
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ඒකාබද්ධ සේවා)
අධ්‍යාපන අමාත්‍යාංශය
ඉසුරුපාය, බත්තරමුල්ල
(නිල බලයෙන් පත් වූ සාමාජික)

11. ආර්.ඒ.ඩී.ආර්. රණසිංහ මෙනවිය
අධ්‍යක්ෂ (වැඩ බලන)
කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව
මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික
ප්‍රතිපත්ති අමාත්‍යාංශය
කොළඹ 01
(භාණ්ඩාගාර නියෝජිත)

07. මණ්ඩලයේ සංවිධාන ව්‍යුහය



HM2-1	DG	අධ්‍යක්ෂ ජනරාල්	**01**
HM1-1	D(A)	අධ්‍යක්ෂ- පරිපාලන	**01**
	D(F)	අධ්‍යක්ෂ- මූල්‍ය	**01**
	D(TR)	අධක්ෂ- ප්‍රතිකාර, පුනුරුත්ථාපන හා බාහිර සේවා	**01**
	D(R)	අධ්‍යක්ෂ- පර්යේෂණ	**01**
	D(PET)	අධ්‍යක්ෂ- නිවාරක අධ්‍යාපන හා පුහුණු	**01**
JM 1-1	AO	පරිපාලන නිලධාරි	**01**
	M- T&M	කළමණාකරු - ප්‍රවාහන හා නඩත්තු	**01**
	M - HRM	කළමණාකරු - මානව සම්පත්	**01**
	M - IT	කළමණාකරු - තොරතුරු තාක්ෂණ	**01**
	M - P	කළමණාකරු - ප්‍රසම්පාදන	**01**
	M	පළමණාකරු - මධ්‍යස්ථාන	**04**
	M	කළමණාකරු	**01**
	FO	මූල්‍ය නිලධාරි	**01**
	C	උපදේශන නිලධාරි - මධ්‍යස්ථාන	**16**
	IO	ප්‍රතිකාර හා විමර්ශන නිලධාරි	**03**
	OR	බාහිර සේවා නිලධාරි	**07**
	RO	පර්යේෂණ නිලධාරි	**10**
	SO	විද්‍යාත්මක නිලධාරි	**17**
	DE&IO	මත්ද්‍රව්‍ය අධ්‍යාපන හා තොරතුරු නිලධාරි	**07**
	LB	පුස්ථකාලයාධිපති	**01**
	ALO	සහකාර නීති නිලධාරි	**01**
MA2-1 (Technical)	BK	පොත් තබන්නා	**01**
	N	හෙද නිලධාරි	**05**
	CA	උපදේශන සහකාර (මධස්ථාන) + ම.නි.ප්‍ර.පු.ස.	**91**
	OA	බාහිර සේවා සහකාර	**08**
	RA	පර්යේෂණ සහකාර	**07**
	ITA	තොරතුරු තාක්ෂණ සහකාර	**02**
	LT	රසායනාගාර තාක්ෂණික ශිල්පී	**04**
	DE&IA	මත්ද්‍රව්‍ය අධ්‍යාපන හා තොරතුරු සහකාර	**09**

***	අධ්‍යක්ෂ (නමෝදිෂ්ඨ හා පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන) - අමාත්‍යාවරයා විසින් පත්කරනු ලබයි		01
MM 1-1	DD/AD (A)	සහකාර අධ්‍යක්ෂ - පරිපාලන	**01**
	DD/AD (F)	සහකාර අධ්‍යක්ෂ – මූල්‍ය	**01**
	DD/AD (T&R)	සහකාර අධක්ෂ- ප්‍රතිකාර හා පුනුරුත්ථාපන	**01**
	DD/AD (O)	සහකාර අධ්‍යක්ෂ - බාහිරසේවා	**01**
	DD/AD (DPTC)	සහකාර අධ්‍යක්ෂ (නමෝදිෂ්ඨ හා පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන)	**01**
	DD/AD (R)	සහකාර අධ්‍යක්ෂ- පර්යේෂණ	**01**
	DD/AD (SR)	සහකාර අධ්‍යක්ෂ - විද්‍යාත්මක හා පර්යේෂණ	**01**
	DD/AD (PET)	සහකාර අධ්‍යක්ෂ -නිවාරක අධ්‍යාපන හා පුහුණු	**01**
	DD/AD (PCA)	සහකාර අධ්‍යක්ෂ - පුරෝගාමී රසායන	**01**
	AD (P)	සහකාර අධ්‍යක්ෂ - පළාත්	**03**
	BS/LO	මණ්ඩලීය ලේකම්/ නීති නිලධාරි	**01**
	IA	අභ්‍යන්තර විගණක	**01**
MA 5-2	AC	සහකාර උපදේශන නිලධාරි	**26**
	AOO	සහකාර බාහිර සේවා නිලධාරි	**22**
	ARO	සහකාර පර්යේෂණ නිලධාරි	**08**
	SAP	පද්ධති විශ්ලේෂක/ වැඩසටහන්කරු	**02**
	ASO	සහකාර විද්‍යාත්මක නිලධාරි	**04**
	AEIO	සහකාර මත්ද්‍රව්‍ය අධ්‍යාපන හා තොරතුරු නිලධාරි	**12**
MA 1-1	(තාක්ෂණික නොවන)	කළමණාකරන සහකාර	**37**
DR	රියදුරු		**18**
LA	පුස්තකාල සහයක		**01**
PI	කාර්යාල කාර්ය සහයක		**19**

මණ්ඩලයේ විධායක කාර්ය මණ්ඩලය

අංකය	නම	තනතුර	අධ්‍යාපන සුදුසුකම්
1.	ශාක්‍ය නානායක්කාර මහතා	සභාපති 2022.10.12 වන දින පත් කර ඇත.	නීතීඥ
			මනෝ විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව - කොළඹ විශ්වවිද්‍යාලය
			කම්කරු අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව - කොළඹ විශ්වවිද්‍යාලය
			ශාස්ත්‍රපති උපාධිය - කැළණිය විශ්වවිද්‍යාලය
2.	විශේෂඥ වෛද්‍ය ප්‍රියංගි අමරබන්දු මහත්මිය	සභාපතිනි 2022.10.10 වන දින සේවයෙන් ඉල්ලා අස්වී ඇත.	එම්.බී.බී.එස් (MBBS) - කොළඹ විශ්වවිද්‍යාලය
			D.Path
			MD (Histopath)
3.	එස්.එම්.බී. නන්දා කුමාරිහාමි මහත්මිය	අධ්‍යක්ෂ (පර්යේෂණ)	දර්ශනපති උපාධිය (MPhil) සමාජ විද්‍යාව - කැළණිය විශ්වවිද්‍යාලය
		අධ්‍යක්ෂ ජනරාල් (රාජකාරී ඉටුකරන) 2021.03.31 සිට 2022.01.10 දක්වා	සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති (MSSC) උපාධිය - කැළණිය විශ්වවිද්‍යාලය
			සමාජ විද්‍යාව හා මානව විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
			උපදේශනය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව - ශ්‍රී ලංකා පදනම් ආයතනය
4.	එල්.ඩී.එස්. පෙරේරා මහත්මිය	අධ්‍යක්ෂ මූල්‍ය (වැඩ බලන) 2022.05.31 වන දින සේවයෙන් ඉල්ලා අස්වී ඇත.	-
5.	එච්.යු.ආර්. ෆොන්සේකා මහතා	අධ්‍යක්ෂ මූල්‍ය (රාජකාරී ආවරණ) 2022.07.18 වන දින සිට 2022.12.31 දක්වා	වාණිජවේදී විශේෂ උපාධිය - කොළඹ විශ්වවිද්‍යාලය

6.	මල්ෂා මුණසිංහආරච්චි මහත්මිය	අධ්‍යක්ෂ පරිපාලන (වැඩ බලන) 2022.02.03 වන දින පත්කර ඇත. 2022.03.31 වන දින සේවයෙන් ඉල්ලා අස් වී ඇත.	ජීව විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය - කොළඹ විශ්වවිද්‍යාලය
			ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධිය (අලෙවිකරණය) - කොළඹ විශ්වවිද්‍යාලය
			ශ්‍රී ලංකා පරිපාලනය සේවයේ II වන පන්තිය
7.	නීතීඥ ප්‍රියංගනී හේවාරත්න මිය	අධ්‍යක්ෂ පරිපාලන (රාජකාරී ආවරණ) 2022.09.13 වන දින සිට 2022.12.31 දක්වා	නීතිය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (LL.M.) - කොතලාවල ආරක්ෂක විද්‍යාලය
			රාජ්‍ය පරිපාලනය (ප්‍රතිපත්ති) පිළිබඳ පශ්චාත් උපාධි - ෆ්ලින්ඩර්ස් විශ්වවිද්‍යාලය (ඕස්ට්‍රේලියාව)
			ශ්‍රී ලංකා පරිපාලනය සේවයේ I වන පන්තිය
8.	කණිෂ්ක කුමාර ද සිල්වා මහතා	අධ්‍යක්ෂ (පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන) (පනතට අනුව පත්කරන) 2021.05.03 වන දින පත්කර ඇත. 2022.10.07 වන දින සේවයෙන් ඉල්ලා අස් වී ඇත.	-
9.	ටී.ඩබ්. පේමසිරි මහතා	අධ්‍යක්ෂ - ප්‍රතිකාර පුනරුත්ථාපන හා බාහිරසේවා	සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය - කැලණිය විශ්වවිද්‍යාලය
			වාණිජවේදී උපාධිය - කොළඹ විශ්වවිද්‍යාලය
			සමාජ වැඩ පිළිබඳ ඩිප්ලෝමාව - ජාතික සමාජ සංවර්ධන ආයතනය
			ඉංග්‍රීසි ඩිප්ලෝමාව - බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

10.	එස්.ටී. වැරණියගොඩ මහත්මිය	මණ්ඩලීය ලේකම්/ නීති නිලධාරී 2022.09.08 වන දින සේවයෙන් ඉල්ලා අස් වී ඇත.	නීතිවේදී උපාධිය - කොළඹ විශ්වවිද්‍යාලය
			නීතිය පිළිබඳ පශ්චාත් උපාධිය - පුනේ විශ්වවිද්‍යාලය (ඉන්දියාව)
11.	ස්කොඩ්‍රන් ලීඩර් ජී.කේ.බී.පී. විජේවර්ධන මෙය	මණ්ඩලයේ ලේකම් හා නීති නිලධාරී (රාජකාරී ආවරණ) 2022.09.09 වන දින සිට 2022.12.31 දක්වා	විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන උපාධිය - ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
			නීතීඥ - නීති විද්‍යාලය
12.	ඩී.පී.එම්. ගමගේ මහත්මිය	අභ්‍යන්තර විගණක	සහතිකලත් ව්‍යාපාර ගණකාධිකාරී - ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය
			විද්‍යාවේදී (ව්‍යාපාර පරිපාලන) උපාධිය - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
			AAT(SL) - ශ්‍රී ලංකා වරලත් ගිණුම්කරණ ශිල්පීය ආයතනය
13.	එම්.ඒ.ඩබ්. මාරසිංහ මහතා	සහකාර අධ්‍යක්ෂ - බාහිරසේවා 2022.04.30 දින විශ්‍රාම ලබා ඇත	මනෝ විද්‍යාව පිළිබඳ ජාතික ඩිප්ලෝමාව - මනෝ විද්‍යා අධ්‍යයන ආයතනය
			උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාව - මනෝවිද්‍යා අධ්‍යයන ආයතනය
14.	ඒ.ඩබ්.ඒ. කුමාරි මහත්මිය	සහකාර අධ්‍යක්ෂ - පරිපාලන	ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධිය - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
			විද්‍යාවේදී මානව සම්පත් කළමනාකරණය පිළිබඳ විශේෂ උපාධිය - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
			මත්ද්‍රව්‍ය දුර්භාවිත පිළිබඳ කළමනාකරණ ඩිප්ලෝමාව - කොළඹ විශ්වවිද්‍යාලය
15.	ප්‍රදීප් කුමාර කොහොලානේගෙදර මහතා	සහකාර අධ්‍යක්ෂ - නිවාරක අධ්‍යාපන හා පුහුණු	ජාත්‍යන්තර කටයුතු අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය - උප්සලා විශ්වවිද්‍යාලය (ස්වීඩනය)
			ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය - කොළඹ විශ්වවිද්‍යාලය

			උපදේශනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (PGDC)
			මත්ද්‍රව්‍ය උපදේශනය පිළිබඳ ජාත්‍යන්තර සහතිකය - එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුව කොළඹ ක්‍රමය
16.	ඩි.පී.පී. වීරසිංහ මහත්මිය	සහකාර අධ්‍යක්ෂ - විද්‍යාත්මක පර්යේෂණ 2022.11.24 වන දින අභාවප්‍රාප්ත වී ඇත.	රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය - දිල්ලි විශ්වවිද්‍යාලය (ඉන්දියා)
			විශ්ලේෂණ රසායන විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධිය - පේරාදෙණිය විශ්වවිද්‍යාලය
17.	කේ.වී. රංජිත් වික්‍රමසිංහ මහතා	සහකාර අධ්‍යක්ෂ - විද්‍යාත්මක පර්යේෂණ (රාජකාරී ආවරණ) 2022.11.28 වන දින පත්කර ඇත.	පරිගණක යෙදුම් පිළිබඳ ඩිප්ලෝමාව - සොලරීස් පරිගණක අධ්‍යාපන ආයතනය
			රසායනාගාර තාක්ෂණ පිළිබඳ ඩිප්ලෝමාව - රසායන විද්‍යා ආයතනය
18.	ජී.ආර්. ගුණවර්ධන මහතා	සහකාර අධ්‍යක්ෂ - නාමෝදිෂ්ඨ හා පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන	සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය - කැළණිය විශ්වවිද්‍යාලය
			සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය - කැළණිය විශ්වවිද්‍යාලය
19.	ටී.කේ.ආර්. දිසානායක මහත්මිය	සහකාර අධ්‍යක්ෂ - පුරෝගාමී රසායන	රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය - කොළඹ විශ්වවිද්‍යාලය
20.	ඒ.ටී. දර්ශන මහතා	සහකාර අධ්‍යක්ෂ - පර්යේෂණ	සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය - කැළණිය විශ්වවිද්‍යාලය
			සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය - කොළඹ විශ්වවිද්‍යාලය
			මත්ද්‍රව්‍ය දුර්භාවිත පිළිබඳ කළමනාකරණ ඩිප්ලෝමාව - කොළඹ විශ්වවිද්‍යාලය


08. ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය දුර්භාවිතය ආශ්‍රිත කාලීන ප්‍රවණතා

2022 වර්ෂය තුළ මත්ද්‍රව්‍ය සම්බන්ධ අත්අඩංගුවට ගැනීම් සහ ප්‍රතිකාර හා පුනරුත්ථාපන සේවාවන්වලට ඇතුළත්වීම්වලට අදාල දත්ත විශ්ලේෂණය කිරීමේ දී සංඛ්‍යාත්මකව වැඩි වීමක් නිරීක්ෂණය වී ඇත. නීතිය ක්‍රියාත්මක කරන ආයතන විසින් ක්‍රියාත්මක කරන ලද වැටලීම් සංඛ්‍යාව සහ අදාළ මත්ද්‍රව්‍ය ප්‍රමාණ පහත සාරාංශගත කර ඇත.

මත්ද්‍රව්‍ය වර්ගය	අත්අඩංගුවට ගත් පුද්ගලයින් සංඛ්‍යාව	ප්‍රතිශතය (%)
හෙරොයින්	69,688	45.6
ගංජා	53,579	35.0
කොකේන්	39	0.0
හෂීස්	197	0.1
මෙතැම්පිටමින්	22,631	14.8
මනෝවර්තක ඖෂධ	686	0.4
අබිං	18	0.1
වෙනත්	6,141	4.0
එකතුව	152,979	100.0

(මූලාශ්‍රය : පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය - 2022)

2022 වර්ෂයේදී ශ්‍රී ලංකාව තුළ මත්ද්‍රව්‍ය වැරදි සඳහා අත්අඩංගුවට ගනු ලැබූ මුළු පුද්ගල සංඛ්‍යාව 152,979 කි. එය 2021 වර්ෂය හා සසඳන කළ 36%ක වැඩිවීමකි.



(මූලාශ්‍රය : පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය - 2022)


මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් අත්අඩංගුවට ගැනීම් සලකා බැලීමේදී වැඩිම අත්අඩංගුවට ගැනීම් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ බස්නාහිර පළාතෙනි. එය 119,258 කි. දිස්ත්‍රික්ක මට්ටමින් අත්අඩංගුවට ගත් පුද්ගලයින් සංඛ්‍යාව 63,009 ක් ලෙස කලුතර දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇත.

2022 වර්ෂයේ මත්ද්‍රව්‍ය වැටලීම්වලදී අත්අඩංගුවට ගත් මත්ද්‍රව්‍ය ප්‍රමාණ පිළිබඳ සාරාංශයන් පහත ඉදිරිපත් කර ඇත.

මත්ද්‍රව්‍ය වර්ගය	අත්අඩංගුවට ගත් ප්‍රමාණය (kg)
හෙරොයින්	1,345.119
ගංජා	16,165.854
කොකේන්	370.112
හෂීස්	39.261
මෙතැම්පිටමින්	241.596
අබිං	10.809
මනෝවර්තක ඖෂධ	0.141
වෙනත්	82.820


(මූලාශ්‍රය : පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය - 2022)

ශ්‍රී ලංකාව තුළ මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහිවූවන් සඳහා ප්‍රතිකාර හා පුනරුත්ථාපන සේවාවන් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන විසින් ක්‍රියාත්මක කරනු ලබයි. 2022 වර්ෂයේ මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහි වූ සේවාලාභීන් 1,930 දෙනෙක් ප්‍රතිකාර හා පුනරුත්ථාපන සේවාවන් ලබාගෙන ඇත. එම සේවාලාභීන්ගෙන් 740 (38.5%) අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයෙන් ද, 67 (3.5%) බන්ධනාගාර ප්‍රතිකාර වැඩසටහනින් ද, 304 (16%) රාජ්‍ය නොවන සංවිධානවලින් ද, 819 (42%) පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශයට අයත් කන්දකාඩු ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානයෙන්ද ප්‍රතිකාර හා පුනරුත්ථාපන සේවාවන් ලබාගෙන ඇති අතර එම සේවාලාභීන්ගෙන් බහුතරයක් (26%) කොළඹ දිස්ත්‍රික්කයෙන් ආයතනගතවූවන් ය.



(මූලාශ්‍රය : මත්ද්‍රව්‍ය දුර්භාවිත දත්ත ඇගයීම් පද්ධතිය - 2022)

ප්‍රතිකාර ලබාගත් පුද්ගලයන්ගෙන් 39% ක් අවුරුදු 30 හෝ ඊට වැඩි පුද්ගලයින් වෙති. 2021 වර්ෂය හා සැසඳීමේදී 2022 වර්ෂය තුළ ප්‍රතිකාර සඳහා යොමු වූ සේවාලාභීන් සංඛ්‍යාව 13% කින් වැඩි වී ඇත.



(මූලාශ්‍රය : මත්ද්‍රව්‍ය දුර්භාවිත දත්ත ඇගයීම් පද්ධතිය - 2022)

09. සංස්ථා පාලනය

අන්තරායදායක ඖෂධ පාලනය කිරීමේ ජාතික මණ්ඩලය පනතේ 6(3) වගන්තියට අනුව මණ්ඩලය අවම වශයෙන් මසකට එක් වරක් හෝ රැස් විය යුතුය.

අනු කමිටු

1984 අංක 11 දරන අන්තරායදායක ඖෂධ පාලනය කිරීමේ ජාතික මණ්ඩලය පනතේ 8වන වගන්තිය ප්‍රකාරව අමාත්‍යවරයා විසින් පවරනු ලැබිය හැකි බලතල ක්‍රියාත්මක කිරීම සහ කාර්ය ඉටු කිරීම භාර කරනු ලැබිය යුතු යම් අනුකාරක සහා මේ පනතේ කාර්ය සඳහා මණ්ඩලය විසින් පත් කරනු ලැබිය හැකිය.

මේ ආකාරයට පත්කරන ලද පහත අනු කමිටු 2022 වර්ෂයේදී ක්‍රියාත්මක විය.

1. 2008 අංක 1 දරන මාදක සහ මනෝවර්ථක ඖෂධ නීතිවිරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනත සංශෝධනය කිරීම සඳහා වූ අනුකමිටුව

2. 2007 අංක 54 දරන ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපන) පිළිබඳ පනත සංශෝධනය කිරීම සඳහා වූ අනු කමිටුව

3. 1984 අංක 11 දරන අන්තරායදායක ඖෂධ පාලනය කිරීමේ ජාතික මණ්ඩලය පනත සංශෝධනය කිරීම සඳහා වූ අනු කමිටුව

10. මූල්‍ය හා කාර්යසාධන විශ්ලේෂණය

	2022 (රු.)	2021 (රු.)	වෙනස (රු.)	ප්‍රතිශතය	
රජයේ පුනරාවර්ථන ප්‍රධාන	234,850,000.00	243,944,000.00	9,094,000.00	3%	අඩුවීම
වෙනත් ආදායම් (සටහන 2)	9,634,530.52	41,568,026.21	31,933,495.69	76%	අඩුවීම
මුලු වියදම	292,837,266.19	270,493,976.89	22,343,289.30	8%	වැඩිවීම

11. ක්‍රියාකාරීත්වය පිළිබඳ සමාලෝචනය

11.1 නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය

1984 අංක 11 දරන අන්තරාදායක ඖෂධ පාලනය කිරීමේ ජාතික මණ්ඩලය පනතේ 7 (ඉ) වගන්තිය යටතේ පවරා දෙන ලද බලතල ප්‍රකාරව "ඖෂධ අයුතු ලෙස භාවිතා කිරීම හා වැළැක්වීමේ ජාතික අධ්‍යාපන වැඩ පිළිවෙලවල් ළමයින් හා වැඩිහිටියන් සඳහා පවත්වාගෙන යාම" ස්වකීය ප්‍රමුඛ වගකීම කරගත් අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය, "අපි ගුණාත්මක අධ්‍යාපනය හා පුහුණුව තුළින් මත්ද්‍රව්‍ය දුර්භාවිතය අවම සහ නිවාරණය වූ ආරක්ෂාකාරී පරිසරයක් නිර්මාණය කර ගැනීම සඳහා මිනිසුන් බල ගන්වමු" යන තේමාව පෙරදැරිව වාර්ෂිකව වැඩසටහන් දියත් කරනු ලබයි.

මෙකී වැඩසටහන් සමාජ ආකලනය හා තිරසාර සංවර්ධන ඉලක්ක (***ඉලක්ක අංක 3.5*** හානිකර ආකාරයට මද්‍යසාර භාවිතය සහ අන්තරායකාරී ඖෂධ භාවිතය වැලැක්වීමේ ක්‍රියාමාර්ග සහ ප්‍රතිකාර ශක්තිමත් කිරීම, ***ඉලක්ක අංක 5.1*** කාන්තාවන්ට හා ගැහැණු ළමුන්ට එරෙහිව සියලුම ස්ථානයන්හි සිදුවන්නා වූ සියලුම ආකාරයේ වෙනස් කොට සැලකීම් තුරන් කිරීම, (නිවාරණ අධ්‍යාපන හා පුහුණු වැඩසටහන් සඳහා සහභාගිවීමට සමාන අවස්ථාවන් සැලැස්වීමේ උපකාරකයක් ලෙස) ***ඉලක්ක අංක 16 b:*** තිරසර සංවර්ධනය සඳහා වෙනස්කොට සැලකීම වැලැක්වීම වෙනුවෙන් වූ නීති සහ ප්‍රතිපත්ති ප්‍රවර්ධනය කිරීම හා බලගැන්වීම, (නිවාරණ ක්‍රියාකාරකම් සඳහා සම්බන්ධ වීමට සෑම පුද්ගලයෙකු වෙතටම අවස්ථාව සලසාදීම සඳහා) අරමුණු කරගනිමින් විද්‍යාත්මක හා ගුණාත්මක ක්‍රමවේදයන් ඔස්සේ මනෝ විද්‍යාත්මක ඉගෙනුම් න්‍යායන් පදනම් කරගත් පුහුණු කාර්ය මණ්ඩලයක් මඟින් ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO) විසින් නිර්දේශ කරනු ලබන ප්‍රධාන ධාරාවන් හය (6) යටතේ ක්‍රියාවට නැංවෙයි.

- පාසල් පාදක මත්ද්‍රව්‍ය නිවාරණ හා පුහුණු වැඩසටහන්
- තරුණ ප්‍රජා පාදක මත්ද්‍රව්‍ය නිවාරණ අධ්‍යාපන හා පුහුණු වැඩසටහන්
- පවුල් පාදක මත්ද්‍රව්‍ය නිවාරණ අධ්‍යාපන හා පුහුණු වැඩසටහන්
- විශාල වැඩබිම් පාදක මත්ද්‍රව්‍ය නිවාරණ අධ්‍යාපන හා පුහුණු වැඩසටහන්
- මාධ්‍ය පාදක මත්ද්‍රව්‍ය නිවාරණ අධ්‍යාපන හා පුහුණු වැඩසටහන්
- පාරිසරික පාදක මත්ද්‍රව්‍ය නිවාරණ අධ්‍යාපන හා පුහුණු වැඩසටහන්

මෙම ප්‍රධාන ධාරාවන් හය (6) යටතේ අනුවිෂයන් සහ අනුශාංගික වැඩසටහන් ලෙස සකස් කරන ලද වැඩසටහන් ශ්‍රී ලංකාවේ සමස්ත ජනගහනයම ආවරණය වන පරිදි ක්‍රියාත්මක කරනු ලබයි. මෙම වාර්තාවෙහි සැබෑ අරමුණ වන්නේ අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද පස් අවුරුදු සහයෝගීතා සැලැස්මට අනුගතව ගෝලීය තිරසාර සංවර්ධන ඉලක්ක වෙත ද යොමුවෙමින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙන් අපේක්ෂිත කාර්යයන් ගුණාත්මකව හා ප්‍රමාණාත්මකව සපුරාගෙන ඇති ප්‍රමාණය කොපමණද යන්න සලකා බැලීමයි. මේ සඳහා වූ අපගේ සැලසුම්වල ගුණාත්මක විශ්ලේෂණ තුළින් දිගු කාලීන මෙන්ම අතරමැදි ප්‍රතිඵල වල ප්‍රබල සංකලනයක් දැක ගැනීමට හැකියාව ඇති අතර පාසැල් සිසුන් ඉලක්ක කොට ආරම්භ කරන ලද මෙතැම්ෙටමයින් සංවාදයට නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය සාර්ථකව මුහුණ දෙමින්, එය

අවම කිරීම වෙනුවෙන් මාධ්‍ය හා සම්බන්ධ ක්‍රියාකාරී හවුල්කාර වැඩසටහන් ඔස්සේ වර්ෂය පුරාවටම විශාල ලෙස කටයුතු කරන ලදී.

මෙම කාලය තුළ ළමුන්ගේ අවධානයට ලක් වූ තවත් කරුණක් ලෙස ගංජා නීතිගත කිරීම දැක්විය හැකි අතර එහි සෞඛ්‍ය ප්‍රතිලාභ පිළිබඳව වූ ආකර්ෂණීය විශ්වාස පද්ධතිය බිඳ දැමීම නිවාරණ වැඩසටහන්වල ප්‍රධාන මාතෘකාවක් බවට පත් කර එම විශ්වාසයන් අවම කිරීමට ප්‍රයත්න දරන ලදී.

දරුවන් අතර වඩාත් ප්‍රචලිතව තිබූ ප්‍රාථමික මත්ද්‍රව්‍යයක් වන ***"තුල්"***, විෂයෙහි දරුවන් කෙරෙහි වූ වැරදි ආකල්ප වෙනස් කිරීම සහ එමගින් ඇතිවන දීර්ඝකාලීන ප්‍රතිඵල අවම කිරීමට කටයුතු කිරීම නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය විසින් සාර්ථකව සිදුකරන්නට යෙදුන තවත් කාර්යයකි.
නැගී එන සහ නව ප්‍රවණතා රැසක් අවම කිරීමටත් පාසල් ප්‍රජාව තුළ මත්ද්‍රව්‍ය ප්‍රවර්ධනය කිරීම සඳහා ගෙන යන වැඩපිළිවලට සාර්ථකව මුහුණ දිය හැකි ළමා පරපුරක් බිහි කිරීමටත් තිරසාර වැඩසටහන් ජාලයක් නිර්මාණය කර ක්‍රියාත්මක කිරීමට 2022 වසර තුළ අපට හැකි විය.

පාසල් විෂය මාලාවන් ආධාර කරගනිමින් සිසුන් තුළ ගොඩනැගෙන මත්ද්‍රව්‍ය ප්‍රවර්ධනය අඩු කිරීම් වෙනුවෙන් ගුරුවරුන් සිසුන්ගේ ගාමක බලවේග බවට පත්කර අවශ්‍ය විටදී කෙටි මැදිහත්කරණයන් සිදුකරන ලදී. ප්‍රතිඵල දිගුකාලීන වන අතර ගුණාත්මක සිසු තත්ත්ව කව (SQS) එහි අනාගතය සහ දිගුකාලීන පැවැත්ම සහතික කර ඇත.



(ඡායාරූප 11.1.1)

11.1.1 පාසල් පාදක මත්ද්‍රව්‍ය නිවාරණ හා පුහුණු වැඩසටහන්

11.1.1.1 පාසල් සිසුන් දැනුවත් කිරීම

දරුවන් තුළ මත්ද්‍රව්‍ය දුර්භාවිතය වර්ධනය කිරීමට බලපාන සාධක අතර ඔවුන්ගේ සංවර්ධන අවධීන් වෙත බලපෑම් කරන පාරිසරික සාධක සුවිශේෂී තැනක් ගනී. පාසල් පාදක මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන්වල අරමුණ වූයේ මත්ද්‍රව්‍ය සඳහා දරුවන් තුළ කැමැත්ත ඇති කරවන සාධක සහ එයට ආකර්ශනය ඇති කරවන පාරිසරික සාධක අවම කිරීමයි. එමෙන්ම පාසල් පාදක මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් සඳහා යොදාගනු ලබන උපාය මාර්ගය වනුයේ මත්ද්‍රව්‍ය වෙළඳපල මඟින් ඉදිරිපත් කරන උපක්‍රම සඳහා නොරැවටී එවන් අවස්ථාවලින් මිදී සිටීමට අවශ්‍ය දැනුම සහ කුසලතා වර්ධනය කරමින් ඒ කෙරෙහි ඇති ධනාත්මක ආකල්ප වෙනස් කිරීමයි.

මේ වන විට එම වැඩසටහන් තුළින් වැඩි සාර්ථකත්වයක් පෙන්නුම් කරන අතර එහි ප්‍රතිඵලයක් ලෙස පාසල් පද්ධතියෙන් මතුව ආ මත්ද්‍රව්‍ය ආශ්‍රිත නව ප්‍රවණතා සැලකිය යුතු ලෙස අඩු වී තිබේ.

තිරසාර සංවර්ධන ඉලක්ක මත පදනම්ව දිගුකාලීන ප්‍රතිඵල ඇති කිරීමේ අරමුණින් 2022 වසරේ දී ගුණාත්මක සිසු තත්ත්ව කව (SQS) ආරම්භ කරන ලදි. මෙම සියලු වැඩසටහන් අඩු පිරිවැයක් යටතේ සිදුකරන ලද ඵලදායී වැඩසටහන් ලෙස හඳුන්වා දිය හැකි ය. 2022 වසර සඳහා සැලසුම් කර තිබූ ඉලක්ක ගත වැඩසටහන් සංඛ්‍යාව 500ක් වූ නමුත් මෙම සංඛ්‍යාව අභිබවා යමින් වැඩසටහන් 763ක් භෞතිකව සිදු කළ අතර වඩාත් ගුණාත්මක ප්‍රතිඵලය වූයේ පාසල් ගුරුවරුන් පුහුණුකරුවන් ලෙස යොදා ගනිමින් Echo වැඩසටහන් විශාල ප්‍රමාණයක් පාසල් පද්ධතිය පුරා පංතිකාමර මට්ටමින් මුදා හැරීමයි.

පසුගිය වසර පහ තුළ සිදුකරන ලද වැඩසටහන්වල භෞතික ප්‍රගතිය පිළිබඳ විශ්ලේෂණයක් පහත වගුවේ දක්වා ඇත. ඒ අනුව පසුගිය වසර පහ තුළ ලද ඉහළම ප්‍රගතිය 2022 වසරේ දී ලබාගැනීමට නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය සමත් විය. එය වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම හා සැසඳීමේ දී 152.6%ක ප්‍රවර්ධනයකි.

පාසල් සිසුන් දැනුවත් කිරීම 2018-2022

	2018	2019	2020	2021	2022
ඇස්තමේන්තුගත වැඩසටහන් ප්‍රමාණය	500	500	500	500	500
සම්පූර්ණ කරන ලද වැඩසටහන් ගණන	670	390	79	239	763
සම්පූර්ණ කරන ලද වැඩසටහන් ගණන ඇස්තමේන්තුගත සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස	134%	78%	15.8%	47.8%	152.6%
ඇස්තමේන්තුගත ශිෂ්‍ය සංඛ්‍යාව	130,000	130,000	130,000	130,000	200,000
සහභාගී වූ ශිෂ්‍ය සංඛ්‍යාව	121,536	79,863	15,665	39,837	129,848
සහභාගී වූ ශිෂ්‍ය සංඛ්‍යාව ඇස්තමේන්තුගත සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස	93.48%	61.43%	12.05%	30.64%	64.92%

(11.1.1.1 වගුව)

11.1.1.2 ජාත්‍යන්තර පාසල් සිසුන් පාදක කරගත් නිවාරණ අධ්‍යාපන හා පුහුණු වැඩසටහන්

රජයේ පාසල් පාරිසරික පාදක මත්ද්‍රව්‍ය නිවාරණ උපක්‍රම මඟින් දැනුවත් කිරීමට හැකි වුවද ජාත්‍යන්තර පාසල් මෙම රෙගුලාසි අනුගමනය කිරීමට බැඳී නොසිටින නමුත් සමාගම් ලියාපදිංචි කිරීමේ පනතින් බැඳී සිටියි. නමුත් ජාතික මත්ද්‍රව්‍ය නිවාරණ ප්‍රතිපත්තිය බොහෝ ජාත්‍යන්තර පාසල් තුළ ස්ථාපිත කිරීමටත් එම දරුවන් තුළ මත්ද්‍රව්‍ය පිළිබඳ පැවැති ප්‍රතිරූපය වෙනස් කිරීමටත් නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශයට හැකි විය. ඔවුන් විසින්ම ගැටලු හඳුනාගනිමින් අප වෙත ප්‍රවේශය සකස්කර දීම නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය අද ලද තවත් සාර්ථකත්වයක් ලෙස හඳුන්වා දිය හැකි ය.

2022 වර්ෂයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අභිබවා 120% ප්‍රගතියකින් මෙම වැඩසටහන් සම්පූර්ණ කිරීමට නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය සමත් විය.

ජාත්‍යන්තර පාසල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් 2018-2022					
	2018	2019	2020	2021	2022
ඇස්තමේන්තුගත වැඩසටහන් ප්‍රමාණය	10	10	10	10	10
සම්පූර්ණ කරන ලද වැඩසටහන් ගණන	13	9	0	3	12
සම්පූර්ණ කරන ලද වැඩසටහන් ගණන ඇස්තමේන්තුගත සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස	130%	90%	0%	30%	120%
ඇස්තමේන්තුගත ශිෂ්‍ය සංඛ්‍යාව	2,000	2,000	2,000	2,000	2,000
සහභාගී වූ ශිෂ්‍ය සංඛ්‍යාව	1671	1443	0	183	2,166
සහභාගී වූ ශිෂ්‍ය සංඛ්‍යාව ඇස්තමේන්තුගත සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස	83.55%	72.15%	0%	9.15%	108.3%

(11.1.1.2 වගුව)

11.1.1.3 දෙමාපිය කුසලතා සංවර්ධන වැඩසටහන්

දරුවෙකුගේ මත්ද්‍රව්‍ය භාවිතයේ පදනම සැකසීමේදී ක්ෂුද්‍ර සහ සාර්ව පරිසරයන් දෙකම තීව්‍ර භූමිකාවක් නිරූපණය කරයි. සුමට පරිසරයක් තුළ දරුවෙක්ගේ සමාජානුයෝජන ක්‍රියාවලිය හැඩගස්වන වඩාත් බලගතුම සංස්ථාව වනුයේ පවුලයි. දෙමාපියන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය, ගැටලුකාරී පවුල් පරිසරය, ළමා අපයෝජන සහ නොසලකා හැරීම්, මාපියන් සහ රැක බලාගන්නන් විසින් දරුවන් හඳා වඩා ගැනීමේ දී ඇතිවන ගැටළු, දරුවන් මත්ද්‍රව්‍ය භාවිතය සඳහා යොමු කරවන අවදානම් සාධක ලෙස දැක්විය හැකි ය. දෙමාපිය කුසලතා සංවර්ධන වැඩසටහන් මඟින් දරුවන්ගේ ආරක්ෂක සාධක ඉහළ නැංවීම පසුකාලීනව සමාජානුයෝජන ක්‍රියාවලියේ දී ඇතිවිය හැකි අවදානම් සාධක අවම කිරීමට හේතු වෙයි.

2022 වසරේදී දෙමාපිය කුසලතා සංවර්ධන වැඩසටහන් 104ක් ක්‍රියාත්මක කරමින් 52%ක භෞතික ප්‍රගතියක් අත්කර ගැනීමට නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය සමත් විය.

11.1.1.3 දෙමාපිය කුසලතා සංවර්ධන වැඩසටහන් 2018-2022					
	2018	2019	2020	2021	2022
ඇස්තමේන්තුගත වැඩසටහන් ප්‍රමාණය	200	200	200	200	200
සම්පූර්ණ කරන ලද වැඩසටහන් ගණන	204	121	0	117	104
සම්පූර්ණ කරන ලද වැඩසටහන් ගණන ඇස්තමේන්තුගත සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස	102%	60.5%	0%	58.5%	52%
ඇස්තමේන්තුගත දෙමාපිය සංඛ්‍යාව	22,000	22,000	22,000	22,000	22,000
සහභාගී වූ දෙමාපිය සංඛ්‍යාව	24,919	14,652	0	3,187	14,448
සහභාගී වූ දෙමාපිය සංඛ්‍යාව ඇස්තමේන්තුගත සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස	113.26%	66.66%	0	14.5%	65.67%

(11.1.1.3 වගුව)

11.1.1.4 ගුරුවරුන් පුහුණු කිරීමේ වැඩසටහන්

දරුවන් සාර්ථක ලෙස සමාජානුයෝජනය කිරීමේ ක්‍රියාවලියේ දෙවන ආනුශාංගික ආයතනය වන්නේ පාසලයි. ගුරුවරුන් නිවාරණ පුහුණුකරුවන් ලෙස පුහුණු කිරීමෙන්, වසර පුරාවටම දරුවන් වෙනුවෙන් පන්ති කාමර මට්ටමින් නිවාරණ වැඩසටහන පවත්වාගෙන යාමට හැකියාව ලැබෙන අතර අවදානම් සහිත දරුවන් සහ දැනටමත් භාවිතයේ යෙදෙන දරුවන් හඳුනා ගැනීමටත්, ඔවුන් වෙත කෙටි මැදිහත්වීම් ලබාදීමටත්, අවශ්‍යතාවය මත ප්‍රතිකාර සඳහා යොමුකිරීමටත් හැකියාව සැලසෙයි. මෙම වැඩසටහන් මාලාව හරහා උපදේශන ගුරුවරුන් ද පුහුණු කළ අතර මෙය පාසල් ප්‍රතිපත්තියක් ලෙස ක්‍රියාත්මක කිරීම අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ එක්ව *"ශික්ෂා"* පාසල් පාදක මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් මාලාවට සමගාමීව 2022 වසර තුළ දී සිදු කරන ලදි.

11.1.1.4 ගුරුවරුන් පුහුණු කිරීමේ වැඩසටහන්					
	2018	2019	2020	2021	2022
ඇස්තමේන්තුගත වැඩසටහන් ප්‍රමාණය	30	30	30	30	30
සම්පූර්ණ කරන ලද වැඩසටහන් ගණන	31	07	06	06	18
සම්පූර්ණ කරන ලද වැඩසටහන් ගණන ඇස්තමේන්තු ගත සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස	103.33%	23.33%	20%	20%	60%
ඇස්තමේන්තුගත ගුරුවරුන් සංඛ්‍යාව	1,000	1,000	1,000	1,000	1,000
සහභාගී වූ ගුරුවරුන් සංඛ්‍යාව	2,776	772	268	390	969
සහභාගී වූ ගුරුවරුන් සංඛ්‍යාව ඇස්තමේන්තුගත සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස	276.6%	77.2%	26.8%	39%	24.23%

(11.1.1.4 වගුව)



(ඡායාරූප 11.1.1.4.1)



(ඡායාරූප 11.1.1.4.2)

11.1.1.5 ගුරුවරුන් සඳහා අධ්‍යාපනික වැඩසටහන් පැවැත්වීම

දෙමව්පියන් සහ භාරකරුවන් හැරුණු විට ගුරුවරුන් යනු දරුවන් සමඟ ගනුදෙනු කරන සහ දරුවන්ගේ සමාජ සුබසාධනයට විශාල දායකත්වයක් සපයන සමාජ කණ්ඩායමකි. මත්ද්‍රව්‍ය සහ මද්‍යසාර සම්බන්ධයෙන් ඇතැම් ගුරුවරුන්ගේ ආකල්ප මෙන්ම ඔවුන් තුළ ඒ කෙරෙහි ඇති

ආකර්ෂණය දරුවන්ගේ අනාගතය ගොඩනැගීම කෙරෙහි විශේෂ බලපෑමක් ඇති කරයි. මේ හේතුව මත, මත්ද්‍රව්‍ය භාවිතයට ඇති අවදානම අවම කරමින් දරුවන් සමඟ සාර්ථකව කටයුතු කරන්නේ කෙසේද යන්න පිළිබඳ ගුරුවරුන්ගේ කුසලතා සහ ආකල්ප ප්‍රවර්ධනය කිරීම සඳහා මෙම නව හඳුන්වාදීම 2021 වසරේදී පාසල් මත්ද්‍රව්‍ය නිවාරණ උපාය මාර්ග වෙත එක් කරන ලදි.

11.1.1.5 ගුරුවරුන් සඳහා අධ්‍යාපනික වැඩසටහන් පැවැත්වීම					
	2018	2019	2020	2021	2022
ඇස්තමේන්තුගත වැඩසටහන් ප්‍රමාණය	-	-	-	30	30
සම්පූර්ණ කරන ලද වැඩසටහන් ගණන	-	-	-	19	18
සම්පූර්ණ කරන ලද වැඩසටහන් ගණන ඇස්තමේන්තු ගත සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස	-	-	-	63.33%	60%
ඇස්තමේන්තුගත ගුරුවරුන් සංඛ්‍යාව	-	-	-	1,000	1,000
සහභාගී වූ ගුරුවරුන් සංඛ්‍යාව	-	-	-	793	1,136
සහභාගී වූ ගුරුවරුන් සංඛ්‍යාව ඇස්තමේන්තු ගත සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස	-	-	-	79.3%	113.6%

(11.1.1.5 වගුව)

11.1.1.6 දහම් පාසල් සිසුන් දැනුවත් කිරීම

මතින් නිදහස් සදාචාරවත් දරු පරපුරක් සහ තරුණ පරපුරක් බිහිකිරීමේ අරමුණ පෙරදැරිව නිවාරණ අධ්‍යාපන හා පුහුණු අංශය මඟින් 2022 වසරේදී දහම් පාසල් සිසුන් දැනුවත් කිරීම සඳහා විශ්වීය නිවාරණ වැඩසටහන් 40ක් පවත්වා ඇති අතර ඊට සහභාගී වූ සිසුන් සංඛ්‍යාව 4,234කි.


11.1.6 දහම් පාසල් සිසුන් දැනුවත් කිරීම 2018-2022					
	2018	2019	2020	2021	2022
ඇස්තමේන්තුගත වැඩසටහන් ප්‍රමාණය	30	30	-	100	100
සම්පූර්ණ කරන ලද වැඩසටහන් ගණන	56	45	-	58	40
සම්පූර්ණ කරන ලද වැඩසටහන් ගණන ඇස්තමේන්තුගත සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස	186.66%	150%	-	58%	40%
ඇස්තමේන්තුගත ශිෂ්‍ය සංඛ්‍යාව	6,000	6,000	-	10,000	20,000
සහභාගී වූ ශිෂ්‍ය සංඛ්‍යාව	7,050	7,050	-	1,955	4,234
සහභාගී වූ ශිෂ්‍ය සංඛ්‍යාව ඇස්තමේන්තුගත සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස	2018	2019	2020	2021	2022

(11.1.6 වගුව)


11.1.7 පසුගිය වසර 5ක කාලය තුළ (2018 - 2022) පාසල් පාදක මත්ද්‍රව්‍ය නිවාරණ හා පුහුණු වැඩසටහන් පැවැත්වූ ආකාරය විශ්ලේෂණාත්මකව

	වැඩසටහන	2018		2019		2020		2021		2022	
		වැඩසටහන් ගණන	සහභාගී සංඛ්‍යාව	වැඩසටහන් ගණන	සහභාගී සංඛ්‍යාව	වැඩසටහන් ගණන	සහභාගී සංඛ්‍යාව	වැඩසටහන් ගණන	සහභාගී සංඛ්‍යාව	වැඩසටහන් ගණන	සහභාගී සංඛ්‍යාව
1	සිසුන් දැනුවත් කිරීම්	670	121,536	390	79,863	79	15,665	239	39,837	763	129,848
2	ගුරු පුහුණුව	31	2,776	07	772	06	268	06	390	18	969
3	ගුරු අධ්‍යාපන වැඩසටහන්	-	-	-	-	-	-	19	793	18	1,136
4	දෙමාපිය දැනුවත් කිරීම	204	24,919	121	14,652	02	94		3,187	104	14,448
5	දහම් පාසල්	56	7,050	45	7,691	-	-	58	1,955	40	4,234
6	ජාත්‍යන්තර පාසල්	13	1,671	09	1,443	-	-	03	183	12	2,166

(11.1.7 වගුව)



(11.1.1 ප්‍රස්ථාරය)



(11.1.2 ප්‍රස්ථාරය)

11.1.2 තරුණ ප්‍රජා පාදක මත්ද්‍රව්‍ය නිවාරණ අධ්‍යාපන හා පුහුණු වැඩසටහන්

11.1.2.1 තරුණ ප්‍රජාව දැනුවත් කිරීම

මත්ද්‍රව්‍ය නිවාරණයේ පදනම වන්නේ තරුණ තරුණියන් මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වීම වැලැක්වීම, ඔවුන්ගේ පළමු භාවිතය හැකිතාක් කල් දැමීම සහ දැනටමත් මත්ද්‍රව්‍ය භාවිතය ආරම්භ කර ඇත්නම් ඔවුන් මත්ද්‍රව්‍ය දුර්භාවිතය නිසා ඇතිවන අක්‍රමතා වෙත යොමුවීම වැලැක්වීමයි. මත්ද්‍රව්‍ය කෙරෙහි ඇති මිත්‍යා විශ්වාසයන්ගෙන් ඔවුන් මුදවාලීම සඳහා තරුණයින් සම්බන්ධ වී සිටින ආයතනවල මත්ද්‍රව්‍ය ප්‍රතිපත්ති ශක්තිමත් කිරීම අත්‍යාවශ්‍ය බව ගෝලීය පර්යේෂණ තහවුරු කරයි. නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය අදාල ආයතන වල පරිපාලනය හා එකව දැනටමත් එම ප්‍රතිපත්ති භාවිතා කරමින් කෙටි මැදිහත්වීම් සහ ප්‍රතිකාර සඳහා යොමු කිරීම් සිදුකිරීම ආරම්භ කර ඇත. පසුගිය වසර පුරාවටම අප නිලධාරීන් විසින් තරුණයින්ගේ සමාජීය සහ පුද්ගල කුසලතා වර්ධනය කරමින් ඔවුන් මත්ද්‍රව්‍යට යොමුවීම වැළැක්වීම සඳහා වැඩසටහන් රාශියක් සැලසුම් කර ක්‍රියාත්මක කර ඇති අතර එහි ධනාත්මක ප්‍රතිඵල ව්‍යාප්ත වෙමින් පවතියි.

11.1.2.1 තරුණ ප්‍රජාව දැනුවත් කිරීම 2018-2022					
	2018	2019	2020	2021	2022
ඇස්තමේන්තුගත වැඩසටහන් ප්‍රමාණය	150	150	150	150	150
සම්පූර්ණ කරන ලද වැඩසටහන් ගණන	141	135	71	170	173
සම්පූර්ණ කරන ලද වැඩසටහන් ගණන ඇස්තමේන්තුගත සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස	94%	90%	47.33%	113.3%	115.33%
ඇස්තමේන්තුගත සංඛ්‍යාව	22,000	22,000	22,000	22,000	12,000
සහභාගී වූ සංඛ්‍යාව	12, 229	14, 652	8,396	7, 991	10, 301
සහභාගී වූ සංඛ්‍යාව ඇස්තමේන්තුගත සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස	55.58%	66.66%	38.16%	36.3%	85.84%

(11.1.2.1 වගුව)

11.1.2.2 විශ්වවිද්‍යාල සිසුන් දැනුවත් කිරීම

විශ්වවිද්‍යාල සහ අනෙකුත් තෘතීක අධ්‍යාපන ආයතන නියෝජනය කරන සිසුන් යනු පසු යොවුන් වියට හෝ වැඩිහිටි වියට පා තබන තරුණ පිරිසයි. ඔවුන්ගේ සංවර්ධන අවධීන් සැලකිල්ලට ගත් විට, ඔවුන් තවදුරටත් ජීව විද්‍යාත්මක වශයෙන් ඖෂධ අත්හදා බැලීමේ දැඩි අවදානමක් නොපෙන්වයි. වර්තමාන පර්යේෂණ සහ වාර්තා උපුටා දක්වන්නේ ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල සිසුන් විනාශකාරී මෙන්ම ආවේග පාලනයේ සැලකිය යුතු දුර්වලතා ද පෙන්නුම් කරනු ලබන බවයි. ඔවුන් සමාජය තුළ දැනුම විසංයෝජනය කිරීමේ ගාමක බලවේගයක් වන අතර පසු පරම්පරාවේ තරුණ තරුණියන් ද ඔවුන් අනුකරණය කිරීමට වැඩි ඉඩකඩක් පවති. වර්තමානයේ, ගංජා භාවිතය සම්බන්ධයෙන් ද සමාජය තුළ ප්‍රබලතම ආකල්පමය වෙනසක් සිදු කරනු ලබන්නේ විශ්වවිද්‍යාල ශිෂ්‍යයින් විසිනි. මෙම ව්‍යාජ මත ඇසුරෙන් ගොඩනැගුණු අදහස් වෙනස් කිරීම අරමුණු කර ගනිමින් විශ්වවිද්‍යාල සිසුන් 1,552ක් දැනුවත් කිරීමට නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය 2022 වර්ෂයේදී කටයුතු කර ඇත.

11.1.2.2 විශ්වවිද්‍යාල සිසුන් දැනුවත් කිරීම 2018-2022

	2018	2019	2020	2021	2022
ඇස්තමේන්තුගත වැඩසටහන් ප්‍රමාණය	10	10	20	20	20
සම්පූර්ණ කරන ලද වැඩසටහන් ගණන	14	20	1	14	7
සම්පූර්ණ කරන ලද වැඩසටහන් ගණන ඇස්තමේන්තුගත සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස	130%	200%	5%	70%	35%
ඇස්තමේන්තුගත සංඛ්‍යාව	2,000	3,000	4,000	4,000	12,000
සහභාගී වූ සංඛ්‍යාව	1,671	3,209	57	952	1,552
සහභාගී වූ සංඛ්‍යාව ඇස්තමේන්තුගත සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස	83.55%	106.96%	1.43%	23.8%	12.93%

(11.1.2.2 වගුව)

11.1.2.3 තරුණ ප්‍රජාව පුහුණු කිරීමේ වැඩසටහන්

තරුණ ප්‍රජාවට තම සම වයසේ මිතුරන් හට වඩාත් සමීපව ආමන්ත්‍රණය කිරීමේ හැකියාව ඇති බැවින් මත්ද්‍රව්‍ය නිවාරණ අභ්‍යාසලාභීන් ලෙස ඔවුන් පුහුණු කිරීමේ අරමුණින් 2022 වර්ෂයේදී නිවාරණ අධ්‍යාපන හා පුහුණු අංශය තරුණ ප්‍රජා පුහුණු වැඩසටහන් 18ක් පවත්වන ලද අතර එය 2021 වසරට සාපේක්ෂව 36.7%ක වර්ධනයකි. සම්බන්ධ වූ මුළු සංඛ්‍යාව 1,283 කි.

11.1.2.3 තරුණ ප්‍රජාව පුහුණු කිරීමේ වැඩසටහන් 2018-2022

	2018	2019	2020	2021	2022
ඇස්තමේන්තුගත වැඩසටහන් ප්‍රමාණය	30	30	30	30	30
සම්පූර්ණ කරන ලද වැඩසටහන් ගණන	22	20	11	7	18
සම්පූර්ණ කරන ලද වැඩසටහන් ගණන ඇස්තමේන්තුගත සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස	73.33%	66.66%	36.6%	23.3%	60%


ඇස්තමේන්තුගත සංඛ්‍යාව	1,000	1,000	1,000	1,000	4,000
සහභාගී වූ සංඛ්‍යාව	1,252	995	475	298	1,283
සහභාගී වූ සංඛ්‍යාව ඇස්තමේන්තුගත සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස	125.2%	99.5%	47.5%	29.8%	32.08

(11.1.2.3 වගුව)


11.1.2 පසුගිය වසර 5ක කාලය තුළ (2018 - 2022) තරුණ ප්‍රජා පාදක මත්ද්‍රව්‍ය නිවාරණ අධ්‍යාපන හා පුහුණු වැඩසටහන් පැවැත්වූ ආකාරය විශ්ලේෂණාත්මකව

		2018		2019		2020		2021		2022	
	වැඩසටහන	වැඩසටහන් ගණන	සහභාගී සංඛ්‍යාව	වැඩසටහන් ගණන	සහභාගී සංඛ්‍යාව	වැඩසටහන් ගණන	සහභාගී සංඛ්‍යාව	වැඩසටහන් ගණන	සහභාගී සංඛ්‍යාව	වැඩසටහන් ගණන	සහභාගී සංඛ්‍යාව
1	දැනුවත් කිරීම්	141	12,229	135	13,373	71	8,396	170	7,991	173	10,301
2	විශ්වවිද්‍යාල සිසුන්	14	3,498	20	3,209	-	-	14	952	07	1,552
3	පුහුණු වැඩසටහන්	22	1,252	20	995	11	475	07	298	18	1,283

(11.1.2.4 වගුව)



(11.1.2.1 ප්‍රස්ථාරය)



(11.1.2.2 ප්‍රස්ථාරය)

11.1.3 පවුල් පාදක මත්ද්‍රව්‍ය නිවාරණ අධ්‍යාපන හා පුහුණු වැඩසටහන්

අප මීට පෙරද පෙන්වා දී ඇති පරිදි දරුවෙකුගේ මූලික සමාජ ඒකකය පවුලයි. දරුවන් හදා වඩා ගැනීමේදී දරුවන් රැක බලා ගන්නා දෙමාපියන්, භාරකරුවන් සහ ඔවුන්ගේ ආකල්ප දරුවන් තුළ මත්ද්‍රව්‍ය හා වෙනත් අයහපත් හැසිරීම් ඇති කිරීමට දැඩි පිටුවහලක් ඇති කරයි.

රැකබලාගන්නන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයට ඇති කැමැත්ත, මත්ද්‍රව්‍ය භාවිතය දිරිමත් කිරීම සහ කුඩා අවධියේදීම දරුවන් මත්ද්‍රව්‍ය භාවිතයට හුරුවීම, පසුකාලීන තරුණයන් තුළ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීමේ අවදානම වැඩි කරයි. නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය මේ සම්බන්ධයෙන් අවධානය යොමුකරමින්, පවුල් පාදක කරගත් නිවාරණ අධ්‍යාපන වැඩසටහන් මෙන්ම දෙමාපිය කුසලතා සංවර්ධන වැඩසටහන්ද ක්‍රියාත්මක කිරීම තුළින් දරුවන්ගේ පසුකාලීන සංවර්ධනය සෞඛ්‍යසම්පන්න සහ ආරක්ෂිත ආකාරයකින් සිදු කිරීමට අවශ්‍ය පරිසරය නිර්මාණය කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කරයි.

මෙම වැඩසටහන් පවුල් පාදක මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් මෙන්ම දෙමාපිය කුසලතා සංවර්ධන වැඩසටහන් ලෙස කාණ්ඩ දෙකක් යටතේ ක්‍රියාත්මක වේ. 2021 වසරට සාපේක්ෂව 29%ක වර්ධනයක් පෙන්නුම් කරන 2022 වසර පුරා දෙමාපිය වැලැක්වීමේ වැඩසටහන් 100ක් පවත්වා ඇති අතර, දැනුවත් වී ඇති සංඛ්‍යාව 6,458කි.

11.1.3.1 පවුල් පාදක කරගත් නිවාරණ වැඩසටහන්

11.1.3.1 පවුල් පාදක කරගත් නිවාරණ අධ්‍යාපන වැඩසටහන් 2018-2022

	2018	2019	2020	2021	2022
ඇස්තමේන්තුගත වැඩසටහන් ප්‍රමාණය	200	200	200	200	200
සම්පූර්ණ කරන ලද වැඩසටහන් ගණන	204	121	27	42	100
සම්පූර්ණ කරන ලද වැඩසටහන් ගණන ඇස්තමේන්තුගත සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස	102%	60.5%	13.5%	21%	50%
ඇස්තමේන්තුගත සංඛ්‍යාව	22,000	22,000	22,000	22,000	22,000
සහභාගී වූ සංඛ්‍යාව	12,219	14,652	2,591	1,725	6,458
සහභාගී වූ සංඛ්‍යාව ඇස්තමේන්තුගත සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස	55.58%	66.66%	11.77%	7.8%	29.35%

(11.1.3.1 වගුව)

11.1.3.2 පවුල් පාදක කරගත් කුසලතා සංවර්ධන වැඩසටහන්

11.1.3.2 පවුල් පාදක කරගත් කුසලතා සංවර්ධන වැඩසටහන් 2018-2022

	2018	2019	2020	2021	2022
ඇස්තමේන්තුගත වැඩසටහන් ප්‍රමාණය	-	-	-	25	25
සම්පූර්ණ කරන ලද වැඩසටහන් ගණන	-	-	-	02	02
සම්පූර්ණ කරන ලද වැඩසටහන් ගණන ඇස්තමේන්තුගත	-	-	-	8%	8%

සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස					
ඇස්තමේන්තුගත සංඛ්‍යාව	-	-	-	1,000	1,000
සහභාගී වූ සංඛ්‍යාව	-	-	-	145	44
සහභාගී වූ සංඛ්‍යාව ඇස්තමේන්තුගත සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස	-	-	-	14.5%	4.4%

(11.1.3.2 වගුව)

11.1.3.3 පවුල් පාදක කරගත් උපදේශන වැඩසටහන්

කුසලතා මත පදනම් වූ පවුල් පාදක නිවාරණ හෝ දැනුවත්කිරීමේ වැඩසටහන්වල ප්‍රතිඵලයක් වශයෙන්, ඇතැම් පවුල්වල දීර්ඝ කාලීනව පවතින මත්ද්‍රව්‍ය ගැටලු අපගේ නිලධාරීන් වෙත යොමු කෙරෙනු ලැබෙයි. මෙබඳු ගැටලු බොහෝ විට රැගෙන එන්නේ කාන්තාවන් විසිනි. නිවාරණයේ තවත් දිගුවක් ලෙස අවශ්‍යතා මත කෙටි මැදිහත්වීම සහ යොමු කිරීම් ලබා දීමට නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශයේ නිලධාරීන් මැදිහත් වෙයි. ප්‍රතිඵල දිගුකාලීන වන අතර පවතින ප්‍රතිකාර ක්‍රම වෙත ප්‍රවේශ වීමට නොහැකි වූ හෝ දැනුවත්වීම් නොමැති පුද්ගලයින් හට ඒ වෙත යොමු වීමේ අවස්ථාව සලසාදීම අප අරමුණයි.

11.1.3.3 පවුල් පාදක කරගත් උපදේශන වැඩසටහන් 2018-2022

	2018	2019	2020	2021	2022
ඇස්තමේන්තුගත වැඩසටහන් ප්‍රමාණය	100	100	100	100	100
සම්පූර්ණ කරන ලද වැඩසටහන් ගණන	91	86	79	138	190
සම්පූර්ණ කරන ලද වැඩසටහන් ගණන ඇස්තමේන්තුගත සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස	91%	86%	79%	138%	190%
ඇස්තමේන්තුගත සංඛ්‍යාව	500	500	1,000	1,000	1,000
සහභාගී වූ සංඛ්‍යාව	2,507	1,001	359	187	553
සහභාගී වූ සංඛ්‍යාව ඇස්තමේන්තුගත සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස	513.4%	200.2%	35.9%	18.7%	55.3%


(11.1.3.3 වගුව)

11.1.3.4 පසුගිය වසර 5ක කාලය තුළ (2018 - 2022) පවුල් පාදක මත්ද්‍රව්‍ය නිවාරණ අධ්‍යාපන හා පුහුණු වැඩසටහන පැවැත්වූ ආකාරය විශ්ලේෂණාත්මකව


		2018		2019		2020		2021		2022	
	වැඩසටහන	වැඩසටහන් ගණන	සහභාගී සංඛ්‍යාව	වැඩසටහන් ගණන	සහභාගී සංඛ්‍යාව	වැඩසටහන් ගණන	සහභාගී සංඛ්‍යාව	වැඩසටහන් ගණන	සහභාගී සංඛ්‍යාව	වැඩසටහන් ගණන	සහභාගී සංඛ්‍යාව
1	නිවාරණ වැඩසටහන්	-	-	-	-	27	475	42	1,725	100	6,458
2	කුසලතා සංවර්ධන වැඩසටහන්	-	-	-	-	-	-	02	145	02	44

3	උපදේශන වැඩසටහන්	91	2,507	86	1,001	79	359	138	187	190	553

(11.1.3.4 වගුව)



(11.1.3.1 ප්‍රස්ථාරය)



(11.1.3.2 ප්‍රස්ථාරය)

11.1.4 විශාල වැඩබිම් පාදක මත්ද්‍රව්‍ය නිවාරණ අධ්‍යාපන හා පුහුණු වැඩසටහන්

පුද්ගලයෙකුගේ සමාජානුයෝජන ක්‍රියාවලිය ශක්තිමත් කරන ක්ෂුද්‍ර පරිසරයේ තවත් ප්‍රබල ආයතනයක් වන්නේ සේවා ස්ථානයයි. වැඩ පරිසරය මත්ද්‍රව්‍ය නිවාරණය වෙනුවෙන් කිහිපාකාරයකින් ම බලපෑම් ඇති කරනු ලබයි. සේවා පරිසරය, සේවක සෞඛ්‍යය සහ ඔවුන්ගේ සුබසාධනය ක්‍රියාවට නංවන මත්ද්‍රව්‍ය නිවාරණ ප්‍රතිපත්ති සේවකයින්ගේ පමණක් නොව, ඔවුන්ගේ පවුලේ සාමාජිකයින්ගේ, ප්‍රජාවගේ සෞඛ්‍යයට මෙන්ම සමාජයේ යහපත් පැවැත්මට ද හේතුවකි. පසුගිය වසර පුරාම නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය විසින් සේවා ස්ථාන සමඟ එක්ව, ප්‍රතිපත්ති නිර්මාණය කිරීම, මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් සේවකයින්ගේ ආකල්ප වෙනස් කිරීම සහ ප්‍රතිකාර සඳහා සහාය අවශ්‍ය පුද්ගලයින් ඒ සඳහා යොමු කිරීම වැනි බොහෝ කාර්යයන් සිදු කරන ලදී. මෙම වැඩසටහන් එම ආයතන වල සාර්ථකත්වයට බලපෑම් ඇතිකරවන්නට සමත් විය. මීට සමගාමීව නිදහස් වෙළඳ කලාපය තුළ ද බොහෝ ක්‍රියාකාරකම් දියත් කරන ලදි. මේ නිසා නිවාරක අධ්‍යාපන

හා පුහුණු අංශයේ නිලධාරීන් රටේ ආර්ථිකයට වක්‍රව දායක වී ඇත. තවද මෙම වැඩසටහන් 2023 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පසුබිම ද මේ වන විට සකස් කර ඇත.

11.1.4.1 නීතිය බලාත්මක කිරීමේ ආයතන දැනුවත් කිරීම

රට තුළ මත්ද්‍රව්‍ය සැපයුම අවම කිරීමට නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් විශාල වැඩ කොටසක් ඉටුකරයි. නමුත් ඇතැම් නිලධාරීන් මත්ද්‍රව්‍යවලට යොමුවන බවත් යොමුවූවන්ගේ ඒ සඳහා ඇති කායික අවශ්‍යතාවය බලවත් බවත් මෑතකාලීන වාර්තා සනාථ කරයි. අප සතු තවත් නිවාරණ කාර්යයක් වන්නේ රටක නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් සෞඛ්‍ය සම්පන්න පිරිසක් බවට පත් කිරීමයි. මෙය දිගුකාලීන ප්‍රතිඵල ලබාදෙන ආයෝජනයකි. නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් පවුල්වලින් හුදකලා වීම, නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් තුළ මත්ද්‍රව්‍ය හා මද්‍යසාර භාවිත ආකල්පයක් ලෙස සාමාන්‍යකරණය වී තිබීම දරුණු ප්‍රතිවිපාක ගෙන දී ඇත. 2022 වසර තුළ සෙබළුන් 4896ක් සඳහා නිවාරණ වැඩසටහන් 32ක් පවතිවමින් ඔවුන් මත්ද්‍රව්‍ය භාවිතයෙන් ඈත් කිරීමට උත්සාහ දරා ඇත.

11.1.4.1 නීතිය බලාත්මක කිරීමේ ආයතන දැනුවත් කිරීම 2018-2022

	2018	2019	2020	2021	2022
ඇස්තමේන්තුගත වැඩසටහන් ප්‍රමාණය	55	55	55	55	55
සම්පූර්ණ කරන ලද වැඩසටහන් ගණන	44	57	16	32	32
සම්පූර්ණ කරන ලද වැඩසටහන් ගණන ඇස්තමේන්තුගත සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස	80%	103.63%	29.09%	58.2%	58.2%
ඇස්තමේන්තුගත සංඛ්‍යාව	11,000	11,000	11,000	11,000	12,000
සහභාගී වූ සංඛ්‍යාව	9,204	8,672	2,504	3,797	4,896
සහභාගී වූ සංඛ්‍යාව ඇස්තමේන්තුගත සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස	83.67%	78.83%	22.76%	34.5%	40.8%

(11.1.4.1 වගුව)

11.1.4.2 රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම

ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවයේ මිලියන 1.5ට අධික සේවක පිරිසක් සිටියි. මේ හැර සමාජ සුබසාධනය සඳහා ද නිලධාරීන් ගණනාවක් අනුයුක්ත කර ඇත. නමුත් මද්‍යසාර සහ මත්ද්‍රව්‍ය භාවිතය ඒ කෙරෙහි ඇති ධනාත්මක ආකල්ප ඔවුන්ගේ පවුල්වල සුබසාධනය බෙහෙවින් අඩපණ කර ඇත. මත්ද්‍රව්‍යවලින් නිදහස් රාජ්‍ය සේවකයෙකු බිහි කිරීමටත් ඔවුන්ගේ ආකල්ප වල වෙනසක් ඇතිකිරීම සඳහාත් ඔවුන්ව දැනුවත් කරමින් මතින් නිදහස් රාජ්‍ය සේවයක් ඇති කිරීමටත් ඔවුන් සමාජීය ආකෘතියක් බවට පත්කිරීමටත් නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය පසුගිය වසර පුරාම කටයුතු කළේ ය.

11.1.4.2 රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම 2018-2022					
	2018	2019	2020	2021	2022
ඇස්තමේන්තුගත වැඩසටහන් ප්‍රමාණය	150	150	150	150	150
සම්පූර්ණ කරන ලද වැඩසටහන් ගණන	85	147	74	149	45
සම්පූර්ණ කරන ලද වැඩසටහන් ගණන ඇස්තමේන්තුගත සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස	56.66%	98%	49.33%	99.33%	30%
ඇස්තමේන්තුගත සංඛ්‍යාව	12,000	12,000	12,000	12,000	8,000
සහභාගී වූ සංඛ්‍යාව	6,582	11,260	4,260	8,736	3,979
සහභාගී වූ සංඛ්‍යාව ඇස්තමේන්තුගත සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස	54.85%	93.83%	35.5%	72.8%	49.74%

(11.1.4.2 වගුව)

11.1.4.3 රාජ්‍ය නිලධාරීන් පුහුණු කිරීම

ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය අර්බුදයේ ස්වභාවය දෙස බලන කල එය කිසිදු ආයතනයකට තනිව කළමනාකරණය කළ හැක්කක් නොවේ. පාසල් දරුවන් පුහුණු කිරීමට හා අධ්‍යාපනය ලබා දීමට ගුරුවරුන් පුහුණු කළ පරිද්දෙන් ම රාජ්‍ය සේවකයන් පුහුණුවට ලක්කර ඔවුන් ජාලගත කිරීම ඔස්සේ මත්ද්‍රව්‍ය නිවාරණ කටයුතු වල යෙදවීම 2021 වර්ෂයේ සිට ආරම්භ කරන ලදි. මේ අනුව මෙකී වැලැක්වීමේ පියවරයන් අප අපේක්ෂා කළ තත්ත්වයටත් වඩා සමාජගත වන අතරම සමාජ ඉල්ලුම ඇඩු කරලීමට සෘජුවම දායක වී ඇත. තවද මත්ද්‍රව්‍ය ව්‍යාප්තිය පිළිබඳව ජනතාවගේ දැනුම ප්‍රවර්ධනය වීමත් සමඟින් කර්මාන්තය අනුගමනය කරන උපායමාර්ග පිළිබඳ වූ දැනුවත් බව ඉහළ යෑම සැපයුම් සංකෝචනයවීමට හේතු වී ඇත. මේ අනුව මෙම වසර තුළ පවත්වන ලද වැඩසටහන්වල භෞතික ප්‍රගතිය 48කි. එමගින් රාජ්‍ය නිලධාරීන් 1,598 දෙනකු පුහුණුකරුවන් ලෙස සංවර්ධනය කර සමාජයට දායාද කිරීමට නිවාරක අධ්‍යාපන හා පුහුණු කිරීමේ නිලධාරීන් සමත්වී ඇත.

11.1.4.3 රාජ්‍ය නිලධාරීන් පුහුණු කිරීම 2018-2022

	2018	2019	2020	2021	2022
ඇස්තමේන්තුගත වැඩසටහන් ප්‍රමාණය	-	-	-	50	50
සම්පූර්ණ කරන ලද වැඩසටහන් ගණන	-	-	-	51	44
සම්පූර්ණ කරන ලද වැඩසටහන් ගණන ඇස්තමේන්තු ගත සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස	-	-	-	102%	88%
ඇස්තමේන්තුගත සංඛ්‍යාව	-	-	-	3,000	3,000
සහභාගී වූ සංඛ්‍යාව	-	-	-	2,474	1,598
සහභාගී වූ සංඛ්‍යාව ඇස්තමේන්තු ගත සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස	-	-	-	82.5%	53.27%

(*11.1.4.3 වගුව*)

11.1.4.4 විශාල වැඩබිම් ආශ්‍රිත නිවාරණ වැඩසටහන්

වාර්තාවලින් පෙන්වා දෙන ආකාරයට මත්ද්‍රව්‍ය ගැටලුවේ තවත් කේන්ද්‍රස්ථානයක් ලෙස ආයෝජන ප්‍රවර්ධන කලාපය හඳුන්වා දිය හැකි ය. මත්ද්‍රව්‍ය හේතුවෙන් නිෂ්පාදනය කෙරෙහි බලපෑම් ඇති කරන ප්‍රබලතම සාධකය වන්නේ පුහුණු ශ්‍රමිකයන් ආයතනයෙන් ඉවත් කිරීමට සිදුවීමයි. රටේ ඩොලර් හිඟය කෙරෙහි ද සෘජු බලපෑම් ඇති කරවන්නක් ලෙසට ද එය හඳුන්වා දිය හැකි ය. සෞඛ්‍යය, පවුල් අර්බුද සහ මූල්‍ය ගැටළු හේතුවෙන් සේවකයින් මත්ද්‍රව්‍ය වලට යොමු වීමද තවත් සමජ ගැටලුවකි. මෙම පිරිස ඉලක්ක කරමින් ප්‍රතිපත්ති සම්පාදනයේ සිට ප්‍රතිකාර කෙරෙහි යොමු කිරීම දක්වා නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශයේ නිලධාරීන් වසර පුරාවටම වැඩසටහන් ක්‍රියාත්මක කරමින් සිටී යි. මෙම වැඩසටහන් වල මූල්‍ය පිරිවැය අදාල ආයතන වලින්ම සපයන අතර පසුගිය වසර තුළ දැනුවත් කළ නිදහස් වෙළඳ කලාපයේ සේවකයින් සංඛ්‍යාව 15,095 කි. එය 2022 වසර තුළ අපේක්ෂිත ඉලක්කය හා සැසඳීමේ දී 188.69%ක වැඩි ප්‍රතිශතයකි.

11.1.4.4 විශාල වැඩබිම් ආශ්‍රිත නිවාරණ වැඩසටහන් 2018-2022					
	2018	2019	2020	2021	2022
ඇස්තමේන්තුගත වැඩසටහන් ප්‍රමාණය	40	40	40	40	40
සම්පූර්ණ කරන ලද වැඩසටහන් ගණන	77	95	18	21	59
සම්පූර්ණ කරන ලද වැඩසටහන් ගණන ඇස්තමේන්තුගත සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස	192.2%	237.5%	45%	52.5%	147.5%
ඇස්තමේන්තුගත සංඛ්‍යාව	1,000	1,000	6,000	6,000	8,000
සහභාගී වූ සංඛ්‍යාව	7,593	20,173	7,630	5,674	15,095
සහභාගී වූ සංඛ්‍යාව ඇස්තමේන්තුගත සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස	759.3%	2017.3%	127.16%	94.6%	188.69%

(11.1.4.4 වගුව)

11.1.4.5 සෞඛ්‍ය අංශය ආශ්‍රිත දැනුවත් කිරීමේ වැඩසටහන්

මත්ද්‍රව්‍ය ගැටලුව සෞඛ්‍ය ක්ෂේත්‍රයට සෘජුවම සම්බන්ධ වන අතර වර්තමානයේ එය වසංගත රෝග විද්‍යාවට ඇතුළත් වේ. සෞඛ්‍ය නිලධාරීන් නිවාරණ නියෝජිතයන් ලෙස යොදා ගනිමින් මෙම පණිවිඩය සමාජගතකිරීම ඉතා පහසුය. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල හරහා ගර්භනී කාන්තාවන් සහ මහජන සෞඛ්‍ය පරීක්ෂක හරහා අනෙකුත් සමාජ අංශ පහසුවෙන් දැනුවත් කිරීමේ හැකියාව ඇත. එසේම සෞඛ්‍ය ක්ෂේත්‍රයේ තවත් ගැටලුවක් ලෙස ඖෂධ අනිසි භාවිතය ද වාර්තා වේ. ගුණාත්මක වැඩසටහන් 45ක් හරහා සෞඛ්‍ය නිලධාරීන් 2,162 ක් දැනුවත් කිරීමට පසුගිය වසර තුළ නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශයේ නිලධාරීන් ට හැකි විය. එය අපේක්ෂිත ඉලක්කයෙන් 108.2% සම්පූර්ණ කිරීමකි.

11.1.4.5 සෞඛ්‍ය අංශය ආශ්‍රිත දැනුවත් කිරීමේ වැඩසටහන් 2018-2022					
	2018	2019	2020	2021	2022
ඇස්තමේන්තුගත වැඩසටහන් ප්‍රමාණය	20	20	20	20	20
සම්පූර්ණ කරන ලද වැඩසටහන් ගණන	21	26	13	5	45
සම්පූර්ණ කරන ලද වැඩසටහන් ගණන ඇස්තමේන්තු ගත සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස	105%	130%	65%	25%	225%
ඇස්තමේන්තුගත සංඛ්‍යාව	2,000	2,000	2,000	2,000	2,000
සහභාගී වූ සංඛ්‍යාව	1,242	1,780	618	182	2,164
සහභාගී වූ සංඛ්‍යාව ඇස්තමේන්තු ගත සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස	62.1%	89%	30.9%	9.1%	108.2%

(11.1.4.5 වගුව)

11.1.4.6 වතු ආශ්‍රිත ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන්

වතු ප්‍රජාව සමාජය තුළ ආන්තීකරණයට ලක් වූ පිරිසක් ලෙස හඳුනාගත හැකි ය. එම සමාජය තුළ ජීවත්වෙන ආර්ථික වශයෙන් පසුගාමී ජීවිත තව තවත් ගැටලු සහගත දුක්ඛිත තත්ත්වයට පත් කරවන උත්ප්‍රේරකයක් වන්නේ මත්ද්‍රව්‍යයි. මෙම තත්ත්වය මනා ලෙස අවබෝධ කර ගනිමින් නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශයේ නිලධාරීන් වතු ආශ්‍රිත ජනතාවගේ සෞඛ්‍ය හා සුභසාධනය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් ඔවුන් වෙනුවෙන් වැඩසටහන් ක්‍රියාත්මක කරයි.


11.1.4.6 වතු ආශ්‍රිත ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් 2018-2022					
	2018	2019	2020	2021	2022
ඇස්තමේන්තුගත වැඩසටහන් ප්‍රමාණය	20	20	20	20	20
සම්පූර්ණ කරන ලද වැඩසටහන් ගණන	25	24	03	-	03
සම්පූර්ණ කරන ලද වැඩසටහන් ගණන ඇස්තමේන්තුගත සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස	125%	120%	15%	0%	15%
ඇස්තමේන්තුගත සංඛ්‍යාව	2,000	2,000	2,000	2,000	2,000
සහභාගී වූ සංඛ්‍යාව	1,492	1,148	140	-	152
සහභාගී වූ සංඛ්‍යාව ඇස්තමේන්තු ගත සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස	74.85%	72.4%	7%	0%	7.6

(11.1.4.6 වගුව)


11.1.4.7 පසුගිය වසර 5ක කාලය තුළ (2018 - 2022) විශාල වැඩබිම් පාදක මත්ද්‍රව්‍ය නිවාරණ අධ්‍යාපන හා පුහුණු වැඩසටහන් පැවැත්වූ ආකාරය විශ්ලේෂණාත්මකව

	වැඩසටහන	2018		2019		2020		2021		2022	
		වැඩසටහන් ගණන	සහභාගී සංඛ්‍යාව	වැඩසටහන් ගණන	සහභාගී සංඛ්‍යාව	වැඩසටහන් ගණන	සහභාගී සංඛ්‍යාව	වැඩසටහන් ගණන	සහභාගී සංඛ්‍යාව	වැඩසටහන් ගණන	සහභාගී සංඛ්‍යාව
1	නීතිය බලගැන්වීමේ ආයතන	44	9,204	57	8,672	16	2,504	32	3,797	32	4,896
2	නිලධාරීන් දැනුවත් කිරීම	85	6,582	147	11,260	74	4,260	149	8,736	45	3,979
3	නිලධාරීන් පුහුණු	-	-	-	-	-	-	51	2,474	44	1,598
4	විශාල වැඩබිම්	77	7,593	95	20,173	18	7,630	21	5,674	59	15,095
5	සෞඛ්‍ය අංශය	21	1,242	26	1,780	13	618	05	182	45	2,164
6	වතු ප්‍රජාව	25	1,492	24	1,448	03	140	-	-	03	152

(11.1.4.7 වගුව)



(11.1.4.1 ප්‍රස්ථාරය)



(11.1.4.2 ප්‍රස්ථාරය)

11.1.5 මාධ්‍ය පාදක මත්ද්‍රව්‍ය දුර්භාවිත නිවාරණය

මාධ්‍ය යනු අද සමාජයේ මහජන මතය හඳුන්වාදීමේ ප්‍රබලතම මෙවලමයි. වසංගත තත්ත්වය හා ආර්ථික අර්බුදය හමුවේ මාධ්‍ය පාදක කර ගනිමින් සිදු කරන දැනුවත්කිරීම් වේගයෙන් ඉහළ ගියේ ය. පසුගිය වසර කිහිපය තුළ නිවාරක අධ්‍යාපන හා පුහුණු කිරීමේ අංශය හැකිතාක් ඉලෙක්ට්‍රොනික මුද්‍රිත හා සමාජ මාධ්‍ය භාවිතය වර්ධනය කිරීමට කටයුතු කර ඇත.

නිවාරක අධ්‍යාපන හා පුහුණු කිරීමේ අංශයේ සාමාජිකයින් මත්ද්‍රව්‍ය භාවිතය වැළැක්වීමේ කටයුතු සඳහා දේශීය රූපවාහිනී නාලිකා, ගුවන්විදුලි නාලිකා මෙන්ම පුවත්පත් ද භාවිතා කළහ. තවද, ***"Talk with Counselor"*** යූ ටියුබ් නාලිකාව සහ ***"මවන්"*** සහ ***"ඇබ්බැහිවීම"*** වැනි ෆේස්බුක් පිටු සක්‍රීය කිරීම ද සමාජ මාධ්‍ය තුළ සිදු කලහ. මේ සඳහා නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය හි මාධ්‍ය ඒකකයක් ස්ථාපිත කර මාධ්‍ය නිලධාරියෙකු ද පත් කරන ලදි. කිසිදු මූල්‍ය පිරිවැයකින් තොරව මෙම කාර්යයන් සම්බන්ධීකරණය කිරීම නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය ලද අද්විතීය වර්ධනයකි.

11.1.5.1 අධ්‍යාපනික ප්‍රදර්ශන හා මත්ද්‍රව්‍ය නිවාරණය වෙනුවෙන් ප්‍රජා සක්‍රීයකරණය

පසුගිය වසර දෙක තුළ, රට තුළ මහජන ප්‍රදර්ශනය සහ සමාජ බලගැන්වීමේ ක්‍රියාකාරකම් සීමිත වූ නමුත්, පහත වගුවෙන් පෙන්නුම් කරන්නේ නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය තම කාර්යභාරය ඉටු කිරීමට සමත් වී ඇති බවයි.

11.1.5.1 අධ්‍යාපනික ප්‍රදර්ශන					
	2018	2019	2020	2021	2022
ඇස්තමේන්තුගත වැඩසටහන් ප්‍රමාණය	20	20	20	20	20
සම්පූර්ණ කරන ලද වැඩසටහන් ගණන	16	17	06	-	10
සම්පූර්ණ කරන ලද වැඩසටහන් ගණන ඇස්තමේන්තුගත සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස	80%	85%	30%	-	50%
ඇස්තමේන්තුගත සංඛ්‍යාව	20,000	20,000	20,000	20,000	20,000
සහභාගී වූ සංඛ්‍යාව	32,240	38,552	11,460	-	9,896
සහභාගී වූ සංඛ්‍යාව ඇස්තමේන්තුගත සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස	161.2%	192.76%	57.3%	-	49.48%

(11.5.1 වගුව)

11.1.5.2 පුවත්පත් සහ මුද්‍රිත මාධ්‍ය ආශ්‍රිත මැදිහත්වීම

වර්තමානය තුළ පුවත්පත් දෙආකාරයකින් සමාජය තුළ සංසරණය වේ. එය සෘජු මුද්‍රිත පුවත්පතක් ලෙස මෙන්ම විද්‍යුත් මාධ්‍යයෙන් ද ප්‍රකාශයට පත් කෙරේ. 2022 වසර තුළ මෙම ආකාර දෙක හරහාම මත්ද්‍රව්‍ය නිවාරණය සඳහා ප්‍රකාශයට පත් කරන ලද ලිපි පාඨකයන් වෙත ළඟා වූ අතර එමගින් වැලැක්වීමේ පණිවිඩය නියමිත ඉලක්කය අභිබවා යාමට සමත් විය.

11.1.5.2 පුවත්පත් සහ මුද්‍රිත මාධ්‍ය ආශ්‍රිත මැදිහත්වීම 2018-2022					
	2018	2019	2020	2021	2022
ඇස්තමේන්තුගත වැඩසටහන් ප්‍රමාණය	-	-	-	160	12
සම්පූර්ණ කරන ලද වැඩසටහන් ගණන	-	-	-	44	18
සම්පූර්ණ කරන ලද වැඩසටහන් ගණන ඇස්තමේන්තුගත සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස	-	-	-	27.5%	150%
ඇස්තමේන්තුගත සංඛ්‍යාව	-	-	-	90,0000	50,000
සහභාගී වූ සංඛ්‍යාව	-	-	-	461,500	263,000
සහභාගී වූ සංඛ්‍යාව ඇස්තමේන්තුගත සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස	-	-	-	51.27%	526%

(11.1.5.2 වගුව)

11.1.5.3 ගුවන් විදුලිය ආශ්‍රිත මැදිහත්වීම

පසුගිය වසර දෙක තුළ ගුවන් විදුලි වැඩසටහන් හරහා නිවාරණය පිළිබඳව දැනුවත්කිරීම් සිදුකිරීම සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇත. වසංගත තත්ත්වය හේතුවෙන් විද්‍යුත් මාධ්‍ය කෙරෙහි වැඩි අවධානයක් යොමුවීම එයට හේතුව වශයෙන් සඳහන් කළ හැකි ය.

11.1.5.3 ගුවන් විදුලිය ආශ්‍රිත මැදිහත්වීම 2018-2022					
	2018	2019	2020	2021	2022
ඇස්තමේන්තුගත වැඩසටහන් ප්‍රමාණය	-	-	-	120	15
සම්පූර්ණ කරන ලද වැඩසටහන් ගණන	-	-	-	109	25
සම්පූර්ණ කරන ලද වැඩසටහන් ගණන ඇස්තමේන්තුගත සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස	-	-	-	90.8%	166.67%
ඇස්තමේන්තුගත සංඛ්‍යාව	-	-	-	1 20,0000	150,000
සහභාගී වූ සංඛ්‍යාව	-	-	-	948,660	189,500
සහභාගී වූ සංඛ්‍යාව ඇස්තමේන්තුගත සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස	-	-	-	82.1%	126.33%

(11.1.5.3 වගුව)

11.1.5.4 රූපවාහිනී මාධ්‍ය ආශ්‍රිත මැදිහත්වීම

මුල් කාලීනව රූපවාහිනී වැඩසටහන් පිළිබඳ ඇස්තමේන්තුගත අගයක් ඉදිරිපත් කිරීමට අවබෝධයක් නොතිබුණ ද, මේ වනවිට ඉතා ආකර්ෂණීය ලෙස වැඩසටහන් සැලසුම්කර ක්‍රියාත්මක කිරීමට නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය සමත් වී ඇත. නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශයේ මාධ්‍ය ඒකකය මෙහිදී සුවිශේෂී කාර්යභාරයක් ඉටුකරන අතර මෙම වැඩසටහන් රජයේ සහ පෞද්ගලික රූපවාහිනී ඔස්සේ නොමිලේ ව්‍යාප්ත කිරීමට කටයුතු කර ඇත.

11.1.5.4 රූපවාහිනී මාධ්‍ය ආශ්‍රිත මැදිහත්වීම 2018-2022					
	2018	2019	2020	2021	2022
ඇස්තමේන්තුගත වැඩසටහන් ප්‍රමාණය	-	-	-	150	25
සම්පූර්ණ කරන ලද වැඩසටහන් ගණන	-	-	-	117	98
සම්පූර්ණ කරන ලද වැඩසටහන් ගණන ඇස්තමේන්තුගත සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස	-	-	-	78%	392%
ඇස්තමේන්තුගත සංඛ්‍යාව	-	-	-	100,0000	250,000
සහභාගී වූ සංඛ්‍යාව	-	-	-	948,192	1162,000
සහභාගී වූ සංඛ්‍යාව ඇස්තමේන්තුගත සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස	-	-	-	94.8%	464.8%

(11.1.5.4 වගුව)

11.1.5.5 සමාජ මාධ්‍ය ආශ්‍රිත මැදිහත්වීම

නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය මඟින් පසුගිය වසර දෙකක කාලය තුළ මාධ්‍ය පරිශීලනය කරන්නා අවබෝධ කරගනිමින් සහ මත්ද්‍රව්‍ය නිවාරණය සඳහා සමාජ මාධ්‍ය ඵලදායී ලෙස යොදා ගනිමින් නිවාරණ පණිවිඩය ව්‍යාප්ත කිරීමට සමත් වී ඇත.

11.1.5.5 සමාජ මාධ්‍ය ආශ්‍රිත මැදිහත්වීම 2018-2022					
	2018	2019	2020	2021	2022
ඇස්තමේන්තුගත වැඩසටහන් ප්‍රමාණය	-	-	-	448	168
සම්පූර්ණ කරන ලද වැඩසටහන් ගණන	-	-	-	244	63
සම්පූර්ණ කරන ලද වැඩසටහන් ගණන ඇස්තමේන්තුගත සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස	-	-	-	54.46%	36.3%
ඇස්තමේන්තුගත සංඛ්‍යාව	-	-	-	6k	6k
සහභාගී වූ සංඛ්‍යාව	-	-	-	2.1k	65.4k
සහභාගී වූ සංඛ්‍යාව ඇස්තමේන්තුගත සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස	-	-	-	35%	10900%

(11.1.5.5 වගුව)

11.1.5.6 මාධ්‍ය නිෂ්පාදන කටයුතු

නිවාරණය සඳහා අවශ්‍ය ඉගණුම් ආධාරක නිර්මාණය කරගැනීම මත්ද්‍රව්‍ය අනිසි භාවිතය වැලැක්වීමේ දී අනිවාර්ය අංගයකි. පත්‍රිකා, අත් පත්‍රිකා, පෝස්ටර් සහ අනෙකුත් පුහුණු ද්‍රව්‍ය නිර්මාණය කිරීම විශාල ප්‍රේක්ෂකයින් සංඛ්‍යාවක් එකවර ඇමතීමේ හැකියාව ලඟාකරවයි. පහත වගුවේ දැක්වෙන්නේ පසුගිය වසර දෙක තුළ ඒ වෙනුවෙන් වූ මැදිහත්වීමයි.


11.1.5.6 මාධ්‍ය නිෂ්පාදන කටයුතු 2018-2022					
	2018	2019	2020	2021	2022
ඇස්තමේන්තුගත වැඩසටහන් ප්‍රමාණය	-	-	-	20	10
සම්පූර්ණ කරන ලද වැඩසටහන් ගණන	-	-	-	9	03
සම්පූර්ණ කරන ලද වැඩසටහන් ගණන ඇස්තමේන්තුගත සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස	-	-	-	45%	15%
ඇස්තමේන්තුගත සංඛ්‍යාව	-	-	-	10%	10%
සහභාගී වූ සංඛ්‍යාව	-	-	-	5%	14.4%
සහභාගී වූ සංඛ්‍යාව ඇස්තමේන්තුගත සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස	-	-	-	50%	144%

(11.1.5.6 වගුව)


11.1.5.7 පසුගිය වසර 5ක කාලය තුළ (2018 - 2022) මාධ්‍ය පාදක මත්ද්‍රව්‍ය නිවාරණ අධ්‍යාපන හා පුහුණු වැඩසටහන් ආකාරය විශ්ලේෂණාත්මකව

	වැඩසටහනේ	2018		2019		2020		2021		2022	
		වැඩසටහන් ගණන	සහභාගී සංඛ්‍යාව	වැඩසටහන් ගණන	සහභාගී සංඛ්‍යාව	වැඩසටහන් ගණන	සහභාගී සංඛ්‍යාව	වැඩසටහන් ගණන	සහභාගී සංඛ්‍යාව	වැඩසටහන් ගණන	සහභාගී සංඛ්‍යාව
1	අධ්‍යාපනික ප්‍රදර්ශන	16	32,240	17	20,000	06	11,460	-	-	10	9,896
2	පුවත්පත් සහ මුද්‍රිත මාධ්‍ය	-	-	-	-	-	-	44	461,500	18	263,000
3	ගුවන් විදුලිය	-	-	-	-	-	-	109	984,660	25	189,500
4	රූපවාහිනී මාධ්‍ය	-	-	-	-	-	-	117	948,192	98	1162,000
5	සමාජ මාධ්‍ය ආශ්‍රිත මැදිහත්වීම	-	-	-	-	-	-	244	2120	63	65,436
6	මාධ්‍ය නිෂ්පාදන කටයුතු	-	-	-	-	-	-	09	5012	03	14,400
7	නිලධාරී පුහුණුව	-	-	-	-	-	-	-	-	01	60

(11.1.5.7 වගුව)



(11.1.5.1 ප්‍රස්ථාරය)



(11.1.5.2 ප්‍රස්ථාරය)

11.1.6 පාරිසරික පාදක මත්ද්‍රව්‍ය නිවාරණ අධ්‍යාපන හා පුහුණු වැඩසටහන්

පාරිසරික පාදක මත්ද්‍රව්‍ය නිවාරණයට සහ ප්‍රතිපත්ති සම්පාදනයට දායකවීම නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශයේ හයවන අනු අංගයයි. මෙහිදී මහජන ප්‍රදර්ශන සහ ප්‍රතිපත්ති සම්පාදනය සඳහා රජයට සහ වෙනත් ආයතනවලට සහය සැලසීම සිදුකරයි.

11.1.6.1 මත්ද්‍රව්‍ය නිවාරණය ආශ්‍රිත ප්‍රජාව බලගැන්වීමේ වැඩසටහන්

බහු වාර්ගික, බහු ආගමික සහ බහු සංස්කෘතික ශ්‍රී ලංකාව තුළ නිවාරණ, අධ්‍යාපනික සහ පුහුණු වැඩසටහන් පැවැත්වීමේදී අපි මෙම විවිධත්වය කෙරෙහිද අවධානය යොමු කරන්නෙමු. එසේම, මත්ද්‍රව්‍ය ගැටලුවෙන් නිශ්චිතවම අවදානමට ලක්වන කාන්තාවන් සහ දරුවන්ගේ අවශ්‍යතා ද සැලකිල්ලට ගනිමු. මේ අනුව, අප කලින් පෙන්වා දුන් පරිදි, තිරසාර සංවර්ධන ඉලක්ක යන්ට අනුකූලව, (ඉලක්ක 3.1, 5.6, 16b.) දිවයිනේ සියලුම දිස්ත්‍රික්කයන් ආවරණය වන පරිදි ප්‍රජා දැනුවත් කිරීම සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන මාධ්‍ය තුනෙන්ම සිදු කරන්නෙමු. මෙම වැඩසටහන් සමාජයේ පවතින කුඩාම ඒකකයෙන් පටන්ගෙන බිම් මට්ටමේ ප්‍රජා ඒකකයන් දක්වා විහිදෙන පරිදි ජාලගත කර ඇත.

11.1.6.1 මත්ද්‍රව්‍ය නිවාරණය ආශ්‍රිත ප්‍රජාව බලගැන්වීමේ වැඩසටහන් 2018-2022

	2018	2019	2020	2021	2022
ඇස්තමේන්තුගත වැඩසටහන් ප්‍රමාණය	300	300	300	300	300
සම්පූර්ණ කරන ලද වැඩසටහන් ගණන	407	548	66	93	215
සම්පූර්ණ කරන ලද වැඩසටහන් ගණන ඇස්තමේන්තුගත සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස	135.66%	182.66%	22%	31%	71.67%
ඇස්තමේන්තුගත සංඛ්‍යාව	42,000	42,000	42,000	42,000	42,000
සහභාගී වූ සංඛ්‍යාව	35,004	53,052	6,392	11,841	28,214
සහභාගී වූ සංඛ්‍යාව ඇස්තමේන්තුගත සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස	83.24%	126.31%	15.21%	28.2%	67.18%

(11.1.6.1 වගුව)

11.1.6.2 මත්ද්‍රව්‍ය නිවාරණය ආශ්‍රිත ප්‍රජාව පුහුණු කිරීමේ වැඩසටහන්

නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය විසින් මහජන නායකයින් පුහුණුකරුවන් ලෙස පුහුණු කිරීම සහ ඔවුන් හරහා සමාජය වෙත නිවාරණ පණිවිඩය සම්ප්‍රේෂණය කිරීම සඳහා වාර්ෂිකව වැඩසටහන් මාලාවක් පවත්වනු ලබයි.

11.1.6.2 මත්ද්‍රව්‍ය නිවාරණය ආශ්‍රිත ප්‍රජාව පුහුණු කිරීමේ වැඩසටහන් 2018-2022					
	2018	2019	2020	2021	2022
ඇස්තමේන්තුගත වැඩසටහන් ප්‍රමාණය	-	-	-	20	20
සම්පූර්ණ කරන ලද වැඩසටහන් ගණන	-	-	-	5	1
සම්පූර්ණ කරන ලද වැඩසටහන් ගණන ඇස්තමේන්තුගත සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස	-	-	-	20%	5%
ඇස්තමේන්තුගත සංඛ්‍යාව	-	-	-	1,000	1,000
සහභාගී වූ සංඛ්‍යාව	-	-	-	210	50
සහභාගී වූ සංඛ්‍යාව ඇස්තමේන්තුගත සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස	-	-	-	21%	5%

(11.1.6.2 වගුව)

11.1.6.3 මත්ද්‍රව්‍ය අනිසි භාවිතය සහ නීති විරෝධී ජාවාරමට එරෙහි ජාත්‍යන්තර දිනය 2022 ජූනි 26

වත්මන් වසංගත තත්ත්වය සහ ආර්ථික අවපාතය නොතකා, ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය විරෝධී දිනය සැමරීම මෙවර ද නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය මඟින් 2022 ජූනි 26 වන දින සංවිධානය කරන ලදි. ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම හා එක්ව සිදු කරන ලද සැමරුම් උත්සවය සඳහා රාජ්‍ය ආයතනවල නිලධාරීන්, රාජගිරිය අවට පාසල් සිසුන්, නීතිය ක්‍රියාත්මක කරන ආයතනවල නිලධාරීන්, ආගමික නායකයන්, ප්‍රජා නායකයින් ඇතුළු පිරිස් සහභාගී විය.

11.1.6.4 ජාත්‍යන්තර ළමා දින වැඩසටහන


ජාත්‍යන්තර ළමා දින සැමරුම ද 2022 ඔක්තෝබර් 01 වැනිදාට යෙදෙන ලෝක ළමා දිනයට සමගාමීව දෙහිවල සත්වෝද්‍යාන පරිශ්‍රයේදී මෙම වසරේදී ද සිදු කරන්නට යෙදුණි. මේ සඳහා මූල්‍ය දායකත්වය ජෝන් කීල්ස් පදනම විසින් ලබා දෙන ලද අතර "සඳ" රූපවාහිනිය විසින් මාධ්‍ය ආවරණය සපයා දෙන ලදී. දරුදැරියන් හාරදහසකට (4000) අධික ප්‍රමාණයක් සහ ඔවුන්ගේ දෙමාපියන්ගේ සහභාගීත්වයෙන් මෙවරත් විනෝදාත්මක ඉසව්වලින් පිරුණු ළමා දින උත්සවයක් සංවිධානය කිරීමට නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය සමත් විය.




11.1.6.5 පසුගිය වසර 5ක කාලය තුළ (2018 - 2022) පාරිසරික පාදක මත්ද්‍රව්‍ය නිවාරණ අධ්‍යාපන හා පුහුණු වැඩසටහන් පැවැත්වූ ආකාරය විශ්ලේෂණාත්මකව

		2018		2019		2020		2021		2022	
	වැඩසටහන	වැඩසටහන් ගණන	සහභාගී සංඛ්‍යාව	වැඩසටහන් ගණන	සහභාගී සංඛ්‍යාව	වැඩසටහන් ගණන	සහභාගී සංඛ්‍යාව	වැඩසටහන් ගණන	සහභාගී සංඛ්‍යාව	වැඩසටහන් ගණන	සහභාගී සංඛ්‍යාව
1	ප්‍රජාව බලගැන්වීම	407	35,004	548	53,052	66	6,392	93	11,841	215	28,214
2	ප්‍රජාව පුහුණු කිරීම	-	-	-	-	-	-	05	210	01	50
3	කාන්තා දින වැඩසටහන	-	-	-	-	-	-			08	649
4	මත්ද්‍රව්‍ය අනිසි භාවිතය සහ නීති විරෝධී ජාවාරමට එරෙහි ජාත්‍යන්තර දිනය	-	-	-	-	-	-	-	-	22	89,382
5	ළමා දින වැඩසටහන	-	-	-	-	-	-	-	-	05	3,621
6	ද්‍රව්‍ය සකස් කිරීම	-	-	-	-	-	-	-	-	-	-
7	ප්‍රතිපත්ති සම්පාදනය									05	05

(11.1.6.5 වගුව)



(11.1.6.1 ප්‍රස්ථාරය)



(11.1.6.2 ප්‍රස්ථාරය)

මත්ද්‍රව්‍ය නිවාරණ සහතිකපත්‍ර පාඨමාලාව

සමාජය වෙත දැනුම බෙදාහැරීමේ අරමුණ ඇතිව 2021 වසරේ සිට ආරම්භ කරන ලද මත්ද්‍රව්‍ය නිවාරණ සහතික පත්‍ර පාඨමාලාව මඟින් අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය අධ්‍යාපන ආයතනයක් ලෙස තහවුරු කිරීමට නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය විසින් කටයුතු කළ අතර රජයේ මුදල් මත පමණක් යැපීම අවම කිරීම ද මෙහි තවත් අරමුණකි. මේ වන විට රාජ්‍ය භාණ්ඩාගාරය වෙත ලබාදී ඇති මුදල රුපියල් මිලියන 3.49කි.

නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශයේ 2021/22 වර්ෂයන්හි භෞතික හා මූල්‍ය ප්‍රගතිය සන්සන්දනාත්මකව ඉදිරිපත් කිරීම

වර්ෂය	භෞතික ප්‍රගතිය	මූල්‍ය ප්‍රගතිය
2021	55.06%	14.61%
2022	91.52%	31.52%

නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශයේ 2021 වර්ෂයේ භෞතික ප්‍රගතිය 55.06%ක් වූ අතර 2022 වර්ෂයේ භෞතික ප්‍රගතිය 91.52%ක් වේ. එමෙන්ම 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය 14.61%ක් වූ අතර 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය 31.52%ක් වේ.

2021 වර්ෂය තුළ පැවති වසංගත තත්ත්වය හා රට පුරා උද්ගත වූ ආර්ථික අර්බුදය හේතුවෙන් වැඩසටහන් සංඛ්‍යාව සැලකිය යුතු අයුරින් සීමා කිරීමට සිදුවීම හා රජය විසින් සපයන ලද මූල්‍ය

ප්‍රතිපාදන කිහිප අවස්ථාවකදීම කප්පාදු කිරීම හේතුවෙන් 2022 වර්ෂයේ මූල්‍ය මෙන්ම භෞතික ප්‍රගතිය ලඟා කර ගැනීමට නොහැකි විය.

නමුත් රටේ ආර්ථික ස්ථාවරත්වය තවදුරටත් ශක්තිමත් නොවීම 2022 වර්ෂය පුරාවට ද පැවති අතර නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශයේ වාර්ෂික අනුමත මූල්‍ය ඇස්තමෙන්තුවලින් 50%ක් පමණක් ලැබීම හේතුකොටගෙන මූල්‍ය ප්‍රගතිය පසුබෑවද නැවත සක්‍රීය වූ රට තුළ යෝජිත වැඩසටහන් ක්‍රියාත්මක කරලීමට අධ්‍යාපන අංශයට හැකියාව ලැබිණ. මේ වෙනුවෙන් බාහිර පාර්ශවයන් වෙතින් ලද අනුග්‍රහය ද මෙලෙස 2022 වර්ෂය තුළ 91.52% තරම් වූ ඉහළ භෞතික ප්‍රගතියක් ලබා ගැනීමට හේතු විය.

11.2 බාහිරසේවා ඒකකය

11.2.1 හැඳින්වීම සහ බාහිරසේවා ඒකකයේ කාර්යභාරය

මත්ද්‍රව්‍ය සඳහා වන ඉල්ලුම අවම කරමින් අවදානම් කණ්ඩායම් මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවීම වළක්වා ගැනීම, මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන් හට භාවිතයෙන් ඉවත් වීමට අවශ්‍ය සහාය දැක්වීම සහ ඒ සඳහා යෝග්‍ය පරිසරයක් නිර්මාණය කිරීම, ප්‍රතිකාර අවස්ථා සලසා දෙමින් භාවිතා කරන්නන් හා පවුල්වල සාමාජිකයින් වෙත උපදේශන සේවා හා පසු රැකවරණ කටයුතු සිදු කිරීම සහ එම සමස්ත ක්‍රියාවලිය ඔස්සේ සේවාලාභීන්ට හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ට මත්ද්‍රව්‍ය භාවිතයෙන් නිදහස් ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය සහයෝගය ලබා දීම සඳහා බාහිරසේවා ඒකකය කටයුතු කරනු ලබයි. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ මත්ද්‍රව්‍ය නිවාරණ, ප්‍රතිකාර හා පුනරුත්ථාපන සේවාවන් පළාත්, දිස්ත්‍රික්ක, ප්‍රාදේශීය, ග්‍රාම නිලධාරී සහ ප්‍රජා මට්ටම දක්වා ව්‍යාප්ත කිරීම සඳහා අදාළ පරිපාලන ව්‍යුහයන්, ප්‍රජා සහ සිවිල් ක්‍රියාකාරී සංවිධාන බලගැන්වීම සහ අවශ්‍ය තාක්ෂණික දායකත්වය ලබාදීමේ දී බාහිරසේවා නිලධාරීන් නියෝජිතයින් සහ සම්බන්ධීකාරකවරුන් වශයෙන් කටයුතු කරනු ලබයි.

ඉහත අරමුණු සාක්ෂාත් කරගැනීම උදෙසා, ළඟාවීමට අපහසු සහ සේවාවන් වෙත ප්‍රවේශවීමට අවස්ථාව නොමැති පුද්ගලයින් සහ කණ්ඩායම් අදාළ සේවාවන් වෙත ප්‍රවේශවීම තහවුරු කිරීම සඳහා බාහිරසේවා නිලධාරීන් විසින් මත්ද්‍රව්‍ය භාවිතා කරන පුද්ගලයින් හඳුනාගැනීමේ සිට මත්ද්‍රව්‍ය භාවිතයෙන් නිදහස්වීම දක්වා අවශ්‍ය මැදිහත්වීම් සිදු කරනු ලබයි. ඊට අමතරව මානසික වෛද්‍ය සායන සහ ප්‍රාථමික සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් වැනි සෞඛ්‍ය සේවාවන් සඳහා මෙන්ම පරිපාලන ව්‍යුහයන්ට අදාළව මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු සක්‍රීය කරමින් රාජ්‍ය ආයතනික ව්‍යුහය මෙන්ම රාජ්‍ය නොවන පාර්ශව, සිවිල් සහ ස්වේච්ඡා සංවිධාන මත්ද්‍රව්‍ය නිවාරණය උදෙසා බලගැන්වීම ද සිදු කරනු ලබයි.

11.2.2 2022 වර්ෂයට අදාළ කාර්යසාධනය

ඉහත කාර්යයන් ඉටු කිරීම සඳහා 2022 වර්ෂය තුළ බාහිරසේවා නිලධාරීන් 28 දෙනෙකු කොළඹ, කළුතර, මාතර, ගාල්ල, කුරුණෑගල, අනුරාධපුර, රත්නපුර, පොළොන්නරුව, මහනුවර, නුවරඑළිය, අම්පාර, බදුල්ල, යාපනය, මොණරාගල හා කෑගල්ල දිස්ත්‍රික්ක ආවරණය කරන ලද අතර සේවා අවශ්‍යතාවය මත අනෙකුත් දිස්ත්‍රික්ක ද ආවරණය කර ඇත. 2022 වර්ෂයේ අනුමත ක්‍රියාකාරී සැලැස්මට අනුව යෝජිත ඉලක්ක සපුරා ගනිමින් පහත සඳහන් ක්‍රියාකාරකම් තුළින් මත්ද්‍රව්‍ය නිවාරණ ප්‍රතිකාර හා පුනරුත්ථාපන වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

11.2.3 මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් (විශේෂයෙන් හඳුනාගත් අංශ සඳහා)

වැඩසටහන් අංශය	වැඩසටහන් සංඛ්‍යාව	සහභාගි වූ සංඛ්‍යාව
ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන්	366	34,325
රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන්	246	15,169
සෞඛ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන්	38	1,220
නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන්	73	2,333
පාසැල් සිසුන් සහ දෙමව්පියන් දැනුවත් කිරීමේ වැඩසටහන්	53	9,215
ඇඟළුම් ක්ෂේත්‍රයේ සේවකයින් දැනුවත් කිරීමේ වැඩසටහන්	2	3,050
කම්කරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන්	13	2,616
ප්‍රවාහන අංශයේ සේවකයින් දැනුවත් කිරීමේ වැඩසටහන්	42	3,458

විවිධ ඉලක්ක කණ්ඩායම් සඳහා ක්‍රියාත්මක කරන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් හරහා මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් පවතින වැරදි සහ සෘණාත්මක පරිකල්පනයන් සහ විශ්වාසයන් නිවැරදි සහ ධනාත්මක බවට පත් කිරීමට හැකියාව ලැබී ඇත. ඒ හරහා මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධ යථාර්ථය ඔවුන් වෙත අවබෝධ කරවීම මෙන්ම ඒ හරහා ඉදිරි මැදිහත්වීමක් අවශ්‍ය පුද්ගලයින් සහ කණ්ඩායම් හඳුනාගනිමින් ඔවුන් වෙත අවශ්‍ය ප්‍රතිකාරාත්මක මැදිහත්වීම් සිදුකිරීමට මෙම වැඩසටහන් හරහා අවකාශය ලැබී ඇත.

11.2.4 විශේෂ දින සහ අවස්ථාවන් පදනම් කරගනිමින් ක්‍රියාත්මක කරන ලද නිවාරණ වැඩසටහන්

- **ජාත්‍යන්තර කන්තා දිනය - 2022**

අනු අංකය	ඉලක්ක කණ්ඩායම	වැඩසටහන පැවැත්වූ ස්ථානය	සහභාගී වූ පුද්ගල සංඛ්‍යාව
I.	ඇඟළුම් සේවිකාවන්	MAS ආයතනය - අවිස්සාවේල්ල	1,200
II.	ඇඟළුම් සේවිකාවන්	MAS ආයතනය - තුල්හිරිය	3,200
III.	කාන්තාවන්	මුස්ලිම් නගර දේවස්ථානය - මාවනැල්ල	300
IV.	කාන්තාවන් (අඩු ආදායම්ලාභී පවුල්වල කාන්තාවන්)	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය - කොළොන්නාව	75
V.	මත්ද්‍රව්‍ය භාවිත සේවාලාභීන්ගේ පවුල්වල කාන්තාවන්	කවිධජ භාවනා මධ්‍යස්ථානය - මොරටුව	50
VI.	වතුකරයේ කාන්තාවන්	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය - හපුතලේ	60
VII.	කාන්තාවන්	මානික්ක වත්ත විහාරය - අවිස්සාවේල්ල	60

මත්ද්‍රව්‍ය නිවාරණය උදෙසා කාන්තාවන් බලගැන්වීමට සහ කාන්තාවන් ඉලක්ක කර ගනිමින් ක්‍රියාත්මක වන මත්ද්‍රව්‍ය ප්‍රවර්ධනයන් සම්බන්ධ යථාර්ථය අවබෝධ කර ගැනීමට අවශ්‍ය දැනුම ලබාදීම මෙම වැඩසටහන් හරහා මූලික වශයෙන් සිදුකර ඇත. විශේෂයෙන් පුරුෂයින්ගේ මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් විඳිතියින් බවට පත්වන කාන්තාවන් වෙනුවෙන් ඔවුන් එම පීඩනයෙන් කෙසේ නිදහස් විය යුතුද යන්න සහ ඒ වෙනුවෙන් පවුල් ඒකකය තුළ ඔවුන් විසින් කරගත යුතු වෙනස්කම් සම්බන්ධයෙන් ද මේ හරහා කාන්තාවන්ට අවශ්‍ය දැනුම හා කුසලතා ලබාදීමට අවකාශය ලැබී ඇත.

- **මත්ද්‍රව්‍ය දුර්භාවිතය සහ නීතිවිරෝධී ප්‍රවාහනයට එරෙහි ජාත්‍යන්තර දිනය 2022 ජුනි 26**

අනු අංකය	ඉලක්ක කණ්ඩායම	වැඩසටහන පැවැත්වූ ස්ථානය	සහභාගී වූ පුද්ගල සංඛ්‍යාව
I.	කර්මාන්ත ශාලා සේවකයින්	මැලිබන් ඇඟළුම් ආයතනය - දැරණියගල	1,500
II.	නාගරික ප්‍රජාව	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය - වරකාපොල	1,500
III.	ඇඟළුම් සේවිකාවන්	Methliya ආයතනය - තුල්හිරිය	1,500





- **ජාත්‍යන්තර ළමා හා වැඩිහිටි දිනය මුල් කර ගෙන සිදු කරන ලද වැඩසටහන්**

අනු අංකය	ඉලක්ක කණ්ඩායම	වැඩසටහන් මාදිලිය	වැඩසටහන පැවැත්වූ ස්ථානය
I.	ළමුන් සහ දෙමව්පියන්	"සිහින දකින ළමා ලොවක්" තේමාව යටතේ අධ්‍යාපනික ප්‍රදර්ශනය	රුවන්වැල්ල රාජසිංහ ජාතික පාසල
II.	ළමුන් සහ දෙමව්පියන්	"යහපත් හෙට දවසක් වෙනුවෙන් සුරක්ෂිත දරු පරපුරක් තනමු" ශ්‍රී ලංකා ටෙලිකොම් මොබිටෙල් ආයතනය සමග	මෝදර මට්ටක්කුලියේ දෙමාපියන් හා දරුවන් දැනුවත් කිරීම
III.	ළමුන්	ආකල්ප සංවර්ධන වැඩසටහන	කළුතර ශුද්ධ වූ පවුලේ කන්‍යාරාම පාසල
IV.	ළමුන්	ක්‍රියාකාරකම් ඇතුළත් දැනුවත් කිරීමේ වැඩසටහන්	දෙහිවල එස්.ද.එස් ජයසිංහ ක්‍රීඩාංගනය

V.	ළමුන්	මත්ද්‍රව්‍ය භාවිත සේවාලාභීන්ගේ පවුල්වල දරුවන් හා අවදානම් සහගත ප්‍රදේශයන්හි සිටින දරුවන්	පාදුක්ක ළමා ක්‍රීඩා පිටිය
VI.	ළමුන්	ළමා දිනය නිමිත්තෙන් චිත්‍ර තරඟයක් පැවැත්වීම	කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

මත්ද්‍රව්‍ය නිවාරණය උදෙසා ළමයින් බලගැන්වීම සහ ළමුන්ගේ නිර්මාණාත්මක චින්තනය නිවැරදි අවබෝධයක් ඇති කරවීම සඳහා මෙහෙයවීම මෙම වැඩසටහන්වල ප්‍රධාන අරමුණ විය. මෙම වැඩසටහන් සඳහා ළමුන් ඉහළ උනන්දුවකින් සහ උද්යෝගයකින් සහභාගී වූ අතර ඒ හරහා දරුවන් තුළ මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධ නිවැරදි ආකල්පයක් ඇතිකරවීමට හැකියාව ලැබී ඇත.





11.2.5 විශේෂිත ආගමික උත්සව මුල්කර ගනිමින් සිදු කරන ලද ප්‍රජාව දැනුවත්කිරීමේ වැඩසටහන්

අනු අංකය	දිස්ත්‍රික්කය	වැඩසටහන
I.	රත්නපුර	රත්නපුර සමන් දේවාල පෙරහැරට සමගාමීව සිදු කරන ලද ජංගම වැඩසටහන
II.	යාපනය	නල්ලූර් කෝවිලේ වාර්ෂික මංගල්‍යයට සමගාමීව සිදු කරන ලද ජංගම වැඩසටහන
III.		වල්ලිපුරම් හිංදු කෝවිල් උත්සවයට සමගාමීව සිදු කරන ලද ජංගම වැඩසටහන
IV.	මහනුවර	ශ්‍රී දළදා මාළිගාවේ ඇසළ පෙරහැරට සමගාමීව සිදු කරන ලද ජංගම වැඩසටහන
V.	රත්නපුර	ශ්‍රී පාදස්ථානය ආශ්‍රිතව සිදුකරන ලද වැඩසටහන
VI.	මොණරාගල	කතරගම මහා දේවාල පෙරහැරට සමගාමීව සිදු කරන ලද ජංගම වැඩසටහන

VII.	අනුරාධපුර	පොසොන් පොහොය නිමිත්තෙන් පෝස්ටර් හා අත්පත්‍රිකා බෙදා දෙමින් මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන
VIII.	කොළඹ	බෙල්ලන්විල රජමහා විහාරයේ ඇසළ මහා පෙරහැරට සමගාමීව සිදු කරන ලද ජංගම වැඩසටහන

ආගමික පසුබිමක් සහිත උත්සව අවස්ථා සහ වැඩසටහන් ඉලක්ක කරගනිමින් සිදුකරන ලද ඉහත ක්‍රියාකාරකම් හරහා ජනතාව තුළ මත්ද්‍රව්‍ය නිවාරණය සම්බන්ධයෙන් යම් අවධානයක් මෙන්ම ඒ හරහා දැනට ක්‍රියාත්මක ප්‍රතිකාර සේවාවන් සම්බන්ධයෙන් තොරතුරු සම්ප්‍රේෂණය කිරීමටද හැකියාව ලැබී ඇත.

11.2.6 පුහුණු වැඩසටහන්

- **සංවර්ධන නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන්**

රේඛීය අමාත්‍යාංශය යටතේ අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයට අනුයුක්ත කර ඇති මත්ද්‍රව්‍ය නිවාරණ ප්‍රතිකාර හා පුනරුත්ථාපන සංවර්ධන නිලධාරීන්ගේ තාක්ෂණික විෂය කාරණා සම්බන්ධ ධාරිතා සංවර්ධනය සඳහා අවස්ථානුකූලව විවිධ විෂය කාරණා යටතේ පුහුණු වැඩසටහන් පවත්වන ලදි.

අංකය	දිනය	වැඩසටහන් සිදු කරන දිස්ත්‍රික්කය
1	2022.09.07 - 2022.09.07	කුරුණෑගල
2	2022.09.30	කළුතර
3	2022.10.20 - 2022.10.21	රත්නපුර
4	2022.09.11 -2022.09.13	හම්බන්තොට
5	2022.10.18 - 2022.10.19	යාපනය
6	2022.11.14 - 2022.11.16	මාතලේ
7	2022.12.19 - 2022.12.23	මාතර
8	2022.12.23 - 2022.12.25	අනුරාධපුර
9	2022.11.12 - 2022.12.13	මඩකලපුව
10	2022.11.16 - 2022.11.19	මහනුවර හා නුවරඑළිය
11	2022.12.22	ගාල්ල

මෙම පුහුණු වැඩසටහන් තුළින් නිවැරදි තාක්ෂණික දැනුම භාවිත කරමින් මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහනක් සහ ප්‍රතිකාරාත්මක මැදිහත්වීමක් සිදුකළ යුතු ආකාරය සම්බන්ධයෙන් අවශ්‍ය දැනුම ලබාදීම සිදුකර ඇත. ඉහත නිලධාරීන් දැනට අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් නිවාරණ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

- **කන්දකාඩු ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථාන නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන්**

	දිනය	සහභාගි වූ නිලධාරීන් සංඛ්‍යාව
පළමු වැඩසටහන	2022.02.21 සිට 25 දක්වා	නිලධාරීන් 34
දෙවන වැඩසටහන	2022.05.17 සිට 21 දක්වා	නිලධාරීන් 35
තුන්වන වැඩසටහන	2022.09.06 සිට 10 දක්වා	නිලධාරීන් 38

11.2.7 ප්‍රතිකාරාත්මක මැදිහත්වීම්

වැඩසටහන් කාණ්ඩය	පුද්ගලයින් සංඛ්‍යාව
මත්ද්‍රව්‍ය භාවිතා කරන පුද්ගලයින් හඳුනා ගැනීම සහ එම පිරිස් ලැයිස්තුගත කිරීම	4,435
ප්‍රතිකාර හා පුනරුත්ථාපන කාර්යයන් සඳහා ප්‍රතිකාර මධ්‍යස්ථාන වෙත යොමු කිරීම	3,980
ප්‍රතිකාරලාභීන්ගේ පසුරැකවරණ කටයුතු සිදු කිරීම	7,627
මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන්ට සහ ඔවුන්ගේ පවුල් සඳහා උපදේශන සේවා සැපයීම	10,346
මත්ද්‍රව්‍ය භාවිතයෙන් නිදහස්වීම්	888
ප්‍රජා පාදක ප්‍රතිකාර වැඩසටහන යටතේ සේවාවන් සැපයීම	1,195

බාහිරසේවා නිලධාරීන් විසින් ප්‍රතිකාර හා පුනරුත්ථාපන සේවාවන් වෙත පුද්ගලයින් යොමු කරවීම සහ ප්‍රජාව තුළ සිට අවශ්‍ය මැදිහත්වීම් සිදුකිරීම සම්බන්ධයෙන් කටයුතු කරනු ලබන අතර 2022 වර්ෂය තුළ ඉහත ප්‍රතිකාරාත්මක සේවාවන් සපයමින් මත්ද්‍රව්‍ය ඇබ්බැහිකාරී පුද්ගලයින් නැවත සමාජගත කිරීම සඳහා සැළකිය යුතු දායකත්වයක් දක්වා ඇත.

11.2.8 රෝහල් ආශ්‍රිත මානසික සෞඛ්‍ය සායන සඳහා පැමිණෙන පුද්ගලයින් සඳහා උපදේශන සේවා සැපයීම

රජයේ දිස්ත්‍රික් මට්ටමින් සහ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා මට්ටමින් ක්‍රියාත්මක මත්ද්‍රව්‍ය ඇබ්බැහිකාරී පුද්ගලයින් සඳහා වන මානසික සෞඛ්‍ය සායන සඳහා අවශ්‍ය උපදේශන සේවාවන් ලබාදීම බාහිරසේවා නිලධාරීන් විසින් සිදුකරනු ලබයි. අදාළ සායන වෙත ස්වේච්ඡාවෙන් පැමිණෙන පුද්ගලයින් සඳහා විශේෂඥ මනෝවෛද්‍යවරුන් විසින් අවශ්‍ය ඖෂධමය සහ චිකිත්සාමය මැදිහත්වීම් සිදුකරනු ලබන අතර අදාළ පුද්ගලයින්ගේ මනෝසමාජීය යහපැවැත්ම සංවර්ධනය සඳහා සහ ඇබ්බැහිකාරීත්වයෙන් මිදීම සහ සුවවීම අඛණ්ඩව පවත්වාගෙන යාම සම්බන්ධයෙන් මෙන්ම පෞරුෂ සංවර්ධනය ඇතුළු විවිධ අංශ ඔස්සේ අවශ්‍ය උපදේශන සේවාවන් ලබාදීම මෙහිදී සිදුකරනු ලබයි.

11.2.9 බන්ධනාගාර රැඳවියන් සඳහා උපදේශන සේවාවන් සැපයීම

අනු අංකය	දිස්ත්‍රික්කය	උපදේශන සේවාවන් සපයන ලද බන්ධනාගාරය
I.	හම්බන්තොට	අගුණකොළපැලැස්ස බන්ධනාගාරය
II.	මොණරාගල	මොණරාගල බන්ධනාගාරය
III.	මාතර	මාතර බන්ධනාගාරය
IV.	අනුරාධපුර	අනුරාධපුර බන්ධනාගාරය
V.	පොළොන්නරුව	පොලොන්නරුව බන්ධනාගාරය
VI.	කුරුණෑගල	වාරියපොල බන්ධනාගාරය
VII.	කොළඹ	වැලිකඩ බන්ධනාගාරය (කාන්තා හා පිරිමි)
VIII.	රත්නපුර	කුරුවිට බන්ධනාගාරය
IX.	බදුල්ල	බදුල්ල බන්ධනාගාරය
X.	යාපනය	යාපනය බන්ධනාගාරය

11.2.10 පසුරුකවරණ ක්‍රියාවලිය විධිමත් කිරීම

ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානවලින් ප්‍රතිකාර සේවාවන් ලබා පිටව යන සේවාලාභීන් සම්බන්ධයෙන් අවශ්‍ය අඛණ්ඩ පසුරුකවරණ සේවාවන් සැපයීම සහ ඒ හරහා ඔවුන් සුවවීම අඛණ්ඩව පවත්වාගෙන යාම තහවුරු කිරීම සඳහා අවශ්‍ය පසුබිම සැපයීම සහ ඒ සඳහා අවශ්‍ය මැදිහත්වීම් සිදුකිරීම බාහිරසේවා නිලධාරීන් විසින් සිදුකරනු ලබයි. 2022 වර්ෂය තුළ එම පසුරුකවරණ ක්‍රමවේදය වඩා විධිමත් කිරීමේ සහ කාර්යක්ෂම කිරීමේ අරමුණින් විශේෂ අභ්‍යන්තර ක්‍රමවේදයක් ආරම්භ කර ඇත. ඒ අනුව ප්‍රතිකාර මධ්‍යස්ථාන නිලධාරීන් විසින් සේවාලාභීන් බැහැර වීමට සති දෙකකට පෙර අදාළ සේවාලාභීන් සම්බන්ධ අවශ්‍ය නිශ්චිත තොරතුරු විද්‍යුත් තැපැල් ලිපිනයක් හරහා බාහිරසේවා අංශය වෙත යොමු කරනු ලබන අතර එම තොරතුරු අදාළ සේවාලාභියාගේ පදිංචි ප්‍රදේශය අනුව වෙන් කර අදාළ ප්‍රදේශය භාර බාහිරසේවා නිලධාරියා වෙත යොමු කරනු ලබයි. එම සේවාලාභියා සම්බන්ධ පසුරුකවරණ කටයුතු අවසන් වූ පසු ඊට අදාළ ප්‍රගතිය ඇතුළත් වාර්තාවක් බාහිරසේවා අංශය විසින් අදාළ ප්‍රතිකාර මධ්‍යස්ථානය වෙත යොමු කරනු ලබයි. මේ හරහා වඩා විධිමත්ව සහ කාර්යක්ෂමව පසුරුකවරණ සේවාවන් ලබාදීම තහවුරු කිරීමට අවස්ථාව ලැබී ඇත.

11.2.11 ප්‍රමිතිගත අනාවරණ පරීක්ෂාවක් හඳුන්වාදීම

බාහිරසේවා නිලධාරීන් විසින් ප්‍රජාව තුළ හඳුනා ගනු ලබන මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින්ගේ ඇබ්බැහිකාරී මට්ටම නිර්ණය කිරීම සඳහා සහ ඒ මත පදනම්ව අවශ්‍ය මැදිහත්වීමේ ක්‍රමවේදය තීරණය කිරීම සඳහා බාහිරසේවා නිලධාරීන්ට WHO ASSIST V-3 අනාවරණ පරීක්ෂණ ක්‍රමය හඳුන්වාදී අවශ්‍ය තාක්ෂණික පුහුණු වැඩසටහන් පවත්වා ඇත.

11.2.12 මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු සක්‍රීය කිරීම සහ පවත්වාගෙන යාම

පළාත් දිස්ත්‍රික්ක සහ ප්‍රාදේශීය මට්ටමින් මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු ස්ථාපිත කිරීමට සහ සක්‍රීය ලෙස එම කමිටු පවත්වාගෙන යාමට අවශ්‍ය තාක්ෂණික දායකත්වය සහ අවශ්‍ය බලගැන්වීම බාහිරසේවා

නිලධාරීන් විසින් සිදුකර ඇත. ඒ අනුව 2022 වර්ෂය තුළ විවිධ මට්ටම්වල මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු 37ක් ස්ථාපිත කර අඛණ්ඩව පවත්වාගෙන යාමට බාහිරසේවා නිලධාරීන් දායකත්වය ලබා දී ඇත.

11.2.13 සෞඛ්‍ය සේවා සපයන ආයතන සමඟ සම්බන්ධීකරණය

බාහිරසේවා අංශය 2022 වර්ෂය තුළ ජාතික ලිංගාශ්‍රිත රෝග පාලන වැඩසටහන, ක්ෂය රෝග පාලන වැඩසටහන, පිළිකා පාලන වැඩසටහන, යොවුන් පියස සායන, මාතෘ සහ ළමා සායන සහ නව විවාහක යුවළ සඳහා ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල මට්ටමින් ක්‍රියාත්මක වන සායන ඇතුළු විවිධ සෞඛ්‍ය සේවාවන් සමග සම්බන්ධීකරණය වෙමින් මත්ද්‍රව්‍ය ඇබ්බැහිකාරී පුද්ගලයින් සහ ඔවුන්ගේ සමීපතමයින්ට අවශ්‍ය සේවාවන් සැපයීමට කටයුතු කර ඇත.

11.2.14 ප්‍රජා පාදක ප්‍රතිකාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ ප්‍රමුඛතාවය ලබාදීම

දැනට නේවාසික ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානවල පවතින සීමිත ධාරිතාවය සහ ප්‍රතිකාර සේවාවන් සඳහා පවත්නා ඉල්ලුම සැළකිල්ලට ගනිමින් ප්‍රජා පාදක ප්‍රතිකාර වැඩසටහන සඳහා ප්‍රමුඛතාවය ලබා දී අනෙකුත් අදාළ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන මෙන්ම ප්‍රජාව සහ සිවිල් ක්‍රියාකාරී සංවිධානවල සහය ලබාගනිමින් ප්‍රජා පාදක ප්‍රතිකාර ක්‍රමවේදය ආරම්භ කර පවත්වා ගෙන යනු ලබයි. මේ යටතේ නව ආකෘතියක් ලෙස මත්ද්‍රව්‍ය ඇබ්බැහිකාරී පුද්ගලයාගේ බිරිඳ/මව හෝ වෙනත් පවුලේ සමීපතමයින්ගේ සහාය උපරිම සහ සක්‍රීය ලෙස ලබා ගනිමින් ඔවුන්ට වෙන් වූ නිශ්චිත වගකීම් පවරමින් ඒ සම්බන්ධයෙන් අවශ්‍ය පුහුණු වැඩසටහන් ද ක්‍රියාත්මක කර ඇත. මෙය නියමු ව්‍යාපෘතියක් ලෙස සියලු බාහිරසේවා නිලධාරීන් තෝරාගත් ප්‍රදේශවල ආරම්භ කර ඇත.

11.2.15 1927 දුරකථන මාර්ගික උපදේශන සේවාව

මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහි වී සිටින පුද්ගලයින්ට සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ට සිය කායික හා මානසික ගැටලු සහ අපහසුතා සම්බන්ධයෙන් උපදේශන සේවාවන් ලබා ගැනීමට හෝ වෙනත් අවශ්‍ය සේවාවක් සම්බන්ධ තොරතුරු ලබාගැනීම සඳහා මෙම දුරකථන මාර්ගික උපදේශන සේවාව ක්‍රියාත්මක කරනු ලබයි.

මෙම මූලික මට්ටමේ මැදිහත්වීම තුළ උපදේශන නිලධාරීන් විසින් සේවාලාභීන් වෙත හෝ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් වෙත ප්‍රධාන අංශ 03ක් යටතේ සේවාවන් සපයනු ලබයි.

- මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් ඇතිවන කායික හා මානසික සංකූලතාවයන් ඇතුළු විරමණ ලක්ෂණ මඟ හරවා ගැනීම සඳහා සේවාලාභීන් වෙත හෝ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් වෙත අවශ්‍ය උපදෙස් සැපයීම
- මත්ද්‍රව්‍ය භාවිතයෙන් මිදීම සඳහා දැනට පවතින ප්‍රතිකාර සේවාවන් සම්බන්ධයෙන් හෝ වෙනත් මනෝවෛද්‍ය විශේෂඥ සේවාවන් වෙත යොමුවීම සම්බන්ධයෙන් අවශ්‍ය තොරතුරු සැපයීම
- මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් භාවිතයෙන් නිදහස් කරගැනීම සඳහා ඉදිරි උපදේශන සැසි සැලසුම් කර ගැනීම, අවශ්‍ය ද්විතීය මට්ටමේ මැදිහත්වීම් සිදු කිරීම, භාවිතයෙන් නිදහස් කරගැනීම සහ පසුවිපරම් ක්‍රියාවලීන් සිදු කිරීම

2022 වර්ෂය තුළ දුරකථන මාර්ගික උපදේශන සේවාව හරහා සේවාවන් ලබාදීම සම්බන්ධ ප්‍රගතිය පහත ඉදිරිපත් කර ඇත.

1927 දුරකථන උපදේශන සේවාවට ලද ඇමතුම්වල ස්වභාවය අනුව ඉදිරි යොමු කිරීම්	
අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ බාහිරසේවා නිලධාරීන් වෙත	1,132
අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ ප්‍රතිකාර මධ්‍යස්ථාන වෙත	263
අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ අධ්‍යාපන නිලධාරීන් වෙත	29
රජයේ රෝහල් ආශ්‍රිත සායන සඳහා	155
දුම්කොළ, මද්‍යසාර ප්‍රතිකාර මධ්‍යස්ථාන වෙත හා 1927 දුරකතන උපදේශන අංකය වෙත	134
දුරකථන උපදේශනය	38
පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන වෙත	32
යොමු කිරීමකින් තොරව මූලික තොරතුරු සැපයීම	484
සමස්ත ඇමතුම් සංඛ්‍යාව	2,267

බාහිරසේවා ඒකකයේ 2021/22 වර්ෂයන්හි භෞතික හා මූල්‍ය ප්‍රගතිය සන්සන්දනාත්මකව ඉදිරිපත් කිරීම

වර්ෂය	මූල්‍ය ප්‍රගතිය	භෞතික ප්‍රගතිය
2021	41%	40%
2022	42%	54%

2021 වර්ෂයේ පැවති වසංගත තත්ත්වය මත මූල්‍ය හා භෞතික ප්‍රගතියේ අඩුවීමක් ඇති අතර ඊට සාපේක්ෂව 2022 වර්ෂයේ මූල්‍ය හා භෞතික ප්‍රගතිය වැඩි විය.

11.3 ප්‍රතිකාර හා පුනරුත්ථාපන අංශය

මණ්ඩලයේ සේවාවන් අතර ප්‍රතිකාර හා පුනරුත්ථාපන අංශය ද සුවිශේෂී ස්ථානයක් හිමිකර ගනී. මෙම අංශය මඟින් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් සඳහා උපදේශන, ප්‍රතිකාර හා පුනරුත්ථාපන සේවාවන් ලබා දේ. මෙම වර්ෂයේදී ද මණ්ඩලයේ ස්ථාපිත පුනරුත්ථාපන මධ්‍යස්ථාන මඟින් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීම නිසා විවිධ ප්‍රශ්නවලට මුහුණ දුන් පුද්ගලයින් එම ගැටලුවලින් මුදවා ගැනීම, ඔවුන්ට සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ට සහනයක් ලබා දීම, ඔවුන්ගේ හැකියාවන් ශක්තිමත් කිරීම, අධ්‍යාත්මික සංවර්ධනය, පෞරුෂ සංවර්ධනය ආදී ගුණාත්මක වෙනස්කම් මඟින් ප්‍රතිකාර ක්‍රියාවලිය පෝෂණය කරන ලදි. එමෙන්ම දීප ව්‍යාප්ත මට්ටමින් ක්‍රියාත්මක වන මත්ද්‍රව්‍ය නිවාරණ සහ බාහිරසේවා ක්‍රියාකාරකම් මඟින් සිදුකරන ලද ප්‍රජාව දැනුවත් කිරීම ආශ්‍රිතව ප්‍රජා පාදක ප්‍රතිකාර වැඩසටහන් සඳහා අවශ්‍ය දායකත්වය ද මෙම අංශය මඟින් ලබාදෙන ලදි.

11.3.1 ප්‍රතිකාර වැඩසටහන සඳහා ඇතුළත් කරගැනීම

එහත සඳහන් වර්ගීකරණයට අනුව සෑම ප්‍රතිකාර මධ්‍යස්ථානයකම සේවාලාභීන් ඇතුළත් කරගත් අතර සුපුරුදු පරිදි මෙම වසරේ ද,

- සිය කැමැත්තෙන් නේවාසික ප්‍රතිකාරය සඳහා ඇතුළත්වීම්
- භාරකරුවන්ගේ ඉල්ලීම් මත ඇතුළත් කිරීම්
- අධිකරණය සහ ප්‍රජා විශෝධන ආයතන මඟින් ඇතුළත් කිරීම්
- වෙනත් රාජ්‍ය ආයතන දැනුවත් කිරීම් මඟින් ඇතුළත් කිරීම්
- බාහිරසේවා මඟින් ඇතුළත් කරගැනීම් සිදුකරන ලදි.

ඉහත සියලු ඇතුළත් කිරීම් අපගේ පළපුරුදු උපදේශකවරුන්ගේ මැදිහත්වීම මත සිදුකල අතර පූර්ව උපදේශන සැසි, අනාවරණ පරීක්ෂණ උපයෝගී කර ගනිමින් සේවාලාභීන් නේවාසික ප්‍රතිකාරය සඳහා ඇතුලත් කර ගන්නා ලදි.

ප්‍රතිකාර වැඩසටහන

නේවාසික ප්‍රතිකාරය සඳහා ඇතුළත් කරගත් පසු සෑම මධ්‍යස්ථානයකම ඒ ඒ සේවාලාභියාට අනුරූප වන අයුරින් ප්‍රතිකාර සැලැස්මකට අනුව ප්‍රතිකාර සේවය ලබා දෙන ලදි. විශේෂයෙන්ම සෑම ප්‍රතිකාර මධ්‍යස්ථානයකම මනෝ චිකිත්සක ප්‍රතිකාර ක්‍රමය උපයෝගි කරගනිමින් ඔවුන්ට අදාළ සේවාවන් සපයන ලදි. මත්ද්‍රව්‍යයට ඇබ්බැහිවූවන්ගේ ගැටලු හඳුනාගැනීම, ගැටලු නිර්වචනය කරගැනීම හා ගැටලු විශ්ලේෂණය තුළින් ඔවුන්ට ගැලපෙන ප්‍රතිකාර සැලැස්ම නිර්මාණය කරයි. උපදේශකවරුන්, සහකාර උපදේශකවරුන්ගේ මැදිහත්වීම් යටතේ උපදේශන සහකාරවරුන්ගේ ද සහය ඇතිව වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි. මෙහිදී පුද්ගල උපදේශනය, කණ්ඩායම් උපදේශනය, පවුල් උපදේශනය, වෘත්තීය මාර්ගෝපදේශනය ක්‍රියාවට නංවයි. එමෙන්ම ආත්ම අභිමානය ඇති කිරීම ආශ්‍රිත ක්‍රියාකාරකම්, අධ්‍යාත්මික සංවර්ධනය උදෙසා වූ උපදේශනය, පරිසර රසවින්දනය ආශ්‍රිත ක්‍රියාකාරකම්, වින්දනාත්මක ගුණාංග සංවර්ධනය වැනි සේවාලාභියා සතු වූ විවිධ

ගුණාංගයන් දියුණු කරලීමේ අරමුණෙන් වූ ප්‍රතිකාර සැලැස්මක් උපයෝගී කරගැනීම මඟින් අදාළ සේවාවන් ලබාදෙන ලදි.

විශේෂිත වැඩසටහන්

ප්‍රතිකාර සහ දෛනික වැඩසටහනට අමතරව සෑම මධ්‍යස්ථානයකම සේවාලාභීන්ගේ රසවින්දනය සඳහා වසර තුළ විවිධ වැඩසටහන් ක්‍රියාත්මක විය. රචනා, චිත්‍ර, මසකට වරක් පැවැත්වෙන පැදුරු සාජ්ජය වැනි සුවිශේෂී වැඩසටහන් මෙයට අයත් ය. ආගමික උත්සව, ක්‍රීඩා තරඟ, බැති ගී ප්‍රසංග, වසර අවසාන ප්‍රාසාංගික වැඩසටහන්, අභිප්‍රේරණ වැඩසටහන් ද ඒ අතර වේ.

ආදායම් උත්පාදනය

මණ්ඩලයේ ප්‍රතිකාර මධ්‍යස්ථානවල මෙම වසරේ ද ප්‍රධාන ආදායම් උත්පාදන මාර්ග දෙකක් දක්නට ලැබිණි. නවදිගන්තය සහ මහනුවර මධ්‍යස්ථානවල පොල් වගාව තුළින් ලබාගන්නා ලද ආදායම් සහ මධ්‍යස්ථානවල ගෙවීම් පදනම මත ප්‍රතිකාර සඳහා ඇතුළත් වූ සේවාලාභීන්ගෙන් ලැබූ ආදායම් වශයෙනි.

උපදේශන සහ ප්‍රතිකාර සේවා සැපයීම

අපගේ ප්‍රතිකාර මධ්‍යස්ථාන සහ ප්‍රධාන කාර්යාලය මඟින් උපදේශන සේවා, සේවාලාභීන් 2263 දෙනෙක් සඳහා සපයා ඇති අතර මධ්‍යස්ථාන නේවාසික ප්‍රතිකාරයට ඇතුලත් කරගත් සමස්ත සේවාලාභීන් සංඛ්‍යාව 788කි.

11.3.2 බස්නාහිර පළාත් ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය - තලංගම

මෙම මධ්‍යස්ථානය මඟින් සේවාලාභීන් 40කට නේවාසික ප්‍රතිකාරය ලබාදිය හැකිය. මධ්‍යස්ථානය මඟින් 2022 වසරේ සේවාලාභීන් 846 දෙනෙක් සඳහා උපදේශන කටයුතු සිදුකර තිබූ අතර ඉන් සේවාලාභීන් 124 දෙනෙක් සඳහා නේවාසික ප්‍රතිකාර සේවාවන් ලබා දෙන ලදි.

උපදේශන/ නේවාසික ප්‍රතිකාර සේවාවන්	සේවා ලැබූ සංඛ්‍යාව
උපදේශන	846
නේවාසික ප්‍රතිකාර	124

මෙම වසරේ සිට සේවාලාභීන්ගේ නේවාසික ප්‍රතිකාර ධාරිතාව ඉහළ නැංවීම සඳහා තලංගම මධ්‍යස්ථානය නවීකරණය කරන ලදි. එමෙන්ම ජාතික මට්ටමින් මත්ද්‍රව්‍ය නිවාරණය පුහුණු කිරීම සඳහා වූ පුහුණු වැඩසටහන් මෙම වසර තුළ ක්‍රියාත්මක කරන ලදි.

11.3.3 මධ්‍යම පළාත් (යොවුන්) ප්‍රතිකාර මධ්‍යස්ථානය - මහනුවර

මෙම මධ්‍යස්ථානය මඟින් සේවාලාභීන් 35 දෙනෙකුට එකවර සේවය ලබා දිය හැකිය. මෙම වසරේ මධ්‍යස්ථානය මඟින් සේවාලාභීන් 222 දෙනෙක් සඳහා උපදේශන කටයුතු ලබා දී තිබූ අතර ඉන් සේවාලාභීන් 143 දෙනෙක් සඳහා නේවාසික ප්‍රතිකාර සේවාවන් ලබා දෙන ලදි. මෙම මධ්‍යස්ථානය මඟින් අවුරුදු 21ට අඩු දරුවන් ඇතුළත් කර ගැනීම සිදු කරයි.

උපදේශන හා නේවාසික ප්‍රතිකාර සේවා	සේවා ලැබූ සංඛ්‍යාව
උපදේශන	222
නේවාසික ප්‍රතිකාර	143

11.3.4 දකුණු පළාත් ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය - ගාල්ල

මෙම මධ්‍යස්ථානය මඟින් ද එකවර සේවාලාභීන් 40කට සේවය සැපයිය හැකිය. ඒ අනුව දෙනිකව මෙම වසර තුළ සේවාලාභීන් 222 දෙනෙක් සඳහා උපදේශන කටයුතු ද සේවාලාභීන් 153 දෙනෙක් නේවාසික ප්‍රතිකාර කටයුතු සඳහා ද ඇතුලත් කරගෙන තිබුණි.

උපදේශන හා නේවාසික ප්‍රතිකාර සේවා	සේවා ලැබූ සංඛ්‍යාව
උපදේශන	222
නේවාසික ප්‍රතිකාර	153

11.3.5 නවදිගන්තය ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය - නිට්ටඹුව

සේවාලාභීන් 100කට එකවර සේවය සැපයිය හැකිය. 2022 වසරේ උපදේශනය සැපයූ මුළු සේවාලාභීන් සංඛ්‍යාව 730කි. ඉන් සේවාලාභීන් 368 දෙනෙක් සඳහා නේවාසික ප්‍රතිකාරය ලබා දී තිබුණි.

උපදේශන හා නේවාසික ප්‍රතිකාර සේවා	සේවා ලැබූ සංඛ්‍යාව
උපදේශන	730
නේවාසික ප්‍රතිකාර	368

2021 වර්ෂයේ නවදිගන්ත මධ්‍යස්ථානයේ ප්‍රතිකාර වැඩසටහනේ නව ප්‍රවණතා


සේවාලාභීන් 1000කට එකවර පුනරුත්ථාපන සේවාවන් ලබා දීම සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය යටතේ එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය සහ අපරාධ කාර්යාලය (UNODC) මඟින් එක් ගොඩනැගිල්ලක් සඳහා ධන පරිත්‍යාග කරන ලද අතර එම ගොඩනැගිල්ලේ වැඩ කටයුතු 2022 වසර අග වන විට නිමා විය.

11.3.6 පසුරුකවරණ වැඩසටහන - 2022

එක් එක් මධ්‍යස්ථාන මඟින් 2022 වර්ෂය තුළ නේවාසිකව සිට බැහැර වූ සේවාලාභීන් සම්බන්ධව තොරතුරු පහතින් දක්වා ඇත. මෙහිදී සේවාලාභීන් මධ්‍යස්ථානයට ගෙන්වා ගැනීම, දුරකතන මාර්ගයෙන් තොරතුරු ලබාගැනීම, බාහිරසේවා වැනි ක්‍රම සේවාලාභීන්ගේ පසුරුකවරණය සිදු කිරීම සඳහා උපයෝගී කරගෙන ඇත.

පසුරුකවරණ වැඩසටහන සඳහා යොමු කර ගනු ලැබූ සේවාලාභීන් ප්‍රමාණය

මධ්‍යස්ථානය	ජනවාරි	පෙබරවාරි	මාර්තු	අප්‍රේල්	මැයි	ජූනි	ජූලි	අගෝස්තු	සැප්තැම්බර්	ඔක්තෝබර්	නොවැම්බර්	දෙසැම්බර්
තලංගම පසුරුකවරණ	06	18	20	25	31	36	28	05	07	46	56	49
නිදහස් පිරිස	06	16	12	18	20	25	21	05	07	20	26	25
නුවර පසුරුකවරණ	36	31	34	15	15	09	20	19	39	30	29	39
නිදහස් පිරිස	29	28	25	12	10	08	18	15	33	29	29	38
ගාල්ල පසුරුකවරණ	89	09	74	70	47	33	45	52	100	125	39	67
නිදහස් පිරිස	32	03	35	32	15	15	19	16	28	40	18	23
නවදිගන්තය පසුරුකවරණ	37	59	47	72	97	91	32	174	68	203	93	70
නිදහස් පිරිස	22	39	23	26	31	25	18	54	24	62	20	30



ඉහත සඳහන් තොරතුරු අනුව 2022 වසරේ පසුරුකවරණ කටයුතු කළ සේවාලාභීන්ගෙන් තලංගම මධ්‍යස්ථානයේ 327ක් ද, ගාල්ල මධ්‍යස්ථානයේ 750ක් ද, නවදිගන්ත මධ්‍යස්ථානයේ සේවාලාභීන් 1043ක් ද, නුවර මධ්‍යස්ථානයේ සේවාලාභීන් 316ක් ද වශයෙන් වන අතර මින් තලංගම මධ්‍යස්ථානයේ 201ක් ද, ගාල්ල මධ්‍යස්ථානයේ 276ක් ද, නවදිගන්ත මධ්‍යස්ථානයේ සේවාලාභීන් 374ක් ද, නුවර මධ්‍යස්ථානයේ සේවාලාභීන් 274ක් ද මත්ද්‍රව්‍ය භාවිතයෙන් නිදහස්ව සිටි බවට වාර්තා විය. මේ අනුව අපගේ ප්‍රතිකාර මධ්‍යස්ථානවලින් පමණක් පුනරුත්ථාපනය වී නිදහස්වූවන්ගෙන් 1125ක් මත්ද්‍රව්‍ය භාවිතයෙන් නිදහස් වී ඇත.

ප්‍රතිකාර හා පුනරුත්ථාපන අංශයේ 2021/2022 වර්ෂයන්හි භෞතික හා මූල්‍ය ප්‍රගතිය සන්සන්දනාත්මකව ඉදිරිපත් කිරීම

වර්ෂය	භෞතික ප්‍රගතිය	මූල්‍ය ප්‍රගතිය
2021	73%	78%
2022	67%	98%

ප්‍රතිකාර හා පුනරුත්ථාපන අංශයේ 2021 වර්ෂයේ භෞතික ප්‍රගතිය 73% ක් සහ 2022 වර්ෂයේ භෞතික ප්‍රගතිය 67% වශයෙන් ද මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 78% ක් සහ 98% ක් වශයෙන් 2021 සහ 2022 වර්ෂවලදී දැකගත හැකි විය. පහත දැක්වෙන පොදු කරුණු මෙම විචල්‍යයන් සඳහා හේතු ලෙස දැක්විය හැකිය.

- ඉන්ධන අර්බුදය සහ ප්‍රවාහන අපහසුතා හේතුවෙන් පසුරුකවරණ කටයුතු සඳහා සේවාලාභීන් මධ්‍යස්ථාන වෙත ගෙන්වා ගැනීම අඩු වීම.
- වර්තමානයේ ප්‍රතිකාර මධ්‍යස්ථානවල සිටිය යුතු කාර්ය මණ්ඩලයට වඩා අවම කාර්ය මණ්ඩලයකින් ප්‍රතිකාර ක්‍රියාවලිය පවත්වාගෙන යාමට සිදුව තිබීම.

11.4 නාමෝදිෂ්ඨ හා පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන අංශය

2007 අංක 54 දරන ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපනය) පිළිබඳ පනත සහ 2010 අංක 1653/19 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය යටතේ ප්‍රතිකාර වැඩසටහන පුළුල් කිරීම සඳහා අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ අංශයක් ලෙස නාමෝදිෂ්ඨ හා පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන අංශය පිහිටුවා ඇති අතර, මෙම අංශය යටතේ නාමෝදිෂ්ඨ ප්‍රතිකාර මධ්‍යස්ථාන 10ක්, සමාජ සේවා දෙපාර්තමේන්තුව මඟින් පාලනය වන ප්‍රතිකාර මධ්‍යස්ථාන දෙකක්, පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය මඟින් පාලනය වන ප්‍රතිකාර මධ්‍යස්ථානයක් හා ශ්‍රී ලංකාව පුරා ව්‍යාප්තවී ඇති පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන 25ක් පවතින අතර, එම මධ්‍යස්ථානවල අධීක්ෂණ හා නියාමන කටයුතු සිදු කරනු ලබයි. එමෙන්ම මෙම පනත යටතේ නාමෝදිෂ්ඨ හෝ බලපත්‍ර ලබාගත් ප්‍රතිකාර මධ්‍යස්ථානවල මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන්ට ප්‍රතිකාර හා පුනරුත්ථාපන කටයුතු කාර්යක්ෂමව කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය උපදෙස් මෙම අංශය විසින් සපයනු ලබයි.

නම් කරන ලද ප්‍රතිකාර මධ්‍යස්ථාන වශයෙන් හඳුන්වන බන්ධනාගාර

1	පල්ලේකැලේ	7	කන්දෙවත්ත
2	වටරැක	8	මීතිරිගල
3	තල්දෙන	9	කලුතර
4	වීරවිල	10	අඹේපුස්ස
5	අනුරාධපුරය	11	කන්දකාඩු
6	පල්ලන්සේන		

ඉහත සඳහන් කල නාමෝදිෂ්ඨ ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථාන තුළ රැඳවියන්ගේ උපදේශන කටයුතු සඳහා අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ උපදේශන නිලධාරීන් එම මධ්‍යස්ථාන තුළට අනුයුක්ත කර ඇත.

2022 වසරේ දී නාමෝදිෂ්ඨ හා පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථානවල පවත්වන ලද ප්‍රතිකාර වැඩසටහන් සහ විමර්ශන වැඩසටහන්

වැඩසටහනේ නම	වර්ෂය තුළ සිදු කිරීමට නියමිත වැඩසටහන් ප්‍රමාණය	සිදු කරන ලද වැඩසටහන් ප්‍රමාණය	සහභාගි වූ සේවාලාභීන් ගණන
පුද්ගල උපදේශනය (බන්ධනාගාර)	360	350	350
කණ්ඩායම් උපදේශනය (බන්ධනාගාර)	120	110	750
පවුල් උපදේශනය (බන්ධනාගාර)	60	50	105

විශේෂ වැඩසටහන් (බන්ධනාගාර/ පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන)	04	04	600
නාමෝදිෂ්ඨ මධ්‍යස්ථාන කාර්යය මණ්ඩලය පුහුණු කිරීමේ වැඩසටහන්	04	02	40
පෞද්ගලික ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථාන කාර්ය මණ්ඩලය පුහුණු කිරීමේ වැඩසටහන්	04	03	75
නිවාරණ හා අධ්‍යාපන වැඩසටහන් (බන්ධනාගාර/ පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන)	48	45	850
පෞද්ගලික මත්ද්‍රව්‍ය ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථාන විමර්ශනය	60	47	-
නාමෝදිෂ්ඨ ප්‍රතිකාර මධ්‍යස්ථාන (බන්ධනාගාර) විමර්ශනය	24	10	-

නාමෝදිෂ්ඨ ප්‍රතිකාර මධ්‍යස්ථාන සඳහා යොමු කරනු ලබන සේවාලාභීන් හට මත්ද්‍රව්‍යවලින් නිදහස්වීමට අවශ්‍ය සහය ලබාදීම, නාමෝදිෂ්ඨ ප්‍රතිකාර මධ්‍යස්ථානවලට අනුයුක්තව සේවය කරනු ලබන උපදේශකවරුන්ගේ ප්‍රධාන වගකීම හා කාර්ය භාරය වේ. එබැවින් උපදේශන නිලධාරීන් විසින් ඉහත සඳහන් වැඩසටහන් එම ප්‍රතිකාර මධ්‍යස්ථාන තුළ ක්‍රියාත්මක කරනු ලබයි.

ඒ අනුව ප්‍රතිකාර වැඩසටහන සම්පූර්ණ කිරීමෙන් පසු ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථාන වලින් බැහැරවන සේවාලාභීන් සංවර්ධන තත්ත්වයන් අත්පත් කරගෙන ඇති බව හඳුනාගත හැකි විය. සේවාලාභියා සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ගත කරනු ලැබීම ඒ අතර ප්‍රධාන වේ. මත්ද්‍රව්‍ය භාවිතය පුද්ගලයාගේ සෞඛ්‍යයට හා පවුල් ජීවිතයට ඍජුවම බලපානු ලබන අතර, ප්‍රතිකාර ලබා බැහැර වූ පසු ඔවුන් තම මුදල් මත්ද්‍රව්‍ය භාවිතය සඳහා යෙදවීම වෙනුවට තම ජීවිතයේ නිවැරදි කාර්යයන් සඳහා යොදවනු ලැබීම හේතුවෙන් ඔවුන් මූල්‍යමය වශයෙන් ප්‍රගතියක් අත් කරගෙන ඇති අතර, සමාජය තුළ ගෞරවනීය ජීවිතයක් ගත කිරීමට ද අවස්ථාව උදාකරගෙන තිබේ. එමෙන්ම ආදර්ශමත් දෙමාපියන් ලෙස කටයුතු කිරීමට සහ අවංකව හා කැපවීමෙන් කටයුතු කිරීම හේතුවෙන් වෘත්තීමය දියුණුවක් ළඟා කර ගැනීමේ හැකියාව ද ලැබී තිබේ. මත්ද්‍රව්‍යවලින් නිදහස්වීම හේතුවෙන් බාහිර පෙනුම, අන්‍යෝන්‍ය විශ්වාසය, මිත්‍රත්වය වර්ධනය කර ගැනීම මඟින් වාසි සහගත තත්ත්වයන් ළඟා කරගෙන ඇති බව හඳුනාගත හැක.

එමෙන්ම ප්‍රතිකාර මධ්‍යස්ථාන විමර්ශනය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස, ප්‍රතිකාර මධ්‍යස්ථානයක පැවතිය යුතු අවම ප්‍රමිතීන් වර්ධනය කිරීම, මධ්‍යස්ථානය තුළ පවතින ප්‍රතිකාර ක්‍රමවේදය තවදුරටත් ගුණාත්මක කිරීම, මධ්‍යස්ථාන නිලධාරීන්ගේ තාක්ෂණික දැනුම ඉහළ නැංවීමට හැකියාව ලැබුණි.

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය යටතේ අධීක්ෂණය වන පෞද්ගලික මත්ද්‍රව්‍ය ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථාන තුළ 2022 වර්ෂයේ දී නේවාසිකව ප්‍රතිකාර ලබාගත් සේවාලාභීන් ප්‍රමාණය

	ප්‍රතිකාර මධ්‍යස්ථානය	ලිපිනය	දුරකථන අංකය	2022 වර්ෂය සඳහා ඇතුළත් වූ සේවාලාභීන් ප්‍රමාණය
01	මිතුරු මිතුරෝ ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය	මිතුරු මිතුරෝ ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය රිල්හේන, පැල්මඩුල්ල	045 2274363	212
02	නිදහස ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය	නිදහස ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය අංක 26, ශ්‍රී සද්ධාතිස්ස මාවත, හිග්ගස්හේන, කුරුවිට	071 8714377	108
03	සෙනෙහස ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය	සෙනෙහස ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය අංක 80, තුන්බෝවිල, පිළියන්දල	011 2613242 077 1251578	88
04	නිසංසල ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය	නිසංසල ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය අංක 108, කීනිගම, බුත්පිටිය	033 3555740	68
05	කරුණාවේ නිවස ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය	කරුණාවේ නිවස ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය ඇලිබ, කඳන, හොරණ	077 5110259	245
06	මිදුම ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය	මිදුම ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය සවන් පියස, විජය කුමාරතුංග මාවත, එඬේරමුල්ල, වත්තල	077 7368332	64
07	බලය නිවස ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය	බලය නිවස ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය පරමාවලහේන වත්ත, බමුණුමුල්ල, බණ්ඩාරගම	011 2721812/20	45

08	සුමිත්‍රයෝ පුනරුත්ථාපන මධ්‍යස්ථානය	සුමිත්‍රයෝ පුනරුත්ථාපන මධ්‍යස්ථානය අංක 60, මැල් මැදුර, හෝර්ටන් පෙදෙස, කොළඹ 07	011 2694665	උපදේශනය පමණි
09	ජයවිරු සමාධි නිවහන ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය (සමාජ සේවා දෙපාර්තමේන්තුව)	ජයවිරු සමාධි නිවහන ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය අම්බලම් වත්ත උතුර, පුවක්පිටිය, අවිස්සාවේල්ල	071 4445957	71
10	සමාධි නිවහන ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය (සමාජ සේවා දෙපාර්තමේන්තුව)	සමාධි නිවහන ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය ඌව පලාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව, හාලි ඇළ, උඩුවර	072 3930891	46
11	විමෝචන ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය	විමෝචන ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය නව කල්මුණේ පාර, මඩකලපුව	077 6684671	103
12	බෙතෙස්දා පුනර්ජීවන ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය	බෙතෙස්දා පුනර්ජීවන ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය අංක 60/14, ෆාතිමා වත්ත, දලුවකොටුව, කොච්චිකඩේ	077 3955286	පිරිමි - 1401 කාන්තා - 31
13	යෞවන කිතුමඟ ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය	යෞවන කිතුමඟ ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය අංක 289/1/ඒ, කලු අඳුර, හේවාඉන්න, අවිස්සාවේල්ල	077 7250754	165

14	පැතුම ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය	පැතුම ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය මල්වත්ත, සියඹලාගොඩ, පොල්ගස්ඕවිට	077 7368332	මිදුම ප්‍රතිකාර මධ්‍යස්ථානයට ඇතුළත් කර ගනු ලබන සේවාලාභීන් මාස 06ක ප්‍රතිකාර කාලයෙන් පසු වෘත්තීය පුහුණුව සඳහා මෙම මධ්‍යස්ථානයට යොමු කරනු ලබයි.
15	අල් අනෝ ක්ලබ් ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය	අල් අනෝ ක්ලබ් ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය වාස් සෙන්ටර්, එෆ්. ආර්. ඩයස් මාවත, වෙන්නප්පුව	077 7898232	21
16	නවජීවන අමද්‍යප හඬ සේවය ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය	නවජීවන අමද්‍යප හඬ සේවය ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය උණවටුන, ගාල්ල	077 1277474 077 9563207	573
17	පොරොන්දු දේශය ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය	පොරොන්දු දේශය ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය අංක 389/බී, මාදම්පිටිය, කොළඹ 14	077 6763138 072 9870969	517
18	ක්‍රාඩා ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය	ක්‍රාඩා ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය කුඩා දුම්රියපොල පාර, තොට්ටවැලි ෆාම්, මන්නාරම	077 0724838 077 9819355	116
19	අඳුරින් ආලෝකය ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය	අඳුරින් ආලෝකය ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය නො.56, නැගෙනහිර කලුවරිප්පුව, කටාන	077 7222974	127

20	සතුට බලාපොරොත්තුවේ සේවය ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය	සතුට බලාපොරොත්තුවේ සේවය ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය නාවින්න වත්ත, කඩිගාව, රස්නායකපුර	076 5821740	139
21	නවජීවන ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය	නවජීවන ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය නිශ්ශංක මල්ලවපුර, පොළොන්නරුව	076 7727680	47
22	සිලෝවම් ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය	සිලෝවම් ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය දලුපොත, මීගමුව	077 1146266 071 1258090	273
23	මිතුරු සෙවන ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය	මිතුරු සෙවන ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය, නො. 607/10, පිටිපන හන්දිය, හෝමාගම	077 8144414	33
24	සිරිපා සෙවණ ප්‍රතිකාර මධ්‍යස්ථානය	මනෝජ් ගනේපල්ල මහතා සිරිපා සෙවණ ප්‍රතිකාර මධ්‍යස්ථානය, කුරුවිට	071 1100501 076 0214377	63
25	ජීවනදිය අමද්‍යප සංවිධානය පුනරුත්ථාපන මධ්‍යස්ථානය	ජීවනදිය අමද්‍යප සංවිධානය පුනරුත්ථාපන මධ්‍යස්ථානය, නො. 275/19, බේස්ලයින් පාර, අමන්දොලුව, සීදුව	077 1388347	49
ප්‍රතිකාර ලබාගත් මුළු සේවාලාභීන් සංඛ්‍යාව				**4,605**

2022 වර්ෂය තුළ පෞද්ගලික මත්ද්‍රව්‍ය ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානවලින් සේවාලාභීන් 4605 දෙනෙක් ප්‍රතිකාර ලබාගෙන ඇති බව වාර්තා විය. මෙම සේවාලාභීන් ප්‍රතිකාර කාලසීමාව අවසන් වූ පසු නැවත සමාජගත කිරීම සිදුකරනු ලබයි. එහිදී මත්ද්‍රව්‍යවලින් නිදහස් වූ පුද්ගලයින්හට යහපත් පවුල් ජීවිතක් ළඟාකර ගත හැකි අතර, දරුවන්ගේ අධ්‍යාපන කටයුතුවල දියුණුවක් සහ මූල්‍යමය ගැටලුවලින් මිදී සාමකාමී ජීවිතයක් ගත කිරීමේ හැකියාව ලැබේ.

නාමෝදිෂ්ඨ ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථාන සඳහා 2022 වර්ෂයේ දී මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙන් ඇතුළත් වී ඇති රැඳවියන් සංඛ්‍යාව

	නාමෝදිෂ්ඨ ප්‍රතිකාර මධ්‍යස්ථානය	ලිපිනය	දුරකථන අංකය	රැඳවියන් සංඛ්‍යාව
01	පල්ලේකැලේ එළිමහන් සිරකඳවුර	පල්ලේකැලේ එළිමහන් සිරකඳවුර පල්ලෙකැලේ, කුන්ඩසාලේ	081 4677546	1053
02	වටරැක බන්ධනාගාරය	වටරැක බන්ධනාගාරය බස්නාහිර පලාත, මීගොඩ	0114 677517	312
03	තරුණ වරදකරුවන්ගේ විශෝධන මධ්‍යස්ථානය	තරුණ වරදකරුවන්ගේ විශෝධන මධ්‍යස්ථානය තල්දෙන, බදුල්ල	055 3128437	555
04	වීරවිල එළිමහන් සිරකඳවුර	වීරවිල එළිමහන් සිරකඳවුර වීරවිල	047 4933609 047 4927832	635
05	අනුරාධපුර බන්ධනාගාරය	අනුරාධපුර බන්ධනාගාරය අනුරාධපුර	025 4677501	195
06	තරුණ වරදකරුවන්ගේ විශෝධන මධ්‍යස්ථානය	තරුණ වරදකරුවන්ගේ විශෝධන මධ්‍යස්ථානය පල්ලන්සේන, දළුපොත, මීගමුව	031 4677501	4896
07	කන්දෙවත්ත එළිමහන් සිරකඳවුර	කන්දෙවත්ත එළිමහන් සිරකඳවුර කන්දෙවත්ත, මීතිරිගල	011 4677545 011 4677576	185
08	මීතිරිගල එළිමහන් වැඩකඳවුර	මීතිරිගල එළිමහන් වැඩකඳවුර මීතිරිගල	011 4677545 011 4677578	මීතිරිගල බන්ධනාගාරයේ රැඳවියන් කන්දෙවත්ත බන්ධනාගාරය වෙත ඇතුළත් කර ඇත.
09	කලුතර බන්ධනාගාරය	කලුතර බන්ධනාගාරය කලුතර	034 4939552	1426

10	පබෝධා මෙත්සෙවන ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය	පබෝධා මෙත්සෙවන ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය අඹේපුස්ස	035 4677525	282
11	කන්දකාඩු ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය	කන්දකාඩු ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය කන්දකාඩු	024 3244959	1287
ඇතුළත් වූ මුළු සේවාලාභීන් සංඛ්‍යාව				**10,826**

නාමෝදිෂ්ඨ හා පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන අංශයේ 2021/2022 වර්ෂයන්හි භෞතික හා මූල්‍ය ප්‍රගතිය සන්සන්දනාත්මකව ඉදිරිපත් කිරීම

වර්ෂය	භෞතික ප්‍රගතිය	මූල්‍ය ප්‍රගතිය
2021	56%	5%
2022	76%	29%

2021 වර්ෂය තුළ රට පුරා කොවිඩ් 19 වසංගතය පැතිරයාම හේතුවෙන් ක්‍රියාකාරී සැලැස්ම අනුව යෝජිත වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන තුළට හා නාමෝදිෂ්ඨ ප්‍රතිකාර මධ්‍යස්ථාන තුළට ඇතුළුවීමේදී අපහසුතා ඇතිවීම හා වරින් වර රට වසා දැමීම හේතුවෙන් සැලසුම් කරන ලද වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ගැටලු ඇති විය. එබැවින් 2021 වර්ෂයේ භෞතික ප්‍රගතිය 56%ක් වූ අතර මූල්‍ය ප්‍රගතිය 5% විය. 2022 වර්ෂයේ භෞතික ප්‍රගතිය 76% දක්වා ප්‍රගමනයක් පෙන්නුම් කරනු ලැබූ අතර, මූල්‍ය ප්‍රගතිය 29%ක් විය.

11.5 පර්යේෂණ අංශය

මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය අවම කිරීම සහ මත්ද්‍රව්‍ය භාවිතයෙන් සිදුවන හානිය අවම කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සකස් කිරීම සහ වැඩසටහන් සැලසුම් කිරීමට අවශ්‍ය සාක්ෂි මත පදනම් වූ නිර්දේශ සම්පාදනය කිරීම පර්යේෂණ අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ. 1984 අංක 11 දරන අන්තරායදායක ඖෂධ පාලනය කිරීමේ ජාතික මණ්ඩලය පනතේ වගන්ති අංක 07 (ඊ) ප්‍රකාරව අන්තරායකර ඖෂධ දුර්භාවිතය ව්‍යාප්තියට හේතු සාධක සහ ඒ හා බැඳුණු නෛතික, වෛද්‍ය විද්‍යාත්මක, සමාජයීය, සංස්කෘතික හා ආර්ථික කරුණු පිළිබඳ වූ පර්යේෂණ අධ්‍යයනයන් පැවැත්වීම හරහා පර්යේෂණ අංශය එම කාර්යය සිදුකරනු ලබයි.

පර්යේෂණ අංශය 2022 වර්ෂය තුළ දී පහත සඳහන් ප්‍රධාන උපායමාර්ග හය (06) යටතේ කාර්යයන් සිදු කරනු ලැබිණ.

1. පර්යේෂණ අධ්‍යයන හා සමීක්ෂණ පැවැත්වීම
2. පර්යේෂණ ප්‍රකාශන
3. පුහුණු වැඩමුළු හා පර්යේෂණ අනාවරණ ඉදිරිපත් කිරීම
4. අන්තර්ජාතික ආයතන සමඟ තොරතුරු හුවමාරුව
5. දත්ත පද්ධති කළමනාකරණය
6. ප්‍රවණතා විශ්ලේෂණය

11.5.1 පර්යේෂණ අධ්‍යයන සහ සමීක්ෂණ

I. ප්‍රතිකාර සහ පුනරුත්ථාපන මධ්‍යස්ථානවල ප්‍රමිතීන් පිළිබඳ තක්සේරුකරණ අධ්‍යයනය

2007 අංක 54 දරන ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපනය) පිළිබඳ පනත ප්‍රකාරව රාජ්‍ය හා රාජ්‍ය නොවන ප්‍රතිකාර සේවාවන් සපයන ආයතන විසින් අපේක්ෂිත අවම ප්‍රමිතීන් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් තක්සේරු කිරීමේ ප්‍රධාන පරමාර්ථය සහිතව ක්‍රියාත්මක කරන ලද මෙම අධ්‍යයනයේ දී සියලු රාජ්‍ය හා රාජ්‍ය නොවන ප්‍රතිකාර මධ්‍යස්ථාන (26) නියැදිය වශයෙන් යොදාගෙන තිබේ. එම අධ්‍යයනයේ දී ඉහත පනත මගින් නිර්දේශිත ප්‍රමිතීන් මෙන්ම එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ කාර්යාලය (United Nations Office on Drug and Crime) විසින් නිර්දේශිත ජාත්‍යන්තර ප්‍රමිතීන් සම්බන්ධයෙන් ද අවධානය යොමු කරමින් එම ප්‍රමිතීන් සමග ප්‍රායෝගිකව අනුගත වන ආකාරය සහ එම ප්‍රමිතීන්ගෙන් අපගමනය වන ආකාරය මෙම තක්සේරුකරණ අධ්‍යයනයේ දී අවධානයට ලක්කර ඇත.

සාරාංශය

අධ්‍යයනයට ලක් කරන ලද බහුතර ප්‍රතිකාර මධ්‍යස්ථානවල අනුමත ප්‍රමිතීන්ට අනුකූලව අවශ්‍ය යටිතල පහසුකම් සලසා ඇත. රාජ්‍ය අංශය යටතේ ක්‍රියාත්මක වන ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානවල ප්‍රතිකාර සේවාවන් සඳහා දායකත්වය දක්වන අභ්‍යන්තර ස්ථීර කාර්ය මණ්ඩලයට සාපේක්ෂව පෞද්ගලික ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථාන තුළ අභ්‍යන්තර ස්ථීර කාර්ය මණ්ඩලය අවම මට්ටමකින් ක්‍රියාත්මක වේ. ප්‍රතිකාර ක්‍රියාවලියෙහි ගුණාත්මකභාවය හොඳින් පවත්වාගෙන යාම සඳහා වෘත්තීය දැනුමෙන් පරිපූර්ණ විවිධ විෂයන්වලට අයත් බාහිර සම්පත්දායකයන්ගෙන් සේවාවන් ලබා ගැනීම බහුතරයක් ප්‍රතිකාර මධ්‍යස්ථාන තුළ අවම මට්ටමක පවතී. කාන්තාවන් සඳහා නේවාසික ප්‍රතිකාර ලබා දීමේ පහසුකම් ප්‍රතිකාර මධ්‍යස්ථාන 03ක පමණක් ඇත. මත්ද්‍රව්‍ය ඇබ්බැහිකාරීත්වය සඳහා යොමු වූ විශේෂ කණ්ඩායම්වලට අවශ්‍ය ප්‍රතිකාර සේවාවන් සැපයීම ද අවම මට්ටමින් ක්‍රියාත්මක වේ. විධිමත් අනාවරණ පරීක්ෂණයක් මත පදනම්ව ඇබ්බැහිකාරීත්වයේ මට්ටම නිර්ණය කරමින් ප්‍රතිකාර සේවාවන්ට ඇතුළත් කර ගැනීමේ ක්‍රමවේදයක් ප්‍රතිකාර මධ්‍යස්ථාන 12ක පමණක් ක්‍රියාත්මක කරනු ලබයි. ප්‍රතිකාර මධ්‍යස්ථානවල මූල්‍ය තත්ත්වයන් විගණනය කිරීම මධ්‍යස්ථාන 22ක පමණක් ක්‍රියාත්මක වේ.

II. අධි අවදානම් කණ්ඩායම් අතර නව මත්ද්‍රව්‍ය භාවිත රටාවන් සහ චර්යාවන් සම්බන්ධ හරස්කඩ අධ්‍යයනය (කොළඹ සහ තදාසන්න ප්‍රදේශ ඇසුරින්)

මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් සහ ඒ ආශ්‍රිත චර්යාවන් සම්බන්ධයෙන් හඳුනාගත් අධි අවධානම් කණ්ඩායම් (High Risk Groups) ආශ්‍රිත මත්ද්‍රව්‍ය භාවිතය මෙන්ම මත්ද්‍රව්‍ය භාවිතය හා බැඳි චර්යා රටා සම්බන්ධයෙන් අධ්‍යයනය කර අදාළ නිර්දේශ ඉදිරිපත්කිරීමේ අරමුණින් මෙම අධ්‍යයනය ක්‍රියාත්මක කර ඇත. බීච් බෝයිස් කණ්ඩායම, ලිංගික දිශානතීන් වශයෙන් විවිධත්වයක් දක්වන කණ්ඩායම්, වාණිජ ලිංගික වෘත්තියේ නියැලෙන පුද්ගලයින්, මත්ද්‍රව්‍ය එන්නත් කර ගන්නා පුද්ගලයින්, සමාජශාලා සාදවලට සහභාගි වන පුද්ගලයින් වැනි එකිනෙකට වෙනස් වූ අනන්‍යතාවයක් සහිත කණ්ඩායම්වලට අයත් පුද්ගලයින් 68 දෙනෙකු ආශ්‍රයෙන් මෙම අධ්‍යයනය සිදුකරන ලදි.

සාරාංශය

අධ්‍යයනය සඳහා යොදා ගන්නා ලද සියලු කණ්ඩායම් මත්ද්‍රව්‍ය භාවිතය ආශ්‍රිතව පවතින අධි අවදානම් චර්යාවන් හඳුනා ගන්නා ලද අතර මත්ද්‍රව්‍ය භාවිතය සමඟ ලිංගික ක්‍රියාකාරකම්වල යෙදීමේදී අනාරක්ෂිතව හැසිරීම, HIV ඇතුළු ලිංගාශ්‍රිතව බෝවන රෝග පැතිරීමේ අවදානම, මත්ද්‍රව්‍ය භාවිත කර ලිංගික ඇසුර පැවැත්වීම (Chemsex), HIV රෝගය සමග ජීවත් වන්නන් මත්ද්‍රව්‍ය භාවිතය සමග අනාරක්ෂිත තත්ත්වයට පත් වීම ආදී වූ චර්යාවන් හඳුනා ගන්නා ලදි.

III. කොවිඩ් - 19 වසංගත තත්ත්වය සහ ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය දුර්භාවිතය ආශ්‍රිත ප්‍රවණතා

ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින්ගේ මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි කොවිඩ් 19 වසංගතයේ බලපෑම කෙබඳු ද? යන්න පිළිබඳව මෙහි දී අධ්‍යයනය කරන ලදි. කොවිඩ් 19 වසංගත තත්ත්වය තුළ මත්ද්‍රව්‍ය භාවිතයෙන් මිදීම සඳහා ප්‍රතිකාරවලට ඇතුළත්වීම් සහ මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදි සඳහා අත්අඩංගුවට පත්වීම් පිළිබඳ ප්‍රවණතා හඳුනාගැනීම සහ කොවිඩ් 19 වසංගත තත්ත්වය තුළ මත්ද්‍රව්‍ය ව්‍යාප්තිය සහ මත්ද්‍රව්‍ය ජාවාරම වැනි සාධක පිළිබඳ දැනට පවතින තත්ත්වය හඳුනාගැනීම අධ්‍යයනයේ සුවිශේෂී අරමුණු විය.

සාරාංශය

කොවිඩ් - 19 වසංගත තත්ත්වයට පෙර සහ පසු අවස්ථාවන් සලකා බැලීමේ දී මත්ද්‍රව්‍ය ව්‍යාප්තියේ සුවිශේෂී වෙනසක් නිරීක්ෂණය නොවුණු අතර මත්ද්‍රව්‍ය ජාවාරම සම්බන්ධ ප්‍රවාහන මාධ්‍යවල වෙනස්කම් සිදුව ඇත. නමුත් එය සාමාන්‍යකරණය කළ හැකි තත්ත්වයක් නොවන අතර අවස්ථානුකූලව යම් යම් ප්‍රදේශවලින් වාර්තා වී ඇති සිද්ධීන් පමණි. කොවිඩ් 19 වසංගත කාලසීමාව තුළ ප්‍රතිකාර සේවාවන්ට වාර්තා වීම සම්බන්ධයෙන් අවම ප්‍රවණතාවයක් හඳුනාගත හැකිය.

IV. කාන්තා මත්ද්‍රව්‍ය භාවිතයෙහි ව්‍යාප්තිය පිළිබඳ සමීක්ෂණය - 2022

ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය භාවිත කරන කාන්තා ජනගහනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස/ පොලිස් කොට්ඨාස මට්ටමින් ඇස්තමේන්තුගත කිරීම හා එමඟින් කාන්තා මත්ද්‍රව්‍ය භාවිතයෙහි ව්‍යාප්තිය හඳුනාගැනීම, මත්ද්‍රව්‍ය භාවිත කරන කාන්තාවන්ගේ සමාජ ප්‍රජා විද්‍යාත්මක පැතිකඩ හඳුනාගැනීම, ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය භාවිත කරන කාන්තාවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය ආශ්‍රිත නව ප්‍රවණතා හඳුනාගැනීම සහ මත්ද්‍රව්‍ය භාවිත කරන බවට තහවුරු වූ කාන්තාවන් ප්‍රතිකාර හා පුනරුත්ථාපන සේවාවන් සඳහා යොමු කිරීම අරමුණු කරගනිමින් ක්‍රියාත්මක කරන ලද මෙම අධ්‍යයනයට අදාළ දත්ත බන්ධනාගාර මට්ටමින් රැස්කරන ලද අතර පර්යේෂණ වාර්තාව සම්පාදනය කරමින් පවතී.

V. මත්ද්‍රව්‍ය පාලනය, නිවාරණය ප්‍රතිකාර හා පුනරුත්ථාපනය සම්බන්ධ සමස්ත යාන්ත්‍රණය සම්බන්ධ ගැටලු සහ අභියෝග හඳුනාගැනීම සඳහා වන තක්සේරුකරණය - 2021/2022

ප්‍රතිපත්ති/ නීති/ පනත් සහ මාර්ගෝපදේශ නිසි පරිදි ක්‍රියාත්මක වීම සමාලෝචනය කිරීම, ආයතන අතර සම්බන්ධීකරණය පවත්වාගැනීම සම්බන්ධව සමාලෝචනය කිරීම සහ සැලසුම්කරණය (planning) හා අධීක්ෂණය (Evaluation) නිසි පරිදි ක්‍රියාත්මක වීම සම්බන්ධව සමාලෝචනය කිරීම යන අරමුණු මත මත්ද්‍රව්‍ය පාලනය සම්බන්ධ නීති සම්පාදන ආයතන (15), ප්‍රතිකාර හා පුනරුත්ථාපන ආයතන (15), මත්ද්‍රව්‍ය නිවාරණය සම්බන්ධ ආයතන (25) සහ ජාතික මට්ටමේ විද්වතුන් (5) දෙනෙක් ඇතුළත්ව මෙම අධ්‍යයනය ක්‍රියාත්මක කරන ලදි.

VI. මත්ද්‍රව්‍ය භාවිතය සඳහා ඇබ්බැහිවූ පුද්ගලයින්ගේ සෞඛ්‍ය චර්යාවන් පිළිබඳ අධ්‍යයනය

මත්ද්‍රව්‍ය භාවිතය සඳහා ඇබ්බැහිවූ පුද්ගලයින්ගේ අවදානම් සෞඛ්‍ය චර්යාවන් හඳුනාගැනීම සහ යහපත් සෞඛ්‍ය චර්යාවන් ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය මැදිහත්වීම් යෝජනා කිරීම මෙම

අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වූ අතර මත්ද්‍රව්‍ය භාවිතය සඳහා ඇබ්බැහිවූ පුද්ගලයින්ගේ දෛනික ජීවන රටාවන්වල පවතින වෙනස්කම් හඳුනාගැනීම, අවදානම් සෞඛ්‍ය චර්යාවන් හේතුවෙන් ඇති වී තිබෙන රෝගී තත්ත්වයන් හඳුනාගැනීම, යහපත් සෞඛ්‍ය සම්බන්ධයෙන් පවතින දැනුවත්භාවය මිනුම් කිරීම සෙසු සුවිශේෂී අරමුණු විය. මානසික සෞඛ්‍ය සායන කිහිපයක් අධ්‍යයන ක්ෂේත්‍රය ලෙස තෝරා ගනිමින් මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වී සිටින පුද්ගලයන් ඇසුරින් මෙම අධ්‍යයනය ක්‍රියාත්මක කර ඇත.

VII. මෙතැම්පිටමින් (අයිස්) භාවිතයේ ව්‍යාප්තිය පිළිබඳ ජාතික සමීක්ෂණය - 2022

ශ්‍රී ලංකාවේ මෙතැම්පිටමින් භාවිත කරන පුද්ගලයින්ගේ ව්‍යාප්තියේ ස්වභාවය කෙබඳු ද? යන්න මෙම අධ්‍යයනයේ ගැටලුව වන අතර ශ්‍රී ලංකාවේ මෙතැම්පිටමින් භාවිත කරන ජන සංඛ්‍යාව භූගෝලීය ප්‍රදේශ මට්ටමින් ඇස්තමේන්තුගත කිරීම, ස්ත්‍රී පුරුෂභාවය වයස වැනි ප්‍රජා විද්‍යාත්මක නිර්ණායක අනුව මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය සංසන්දනාත්මකව මිනුම් කිරීම පර්යේෂණයේ ප්‍රධාන අරමුණු වේ. පොලිස් දෙපාර්තමේන්තුව සමග ඒකාබද්ධව මෙම සමීක්ෂණය ක්‍රියාත්මක කරනු ලබන අතර ඒ අනුව දිවයිනේ සියලුම පොලිස් කොට්ඨාස මට්ටමින් ප්‍රජා පොලිස් නිලධාරීන්ගේ සෘජු මැදිහත්වීම හරහා දත්ත රැස්කිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී.

VIII. දරුවන්ගේ මනෝ සමාජයීය සංවර්ධනය කෙරෙහි දෙමාපියන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයේ බලපෑම

දෙමව්පියන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය දරුවන්ගේ මනෝ සමාජයීය සංවර්ධනය කෙරෙහි බලපාන ආකාරය අධ්‍යයනය කිරීම මෙම අධ්‍යයනයෙහි ප්‍රධාන අරමුණ වූ අතර දෙමව්පියන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය තුළින් පවුලට සිදුවන බලපෑම අධ්‍යයනය කිරීම, දෙමව්පියන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය තුළින් දරුවන්ට ඇති වී තිබෙන මනෝ සමාජයීය ගැටළු සුවිශේෂීව හා වෙන් වෙන් වශයෙන් හඳුනා ගැනීමත්, දරුවන්ට ඇති වී තිබෙන මනෝ සමාජයීය ගැටළු හේතුවෙන් ඔවුන් මුහුණ දෙන වෙනත් ගැටළු හඳුනා ගැනීමත් අධ්‍යයනයේ අරමුණු බවට පත්විය.

IX. නීති විරෝධී ගංජා වගාව ආශ්‍රිත සමාජ ආර්ථික තත්ත්වය පිළිබඳ අධ්‍යයනය (මොණරාගල සහ හම්බන්තොට දිස්ත්‍රික්ක ඇසුරෙන්)

නීති විරෝධී ලෙස ගංජා වගා කිරීම සඳහා යොමුවී සිටින පුද්ගලයින්ගේ සමාජ ආර්ථික තත්ත්වය සහ නීති විරෝධී ගංජා වගාව සඳහා යොමුවීම කෙරෙහි බලපාන සාධක හඳුනාගැනීම සඳහා මෙම අධ්‍යයනය සිදු කරන ලදි. මොණරාගල හා හම්බන්තොට දිස්ත්‍රික්ක මූලික කරගනිමින් සිදු කළ මෙම අධ්‍යයනය සඳහා පුද්ගලයින් 30 දෙනෙකු අරමුණු සහගත නියැදි ක්‍රමය යටතේ තෝරාගන්නා ලද අතර ව්‍යුහගත ප්‍රශ්නාවලියක් යොදා ගනිමින් දත්ත එක්රැස් කරන ලදි. මේ වනවිට පර්යේෂණ වාර්තාව සකස් කරමින් පවතී.

X. ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ තත්ත්ව විශ්ලේෂණය

මත්ද්‍රව්‍ය දුර්භාවිතය පිළිබඳ තත්ත්ව විශ්ලේෂණය සහ වැඩසටහන් සැලසුම්කරණයට අදාළ අවශ්‍යතා හඳුනාගැනීම අරමුණු කරගනිමින් ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ මත්ද්‍රව්‍ය ප්‍රචලිතබව/ සුලභතාවය ඇගයීම සහ මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් උද්ගතව ඇති සමාජ ගැටලු හා අවදානම් තත්ත්ව හඳුනාගැනීම මෙම අධ්‍යයනයේ අරමුණ විය.


සාරාංශය

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සෙසු වසම්වලට සාපේක්ෂව ඔබේසේකරපුර, බණ්ඩාරනායකපුර, ඇතුල්කෝට්ටේ, වැලිකඩ බටහිර සහ පිටකෝට්ටේ යන ග්‍රාම නිලධාරී වසම්වල මත්ද්‍රව්‍ය භාවිතය ඉහළ මට්ටමක පවතින අතර නුගේගොඩ, නාවල බටහිර, පිටකෝට්ටේ බටහිර සහ කොස්වත්ත යන ග්‍රාම නිලධාරී වසම්වල මත්ද්‍රව්‍ය භාවිතය සාපේක්ෂව අවම මට්ටමක පවතී. පුද්ගලයින්ගේ මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් පවුල් පරිසරය හා සම්බන්ධ ගැටලු, ළමුන් හා සම්බන්ධ ගැටලු, ආර්ථිකය හා සම්බන්ධ ගැටලු හා මානසික ගැටලු ලෙස විවිධ සමාජයීය ගැටලු ප්‍රදේශය තුළ නිර්මාණය වී ඇත.

ප්‍රදේශයේ පුද්ගලයින්ගේ මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් පාසල් අවට යම් අවදානම් තත්ත්වයක් පවතින බව හඳුනාගත හැකි අතර විශේෂයෙන් ඔබේසේකරපුර හා බණ්ඩාරනායකපුර අවට ඇති පාසල් සඳහා දැඩි අවදානම් තත්ත්වයක් පවතින බව තොරතුරු අනාවරණය වී ඇත. ප්‍රදේශය තුළ මත්ද්‍රව්‍ය භාවිත අවම කිරීම සඳහා සැපයුම අඩාල කිරීම සඳහා නීතිය ක්‍රියාත්මක කිරීම, නිවාරණ හා උපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් පුනරුත්ථාපනයෙන් පසු වෘත්තීය පුහුණු සහ අවස්ථාවන් සහිතව ඵලදායී ලෙස නැවත සමාජගත කිරීම සඳහා සියලු ආයතන ඒකාබද්ධ වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු බව සහ ඊට අදාළව ප්‍රමුඛතාවය ලබාදිය යුතු කාර්යයන් සම්බන්ධයෙන් ද අදාළ වාර්තාව හරහා ඉදිරිපත් කරන ලදි.

11.5.2 පර්යේෂණ ප්‍රකාශන

I. මත්ද්‍රව්‍ය දුර්භාවිත තොරතුරු අත්පොත - 2022




2021 වර්ෂය සහ ඊට පෙර වර්ෂ 04කට අදාළ මත්ද්‍රව්‍ය දුර්භාවිතය සම්බන්ධ විවිධ නිර්ණායක යටතේ දත්ත ඇතුළත් කර මත්ද්‍රව්‍ය දුර්භාවිත තොරතුරු අත්පොත සම්පාදනය කර ඇත. ශ්‍රී ලංකාව තුළ මත්ද්‍රව්‍ය නීතිය ක්‍රියාත්මක කරන ආයතන, ප්‍රතිකාර සේවාවන් සපයනු ලබන ආයතන සහ මත්ද්‍රව්‍ය නිවාරණය හා පාලනය සම්බන්ධයෙන් කටයුතු කරනු ලබන ආයතන මඟින් ඉදිරිපත් කරනු ලබන මත්ද්‍රව්‍ය දුර්භාවිතය සම්බන්ධයෙන් විවිධ නිර්ණායකවලට අදාළ දත්ත විශ්ලේෂණාත්මකව ඉදිරිපත් කර ඇත. මත්ද්‍රව්‍ය දුර්භාවිත තොරතුරු අත්පොත 2022 මුද්‍රණය සඳහා යොමු කොට ඇත.

පහත නිර්ණායක ඔස්සේ මත්ද්‍රව්‍ය දුර්භාවිතය පිළිබඳ දත්ත විශ්ලේෂණාත්මකව ඉදිරිපත් කර ඇත.

- මත්ද්‍රව්‍ය සම්බන්ධ අත්අඩංගුවට ගැනීම්
- මත්ද්‍රව්‍යවල මිල ගණන්
- වෛද්‍යමය අරමුණු සඳහා ගංජා නීත්‍යානුකූල පරිභෝජනය
- මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදි සඳහා බන්ධනාගාරගතවීම්
- ප්‍රතිකාර සඳහා ඇතුළත්වීම්
- මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් රෝහල්ගත වූ පුද්ගලයින්ගේ තොරතුරු
- HIV සහ ඒඩ්ස් සම්බන්ධ තොරතුරු
- පූර්ව රසායන ආනයනය සහ අපනයනය පිළිබඳ තොරතුරු
- මද්‍යසාර සහ දුම්කොළ ආශ්‍රිත තොරතුරු
- මත්ද්‍රව්‍ය සම්බන්ධ අපරාධ
- මත්ද්‍රව්‍ය ආශ්‍රිත රථවාහන අනතුරු

ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය දුර්භාවිතය පිළිබඳ පර්යේෂණ ලිපි එකතුව - VI වන වෙළුම



"මත්ද්‍රව්‍ය භාවිතය" සම්බන්ධ විවිධ දිශානතීන් ඔස්සේ ක්‍රියාත්මක කරන ලද අධ්‍යයන/ සමීක්ෂණ කිහිපයක වාර්තා සංගෘහිත කරමින් "ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය දුර්භාවිතය පිළිබඳ පර්යේෂණ ලිපි එකතුව - VI වන වෙළුම" සම්පාදනය කර ඇත. සාක්ෂි මත පදනම් වූ ප්‍රවේශයන්, ප්‍රතිපත්ති සම්පාදනය සහ වැඩසටහන් සැලසුම්කරණය සඳහා වඩාත් ඵලදායී ලෙස යොදා ගැනීම තහවුරු කිරීම සහ මත්ද්‍රව්‍ය දුර්භාවිතය පිළිබඳ අධ්‍යයන හා පර්යේෂණ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන පාර්ශවයන්ට අවශ්‍ය පරිශීලන මූලාශ්‍රයක් වශයෙන් සමාජගත කිරීමේ අරමුණින් මෙම පර්යේෂණ වාර්තා ප්‍රකාශයට පත් කර ඇත. පහත සමීක්ෂණ අධ්‍යයන මෙහි අන්තර්ගත කර ඇත.

- මෙතැම්පිටමින් (අයිස්) භාවිතය ආශ්‍රිත ප්‍රවණතා පිළිබඳ සමීක්ෂණය
- විශ්වවිද්‍යාල සිසුන් අතර මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ සමීක්ෂණය
- තරුණයින් හා නව යොවුන්වියේ පුද්ගලයින්ගේ මත්ද්‍රව්‍ය භාවිතය ආශ්‍රිත මනෝ සමාජ ලක්ෂණ පිළිබඳ අධ්‍යයනය
- දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන භාවිතය හා ඒ ආශ්‍රිත ප්‍රවණතා පිළිබඳ අධ්‍යයනය
- මත්ද්‍රව්‍ය භාවිත අක්‍රමතා සඳහා ප්‍රතිකාර ලබාගත් සේවාලාභීන් නැවත භාවිතයට යොමුවීම සඳහා බලපාන සාධක හඳුනා ගැනීම සහ ප්‍රතිකාර ක්‍රියාවලියේ ප්‍රතිඵලදායක බව පිළිබඳ සමීක්ෂණය

II. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ "Newsletter" කාර්තුමය සඟරාව



අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය විසින් සිදු කරනු ලබන සේවාවන් ප්‍රවර්ධනය කරමින් සාමාන්‍ය ජනතාවගේ අවධානය මත්ද්‍රව්‍ය නිවාරණ හා පාලන යාන්ත්‍රණය වෙත ලබාගැනීම සඳහාත් එමෙන්ම ආයතනය විසින් ක්‍රියාත්මක කරනු ලබන විවිධ වැඩසටහන්, ක්‍රියාකාරකම් හා සේවාවන් සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීමත් මෙම කාර්තුමය සඟරාව ප්‍රකාශයට පත් කිරීමේ ප්‍රධාන පරමාර්ථ වේ. 2022 වර්ෂය තුළ 31 වන කලාපය (ජනවාරි - මාර්තු), 32 වන කලාපය (අප්‍රේල් - ජුනි) සහ 33 වන කලාපය (ජූලි - සැප්තැම්බර්) එළිදක්වා අදාළ ආයතන වෙත යොමුකරන ලද අතර 34 වන කලාපය (ඔක්තෝම්බර් - දෙසැම්බර්) සම්පාදනය කරමින් පවතී.

III. ශාස්ත්‍රීය ලිපි සම්පාදනය

- ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය භාවිත තත්ත්වය
- ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය භාවිතය ආශ්‍රිත අත්අඩංගුවට ගැනීම්
- තිරසාර හෙටක් උදෙසා ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාව
- සමාජ අවමානය සහ අපකීර්තිය මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන්ගේ අනන්‍යතාවයට බලපාන ආකාරය (න්‍යායාත්මක පැහැදිලි කිරීමක්)

11.5.3 පුහුණු වැඩමුළු හා පර්යේෂණ අනාවරණ ඉදිරිපත් කිරීම

මත්ද්‍රව්‍ය දූර්භාවිතය පිළිබඳ ජාත්‍යන්තර පර්යේෂණ සැසිය - 2022

මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය විසින් 2022 දෙසැම්බර් මස 1 සහ 2 යන දෙදින තුළ මත්ද්‍රව්‍ය දූර්භාවිතය පිළිබඳ ජාත්‍යන්තර පර්යේෂණ සැසිය සාර්ථකව පවත්වන ලදි. The Colombo Plan සහ Japan International Cooperation Agency යන ආයතන පර්යේෂණ සැසියේ ප්‍රධාන පාර්ශවකරුවන් විය. එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ කාර්යාලය (UNODC) විසින් තාක්ෂණික දායකත්වය දක්වන ලදි.

"Joint commitment for creating a drug-free society through best evidence-based practices and innovative approaches"

INTERNATIONAL SYMPOSIUM ON DRUG-RELATED STUDIES 2022
1st and 2nd December 2022
Waters Edge, Sri Lanka

පර්යේෂණ සැසියේ ප්‍රධාන ඉලක්කය වූයේ මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ පර්යේෂණ අනාවරණ ඵලදායී මත්ද්‍රව්‍ය පාලන උපාය මාර්ග සකස් කිරීම, ප්‍රතිපත්ති සම්පාදනය සහ වැඩසටහන් සැලසුම් කිරීම සඳහා ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ පාර්ශවකරුවන් අතර හුවමාරු කර ගැනීම සඳහා පහසුකම් සැලසීමයි. මත්ද්‍රව්‍ය නිවාරණය, ප්‍රතිකාර කිරීම සහ පුනරුත්ථාපනය යන ක්ෂේත්‍රයට අදාළ ප්‍රධාන අංශ 6ක් යටතේ පර්යේෂණ සැසිය පවත්වන ලදි. විද්වතුන්/ පර්යේෂකයන් 100ට අධික පිරිසක් මෙම අවස්ථාවට සහභාගි වූ අතර මත්ද්‍රව්‍ය පාලනය, නිවාරණය, ප්‍රතිකාර සහ පුනරුත්ථාපනය සම්බන්ධ විශේෂඥ දැනුම හුවමාරු කරගනු ලැබිණ. එය නිසැකවම ප්‍රතිපත්ති සම්පාදනය සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමට හැකි වේදිකාවක් විය. ඉදිරිපත් කරන්නන් 44 දෙනෙකුට ඔවුන්ගේ පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කිරීමට අවකාශය ලැබිණ.

පළමුවන සැසි වාරය මත්ද්‍රව්‍ය නිවාරණය සහ ප්‍රතිකාර හා පුනරුත්ථාපනය සඳහා සතිමත් බව ආශ්‍රිත ප්‍රවේශයන් යොදාගැනීම සම්බන්ධයෙන් පැවැත්වුණි. මත්ද්‍රව්‍ය නිවාරණය, මත්ද්‍රව්‍ය නීතිය ක්‍රියාත්මක කිරීම, මත්ද්‍රව්‍ය ප්‍රතිකාර හා පුනරුත්ථාපනය සහ නැවත සමාජගත කිරීම, මත්ද්‍රව්‍ය ආශ්‍රිත විද්‍යාත්මක විශ්ලේෂණය සහ මත්ද්‍රව්‍ය ජාවාරම් සහ මත්ද්‍රව්‍ය දුර්භාවිතය පිටුදැකීමේ තාක්ෂණික අභියෝග යන තේමාවන් යටතේ පර්යේෂකයින් විසින් පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කරනු ලැබිණි.

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ වසර 38ක ඉතිහාසය තුළ පවත්වන ලද ප්‍රථම ජාත්‍යන්තර පර්යේෂණ සම්මන්ත්‍රණය ලෙස මෙය හැඳින්විය හැකිය.





I. පර්යේෂණ අනාවරණ ඉදිරිපත් කිරීමේ සැසි

පර්යේෂණ අංශය විසින් සිදු කරන ලද පර්යේෂණ අධ්‍යයන සහ සමීක්ෂණවල අනාවරණ සහ ඒ ආශ්‍රිත නිර්දේශ සම්බන්ධයෙන් අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ සියලුම තාක්ෂණික නිලධාරීන් සහ බාහිර පාර්ශව දැනුවත් කිරීමේ මූලික පරමාර්ථය ඇතිව 2022 වර්ෂය තුළ පහත මාතෘකා යටතේ පර්යේෂණ අනාවරණ ඉදිරිපත් කර ඇත.

- දුම රහිත දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන භාවිතය සහ වර්තමාන ප්‍රවණතා පිළිබඳ අධ්‍යයනය
- ශ්‍රී ලංකා ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානවල ප්‍රමිතීන් පිළිබඳ තක්සේරුකරණ අධ්‍යයනය

II. මූලික සංඛ්‍යාන ක්‍රම පිළිබඳ පුහුණු වැඩසටහන

පර්යේෂණ අධ්‍යයන සහ සමීක්ෂණ සම්බන්ධයෙන් සහ වෙනත් විශ්ලේෂණාත්මක වාර්තා ඉදිරිපත් කිරීමේදී අවශ්‍ය වන සංඛ්‍යානමය ශිල්ප ක්‍රම සම්බන්ධ ප්‍රායෝගික පුහුණු වැඩසටහනක් පර්යේෂණ නිලධාරීන්ගේ සම්පත් දායකත්වයෙන් පවත්වන ලදි. ආයතනයේ තාක්ෂණික අංශවල නිලධාරීන් ඉලක්ක කරගනිමින් මෙම වැඩසටහන පවත්වන ලදි.

III. ජාතික හා අන්තර්ජාතික පර්යේෂණ සැසි සඳහා පර්යේෂණ සාරසංක්ෂේප (Abstracts) **සහ පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කිරීම**

2021 වසර තුළ පහත සඳහන් පර්යේෂණ පත්‍රිකා ජාතික මට්ටමින් සහ අන්තර්ජාතික මට්ටමින් පවත්වන ලද පර්යේෂණ සැසි සඳහා ඉදිරිපත් කරන ලදි.

අනු අංකය	පර්යේෂණ සැසිය	ඉදිරිපත් කරන ලද පර්යේෂණ පත්‍රිකාව
1	දකුණු ආසියානු සමාජවල සමකාලීන	• තරුණයින්ගේ සහ නව යොවුන්වියේ පසුවන පුද්ගලයින්ගේ මත්ද්‍රව්‍ය භාවිතය ආශ්‍රිත මනෝ සමාජ

	අවිනිශ්චිතතා පිළිබඳ ජාත්‍යන්තර පර්යේෂණ සැසිය - 2022 (කොළඹ විශ්වවිද්‍යාලය)	ලක්ෂණ • බීච් බෝයිස් කණ්ඩායම අතර අලුතින් උද්ගතවන මත්ද්‍රව්‍ය භාවිත රටා සහ අවදානම් හැසිරීම් • කාන්තා ලිංගික ශ්‍රමිකයින් අතර අලුතින් උද්ගතවන මත්ද්‍රව්‍ය භාවිත රටා සහ අවදානම් චර්යා • විශ්වවිද්‍යාල සිසුන් අතර මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය සහ චර්යා රටා
2	**ජාතික පර්යේෂණ සැසිය - 2022 (රජරට විශ්වවිද්‍යාලය)**	• තරුණයින්ගේ සහ නව යොවුන්වියේ පසුවන පුද්ගලයින්ගේ මත්ද්‍රව්‍ය භාවිතය ආශ්‍රිත මනෝ සමාජ ලක්ෂණ • මෙතැම්පිටමින් (අයිස්) භාවිතය ආශ්‍රිත ප්‍රවණතා සහ පුද්ගල චර්යාමය සහ සෞඛ්‍ය ගැටලු පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක් • ගොඩනැගිලි ඉදිකිරීමේ සේවා ස්ථානවල සේවයෙහි නියුතු කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිත ප්‍රවණතා සහ රටා
3	**මත්ද්‍රව්‍ය ආශ්‍රිත අධ්‍යයන පිළිබඳ ජාත්‍යන්තර පර්යේෂණ සැසිය - 2022 (අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය)**	• විශ්වවිද්‍යාල සිසුන් අතර මත්ද්‍රව්‍ය භාවිතය සහ මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි සිසුන්ගේ ආකල්ප • කාන්තාවන් අතර හෙරොයින් භාවිතයේ අලුතින් මතුවන ප්‍රවණතා සහ රටා (කොළඹ දිස්ත්‍රික්කය ඇසුරින්) • ශ්‍රී ලංකාවේ ප්‍රතිකාර සහ පුනරුත්ථාපන මධ්‍යස්ථානවල ක්‍රියාත්මක වන ප්‍රතිකාර ක්‍රම සහ ප්‍රවේශයන් • කොවිඩ් 19 වසංගතය සහ මත්ද්‍රව්‍ය භාවිතය හා සම්බන්ධ ප්‍රවණතා • සමලිංගික පිරිමින්ගේ මත්ද්‍රව්‍ය භාවිත රටා සහ හැසිරීම් පිළිබඳ අධ්‍යයනයක් (කොළඹ සහ තදාසන්න ප්‍රදේශ ඇසුරිනි) • මත්ද්‍රව්‍ය සම්බන්ධ බන්ධනාගාර ඇතුළත්කිරීම් සහ ශ්‍රී ලංකාවේ නව ප්‍රවණතා • පුනරුත්ථාපන ක්‍රියාවලියෙන් පසු නැවත ඇබ්බැහිවීම හා සම්බන්ධ මනෝ සමාජයීය සාධක • මත්ද්‍රව්‍ය දුර්භාවිත අක්‍රමතාවෙන් සුවවීම කෙරෙහි පවුලේ

		බලපෑම • නේවාසික ප්‍රතිකාර සහ පුනරුත්ථාපනයේ පසුවන පුද්ගලයන් තුළ පැවති මත්ද්‍රව්‍ය භාවිත රටාවන් පිළිබඳ අධ්‍යයනයක්: නවදිගන්තය ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය • ජාතික මට්ටමේ මත්ද්‍රව්‍ය දුර්භාවිත කළමනාකරණ දත්ත පද්ධතියක වැදගත්කම: අවශ්‍යතාවය සහ පවතින අභියෝග

IV. පුහුණු වැඩසටහන් පැවැත්වීම

අනු අංකය	වැඩසටහන සහ වැඩසටහන් ගණන	සහභාගීත්වය
1	ප්‍රජා පාදක පුනරුත්ථාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පොලිස් නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන් - 03	ගම්පහ සහ මීගමුව පොලිස් කොට්ඨාස කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොලිස් කොට්ඨාස බස්නාහිර පළාතේ තෝරාගත් පොලිස් කොට්ඨාස
2	කන්දකාඩු පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ නවක නිලධාරීන් සඳහා වන පුහුණු වැඩසටහන - 01	පුනරුත්ථාපන නිලධාරීන්
3	නාවික හමුදා නිලධාරීන් සඳහා වූ පුහුණු වැඩසටහන - 01	නාවික හමුදා නිලධාරීන්
4	ගංජා නීතිගත කිරීමේ අනිසි විපාක - (විවිධ රටවල් ඇසුරින් ලබාගත් සාක්ෂි මත පදනම්ව)	විශ්වවිද්‍යාල ලියෝ සමාජයේ සාමාජිකයින්
5	මනෝවිද්‍යා විශේෂවේදී උපාධි හදාරන සිසුන් සඳහා වූ සීමාවාසික පුහුණු වැඩමුළුව - 01	KAATSU ජාත්‍යන්තර විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයින්
6	KAATSU ජාත්‍යන්තර විශ්වවිද්‍යාලයේ සහයෝගය සහිතව "මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ අක්‍රමතා සහ පුනරුත්ථාපනය වූ පුද්ගලයින් පිළිබඳ අප දන්නා දේ" යන තේමාව යටතේ සිදු කරන ලද පර්යේෂණ අනාවරණ ඉදිරිපත් කිරීමේ වැඩසටහන	
7	මත්ද්‍රව්‍ය උපදේශන සහතික පත් පාඨමාලාව - 67 කණ්ඩායම (නොවැම්බර් 11 සිට දෙසැම්බර් 31 දක්වා)	

මත්ද්‍රව්‍ය ආශ්‍රිත පර්යේෂණ අධ්‍යයන සහ සමීක්ෂණ ක්‍රියාත්මක කිරීම සම්බන්ධ අචාරධර්ම අනුකමිටුවක් ස්ථාපිත කිරීම

මත්ද්‍රව්‍ය දුර්භාවිතය ආශ්‍රිතව විවිධ පුද්ගලයින් සහ ආයතන විසින් විවිධ අරමුණු යටතේ ක්‍රියාත්මක කරනු ලබන පර්යේෂණ අධ්‍යයන සහ සමීක්ෂණ වලදී ඊට අදාළව සැළකිල්ලට භාජනය විය යුතු පර්යේෂණ ආචාරධර්ම සම්බන්ධයෙන් නිර්දේශයන් සහ අනුමැතිය ලබාගැනීම සඳහා අභ්‍යන්තර ආචාරධර්ම අනුකමිටුවක් ස්ථාපිත කිරීමට අවශ්‍ය ව්‍යාපෘති යෝජනාව සකස් කර ඊට අදාළ නිර්දේශ ලබාගෙන ඇත.

11.5.4 අන්තර්ජාතික සහයෝගීතාවය

I. අන්තර්ජාතික මාදක පාලක මණ්ඩලය (International Narcotics Control Board) **සමඟ දත්ත හුවමාරු කිරීම** (INCB)

ශ්‍රී ලංකා රජය විසින් අත්සන් තබා ඇති ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය පාලන සම්මුතීන් ප්‍රකාරව සහ ඊට අනුෂාංගිකව පැන නගින කාරණා සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජය වෙනුවෙන් අදාළ තොරතුරු සහ දත්ත මාසිකව, ත්‍රෛමාසිකව සහ වාර්ෂිකව INCB වෙත යොමු කරනු ලබයි. මත්ද්‍රව්‍ය පාලනය සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන විවිධ ආයතන සම්බන්ධීකරණය කරමින් අවශ්‍ය දත්ත කාලීනව යොමු කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකර ඇත.

ත්‍රෛමාසිකව යොමු කරන ලද දත්ත වාර්තා

- මාදක ඖෂධ ආනයනය හා අපනයනය පිළිබඳ සංඛ්‍යාලේඛන (පෝරමය A) 4 වන කාර්තුව 2021 සහ 1 වන කාර්තුව 2022, 2 වන කාර්තුව 2022, 3 වන කාර්තුව 2022
- 1971 සම්මුතීන් ලැයිස්තු 2හි සඳහන් මනෝවර්ථක ද්‍රව්‍ය ආනයනය හා අපනයනය පිළිබඳ සංඛ්‍යාලේඛන (පෝරමය A/P) 4 වන කාර්තුව 2021 සහ 1 වන කාර්තුව 2022, 2 වන කාර්තුව 2022, 3 වන කාර්තුව 2022

වාර්ෂිකව යොමු කරන ලද දත්ත වාර්තා

1. මාදක ඖෂධ පිළිබඳ අවශ්‍යතා ඇස්තමේන්තු (පෝරමය B)

2. 1971 මනෝවර්ථක ද්‍රව්‍ය පිළිබඳ සම්මුතීන් ලැයිස්තු 2හි අඩංගු වෛද්‍යමය හා විද්‍යාත්මක අවශ්‍යතා සඳහා වන ඖෂධ වර්ග (පෝරමය B/P)

3. මාදක ඖෂධ හා මනෝවර්ථක ද්‍රව්‍ය නිෂ්පාදනය, පරිභෝජනය, ගබඩා කිරීම හා වැටලීම් පිළිබඳ සංඛ්‍යාලේඛන (පෝරමය C)

4. මනෝවර්ථක ද්‍රව්‍ය පිළිබඳ සංඛ්‍යාලේඛන (පෝරමය P)

5. ලෝක මත්ද්‍රව්‍ය වාර්තාව සම්පාදනය සඳහා ශ්‍රී ලංකාව වෙනුවෙන් දත්ත වාර්තා කිරීම - වාර්ෂික දත්ත වාර්තා කිරීමේ ප්‍රශ්නාවලිය (පෝරමය E)

II. එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ කාර්යාලය (UNODC) සමඟ දත්ත හුවමාරු කිරීම

- මත්ද්‍රව්‍ය අත්අඩංගුවට ගැනීම් අතරින් විශාල පරිමාණයේ මත්ද්‍රව්‍ය වැටලීම් සම්බන්ධ සිද්ධීන් පිළිබඳ (IDS) (Individual Drug Seizures) දත්ත වාර්තා කිරීම - පළමුවන කාර්තුව (ජනවාරි - මාර්තු), දෙවන කාර්තුව (අප්‍රේල් - ජුනි) සහ තුන්වන කාර්තුව (ජුලි - සැප්තැම්බර්)

III. ජාත්‍යන්තර සම්මන්ත්‍රණ සහ සැසි සඳහා දායකත්වය දැක්වීම

- එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ කාර්යාලය විසින් සංවිධානය කරන ලද මත්ද්‍රව්‍ය භාවිතයේ ස්වභාවය හා මත්ද්‍රව්‍ය වැළැක්වීම පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදකයින් සඳහා වූ වැඩමුළුව
- එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ කාර්යාලය විසින් සංවිධානය කරන ලද ආසියානු සහ පැසිෆික් කලාපය සඳහා වන වාර්ෂික දත්ත වාර්තා කිරීමේ ප්‍රශ්නාවලිය (ARQ) (Annual Report Questionnaire) සහ ක්‍රමවේදය පිළිබඳ මාර්ගගත පුහුණු වැඩමුළුව

11.5.5 දත්ත පද්ධති කළමනාකරණය

මත්ද්‍රව්‍ය දුර්භාවිත දත්ත ඇගයීම් පද්ධතිය (Drug Abuse Monitoring System - DAMS)

මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදි සඳහා අත්අඩංගුවට පත්වන පුද්ගලයින්ගේ සහ මත්ද්‍රව්‍ය භාවිත අක්‍රමතා සඳහා ප්‍රතිකාර සේවාවන්වලට ඇතුළත් වන සේවාලාභීන්ගේ දත්ත වාර්තා කිරීමේ සහ එම දත්ත මත පදනම්ව විශ්ලේෂණාත්මක වාර්තා ඉදිරිපත් කිරීමේ අරමුණින් මෙම දත්ත පද්ධතිය පවත්වාගෙන යනු ලබයි. මාර්ගගත දත්ත පද්ධතියට සියලුම පොලිස් ස්ථාන සහ ප්‍රතිකාර මධ්‍යස්ථාන (රාජ්‍ය/ රාජ්‍ය නොවන/ බන්ධනාගාර) මඟින් දත්ත වාර්තා කිරීම සිදුවේ. මත්ද්‍රව්‍ය සම්බන්ධ ප්‍රතිකාර සඳහා ඇතුළත් වන සේවාලාභීන්ගේ තොරතුරු සෑම කාර්තුවකට වරක් විශ්ලේෂණය කර වාර්තා ඉදිරිපත් කරනු ලබයි. ඒ අනුව 2022 වර්ෂය තුළ දී වාර්තා 03ක් ප්‍රකාශයට පත්කර ඇත.

- මත්ද්‍රව්‍ය භාවිත අක්‍රමතා සඳහා ප්‍රතිකාරවලට ඇතුළත් වූ සේවාලාභීන් පිළිබඳ සංඛ්‍යාලේඛන වාර්තාව (පළමුවෙනි කාර්තුව - 124 වෙළුම/ දෙවෙනි කාර්තුව - 125 වෙළුම/ තෙවැනි කාර්තුව - 126 වෙළුම)

මත්ද්‍රව්‍ය දුර්භාවිත දත්ත ඇගයීම් පද්ධතියට වාර්තා වූ මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදි සඳහා අත්අඩංගුවට පත් වූ පුද්ගලයින්ගේ තොරතුරු විශ්ලේෂණය කරමින් පහත වාර්තා ප්‍රකාශයට පත්කරන ලදි. අර්ධ වාර්ෂික (ජනවාරි සිට ජුනි දක්වා) වාර්තාවක් (මත්ද්‍රව්‍ය ආශ්‍රිත අත්අඩංගුවට ගැනීම් පිළිබඳ

සංඛ්‍යාලේඛන වාර්තාව - 62 වෙළුම) සහ වාර්ෂික වාර්තාව (මත්ද්‍රව්‍ය ආශ්‍රිත අත්අඩංගුවට ගැනීම් පිළිබඳ සංඛ්‍යාලේඛන වාර්තාව - 63 වෙළුම) 2022 වර්ෂයේ දී ප්‍රකාශයට පත්කර ඇත.

මත්ද්‍රව්‍ය දුර්භාවිතය සම්බන්ධ දත්ත පද්ධතිය පවත්වාගෙන යාම සහ යාවත්කාලීන කිරීම

2022-01-01 සිට 2022-12-31 දක්වා	
පොලිස් ස්ථානවලින් වාර්තා කරන ලද අත්අඩංගුවට පත් පුද්ගලයින් සංඛ්‍යාව	80,000
ප්‍රතිකාර මධ්‍යස්ථානවලින් වාර්තා කරන ලද සේවාලාභීන් සංඛ්‍යාව	1,850

දත්ත පද්ධතිය යාවත්කාලීන කරමින් පවත්වාගෙන යාම සඳහා දත්ත වාර්තා කිරීමේ පත්‍රිකා මුද්‍රණය කර පොලිස් ස්ථාන සහ ප්‍රතිකාර මධ්‍යස්ථාන වෙත යොමු කිරීම සහ දත්ත පද්ධතිය සම්බන්ධ තාක්ෂණික ගැටලු මතුවන අවස්ථාවල අදාළ මැදිහත්වීම් සිදුකර ගැටලු නිරාකරණය කරගැනීමට සහය දක්වන ලදි.

මත්ද්‍රව්‍ය දුර්භාවිතය සම්බන්ධ දත්ත පද්ධතිය පවත්වාගෙන යාම සහ යාවත්කාලීන කිරීම පිළිබඳ පොලිස් නිලධාරීන් පුහුණු කිරීම

පුහුණු වැඩමුළු පැවැත් වූ පොලිස් කොට්ඨාසය	සහභාගී වූ පෙලිස් නිලධාරීන් සංඛ්‍යාව
රත්නපුර	55
ඇඹිලිපිටිය	55
කෑගල්ල	70

11.5.6 ප්‍රවණතා විශ්ලේෂණය

2022 වර්ෂයේ දී මත්ද්‍රව්‍ය දුර්භාවිතය ආශ්‍රිත ප්‍රවණතා හඳුනාගැනීම සඳහා පහත සඳහන් විශ්ලේෂණාත්මක වාර්තා සම්පාදනය කරන ලදි.

- 2020 සහ 2021 වර්ෂවල මත්ද්‍රව්‍ය භාවිත අක්‍රමතා සඳහා ප්‍රතිකාරවලට ඇතුළත් වූ සේවාලාභීන් පිළිබඳ සංඛ්‍යාලේඛන මත පදනම්ව සම්පාදනය කරන ලද වාර්තාව
- මත්ද්‍රව්‍ය සම්බන්ධ ප්‍රතිකාර හා පුනරුත්ථාපන සේවාවන් පිළිබඳ වාර්තාව (ජනවාරි - ඔක්තෝබර්, 2022)
- මත්ද්‍රව්‍ය සම්බන්ධ අත්අඩංගුවට පත්වීම් පිළිබඳ වාර්තාව (ජනවාරි - ඔක්තෝබර්, 2022)
- මුහුණු පොත හරහා ගංජා ප්‍රවර්ධනය පිළිබඳ ප්‍රවණතා විශ්ලේෂණය
- වීථි මට්ටමේ මත්ද්‍රව්‍ය මිල තත්ත්වය සහ මත්ද්‍රව්‍ය ලබාගැනීමට පවතින හැකියාව පිළිබඳ විශ්ලේෂණ වාර්තාව

11.5.7 ප්‍රගති වාර්තා සම්පාදනය

සැලසුම් සකස් කිරීම සහ ප්‍රගති වාර්තා සම්පාදනය සම්බන්ධයෙන් 2022 වර්ෂයේදී පහත සඳහන් කාර්යයන් පර්යේෂණ අංශය විසින් සිදුකරන ලදි.

- 2022 වර්ෂයේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය ඇතුළත් වාර්තාව (පළමු කාර්තුව) සම්පාදනය කර රේඛීය අමාත්‍යාංශයට යොමු කිරීම.
- 2023 අයවැය විවාදය සඳහා අවශ්‍ය මූලාශ්‍ර ඇතුළත් ප්‍රගති වාර්තාව මහජන ආරක්ෂක අමාත්‍යාංශය වෙත භාර දීම.
- කාර්තුමය වශයෙන් ප්‍රගති වාර්තා සම්පාදනය

11.5.8 දේශීය සහ විදේශීය ආධාර සහ තාක්ෂණික සහාය ලබාගැනීමට අදාළ ව්‍යාපෘති

I. ලෝක සෞඛ්‍ය සංවිධානයේ (World Health Organization) 2022 වාර්ෂික මූල්‍යාධාර වැඩසටහන යටතේ පර්යේෂණ අංශයෙහි කාර්ය මණ්ඩලයේ ධාරිතාවය වර්ධනය කිරීම සඳහා ව්‍යාපෘති යෝජනා යොමු කිරීම සහ රු. 1,690,912.15 ක මුදලක මූල්‍යාධාර ලබා ගැනීම

II. ලෝක සෞඛ්‍ය සංවිධානයේ (WHO) 2022 වාර්ෂික මූල්‍යාධාර වැඩසටහන යටතේ නිවාරණ/ ප්‍රතිකාර හා පුනරුත්ථාපන සහ බාහිරසේවා කාර්ය මණ්ඩලයේ ධාරිතාවය වර්ධනය කිරීම සඳහා ව්‍යාපෘති යෝජනා යොමු කිරීම සහ ඊට අදාළ සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම

III. නීති විරෝධී මත්ද්‍රව්‍ය භාවිතය වැළැක්වීම සම්බන්ධ පුහුණු වැඩසටහන් සැලසුම් කිරීම සහ පැවැත්වීම සඳහා Japan International Cooperation Agency ආයතනය සමග සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

IV. දැනුම හුවමාරු කරගැනීමේ වැඩසටහන (Korean International Cooperation Agency - Knowledge Sharing Program) යටතේ කොරියානු රජය වෙත ව්‍යාපෘති යෝජනා යොමු කිරීම

V. ජාතික ක්ෂය රෝග මර්දන වැඩසටහන සමඟ සම්බන්ධීකරණය කර මත්ද්‍රව්‍ය නිවාරණයට සමගාමීව සහ ප්‍රතිකාර හා පුනරුත්ථාපන වැඩසටහන් තුළට ක්ෂය රෝග නිවාරණ කටයුතු ඇතුළත් කිරීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණය සිදුකිරීම

VI. මත්ද්‍රව්‍ය නිවාරණ, ප්‍රතිකාර හා පුනරුත්ථාපනය සඳහා ජාතික මට්ටමේ ස්වේච්ඡා කණ්ඩායමක් පිහිටු වීම

පර්යේෂණ අංශයේ 2021/2022 වර්ෂයන්හි භෞතික හා මූල්‍ය ප්‍රගතිය සන්සන්දනාත්මකව ඉදිරිපත් කිරීම

වර්ෂය	භෞතික ප්‍රගතිය	මූල්‍ය ප්‍රගතිය
2021	77%	45%
2022	93%	63.1%

ඉහත වගුවෙහි සඳහන් පරිදි 2021 වර්ෂයේ භෞතික ප්‍රගතිය 77%ක් වූ අතර 2022 වර්ෂයේ භෞතික ප්‍රගතිය 93%ක් විය. 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය 45%ක් වූ අතර 2022 63.1%ක් විය. ඒ අනුව පර්යේෂණ අංශයේ අරමුණු සහ ඉලක්ක අනුව 2022 වර්ෂය තුළ මත්ද්‍රව්‍ය නිවාරණය හා පාලනය සඳහා වන වැඩසටහන් සඳහා සැළකිය යුතු මට්ටමේ දායකත්වයක් දැක්වීමට පර්යේෂණ අංශයට හැකියාව ලැබී ඇත.

11.6 ජාතික මාදක රසායනාගාරය

මත්ද්‍රව්‍ය භාවිතය වැළැක්වීම සහ පාලනය කිරීම සම්බන්ධයෙන් සියලුම විද්‍යාත්මක ක්‍රියාවන් ආවරණය කිරීම සඳහා අත්‍යවශ්‍ය සහ අංග සම්පූර්ණ විද්‍යාත්මක ඒකකයක් ලෙස ජාතික මාදක රසායනාගාරය, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයට අනුබද්ධිතව ස්ථාපිත කර ඇත. ඖෂධ සැපයුම් පාලනය සහ ඉල්ලුම අවම කිරීම සඳහා රසායනාගාර විශ්ලේෂණය, විද්‍යාත්මක පර්යේෂණ, විද්‍යාත්මක පුහුණුව, තාක්ෂණික සහය සැපයීම, විද්‍යාත්මක නිර්දේශ සහ උපදේශන සේවා සිදු කිරීමෙහි නිරත වේ.

ජාතික මාදක රසායනාගාරය විසින් විමර්ශන, බුද්ධිමය සහ අධිකරණමය අරමුණු සහ කටයුතු සඳහා, නීතිය ක්‍රියාත්මක කරන ආයතන විසින් ඉදිරිපත් කරන ලද සැක සහිත ඖෂධ සාම්පල (මත්ද්‍රව්‍ය සහ මනෝවර්තක ද්‍රව්‍ය, පුරෝගාමී රසායනික ද්‍රව්‍ය) විශ්ලේෂණය කිරීම සහ මධ්‍යසාර, පාලිත ඖෂධ, පාලිත රසායනික ද්‍රව්‍ය (පුරෝගාමී), ක්‍රීඩා ආශ්‍රිත පෝෂණ අතිරේක සාම්පල ද නියාමන අරමුණු සඳහා විශ්ලේෂණය සිදු කෙරේ. තව ද මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් හඳුනාගැනීම සඳහා රෝහල්, අධිකරණ, ප්‍රතිකාර මධ්‍යස්ථාන, රජයේ සහ පෞද්ගලික අංශයේ සේවා ස්ථාන මඟින් ඉදිරිපත් කරන ජීව විද්‍යාත්මක නිදර්ශක විශ්ලේෂණය කිරීම ද සිදු කෙරේ.

එමෙන්ම ජාතික මාදක රසායනාගාරය විසින්, මත්ද්‍රව්‍ය සැපයුම පාලනය, ඉල්ලුම අවම කිරීම සහ මත්ද්‍රව්‍ය දුර්භාවිතය වැළැක්වීම කෙරෙහි අවධානය යොමු කරමින් විද්‍යාත්මක සාක්ෂි පදනම් කරගත් භාවිතයන් ප්‍රවර්ධනය කිරීමේ අරමුණු මත පදනම්ව සිය දෛනික සහ සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කරනු ලබයි.

11.6.1 නීති විරෝධී මත්ද්‍රව්‍ය නිෂ්පාදනය, ජාවාරම් කිරීම, විකිණීම සහ භාවිතයට එරෙහිව ඵලදායී ලෙස නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා විද්‍යාත්මක සහය ලබා දීම.

I. විමර්ශන, මෙහෙයුම්, බුද්ධිමය සහ අධිකරණ කටයුතු සඳහා ශ්‍රී ලංකාව තුළ පවතින සැක සහිත ඖෂධ හඳුනාගැනීම සහ විශ්ලේෂණය

2022 වර්ෂයේ දී නීතිය ක්‍රියාත්මක කරනු ලබන ආයතන විසින් කරන ලද ඉල්ලීම් අනුව, ජාතික මාදක රසායනාගාරය මඟින් අවස්ථා 52ක දී මත්ද්‍රව්‍ය බවට සැක සහිත සාම්පල 101ක් සඳහා විශ්ලේෂණයන් සිදුකොට ඇත. ඉහත විශ්ලේෂණ ප්‍රතිඵල ජාතික හා අනෙකුත් වගකිව යුතු ආයතන සමඟ බෙදා ගනිමින් මත්ද්‍රව්‍ය ගැටළුව පිළිබඳ විවිධ මෙහෙයුම්, නව ප්‍රවණතා පිළිබඳ විශ්ලේෂණ කිරීම, උපක්‍රමික විශ්ලේෂණ කිරීම, නීති ප්‍රතිපත්ති විශ්ලේෂණය හා සැකසුම් අවශ්‍යතා, නෛතික සහ සෞඛ්‍ය ගැටළු අවම කිරීම යන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා භාවිත කර ඇත. මෙම අනාවරණ මඟින් රටේ නීති බලගැන්වීම, අපරාධ නිවාරණය හා සෞඛ්‍ය ප්‍රතිපත්ති සැකසීම් සඳහා සුවිශේෂී බලපෑමක් ඇති කරනු ලබයි.

තවද මහේස්ත්‍රාත් අධිකරණ නියෝගයන්ට අදාලව නිකුත් කරන ලද විශ්ලේෂණ වාර්තා, නඩු පැවරීම සම්බන්ධයෙන් ගත යුතු නෛතික ක්‍රියාමාර්ග සඳහා යොදා ගැනේ.

විෂ අබිං සහ අන්තරායදායක ඖෂධ පාලන පනත හා 2008 අංක 01 දරන මාදක ඖෂධ සහ මනෝ වර්තක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනත යටතේ, රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන විසින් ජාතික මාදක රසායනාගාරය වෙත යොමුකරන ලද මත්ද්‍රව්‍ය බවට සැක සහිත සාම්පල පිළිබඳ සිදු කරන ලද පර්යේෂණාත්මක විශ්ලේෂණ පහත පරිදි වේ.

වගු අංක 1- 2022 වසර තුළදී විශ්ලේෂණය කරන ලද මත්ද්‍රව්‍ය බවට සැක සහිත සාම්පල සංඛ්‍යා

ආයතනය		හෙරොයින්	මෝර්ෆීන්	ඇම්ෆිටමීන්	මෙතම්ෆිටමීන්	ඒකාකී	අෆෝ.	සැව්.	ඔක්.	නෙල්ෂෙ.	සෙස්ස
මහේස්ත්‍රාත් අධිකරණ	අවස්ථා	06	-	04	02	02	02	04	-	-	-
	සාම්පල සංඛ්‍යාව	10	-	07	06	03	06	08	-	-	-
රාජ්‍ය බුද්ධි සේවය	අවස්ථා	-	01	-	-	-	-	-	-	-	-
	සාම්පල සංඛ්‍යාව	-	02	-	-	-	-	-	-	-	-
පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය	අවස්ථා	-	02	-	-	-	-	-	-	-	-
	සාම්පල සංඛ්‍යාව	-	10	-	-	-	-	-	-	-	-
විශේෂ විමර්ශන අංශය, යුධ හමුදා පොලීසිය පාරිභෝගික සේවා අධිකාරිය	අවස්ථා	-	02	01	01	02	02	-	01	01	04
	සාම්පල සංඛ්‍යාව	-	04	01	01	09	02	-	01	01	08
ශ්‍රී ලංකා ගුවන් හමුදාව	අවස්ථා	-	-	01	-	-	-	-	-	-	-
	සාම්පල සංඛ්‍යාව	-	-	01	-	-	-	-	-	-	-
ශ්‍රී ලංකා රේගුව	අවස්ථා	-	-	-	02	01	-	-	-	-	-
	සාම්පල සංඛ්‍යාව	-	-	-	02	01	-	-	-	-	-
ශ්‍රී ලංකා පොලීසිය	අවස්ථා	-	-	-	-	-	-	-	01	-	-
	සාම්පල සංඛ්‍යාව	-	-	-	-	-	-	-	04	-	-
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව	අවස්ථා	-	-	-	-	-	-	-	02	01	-
	සාම්පල සංඛ්‍යාව	-	-	-	-	-	-	-	02	01	-
සෞඛ්‍ය කාර්යාලය බුලත්සිංහල	අවස්ථා	-	-	-	-	-	-	-	-	01	-
	සාම්පල සංඛ්‍යාව	-	-	-	-	-	-	-	-	01	-
අ.ඖ.පා.ජා.ම.	අවස්ථා	-	-	-	-	-	-	-	-	01	04
	සාම්පල සංඛ්‍යාව	-	-	-	-	-	-	-	-	01	08

විශේෂ කාර්ය බලකාය	අවස්ථා	-	-	-	-	-	-	-	-	-	01
	සාම්පල සංඛ්‍යාව	-	-	-	-	-	-	-	-	-	01
එකතුව	**අවස්ථා**	**06**	**05**	**06**	**05**	**05**	**04**	**04**	**04**	**04**	**09**
	සාම්පල සංඛ්‍යාව	**10**	**16**	**09**	**09**	**13**	**08**	**08**	**07**	**04**	**17**

මුළු අවස්ථා සංඛ්‍යාව : 52

මුළු සාම්පල සංඛ්‍යාව : 101

II. වීදි හෙරොයින් පිළිබඳ පර්යේෂණ ව්‍යාපෘතිය

භාවිත කරන්නා හා වෙළඳපොල අතර සම්බන්ධය අධීක්ෂණය සඳහා ඉතාමත් හොඳ දර්ශකයක් ලෙස වීදි හෙරොයින් සාම්පලවල මිල සහ පිරිසිදුභාවය අතර සම්බන්ධතාව අධ්‍යයනය කිරීම තුලින් සුලභතාවයෙහි ඇතිවන්නා වූ වෙනස්කම් ඉතා පහසුවෙන් වටහාගත හැකිය. මීට අමතරව මිල සහ පිරිසිදුභාවය අතර ඇති සම්බන්ධතාවය ඇගයීම තුළින් මත්ද්‍රව්‍ය සැපයුමේ විධි ක්‍රම හඳුනාගැනීම සහ එමඟින් සැළසුම් සහගත ඉලක්ක භාවිතා කරගනිමින් හෙරොයින් ජාවාරම් කිරීම, ප්‍රවාහනය කිරීම හා අත්අඩංගුවට පත්වන භාවිත කරන්නන් සඳහා වඩාත් හොඳින් නීතිය ක්‍රියාත්මක කළ හැක. මෙම පර්යේෂණ අධ්‍යයන ප්‍රතිපත්ති සැකසුම්වලදී සහ නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන්ගේ කාර්යභාරයේ දී වැදගත් වන අතර අත්අඩංගුවට පත්වන මහා පරිමාණ මත්ද්‍රව්‍ය තොග, හෙරොයින් සාම්පලවල උක්ත සබඳතාවය කෙරෙහි බලපෑමක් ඇති කළ හැකි ද යන්න අනාවරණය කරගත හැක.

මීට අමතරව පහත සඳහන් පර්යේෂණ ව්‍යාපෘති අඛණ්ඩව සිදුකරනු ලැබේ.

- වීදිවල දක්නට ලැබෙන හෙරොයින්වල මිල සහ පිරිසිදුභාවය අනාවරණය කර එහි ඇති සම්බන්ධතාවය හඳුනාගැනීම සඳහා සිදුකරනු ලබන පර්යේෂණ
- හෙරොයින් සාම්පලවල මූලාරම්භය හා විකාශනය හඳුනාගැනීම
- වීදි හෙරොයින් සාම්පලවල ඇති නව තනුකකරණ ද්‍රව්‍ය හඳුනාගැනීම සඳහා වන විශ්ලේෂණයන්

බස්නාහිර පළාතේ විවිධ ප්‍රදේශවලින් 2022 වර්ෂය සඳහා ලැබුණු "වීදි" සාම්පල දහතුනක් (13) පවතින තනුකරණ ද්‍රව්‍ය/ එකතු කරන වෙනත් ද්‍රව්‍ය සහ ඒවායේ ඩයිඇසිටයිල් මෝර්ෆීන් (DAM) අන්තර්ගතය සම්බන්ධයෙන් විශ්ලේෂණය කරන ලදි.

වගු අංක 02 – වීදි හෙරොයින් සාම්පලවල පිරිසිදුතාවය (ඩයිඇසිටයිල් මොර්ෆීන් ප්‍රතිශතය)

ආයතනය		සාම්පල සංඛ්‍යාව
පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය	හෙරොයින්	13
එකතුව		13

III. වීදි මෙතැම්ෆිටමින් පිළිබඳ පර්යේෂණ ව්‍යාපෘතිය

පහත සඳහන් පර්යේෂණ ව්‍යාපෘති අඛණ්ඩව සිදුකරනු ලැබේ.

- මෙතැම්ෆිටමින් සාම්පලවල මූලාරම්භය හා විකාශනය හඳුනාගැනීම
- වීදි මෙතැම්ෆිටමින් සාම්පලවල ඇති නව තනුකකරණ ද්‍රව්‍ය හඳුනාගැනීම සඳහා වන විශ්ලේෂණයන්

වගු අංක 03 – වීදි මෙතැම්ෆිටමින් සාම්පලවල පිරිසිදුතාවය

ආයතනය		සාම්පල සංඛ්‍යාව
පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය	මෙතැම්ෆිටමින්	01
එකතුව		01

IV. ඉහළ මත්ද්‍රව්‍ය සැපයුම් සහිත පළාත් පොලිස් ස්ථානවල ක්ෂේත්‍ර හඳුනාගැනීම් සඳහා මත්ද්‍රව්‍ය හඳුනාගැනීමේ ක්ෂේත්‍ර පරීක්ෂණ කට්ටල නිෂ්පාදනය සහ සැපයීම.

මාදක ඖෂධ, මනෝවර්තක සහ පූර්වගාමී රසායන ද්‍රව්‍ය හඳුනාගැනීම සඳහා ක්ෂේත්‍ර පරීක්ෂණ කට්ටල නිෂ්පාදනය සහ තක්සේරු කිරීම ජාතික මාදක රසායනාගාරය මගින් සිදු කෙරේ. ඒ අනුව මේ සම්බන්ධයෙන් මාලදිවයින මගින් ලැබුනු ඉල්ලීමකට අනුව මත්ද්‍රව්‍ය හඳුනාගැනීමේ කට්ටල සඳහා පිරිවැය ඇගයීම සිදු කරන ලදි.

V. ක්ෂේත්‍ර පරීක්ෂණ කට්ටලවල ක්‍රියාකාරීත්වය තහවුරු කිරීම හා නැවත සකස් කිරීම

ක්ෂේත්‍ර පරීක්ෂණ කට්ටල 03ක්, නීතිය ක්‍රියාත්මක කරන ආයතන කිහිපයක් මඟින් ක්‍රියාකාරීත්වය පරීක්ෂා කිරීම සඳහා ආයතනයට යොමු කරන ලද අතර ඒවා පරීක්ෂා කිරීමෙන් අනතුරුව රසායනික ප්‍රතිකාරක නැවත සකසා දෙන ලද අතර ඒවා පහත සඳහන් පරිදි වේ.

වගු අංක 04 - 2022 වසර තුළ නැවත සකස් කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂණ කට්ටලවල දත්ත

ආයතනය	පරීක්ෂණ කට්ටල වර්ගය	පරීක්ෂණ කට්ටල සංඛ්‍යාව
පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය	මාදක රසායන හඳුනාගැනීමේ කට්ටල	01
	පුරෝගාමී රසායන හඳුනා ගැනීමේ කට්ටල	01
ශ්‍රී ලංකා රේගුව	මාදක රසායන හඳුනා ගැනීමේ කට්ටල	01
එකතුව		**03**

VI. මත්ද්‍රව්‍ය සැපයුම අඩාල කිරීම සම්බන්ධයෙන් විද්‍යාත්මක නිර්දේශ/ තාක්ෂණික සහය සහ උපදේශන සේවා

මත්ද්‍රව්‍ය සැපයුම අඩාලකිරීම සම්බන්ධයෙන් විද්‍යාත්මක නිර්දේශ/ තාක්ෂණික සහය සහ උපදේශන සේවා ලබා දීම සම්බන්ධයෙන් ජාතික මාදක රසායනාගාරය වගකිව යුතු අංශයක් ලෙස ක්‍රියා කරනු ලබයි.

වගු අංක 05: 2022 වසර තුළ සපයන ලද තාක්ෂණික සහාය පිළිබඳ විස්තර

ආයතනය/ වැඩසටහන	**සපයන ලද විස්තර**	**ලබා දී ඇති තාක්ෂණික සහාය/ නිර්දේශ**
මහේස්ත්‍රාත් අධිකරණ	විද්‍යාත්මක නිර්දේශ	සිද්ධි 09ක් සඳහා විද්‍යාත්මක සාක්ෂි සපයා ඇත
රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව	මාදක, මනෝවර්තක සහ අනෙකුත් ද්‍රව්‍ය හඳුනාගැනීම.	සාම්පල දහයක් (10) සඳහා FT-IR විශ්ලේෂණය සිදු කරන ලදි.
නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව	සංශෝධිත විෂ, අබිං සහ අන්තරායකර ඖෂධ ආඥා පනතේ III වන උපලේඛනය යටතේ සැලසුම් කර ඇති යෝජිත මත්ද්‍රව්‍ය සහ මනෝවර්තක ද්‍රව්‍ය (dangerous drugs) ලැයිස්තුවේ සිංහල පරිවර්තනය සිදු කිරීම	යෝජිත ලැයිස්තුවේ සිංහල පරිවර්තනය ඉදිරිපත් කරන ලදි .
ලේකම්, මහජන ආරක්ෂක අමාත්‍යාංශය	අත්අඩංගුවට ගත් ඖෂධ බැහැර කිරීමේ ක්‍රම සඳහා තාක්ෂණික පිරිවිතර ලබා දීම	• අත්අඩංගුවට ගත් නීති විරෝධී මත්ද්‍රව්‍ය බැහැර කිරීම සඳහා සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටියක් ස්ථාපිත කිරීමට අදාලව අත්අඩංගුවට ගත් ඖෂධ බැහැර කිරීමේ ක්‍රම පිළිබඳ තාක්ෂණික පිරිවිතර වාර්තාව ලබා දීම • විෂ වර්ග අබිං සහ අන්තරාදායක ඖෂධ වර්ග (සංශෝධන) පනතෙහි සංශෝධිත ඖෂධ ලැයිස්තුවේ හඳුනාගෙන ඇති විෂමතා පිළිබඳ අදහස් සහ

		විෂ වර්ග අබිං සහ අන්තරාදායක ඖෂධ වර්ග (සංශෝධන) පනතෙහි ඖෂධ ලැයිස්තුව සංශෝධනය කිරීම සඳහා අවශ්‍ය නිර්දේශ සැපයීම සිදු කරන ලදි.
පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය	පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශයේ සහය ඇතිව ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් අත්අඩංගුවට ගෙන ඇති හෙරොයින් තොගයට අදාළ තොරතුරු, රසායනික පැතිකඩ දත්ත ආදියෙන් සමන්විත දත්ත ගබඩාවක් ක්‍රියාත්මක කිරීම මත පදනම්ව පරීක්ෂණ අඛණ්ඩව කරගෙනයාමට අදාල තාක්ෂණික සහාය සහ විද්‍යාත්මක සහාය ඉල්ලා ඇත.	හෙරොයින් සමුද්‍ර ප්‍රවාහනයට සම්බන්ධ දත්ත රැස් කිරීම සහ විශේෂඥ දැනුම හුවමාරු කර ගැනීම සම්බන්ධයෙන් දත්ත සමුදායක් පවත්වා ගෙන යාමට ජාත්‍යන්තර ආයතනවලින් ඉල්ලීම් සිදු කරන ලදි.

VII. මත්ද්‍රව්‍ය හා සම්බන්ධ නීති ක්‍රියාත්මක කරන ආයතන නිලධාරීන් සඳහා පවත්වනු ලබන පරිගණක පුහුණු වැඩසටහන්

මත්ද්‍රව්‍ය භාවිතය වැළැක්වීම හා පාලනය පිලිබඳ ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම උදෙසා මත්ද්‍රව්‍යවලට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය උපක්‍රමයක් වන අතර ඒ සඳහා නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් හට විධිමත් පුහුණුවක් ලබා දීම මූලික කොටගෙන පරිගණක පුහුණු වැඩසටහන් මෙම වසර තුළ ද පවත්වන ලදි. ඒ අනුව පරිගණක මූලාශ්‍ර පුහුණු පාඨමාලාව තුළ දැනුම වර්ධනය කිරීම අවබෝධය ඇති කිරීම සහ ඉලක්කගත කාරණා සඳහා වෙනස් වූ මොඩියුල මඟින් ඉතා ප්‍රතිඵලදායක සාර්ථක උපක්‍රමික විධික්‍රම සහිත පුහුණු වැඩසටහන්, නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් හට ලබා දී ඇත. පහත වගුවෙන් පුහුණු වැඩසටහන් සම්බන්ධ විස්තර ඇතුලත් කොට ඇත.

වගු අංක 06: 2022 වසර තුළ සපයන ලද පරිගණක පුහුණු වැඩසටහන්

ආයතනය/ වැඩසටහන	වැඩමුළු සංඛ්‍යාව	සහභාගී වූ සංඛ්‍යාව
රාජ්‍ය බුද්ධි සේවය	2	15
එකතුව	**2**	**15**

VIII. මත්ද්‍රව්‍ය නීතිය ක්‍රියාත්මක කරන ආයතන සඳහා විද්‍යාත්මක පුහුණු වැඩසටහන්

ශ්‍රී ලංකාවේ නීති විරෝධී ඖෂධ හඳුනාගැනීම සම්බන්ධ නීතිය ක්‍රියාත්මක කිරීමේ හැකියාවන් වර්ධනය කිරීම යන තේමාව යටතේ දෙදින විද්‍යාත්මක පුහුණු වැඩසටහන් ජාතික මාදක රසායනාගාරය විසින් සංවිධානය කරන ලද අතර මෙම පුහුණු වැඩමුළුවල අභිමතාර්ථ වූයේ,

1. මාදක ඖෂධ, මනෝවර්තක ද්‍රව්‍ය නීතිවිරෝධී ලෙස ජාවාරම් කිරීම සම්බන්ධ මූලික දැනුම ලබා දීම.
2. මාදක ඖෂධ, මනෝවර්තක ද්‍රව්‍ය සම්බන්ධ පුළුල් අවබෝධාත්මක දැනුම ලබා දීම.
3. මාදක ඖෂධ, මනෝවර්තක ද්‍රව්‍ය හඳුනාගැනීම සම්බන්ධ ක්ෂේත්‍ර පරීක්ෂණ කට්ටල භාවිතා කරමින් ප්‍රායෝගික දැනුම ලබා දීම.
4. මත්ද්‍රව්‍යවල නවීන ආකාර සම්බන්ධව සහභාගි වන්නන් යාවත්කාලීන කිරීම.

වගු අංක 07: 2022 වසර තුළ සංවිධානය කරන ලද විද්‍යාත්මක පුහුණු වැඩසටහන

ආයතනය		ජන.	පෙබ.	මාර්තු	අප්‍රේල්	මැයි	ජූනි	ජූලි	අගෝ.	සැප්.	ඔක්.	දෙසැ.
විශේෂ කාර්ය බලකාය	වැඩමුළු සංඛ්‍යාව	පැය 32	-	-	පැය 16	පැය 32	පැය 16	-	-	පැය 06	-	-
	සහභාගී වූ සංඛ්‍යාව	40	-	-	20	40	20	-	-	25	-	-
ශ්‍රී ලංකා බන්ධනාගාරය	වැඩමුළු සංඛ්‍යාව	පැය 08	-	-	-	-	-	-	-	-	-	-
	සහභාගී වූ සංඛ්‍යාව	35	-	-	-	-	-	-	-	-	-	-
ශ්‍රී ලංකා නාවික හමුදාව	වැඩමුළු සංඛ්‍යාව	-	පැය 16	පැය 16	-	පැය 16	පැය 16	පැය 16		පැය 51	පැය 04	-
	සහභාගී වූ සංඛ්‍යාව	-	50	50	-	50	35	35	-	47	30	-
ශ්‍රී ලංකා නාවික	වැඩමුළු සංඛ්‍යාව	-	පැය 03	-	-	-	-	-	-	-	-	-

හමුදාව (රියදුරු)	සහභාගි වූ සංඛ්‍යාව	-	40	-	-	-	-	-	-	-	-	-
ශ්‍රී ලංකා වෙරළාරක්ෂක බලකාය	වැඩමුළු සංඛ්‍යාව	-	-	පැය 08	-	පැය 07	-	-	-	-	-	-
	සහභාගි වූ සංඛ්‍යාව	-	-	30	-	35	-	-	-	-	-	-
ශ්‍රී ලංකා ගුවන් හමුදාව	වැඩමුළු සංඛ්‍යාව	-	-	පැය 06	-	-	-	-	-	පැය 5	-	-
	සහභාගි වූ සංඛ්‍යාව	-	-	20	-	-	-	-	-	35	-	-
ශ්‍රී ලංකා නාවික හමුදාව - ත්‍රිකුණාමල ය නාවික හමුදා කඳවුර	වැඩමුළු සංඛ්‍යාව	-	-	-	පැය 03	-	-	-	-	-	පැය 05	-
	සහභාගි වූ සංඛ්‍යාව	-	-	-	25	-	-	-	-	-	40	-
පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය	වැඩමුළු සංඛ්‍යාව	-	-	-	-	පැය 16	පැය 64	-	-	-	-	පැය 02
	සහභාගි වූ සංඛ්‍යාව	-	-	-	-	25	120	-	-	-	-	40
ශ්‍රී ලංකා පොලිසිය (කුරුණෑගල කොට්ඨාසය)	වැඩමුළු සංඛ්‍යාව	-	-	-	-	-	-	-	පැය 03	-	-	-
	සහභාගි වූ සංඛ්‍යාව	-	-	-	-	-	-	-	75	-	-	-
ශ්‍රී ලංකා පොලිසිය - (පුත්තලම	වැඩමුළු සංඛ්‍යාව	-	-	-	-	-	-	-	පැය 03	-	-	-

කොට්ඨාශය)	සහභාගිවූ සංඛ්‍යාව	-	-	-	-	-	-	-	80	-	-	-
ශ්‍රී ලංකා හමුදා පොලිස් බලකාය	වැඩමුළු සංඛ්‍යාව	-	-	-	-	-	-	-	-	පැය 16	-	-
	සහභාගිවූ සංඛ්‍යාව	-	-	-	-	-	-	-	-	50	-	-
අධිකරණ නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන	වැඩමුළු සංඛ්‍යාව	-	-	-	-	-	-	-	-	-	පැය 03	-
	සහභාගිවූ සංඛ්‍යාව	-	-	-	-	-	-	-	-	-	80	-
එකතුව	වැඩමුළු සංඛ්‍යාව	පැය **40**	පැය **19**	පැය **30**	පැය **19**	පැය **72**	පැය **84**	පැය **16**	පැය **06**	පැය **78**	පැය **12**	පැය **02**
	සහභාගිවූ සංඛ්‍යාව	**75**	**90**	**100**	**45**	**150**	**175**	**35**	**155**	**157**	**150**	**40**

මුළු පුහුණු වැඩමුළු සංඛ්‍යාව : 27 (පැය 378)

මුළු සහභාගි වූ සංඛ්‍යාව : 1132

IX. අන්තර්ජාලය හා සමාජ මාධ්‍යවලට එරෙහිව මත්ද්‍රව්‍ය ජාවාරම් සහ තැපැල්/ කුරියර්වලට එරෙහිව පියවර ගැනීම

අන්තර්ජාල සහ සමාජ මාධ්‍ය භාවිතා කරමින් මත්ද්‍රව්‍ය අලෙවිය සහ තැපැල්/ කුරියර් හරහා සිදු වන මත්ද්‍රව්‍ය ජාවාරමට එරෙහිව සටන් කිරීම සඳහා පිහිටුවා ඇති ක්‍රියාකාරී කණ්ඩායම සහ උප ක්‍රියාකාරී කණ්ඩායම් සක්‍රීය කිරීමට මූලික පියවර ගෙන ඇති අතර ඒ සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සැකසීමට කටයුතු කර ඇත.

11.6.2. පාලිත ඖෂධ/ද්‍රව්‍ය අපසරණය වැලැක්වීමේ නියාමන අරමුණු සඳහා විද්‍යාත්මක සහය ලබා දීම සහ ඒවායේ ආනයන අපනයන සහ බෙදාහැරීම ඵලදායී ලෙස අධීක්ෂණය කිරීම

I. **අතිරේක ආහාරමය නිශ්පාදනවල අඩංගු තහනම් ද්‍රව්‍ය හඳුනාගැනීම සඳහා කරනු ලබන විශ්ලේෂණ.**

ක්‍රීඩක ක්‍රීඩිකාවන් භාවිතා කරන අතිරේක ආහාර නිෂ්පාදනවල ඇති තහනම් ද්‍රව්‍ය හඳුනාගැනීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම රසායනාගාරය මඟින් සිදුකරන ලදි. ශ්‍රී ලංකාවේ ක්‍රීඩා ක්ෂේත්‍රය තුළ මෙන්ම පාසැල් මට්ටමේද ක්‍රීඩක ක්‍රීඩිකාවන් භාවිතා කරන අතිරේක ආහාර නිෂ්පාදන

තුළ තහනම් ද්‍රව්‍ය අඩංගු බවට ලැබුණු තොරතුරු අනුව මෙවැනි ද්‍රව්‍ය විශ්ලේෂණ කොට එවැනි ද්‍රව්‍ය හඳුනාගැනීම ක්‍රීඩාවේ ජීවගුණය පවත්වා ගැනීම ජාතික කර්තව්‍යයක් ලෙස සලකා ජාතික මාදක රසායනාගාරය මෙම අතිරේක ආහාර නිෂ්පාදන විශ්ලේෂණ කටයුතු අරඹන ලදි.

වගු අංක 8: අදාළ කාලය තුළ විශ්ලේෂණය කළ අතිරේක ආහාර නිෂ්පාදන සම්පල සංඛ්‍යාව

ආයතනය	අරමුණ	සාම්පල සංඛ්‍යාව
ක්‍රීඩා විද්‍යා සහ ශාරීරික අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ව්‍යවහාරික විද්‍යා පීඨය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය	ශ්‍රී ලංකාවේ ආයුර්වේද වෛද්‍ය විද්‍යාවේ භාවිතා කරනු ලබන 'ශ්වාස්කුඨාර රස' නම් නිශ්පාදනයේ ලෝක තහනම් උත්තේජක මර්දන නියෝජිතායතනය (WADA) විසින් තහනම් කර ඇති තහනම් ද්‍රව්‍ය තිබීම/නොපැවතීම සඳහා පර්යේෂණය	03
එකතුව		**03**

මුළු පරීක්ෂණ සංඛ්‍යාව : 01

මුළු සාම්පල සංඛ්‍යාව : 03

II. නියාමන අරමුණු සඳහා මත්ද්‍රව්‍ය, මනෝවර්ථක ද්‍රව්‍ය, පූර්වගාමී රසායනික ද්‍රව්‍ය, මධ්‍යසාර, දුම්කොළ හා වෙනත් අඩංගු නිෂ්පාදන විශ්ලේෂණය

මත්ද්‍රව්‍ය, මනෝවර්ථක ද්‍රව්‍ය, පූර්වගාමී රසායන ද්‍රව්‍ය, මධ්‍යසාර, දුම්කොළ, වෙනත් සහ එවැනි ද්‍රව්‍ය සහ/හෝ වෙනත් ආකලන ද්‍රව්‍ය පවතින බව හඳුනාගැනීම සඳහා/ හෝ නියාමන අරමුණු සඳහා ජාතික මාදක රසායනාගාරය විසින් සිදු කරන ලද පර්යේෂණ පදනම් වූ විශ්ලේෂණයන් පහත දැක්වේ.

වගු අංක 9: 2022 වසරේ විශ්ලේෂණය කරන ලද සාම්පල

ආයතනය	සිදු කරන ලද විශ්ලේෂණ වර්ගය	අවස්ථා සංඛ්‍යාව	සාම්පල සංඛ්‍යාව
පුද්ගල වශයෙන්	දුම්කොළ	01	01
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව	මධ්‍යසාර	01	01
එකතුව		**02**	**02**

මුළු පරීක්ෂණ සංඛ්‍යාව : 02

මුළු සාම්පල සංඛ්‍යාව : 02

III. නියාමන පියවර ශක්තිමත් කිරීම සඳහා තාක්ෂණික සහාය සහ විද්‍යාත්මක නිර්දේශ ලබා දීම

මත්ද්‍රව්‍ය/ මනෝවර්ථක ද්‍රව්‍ය/ පූර්වගාමී රසායන ද්‍රව්‍ය/ මධ්‍යසාර/ දුම්කොළ/ වෙනත් සහ එවැනි ද්‍රව්‍ය සහ/හෝ වෙනත් ආකලන ද්‍රව්‍ය පිළිබඳ නියාමන ක්‍රියාමාර්ගවලට අදාළ තාක්ෂණික සහය සමග විද්‍යාත්මක නිර්දේශ ඉදිරිපත් කිරීම ජාතික මාදක රසායනාගාරය මගින් සිදු කරනු ලබයි.

වගු අංක 10: 2022 වර්ෂයේදී මත්ද්‍රව්‍ය සහ මනෝවර්ථක ද්‍රව්‍ය ආනයනයට අදාළ තාක්ෂණික සහාය ලබා දීම.

ආයතනය	ලබා දී ඇති අවසරයන්
ඖෂධ අධීක්ෂණ දෙපාර්තමේන්තුව, ජාතික වෛද්‍ය නිෂ්පාදන පරිපාලනය, මහජන චීන සමූහාණ්ඩුව.	• රෙමිෆෙන්ටනිල් හයිඩ්‍රොක්ලෝරයිඩ් ආනයනය කිරීම
මත්ද්‍රව්‍ය කොමසාරිස්, මධ්‍යම මත්ද්‍රව්‍ය කාර්යාංශය, ඉන්දියාව	• ට්‍රැමඩෝල් හයිඩ්‍රොක්ලෝරයිඩ් IP 50 mg ආනයනය කිරීම • ට්‍රැමඩෝල් හයිඩ්‍රොක්ලෝරයිඩ් ampoules ආනයනය කිරීම • ට්‍රැමඩෝල් DF granules

IV. වෛද්‍ය සහ උපදේශන වෘත්තිකයන්ගේ ධාරිතා ගොඩනැගීම

මත්ද්‍රව්‍ය අවභාවිතාව පිළිබඳ විද්‍යාත්මක සාක්ෂි මත පදනම්ව, පුහුණු වැඩසටහන්/ සැසිවාර ප්‍රතිකාර, පුනරුත්ථාපනය සහ සමාජ ප්‍රතිසංවිධානය කිරීමේ වැඩසටහන් ජාතික මාදක රසායනාගාරය මගින් පවත්වනු ලැබේ.

වගු අංක 11: අදාළ කාලය තුළදි පවත්වන ලද පුහුණු වැඩසටහන් පිළිබඳ විස්තර

ආයතනය		ජූනි	මැයි	අප්‍රේල්	මාර්තු	පෙබරවාරි	ජනවාරි	දෙසැම්බර්	නොවැම්බර්
විද්‍යාත්මක සාක්ෂි පදනම් කරගත් ප්‍රජා මූලික ඖෂධ ප්‍රතිකාර සහ පුනරුත්ථාපන වැඩසටහන	වැඩමුළු සංඛ්‍යාව	පැය 16	-	-	-	-	-	-	-
	සහභාගි වූ සංඛ්‍යාව	85	-	-	-	-	-	-	-
වෛද්‍ය විද්‍යා පීඨය,	වැඩමුළු සංඛ්‍යාව	පැය 04	-	-	-	-	පැය 04	පැය 06	පැය 03

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	සහභාගි වූ සංඛ්‍යාව	23	-	-	-	-	-	20	49	30
SMI වෘත්තීය පුහුණු ආයතනය	වැඩමුළු සංඛ්‍යාව	පැය 04	-	-	-	-	-	-	-	-
	සහභාගි වූ සංඛ්‍යාව	100	-	-	-	-	-	-	-	-
ශ්‍රී ලංකා පොලිසිය	වැඩමුළු සංඛ්‍යාව	-	පැය 64	පැය 32	-	-	-	-	-	-
	සහභාගි වූ සංඛ්‍යාව	-	305	194	-	-	-	-	-	-
විශ්වවිද්‍යාල සහ උසස් පාසල් සිසුන්	වැඩමුළු සංඛ්‍යාව	-	පැය 02	-	-	-	-	-	-	-
	සහභාගි වූ සංඛ්‍යාව	-	25	-	-	-	-	-	-	-
කන්දකාඩු ප්‍රතිකාර සහ පුනරුත්ථාපන මධ්‍යස්ථානය	වැඩමුළු සංඛ්‍යාව	-	-	-	පැය 03	-	-	-	-	-
	සහභාගි වූ සංඛ්‍යාව	-	-	-	200	-	-	-	-	-
ඖෂධ සහ ඖෂධ විද්‍යා දෙපාර්තමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	වැඩමුළු සංඛ්‍යාව	-	-	-	-	පැය 160	පැය 80	-	-	-
	සහභාගි වූ සංඛ්‍යාව	-	-	-	-	20	10	-	-	-
මත්ද්‍රව්‍ය අපයෝජන කළමනාකරණ අධ්‍යයනය පිළිබඳ ඩිප්ලෝමා සිසුන්	වැඩමුළු සංඛ්‍යාව	-	-	-	-	-	-	පැය 08	-	-
	සහභාගි වූ සංඛ්‍යාව	-	-	-	-	-	-	15	-	-
මාතලේ සහ මහනුවර සංවර්ධන නිලධාරීන්	වැඩමුළු සංඛ්‍යාව	-	-	-	-	-	-	-	පැය 40	-
	සහභාගි වූ සංඛ්‍යාව	-	-	-	-	-	-	-	7	-
බස්නාහිර පළාතේ පාසල්	වැඩමුළු සංඛ්‍යාව	-	-	-	-	-	-	-	-	පැය 06

ගුරුවරුන් සඳහා පුහුණුව	සහභාගි වූ සංඛ්‍යාව	-	-	-	-	-	-	-	-	200
ගාල්ල දිස්ත්‍රික්කයේ සමෘද්ධි සංවර්ධන නිලධාරීන්	වැඩමුළු සංඛ්‍යාව	-	-	-	-	-	-	-	-	පැය 05
	සහභාගි වූ සංඛ්‍යාව	-	-	-	-	-	-	-	-	30
එකතුව	වැඩමුළු සංඛ්‍යාව	පැය **24**	පැය **66**	පැය **32**	පැය **03**	පැය **160**	පැය **80**	පැය **12**	පැය **46**	පැය **14**
	සහභාගි වූ සංඛ්‍යාව	**208**	**330**	**194**	**200**	**20**	**10**	**35**	**56**	**260**

මුළු පුහුණු වැඩමුළු සංඛ්‍යාව : 16 (පැය 378)

මුළු සහභාගි වූ සංඛ්‍යාව : 1313

11.6.3 විද්‍යාත්මක සාක්ෂි මත පදනම් වූ වැළැක්වීම, ප්‍රතිකාර, පුනරුත්ථාපනය සහ නැවත සමජගත කිරීමේ ක්‍රියාවලීන් සඳහා විද්‍යාත්මක සාක්ෂි මත පදනම් වූ සහාය ලබා දීම

I. දුර්භාවිත ඖෂධයන්ගේ පරිවෘත්තීය ද්‍රව්‍ය හඳුනාගැනීම සහ විශ්ලේෂණය

මේ කර්තව්‍යයේදී ජීව විද්‍යාත්මක සාම්පලවල ඇති පාලනයට නතු ඖෂධයන්ගේ පරිවෘත්තීය ද්‍රව්‍ය කොටස් හඳුනාගැනීම සඳහා පුද්ගල හා ආයතන මට්ටමින් විශ්ලේෂණ කරනු ලබයි. විශ්ලේෂණයෙන් පසුව මත්ද්‍රව්‍යවලින් නිදහස් බවට දෙනු ලබන සහතිකය රැකියා ලබා ගැනීම හා වෙනත් කටයුතු සඳහා ප්‍රයෝජනවත් වේ. මෙම රසායනාගාර වාර්තාව රෝග නිධාන හඳුනාගැනීම ප්‍රතිකාර තීරණය කිරීම, පුනරුත්ථාපනය කිරීම සඳහා පුද්ගලයන් යොමු කිරීම, අධ්‍යාපනික මෙන්ම රැකියා අවශ්‍යතා වැනි කාරණා වලදී ප්‍රයෝජනවත් වේ. ඊට අමතරව මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් සඳහා ප්‍රතිකාර හා පුනරුත්ථාපනය සම්බන්ධ 2007 අංක 54 දරන පනත ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සාම්පල විශ්ලේෂණ වාර්ථාවන් මහේස්ත්‍රාත් අධිකරණ වෙත සපයනු ලබයි.

විෂ අබිං අන්තරායකර ඖෂධ පාලනය පිළිබඳ පනත හා 2008 අංක 1 දරන මාදක ඖෂධ සහ මනෝවර්තක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනත බලගැන්වීම උදෙසා ජාතික මාදක රසායනාගාරය විසින් විශ්ලේෂණය කරන ලද ජීව විද්‍යාත්මක සාම්පලවල විස්තරාත්මක ලේඛනයන් පහත වගු අංක 12 මඟින් ඉදිරිපත් කෙරේ.

වගු අංක 12 - 2022 වසරේදී විශ්ලේෂණය කරන ලද ජීව විද්‍යාත්මක නියැදි සංඛ්‍යාව

ආයතනය		**ජන.**	**පෙබ.**	**මාර්තු**	**අප්‍රේ.**	**මැයි**	**ජූනි**	**ජූලි**	**අගෝ.**	**සැප්.**	**ඔක්.**	**නොවැ.**	**දෙසැ.**
රජයේ හා පෞද්ගලික රෝහල	සාම්පල සංඛ්‍යාව	15	10	18	10	04	07	07	09	06	13	13	11
	පරීක්ෂණ සංඛ්‍යාව	76	50	107	62	38	07	44	46	28	67	80	28
නීතිය බලාත්මක කරන ආයතන	සාම්පල සංඛ්‍යාව	05	01	04	-	02	03	-	-	02	02	03	03
	පරීක්ෂණ සංඛ්‍යාව	05	01	15	-	24	36	-	-	24	17	36	36
මහේස්ත්‍රාත් අධිකරණ	සාම්පල සංඛ්‍යාව	-	-	01	-	-	-	-	-	-	02	-	-
	පරීක්ෂණ සංඛ්‍යාව	-	-	12	-	-	-	-	-	-	24	-	-
අ.ඖ.පා.ජා.ම.	සාම්පල සංඛ්‍යාව	-	-	01	-	-	-	-	-	01	01	01	-
	පරීක්ෂණ සංඛ්‍යාව	-	-	01	-	-	-	-	-	01	01	01	-
ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය - වේරහැර ශාඛාව	සාම්පල සංඛ්‍යාව	-	-	-	-	-	-	-	01	-	-	-	-
	පරීක්ෂණ සංඛ්‍යාව	-	-	-	-	-	-	-	01	-	-	-	-
එකතුව	සාම්පල සංඛ්‍යාව	**20**	**11**	**24**	**10**	**06**	**10**	**07**	**10**	**09**	**18**	**17**	**14**
	පරීක්ෂණ සංඛ්‍යාව	**81**	**51**	**135**	**62**	**62**	**43**	**44**	**47**	**53**	**109**	**117**	**64**

මුළු නියැදි සංඛ්‍යාව ***: 80***

මුළු පරීක්ෂණ සංඛ්‍යාව ***: 465***

II. විමර්ශන සහ මෙහෙයුම් අරමුණු සඳහා ජීව විද්‍යාත්මක නිදර්ශකවල මත්ද්‍රව්‍ය ඇති බවට තහවුරු කිරීමේ විශ්ලේෂණයන් සිදු කිරීම

ජීව විද්‍යාත්මක නිදර්ශක (මුත්‍රා) සම්බන්ධයෙන් පරීක්ෂණ කට්ටල හරහා සිදු කරන මූලික පරීක්ෂණ යනු ගුණාත්මක විශ්ලේෂණයක් පමණක් වන අතර එහිදී අදාල නිදර්ශකයන්ගේ මත්ද්‍රව්‍ය හෝ එහි පරිවෘත්තීය ද්‍රව්‍ය තිබීම හෝ නොපැවතීම පමණක් පෙන්නුම් කරන අතර, එහිදී අන්තර් ප්‍රතික්‍රියා කරන මත්ද්‍රව්‍ය හා සමාන රසායනික ද්‍රව්‍ය හේතුවෙන් ද අදාල ප්‍රතිඵල පෙන්නුම් කල හැක. එබැවින් යමෙකු මත්ද්‍රව්‍ය භාවිතා කර ඇති බව විමර්ශනය සඳහා සවිස්තරාත්මක තහවුරු කිරීමේ විශ්ලේෂණයක් සිදු කිරීම අත්‍යවශ්‍ය වේ.

2022 වර්ෂය තුළ ජාතික මාදක රසායනාගාරය විසින් ගෑස් ක්‍රොමැටොග්‍රැෆි මෑස් ස්පෙක්ට්‍රොස්කොපි (Gas Chromatography Mass Spectrometry) තාක්ෂණය භාවිතයෙන් විමර්ශන සහ මෙහෙයුම් අරමුණු සඳහා වන ඉල්ලීම් මත පදනම්ව නීතිය බලාත්මක කරන ආයතන විසින් ඉදිරිපත් කරන ලද ජීව විද්‍යාත්මක නිදර්ශක (මුත්‍රා) සඳහා තහවුරු කිරීමේ විශ්ලේෂණය සිදු කරන ලදි. අදාල නිදර්ශකවල මත්ද්‍රව්‍ය ඇති බවට සනාථ කිරීමට සිදු කරනු ලැබූ තහවුරු කිරීමේ පරීක්ෂාවන් සම්බන්ධයෙන් විස්තර පහත වගුවෙහි සටහන් වේ.

වගු අංක 13 - 2022 කාල සීමාව තුළ සිදු කරන ලද තහවුරු කිරීමේ විශ්ලේෂණය පිළිබඳ විස්තර

ආයතනය	**අරමුණ**	**සාම්පල සංඛ්‍යාව**	**තහවුරු කිරීම සඳහා ඉලක්කගත විශ්ලේෂණ සංඛ්‍යාව**
ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානය, කොළඹ	විමර්ශන	02	02

III. රැකියා ස්ථානයන්හි මත්ද්‍රව්‍ය පරීක්ෂණ

රැකියා ස්ථානවල වැඩ කරන කාල සීමාවන්හිදී පුද්ගලයන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය ආරක්ෂාව සෞඛ්‍ය මෙන්ම කාර්යක්ෂමතාව කෙරෙහිද බලපෑම් ඇති කරයි. එය රටෙහි නිෂ්පාදන ක්‍රියාවලියට අහිතකර ලෙස බලපාන බව පැහැදිලිය. මෙහි අවධානම අවම කිරීම පිණිස ජාතික මාදක රසායනගාරය මඟින් රැකියා ස්ථාන තුළ මත්ද්‍රව්‍ය භාවිතයෙන් තොර කලාප ස්ථාපිත කිරීම උදෙසා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය හා අනුබද්ධ සමාගම්වල සම්බන්ධීකරණයෙන් මත්ද්‍රව්‍ය භාවිතය/ නොකිරීම තහවුරු කිරීම සඳහා සේවකයන්ගේ ශරීර තරලවල පරිවෘත්තීය ද්‍රව්‍ය හඳුනා ගැනීමේ පරීක්ෂණ ක්‍රමවේද ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන් ආරම්භකොට ඇත.

රැකියා ස්ථාන තුළ මත්ද්‍රව්‍ය භාවිතය තහවුරු කිරීම සඳහා විශ්ලේෂණය කරන ලද ජීව විද්‍යාත්මක සාම්පලවල විස්තරාත්මක ලේඛනයන් පහත වගුවෙන් දැක්වේ.

වගු අංක 14 - විශ්ලේෂණය කරන ලද ජීව විද්‍යාත්මක සාම්පල වල විස්තරාත්මක ලේඛනය

ආයතනය		ඒඑෆ්	ඒඑම්එ	ඒඑම්ඩී	ඒඒඑ	ඒඑම්එ	ඒඑන්ඩී	ඒඑල්ඩී	ඒඑස්ඩී	ඒඑස්ඒ	ඒඑස්ඒ
එන්වෝයි ඕර්ටස් පුද්ගලික සමාගම	සාම්පල සංඛ්‍යාව	23	19	10	09	13	03	-	-	-	-
	පරීක්ෂණ සංඛ්‍යාව	47	104	53	54	65	14	-	-	-	-
ශ්‍රී ලංකා වරාය අධිකාරිය	සාම්පල සංඛ්‍යාව	-	-	02	-	-	-	-	-	-	-
	පරීක්ෂණ සංඛ්‍යාව	-	-	24	-	-	-	-	-	-	-

ABC කන්ටේනර්ස්	සාම්පල සංඛ්‍යාව	-	-	10	-	-	-	-	-	-	-
	පරීක්ෂණ සංඛ්‍යාව	-	-	30	-	-	-	-	-	-	-
ඇස්ට්‍රන් ප්‍රයිවට් ලිමිටඩ්	සාම්පල සංඛ්‍යාව	-	-	01	-	02	-	-	-	-	-
	පරීක්ෂණ සංඛ්‍යාව	-	-	02	-	03	-	-	-	-	-
ඇක්යුටි ක්නොලේජ් පාර්ට්නර්ස්	සාම්පල සංඛ්‍යාව	-	-	-	-	01	-	01	03	01	-
	පරීක්ෂණ සංඛ්‍යාව	-	-	-	-	05	-	05	15	05	-
සිලුඑටා ප්‍රයිවට් ලිමිටඩ්	සාම්පල සංඛ්‍යාව	-		-	-	-	-	01	-	-	-
	පරීක්ෂණ සංඛ්‍යාව	-		-	-	-	-	01	-	-	-
රැකියා භාර මණ්ඩලය	සාම්පල සංඛ්‍යාව	-		-	-	-	-	-	-	-	01
	පරීක්ෂණ සංඛ්‍යාව	-		-	-	-	-	-	-	-	12
එකතුව	සාම්පල සංඛ්‍යාව	**23**	**19**	**23**	**09**	**16**	**03**	**02**	**03**	**01**	**01**
	පරීක්ෂණ සංඛ්‍යාව	**47**	**104**	**109**	**54**	**73**	**14**	**06**	**15**	**05**	**12**

මුළු නියැදි සංඛ්‍යාව ***:100***

මුළු පරීක්ෂණ සංඛ්‍යාව ***: 439***

IV. මත්ද්‍රව්‍ය භාවිතා කර රිය පදවන රියදුරන් මාර්ගබදව පරීක්ෂා කිරීම පිළිබඳ නියමු අධ්‍යයනය

ක්‍රියාකාරී සැලැස්මට අනුව අදාළ පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් යෝජිත ක්‍රියාකාරකම් සාකච්ඡා කර අවසන් කර ඇත.

11.6.4 ආයතනික ශක්තිමත් කිරීම

I. ජාත්‍යන්තර කාර්යක්ෂමතා පරීක්ෂණ වැඩසටහන්

එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය පාලන වැඩසටහන මඟින් ජාත්‍යන්තර සහයෝගීතා අභ්‍යාස වැඩසටහන නමින් පවත්වන ජාත්‍යන්තර රසායනාගාර කුසලතා පරීක්ෂණ වැඩසටහනට ජාතික මාදක රසායනාගාරය සහභාගී වේ. මෙම වැඩසටහනට සංවර්ධිත මෙන්ම සංවර්ධනය වෙමින් පවතින රටවල රසායනාගාරයන් සහභාගී වේ.

මේ සඳහා අඛණ්ඩව සිදුකරන සහභාගීත්වය මඟින් ගෝලීය මට්ටමෙන් රසායනාගාර සම්මතකරණ කර ගැනීම, විශලේෂණ හැකියාවන් වර්ධනය කරගැනීම, නිවැරදි තීන්දු ගැනීම පිළිබඳ වඩා නිවැරදි ප්‍රවිශ්ඨයක් ලබා ගනී. ස්ථාවර මෙන්ම ඒකාබද්ධ ප්‍රතිඵල හා වාර්තාකරණයන් සියලුම රසායනාගාර මඟින් ලබා ගැනීම මෙහිදී බලාපොරොත්තු වේ.

මේ සඳහා එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ වැළැක්වීමේ කාර්යාලය මඟින් අවශ්‍ය නිර්දිෂ්ඨ සාම්පල සහ හඳුනා නොගත් සැක සහිත සාම්පල, සහ ජීව විද්‍යාත්මක සම්පල, හඳුනාගැනීම සහ විශ්ලේෂණ සඳහා එවනු ලබයි.

ජාත්‍යන්තර සහයෝගීතා අභ්‍යාස වැඩසටහන (ICE) – 2021 අදියර 2

ජාත්‍යන්තර සහායෝගීතා අභ්‍යාස වැඩසටහන් 2021 අදියර 2 ප්‍රතිඵල සමාලෝචනයට අනුව ජාතික මාදක රසායනාගාරය ඉහළ මට්ටමේ නිරවද්‍යතාවයක් ලබා ගත් අතර UNODC විසින් ඇගයීමට ලක් කරන ලදි.

ජාත්‍යන්තර සහයෝගීතා අභ්‍යාස වැඩසටහන (ICE) – 2022 අදියර 1

සියලුම පරීක්ෂණ සාම්පල, අත්අඩංගුවට ගත් ද්‍රව්‍ය (SM) , ජීව විද්‍යාත්මක නිදර්ශක (BS) නොදන්නා නව මනෝවර්ථන ද්‍රව්‍ය (NPS) සඳහා සිදු කරන ලද සියලුම අදාළ විශ්ලේෂණයන් ප්‍රතිඵල සමාලෝචනයට අනුව ජාතික මාදක රසායනාගාරය ඉහළ මට්ටමේ නිරවද්‍යතාවයක් ලබා ගත් අතර UNODC විසින් ඇගයීමට ලක් කරන ලදි.

ජාත්‍යන්තර සහයෝගීතා අභ්‍යාස වැඩසටහන (ICE) – 2022 අදියර 2

ජාත්‍යන්තර සහායෝගීතා අභ්‍යාස වැඩසටහන 2022 අදියර 2 ට අදාළ සාම්පල ලබා ගැනීම සඳහා UNODC වෙත ආනයන බලපත්‍රය ඉදිරිපත් කර ඇත.

II. ජාතික මාදක රසායනාගාරයෙහි සම්පත් ශක්තිමත් කිරීම, සේවාවන්හි ඵලදායිතාව සහ පහසුකම් සංවර්ධනය - 17025 විද්‍යාගාර තත්ත්ව කළමනාකරණ සහතිකය

ISO 17025 විද්‍යාගාර තත්ත්ව කළමනාකරණ සහතිකය ලබා ගැනීම සඳහා විද්‍යාගාරයේ සේවාවන් ඉහළ සම්මත ක්‍රියාමාර්ගයක පවත්වා ගැනීම පිණිස මත්ද්‍රව්‍ය, මනෝවර්ථන ද්‍රව්‍ය, පුරෝගාමී රසායන හා ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ ක්‍රියාකාරිත්වය වැඩි දියුණු කිරීම සඳහා භාවිතා කරන ද්‍රව්‍ය ආදිය

සම්බන්ධයෙන් සිදු කරනු ලබන විද්‍යාත්මක පරීක්ෂණයන් වැඩිදියුණු කිරීම සඳහා අදාල ලියකියවිලි සකස් කෙරෙමින් පවතී.

උපදේශන සේවා සම්බන්ධ කරන ලද ඉල්ලීම පරිදි, ISO 17025 රසායනාගාර තත්ත්ව කළමනාකරණ පද්ධතිය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික මත්ද්‍රව්‍ය රසායනාගාරය ප්‍රතිසංවිධානය කිරීම සම්බන්ධයෙන් කර්මාන්ත තාක්ෂණ ආයතනය (ITI) විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ලැබී ඇත.

III. ජාත්‍යන්තර සම්බන්ධීකරණය සහ සහයෝගීතාව ශක්තිමත් කිරීම

වගු අංක 15 - 2022 වසරේ ජාත්‍යන්තර සම්බන්ධීකරණය සහ සහයෝගීතාව පිළිබඳ සිදුවීම්

ආයතනය	**වැඩසටහන**	**තාක්ෂණික සහාය / ලබා දී ඇති නිර්දේශ**
මත්ද්‍රව්‍ය පිළිබඳ කොමිසම (Commission on Narcotic Drugs)	මත්ද්‍රව්‍ය පිළිබඳ කොමිසමේ 65 වැනි සැසිවාරයට සමගාමීව අතුරු වැඩසටහන්	මුල් ළමාවිය, මධ්‍යම ළමාවිය සහ නව යොවුන් වියේ වයස් කාණ්ඩවල මත්ද්‍රව්‍ය භාවිතය වැළැක්වීම සඳහා සතිමත්බව මත පදනම් වූ මැදිහත්වීම් (MBI) සම්බන්ධ මත්ද්‍රව්‍ය පිළිබඳ කොමිසම වෙත කෙටුම්පත් යෝජනාවක් ඉදිරිපත් කිරීම
මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලය (UNODC)	මත්ද්‍රව්‍ය භාවිතයේ අක්‍රමිකතාවල ස්වභාවය, වැළැක්වීම, ප්‍රතිකාර කිරීම සහ රැකවරණය පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදකයින් පුහුණු කිරීමේ වැඩසටහන	පුහුණුව සඳහා සහභාගී විය
මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලය (UNODC)	එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ අබුඩාබි හි දින තුනක, මත්ද්‍රව්‍ය භාවිතයේ අක්‍රමිකතාවල ස්වභාවය, වැළැක්වීම සහ ප්‍රතිකාර කිරීම පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ පුහුණුව (ISSUP සම්මන්ත්‍රණය)	පුහුණුව සඳහා සහභාගී විය
JICA පුහුණු වැඩසටහන	JICA - නීති විරෝධී මත්ද්‍රව්‍ය භාවිතය වැලැක්වීම පිළිබඳ මාර්ගගත පුහුණු වැඩසටහන	පුහුණුව සඳහා සහභාගී විය

IV. විද්‍යාත්මක ලිපි/තාක්ෂණ වාර්තා සහ වෙනත් ප්‍රකාශන

ජාතික මත්ද්‍රව්‍ය රසායනාගාරයේ විද්‍යාත්මක නිලධාරීන් විසින් පහත විද්‍යාත්මක ප්‍රකාශන සිදු කර ඇත.

1. 'Enhanced toxicity in seizures containing new psychoactive substances caused by intentional adulteration and/or presence of contaminants', Muthumala K.M., Weerasinghe D.P.P. - scientific sessions of the 14th AFSN Annual Meeting & Symposium on Nov 2-5 2022.
2. 'Scientific evidence based practices to address the challenge of road traffic accidents and injuries due to driving under influence of drugs' Weerasinghe D.P.P., Athauda A.D.Y.K., Muthumala K.M., Mahalekam M.M.S.K. Perera D.G.P.M. - International Symposium on Drug Related Studies organized by NDDCB
3. 'Gender Difference in Substance Abuse, Treatment Availability and Difficulties to Access Treatment in Women', Abeynayake M.W.N.M, Weerasinghe D.P.P, Nanayakkara S. - International Symposium on Drug Related Studies organized by NDDCB
4. 'Scientific Evidence Based Strategic Interventions to Combat the Challenge of Substance Use During Pregnancy And to Prevent Its Implications on Neonates', Abeynayake M.W.N.M, Perera D. G. P.M., Weerasinghe D.P.P, Nanayakkara S. - International Symposium on Drug Related Studies organized by NDDCB
5. 'Diversion of Pharmaceutical Substances for Non-Medical Use: Systematic Analysis', Abeynayake M.W.N.M, Muthumala K.M., Weerasinghe D.P.P, Nanayakkara S - International Symposium on Drug Related Studies organized by NDDCB
6. 'Workplace drug abuse management based on scientific evidence based practices', D.P.P. Weerasinghe , K.M Muthumala, A.D.Y.K Athauda, D.G.P.M. Perera, M. M.S. K Mahalekam - International Symposium on Drug Related Studies organized by NDDCB
7. 'Need for new laws to combat against high potency cannabis varieties available in sri lanka', Weerasinghe D.P.P., Athauda A.D.Y.K.., Mahalekam M.M.S.K. Perera D.G.P.M., M.W.N.M. Abeynayake, Muthumala K.M. - International Symposium on Drug Related Studies organized by NDDCB

ජාතික මාදක රසායනාගාරයේ 2021/2022 වර්ෂයන්හි භෞතික හා මූල්‍ය ප්‍රගතිය සංසන්දනාත්මකව ඉදිරිපත් කිරීම

වර්ෂය	භෞතික ප්‍රගතිය	මූල්‍ය ප්‍රගතිය
2021	68.08%	12.01%
2022	51.4%	35.16%

ඇතැම් ව්‍යාපෘතීන් සම්පූර්ණ කරගැනීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති වීමත්, අදාල රජය හා පෞද්ගලික ආයතන විසින් සිදු කරන ලද ඉල්ලීම් සහ අවශ්‍යතා මත පමණක් විශ්ලේෂණ වාර්තා ලබා දීම සහ තාක්ෂණික සහයන් ලබා දීම සිදු කරනු ලැබීමත් නිසා 2022 වසර සඳහා භෞතික ප්‍රගතිය 51.4% දක්වා අඩුවීමක් සිදුව ඇත.

11.7 පුරෝගාමී පාලන අධිකාරිය

ශ්‍රී ලංකාවේ මාදක සහ මනෝවර්තක ද්‍රව්‍යවලට ද්‍රව්‍ය නීති විරෝධී ලෙස නිෂ්පාදනය කිරීමේ දී භාවිතා කරන පුරෝගාමී රසායනික ද්‍රව්‍ය පාලනය කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව අත්සන් කර ඇති ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය පාලන ගිවිසුමක් වන 1988 මත්ද්‍රව්‍ය හා මනෝවර්තක ද්‍රව්‍යවල නීති විරෝධී ජාවාරමට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතියේ විධිවිධාන ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා බලාත්මක අධිකාරිය ලෙස 2008 අංක 01 දරන මාදක සහ මනෝවර්තක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුතියේ 18 වැනි වගන්තියට අනුව පුරෝගාමී පාලන අධිකාරිය පිහිටුවා ඇත.

පුරෝගාමී රසායනිකයක් යනු වෙනත් සංයෝගයක් නිපදවන රසායනික ප්‍රතික්‍රියාවකට සහභාගි වන රසායන ද්‍රව්‍යකි. මත්ද්‍රව්‍ය පුරෝගාමී රසායනිකයක් යනු නීති විරෝධී මත්ද්‍රව්‍ය සහ මනෝවිද්‍යාත්මක ද්‍රව්‍ය සෑදීම සඳහා භාවිතා කළ හැකි රසායන ද්‍රව්‍යයකි. එබැවින් මෙම රසායනික ද්‍රව්‍ය මෙරටට ආනයනය කිරීම, භාවිතය නිරීක්ෂණය කිරීම සඳහා දැඩි යාන්ත්‍රණයක් අවශ්‍ය වේ.

11.7.1 1988 එක්සත් ජාතීන්ගේ සම්මුතියට අනුකූල වීම

ශ්‍රී ලංකාව 1988 මත්ද්‍රව්‍ය හා මනෝවර්තක ද්‍රව්‍ය නීති විරෝධී ප්‍රවාහනයට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතියට 1991 ජුනි 6 සිට පාර්ශ්වකරුවෙකු වී ඇත. පුරෝගාමී රසායනික ද්‍රව්‍ය පාලනය කිරීම සම්බන්ධ විධිවිධාන සහ අවශ්‍යතා (නීති සම්පාදන සහ පාලන පියවර), සාමාන්‍ය අවශ්‍යතා 12වන වගන්තියේ 1වන ඡේදයේ පහත පරිදි සාරාංශ කර ඇත.

සම්මුතියේ මූලික අදහස වන්නේ මත්ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා භාවිත කළ හැකි රසායනික ද්‍රව්‍ය ගණනාවක් නිත්‍යානුකූල අරමුණු සඳහා වෙළෙඳාමට ඉඩ දී වෙළෙඳාම නියාමනය කිරීම සහ නීති විරෝධී ඖෂධ නිෂ්පාදනය සඳහා යොමුවීම වැළැක්වීමයි. 1988 එක්සත් ජාතීන්ගේ සම්මුතිය පුරෝගාමී රසායනික ද්‍රව්‍ය පාලනය කිරීම සඳහා නීතිමය පදනමක් ස්ථාපිත කරන අතර එවැනි ද්‍රව්‍ය අපසරණය වැළැක්වීම සඳහා සුදුසු පරිපාලන රාමුවක්, ක්‍රියාකාරී යාන්ත්‍රණයක් සහ සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි පිහිටුවීමට යෝජනා කරයි.

1988 එක්සත් ජාතීන්ගේ සම්මුතියේ 12වන වගන්තියට අනුව, පුරෝගාමී රසායනික ද්‍රව්‍ය නිෂ්පාදනය හා බෙදාහැරීමේ නිරත සියලුම පුද්ගලයින් සහ ව්‍යවසායන් නිරීක්ෂණය කළ යුතුය.

"මත්ද්‍රව්‍ය හෝ මනෝවර්තක ද්‍රව්‍ය නීති විරෝධී ලෙස නිෂ්පාදනය කිරීම සඳහා භාවිතා කරන, පනතේ I සහ II වගු තුළ හි ඇති ද්‍රව්‍ය වෙනත් කාර්යයක් සඳහා යොමු කිරීම වැළැක්වීමට වගකිවයුතු පාර්ශවයන් සුදුසු යැයි සලකනු ලබන ක්‍රියාමාර්ග ගත යුතු අතර, මේ සඳහා එකිනෙකා සමඟ සහයෝගයෙන් කටයුතු කළ යුතුය."

ඒ අනුව සහ ඉහත සඳහන් කරුණු අනුව පුද්ගලයින් සහ/හෝ ව්‍යවසායන්, අවසන් භාවිතාකරුවන් 1683, ආනයනකරුවන් 244, වෙළෙන්දන් 245, අපනයනකරුවන් 4, සහ පරිශ්‍ර 393 ලෙස පුරෝගාමී පාලන අධිකාරිය යටතේ ලියාපදිංචි කර ඇති අතර, එම පරිශ්‍ර පිළිබඳ පරීක්ෂණ පැවැත්විය යුතුය. එසේ ලියාපදිංචි නොකළ ව්‍යවසායන්/ පුද්ගලයන් දැනුවත් කිරීම සඳහා සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි පුවත්පත්වල දැන්වීමක් පළ කිරීමට කටයුතු කර ඇත.

11.7.1.1 මත්ද්‍රව්‍ය අනිසි භාවිතය වැළැක්වීම සහ පාලනය සඳහා වන ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්තියට අනුව පුරෝගාමී පාලන අධිකාරියේ කාර්යභාරය

මත්ද්‍රව්‍ය අනිසි භාවිතය වැළැක්වීම සහ පාලනය සඳහා වන ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්තියේ 2.2 වගන්තියට අනුව, පුරෝගාමී පාලන අධිකාරිය හට ශ්‍රී ලංකාව තුළ ඵලදායී අධීක්ෂණ පද්ධතියක් ස්ථාපිත කිරීමට බලය ඇත.

(අ) පුරෝගාමී රසායන ද්‍රව්‍ය ආනයනය සහ අපනයනය සඳහා සහතික සහ අවසර ලබා දීම සහ ගිවිසුම්වල සියලුම අවශ්‍යතා ඵලදායී ලෙස සපුරාලීම සඳහා 1988 මාදක ඖෂධ සහ මනෝවර්තක ද්‍රව්‍යවල නීතිවිරෝධී ජාවාරමට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතියේ 12 වැනි වගන්තියේ විධිවිධානවලට අනුකූලව පුරෝගාමී සහ අත්‍යවශ්‍ය රසායනික ද්‍රව්‍ය පිළිබඳ ජාතික පාලනයන් නියාමනය කිරීම හෝ බලාත්මක කිරීම.

(ආ) පාලනය යටතේ පවතින පුරෝගාමී රසායනික ද්‍රව්‍ය ආනයනය, අපනයනය, ගබඩා කිරීම සහ බෙදාහැරීම සම්බන්ධයෙන් පවතින ක්‍රියා පටිපාටි, භාවිතයන්, රෙගුලාසි සහ නීති වරින් වර සමාලෝචනය කිරීම.

(ඇ) බලපත්‍ර අනුමත කරන බලධාරීන් සහ නීතිය ක්‍රියාත්මක කරන ආයතන සහ අනෙකුත් අදාළ ආයතන සමඟ එක්ව පාලනය යටතේ පවතින පුරෝගාමී රසායනික ද්‍රව්‍ය ජාවාරම් කිරීම, හරවා යැවීම සහ අනිසි ලෙස භාවිතා කිරීම වැළැක්වීම ශක්තිමත් කිරීම.

සලකා බලන කාලසීමාව තුළ සේවක සංඛ්‍යාව වැඩි දියුණු කිරීම, 2010 අංක 01 දරන පුරෝගාමී පාලන අධිකාරියේ රෙගුලාසි සංශෝධනය කිරීම, තත්‍යකාලීන තොරතුරු හුවමාරු කිරීමේ යාන්ත්‍රණයන් පිහිටුවීම, මාර්ගගතව හමුවීම් වෙන්කරවා ගැනීමේ විකල්පය වෙබ් අඩවිය හරහා අධිකාරිය විසින් අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර ඇත. පුරෝගාමී පාලන අධිකාරිය, බලපත්‍ර නිකුත් කිරීම, පරීක්ෂණ ක්‍රියා පටිපාටිය සහ රසායනික බැහැර කිරීමේ ක්‍රියා පටිපාටිය සම්බන්ධයෙන් සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි ස්ථාපිත කර ඇත.

11.7.1.2 2008 අංක 01 දරන මාදක සහ මනෝවර්තක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුතිය ශ්‍රී ලංකාව තුල ක්‍රියාත්මක කිරීම

2008 අංක 01 දරන මාදක ඖෂධ සහ මනෝවර්තක ද්‍රව්‍ය නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනතේ 19 වැනි වගන්තියට අනුව අධිකාරියට පහත රාජකාරි පැවරී ඇත.

අධිකාරියේ කාර්යය

(අ) පනතේ පළමු උපලේඛනයේ Iවන වගුවේ සහ IIවන වගුවේ නිශ්චිතව දැක්වෙන ද්‍රව්‍ය ආනයනය කිරීමට හෝ අපනයනය කිරීමට අපේක්ෂා කරන තැනැත්තන්, අදාළ කර්මාන්තවල අවශ්‍යතාවයන් සැලකිල්ලට ගෙන, නියම කරනු ලබන ආකාරයට වලංගු බලපත්‍රයක් අනුව එසේ සිදු කරන බවට;

(ආ) පනතේ පළමු උපලේඛනයේ Iවන වගුවේ සහ IIවන වගුවේ නිශ්චිතව දැක්වෙන ද්‍රව්‍ය ආනයනය හෝ අපනයනය කිරීමට අදාළ කටයුතු බලපත්‍රලාභියා විසින් කටයුතු කරන්නේ යම් පරිශ්‍රයක සිට ද, එම පරිශ්‍රය ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍යවන පියවර ගන්න බවට;

(ඇ) පනතේ පළමු උපලේඛනයේ Iවන වගුවේ සහ IIවන වගුවේ නිශ්චිතව දැක්වෙන ද්‍රව්‍ය ඒවා ආනයනය කරන ලද හෝ අපනයනය කරන ලද කාර්යය සඳහා පමණක් භාවිතා කරන බවට;

(ඈ) පනතේ පළමුවන උපලේඛනයේ Iවන වගුවේ සහ IIවන වගුවේ නිශ්චිතව දැක්වෙන ද්‍රව්‍ය භාවිතා කරමින් යම් මාදක ඖෂධයක් හෝ මනෝවර්තකයක් නීතිවිරෝධී ලෙස නිෂ්පාදනය කිරීමේ උත්සාහයන් යථා පරිදි වාර්තා කරන බවටත්, එම වරදකරුවන්ට දඬුවම් පැමිණවීම සඳහා උචිත ක්‍රියාමාර්ග ගන්නා බවටත්;

(ඉ) පනතේ පළමු උපලේඛනයේ Iවන වගුවේ සහ IIවන වගුවේ නිශ්චිතව දැක්වෙන ද්‍රව්‍යවලින් යම් රසායනික ද්‍රව්‍යක් ආනයනය කරන හෝ අපනයනය කරන සෑම තැනැත්තෙක්ම, එම ද්‍රව්‍ය ආනයනය කිරීම, අපනයනය කිරීම, භාවිතා කිරීම, නිෂ්පාදනය කිරීම සහ බෙදාහැරීම පෙන්නුම් කරන ත්‍රයිමාසික වාර වාර්තා අධිකාරියට ඉදිරිපත් කරන බවට;

(ඊ) පනතේ පළමු උපලේඛනයේ Iවන වගුවේ සහ IIවන වගුවේ නිශ්චිතව දැක්වෙන ද්‍රව්‍යවලින් යම් ද්‍රව්‍යයකට අදාළව සියලු සැකකටයුතු ගනුදෙනු පිළිබඳ විස්තර, එවැනි ද්‍රව්‍ය කිසිවක් නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම හෝ අපනයනය කිරීම හා සම්බන්ධ තැනැත්තන් විසින් ප්‍රමාදයකින් තොරව අධිකාරියට දැනුම් දෙන බවට;

(උ) නියම කර ඇති කාරණා පිළිබඳ නිසි වාර්තා පවත්වා ගෙන යන බවත්, කටයුතු සහ වාර්තා නියම කරනු ලබන ආකාරයට නියාමනය කරන බවටත්, අධිකාරිය සහතික විය යුතුය.

11.7.1.3 පුරෝගාමී රසායන ද්‍රව්‍ය පාලනයට අදාළ රෙගුලාසි ක්‍රියාත්මක කිරීම

2008 අංක 1 දරන මාදක ඖෂධ සහ මනෝවර්තක ද්‍රව්‍ය පිළිබඳ නීති විරෝධී ජාවාරමට එරෙහි සම්මුතියේ 18වැනි වගන්තිය බලාත්මක කිරීම සඳහා 2010 අංක 1 දරන පුරෝගාමී පාලන අධිකාරි නියෝග රෙගුලාසි අනුව පුරෝගාමී පාලන අධිකාරිය 2010 මැයි 04 දින සිට ක්‍රියාත්මක වේ.

තව ද, නීතිවිරෝධී ලෙස මාදක ඖෂධ සහ මනෝවර්තක ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා යොදාගත හැකි පුරෝගාමී රසායන අපසරණය වැළැක්වීමට අදාළ අධිකාරියේ මෙහෙයුම් සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා මසකට වරක් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පවත්වනු ලැබේ. ඒ අනුව එම කාලය තුළ රැස්වීම් හතරක් (04) පැවැත්විණි.
2008 අංක 1 දරන මාදක ඖෂධ සහ මනෝවර්තක ද්‍රව්‍යවල නීතිවිරෝධී වෙළඳාමට එරෙහි සම්මුතිවල 31 වැනි වගන්තිය ප්‍රකාරව පුරෝගාමී රසායනික ද්‍රව්‍ය සඳහා ගත යුතු පාලන ක්‍රියාමාර්ග 2010 අංක 1 දරන පුරෝගාමී රසායනික ද්‍රව්‍ය (නියාමන පියවර) රෙගුලාසි අංක 1හි දක්වා ඇත.

1988 එක්සත් ජාතීන්ගේ සම්මුතියේ සහ 2008 අංක 1 දරන මාදක ඖෂධ සහ මනෝවර්තක ද්‍රව්‍ය පනතේ 18වැනි වගන්තියට එරෙහිව බලාත්මක කිරීම සඳහා, 2010 අංක 1 දරන පුරෝගාමී පාලන

අධිකාරියේ රෙගුලාසි සහ 2010 අංක 1 දරන පුරෝගාමී රසායනික (නියාමන පියවර) නියෝග පිහිටුවීම සංශෝධනය කිරීම සඳහා අධිකාරිය විසින් නිසි අනුමැතිය ලබා දී ඇත.

11.7.2 පුරෝගාමී රසායනික ද්‍රව්‍යවල නීත්‍යානුකූල අවශ්‍යතාවය සහ පුරෝගාමී රසායන ද්‍රව්‍ය නීති විරෝධී ලෙස මත්ද්‍රව්‍ය නිෂ්පාදනයට අපසරණය වීමේ හැකියාව නිරීක්ෂණය කිරීම

ශ්‍රී ලාංකීය සන්දර්භය තුළ, පුරෝගාමී රසායනික මූලික වශයෙන් භාවිත කරනුයේ රසායනාගාර පර්යේෂණවල ප්‍රතික්‍රියාකාරක ඇතුළුව සුවඳ විලවුන්, තීන්ත, ඩයි වර්ග, ඖෂධ, ප්ලාස්ටික් වැනි දෛනික අවශ්‍යතා ඇතුළු පුළුල් පරාසයක අත්‍යවශ්‍ය නිෂ්පාදන නීත්‍යානුකූලව නිෂ්පාදනය කිරීම සඳහාය. බොහෝ කාර්මික යෙදුම් අතර ඇසිටෝන් සහ මෙතිල් එතිල් කීටෝන් මුද්‍රණ තීන්තවල ද්‍රාවක ලෙස බහුලව භාවිතා වන අතර ඒවා බොහෝ නිෂ්පාදන කර්මාන්තවල දින සංකේතනය සඳහා භාවිතා කරයි. සල්ෆියුරික් අම්ලය ප්‍රධාන වශයෙන් බැටරි අම්ල නිෂ්පාදනය සඳහා භාවිතා වේ. හයිඩ්‍රොක්ලෝරික් අම්ලය සහ සල්ෆියුරික් අම්ලය පී.එච්. අගය සකස් කිරීම සඳහා කර්මාන්තවල අපජල පිරිපහදු කිරීම සඳහා බහුලව භාවිතා වන අතර පිහිනුම් තටාක නඩත්තු කිරීමේදී ද භාවිතා වේ. ඇසිටෝන්, ටොලුයින් සහ මෙතිල් එතිල් කීටෝන් තීන්ත කර්මාන්තයේ ද්‍රාවක ලෙස භාවිතා කරනුයේ දැව ආලේපන වැනි තුනී සහ ද්‍රාවක පදනම් වූ තීන්ත නිෂ්පාදන ක්‍රියාවලීන්හි ය. ටොලුයින් මැලියම් නිෂ්පාදනය සඳහා ද්‍රාවකයක් ලෙසද භාවිතා කරයි. එතිල් ඊතර් කුළුබඩු නිස්සාරණය සඳහා භාවිතා කරයි. පිපරනැල් අයිස්ක්‍රීම් සහ රසකාරක නිෂ්පාදනය වැනි රස කැවිලි නිෂ්පාදන කර්මාන්තවල භාවිතා වේ. පොටෑසියම් පර්මැන්ගනේට් ධූමකරණය සඳහා ගොවිපලවල භාවිතා වේ. ඖෂධීය ඖෂධ කිහිපයක නිෂ්පාදනය සඳහා ඇන්ත්‍රනිලික් අම්ලය, ෆීනයිල් ඇසිටික් අම්ලය, පිපරඩීන්, ඇසිටික් ඇන්හයිඩ්‍රයිඩ්, එන්. ඇසිටිලැන්ත්‍රලිනික් අම්ලය, එපිහිඩ්‍රින්, අර්ගොමෙට්‍රින, නෝර් එප්ඩ්‍රින්, 1-ෆීනයිල් -2-ප්‍රොපනොන සහ ප්සියුඩෝඑපිහිඩ්‍රින් භාවිතා වේ. උදාහරණයක් ලෙස, එපිහිඩ්‍රින් සහ සියුඩෝඑපිහිඩ්‍රින්, ස්වාස නාල විස්තාරණය, නාසික ඉහිල්කිරීම් සඳහා අදාළ ඖෂධ නිෂ්පාදනයට සඳහා භාවිතා වේ. නෝර්එප්ඩ්‍රින් නාසික ඉහිල්කිරීම් නිෂ්පාදනය සඳහා භාවිතා කරයි. ඉරුවාරදය සඳහා ප්‍රතිකාර කිරීම සඳහා අර්ගොමෙට්‍රින් සහ අර්ගොටැමින් නියම කර ඇත. සැෆ්රෝල් සහ අයිසෝ සැෆ්රෝල් සුවඳ විලවුන්, පයිප්පෙරෝනල් සහ සබන් නිෂ්පාදනය සඳහා යොදා ගනී. කාබනික සංයෝග සංස්ලේෂණය සඳහා ලයිසර්ජික් අම්ලය භාවිතා කරයි.

11.7.2.1 පුරෝගාමී රසායන ද්‍රව්‍ය ආනයන හා අපනයන අධීක්ෂණය

ශ්‍රී ලංකාවේ පුරෝගාමී රසායන පාලනය සඳහා බලාත්මක අධිකාරිය ලෙස, පුරෝගාමී පාලන අධිකාරිය විසින් මත්ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමේ හැකියාව අවම කිරීම සඳහා එවැනි රසායනික ද්‍රව්‍ය අපසරණය වීම වැළැක්වීමේ අරමුණින් පුරෝගාමී රසායන ද්‍රව්‍ය ආනයනය, අපනයනය සහ බෙදාහැරීම ඵලදායී ලෙස අධීක්ෂණය කිරීමේ කටයුතු පහත සඳහන් අයුරින් ඉටුකරනු ලබයි.

- **බලපත්‍ර නිකුත් කිරීම**

පුරෝගාමී පාලන අධිකාරිය විසින් 2008 අංක 1 දරන පනතේ පළමු උපලේඛනයේ I සහ II වගුවේ දක්වා ඇති ඕනෑම ද්‍රව්‍යයක් ආනයනය කිරීමට හෝ අපනයනය කිරීමට අයදුම්පත් ඉදිරිපත් කරන පුද්ගලයින් සඳහා බලපත්‍ර නිකුත් කර ඇති අතර 2022 වර්ෂය තුළ බලපත්‍ර 600ක් නිකුත් කර ඇත.

- **පරිශ්‍ර ලියාපදිංචි කිරීම**

පුරෝගාමී පාලන අධිකාරිය විසින් 2008 අංක 1 දරන පනතේ පළමු උපලේඛනයේ I සහ II වගුවේ දක්වා ඇති ඕනෑම ද්‍රව්‍යයක් ආනයනය කිරීමට හෝ අපනයනය කිරීමට අයදුම්පත් ඉදිරිපත් කරන පුද්ගලයින් ගේ, එම කටයුතු වලට අදාළ පරිශ්‍රය ලියාපදිංචි කල යුතු අතර, එවැනි පරිශ්‍ර ලියාපදිංචි කිරීම් 18ක් 2022 වර්ෂය තුළ සිදු කර ඇත.

- **අධීක්ෂණය සහ පරීක්ෂණය**

බලපත්‍රලාභියාගේ ලියාපදිංචි පරිශ්‍රය වරින් වර අධීක්ෂණය කළ යුතු අතර, පනතේ පළමු උපලේඛනයේ I සහ II වගුවේ දක්වා ඇති ද්‍රව්‍ය භාවිතා කරමින් සිදුකරන ක්‍රියාකාරකම්, පුරෝගාමී පාලන අධිකාරිය මඟින් අධීක්ෂණය කළ යුතු අතර රට තුළ පැවති ඉන්ධන අර්බුදය හේතුවෙන් කාල සීමාව තුළ සිදු කරන ලද පරිශ්‍ර පරීක්ෂා කිරීම් සංඛ්‍යාව විසි හතරකට (24) සීමා විය.

පරිශ්‍ර පරීක්ෂාවන් අතරතුර





11.7.2.2 පුරෝගාමී රසායන ද්‍රව්‍ය ගනුදෙනු කිරීම සහ අවසන් භාවිතය නිරීක්ෂණය කිරීම











පනතේ පළමු උපලේඛනයේ I සහ II වගුවේ නිශ්චිතව දක්වා ඇති ඕනෑම ද්‍රව්‍යයක් සම්බන්ධයෙන් කටයුතු කිරීමට අදහස් කරන සෑම පුද්ගලයෙක්ම හෝ පනතේ පළමු උපලේඛනයේ I සහ II වගුවේ දක්වා ඇති යම් ද්‍රව්‍යයක් භාවිතා කිරීමට අදහස් කරන පුද්ගලයන් ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කළ යුතුය. අධිකාරිය, අදාළ ගාස්තුව සමඟ, අයදුම්පත ලැබීමෙන් පසු අයදුම්පතෙහි සපයා ඇති තොරතුරුවල නිරවද්‍යතාවය සහ අලෙවි නියෝජිතයා හෝ අවසාන පරිශීලකයා විසින් ක්‍රියාකාරකම් සිදු කරන ආකාරය තහවුරු කර වසරක කාලයක් සඳහා සහතිකයක් හෝ ලියාපදිංචියක් නිකුත් කරනු ලැබේ. ඒ අනුව පුරෝගාමී රසායනික ද්‍රව්‍ය සඳහා ලියාපදිංචි කර ඇති අයදුම්පත් 636ක් සඳහා ලියාපදිංචි සහතික 600ක් නිකුත් කර ඇත.

	ක්ෂේත්‍රය	ලියාපදිංචි සහතික/බලපත්‍ර වර්ගය					
		අවසන් භාවිතා කරන්නන්	මෙළෙන්දන්	ආනයනකරුවන්	අපනයනකරුවන්	පරීක්ෂා	එකතුව
වසර 2022 (2022.12.31 දිනට)	ලියාපදිංචි අයදුම්පත් සංඛ්‍යාව	449	68	100	01	18	636
	නිකුත් කළ ලියාපදිංචි සහතික/ බලපත්‍ර සංඛ්‍යාව	437	67	94	02	00	600
	පරිශ්‍ර පරීක්ෂා කිරීම						24


වගුව 1 : 2022.01.01 සිට 2022.12.31 දක්වා කාලය තුළ ලියාපදිංචි කර ඇති අයදුම්පත් සහ බලපත්‍ර පිළිබඳ විස්තර



රූපය 1: 2022.01.01 සිට 2022.12.31 දක්වා කාලය තුළ විවිධ බලපත්‍ර කාණ්ඩ සඳහා ලියාපදිංචි වූ අයදුම්පත් සංඛ්‍යාව පිළිබඳ විස්තර




රූපය 2 : 2022.01.01 සිට 2022.12.31 දක්වා කාලය තුළ විවිධ බලපත්‍ර කාණ්ඩ සඳහා නිකුත් කර ඇති බලපත්‍ර සංඛ්‍යාව පිළිබඳ විස්තර



රූපය 3 : 2022.01.01 සිට 2022.12.31 දක්වා කාලය තුළ විවිධ බලපත්‍ර කාණ්ඩ සඳහා ලියාපදිංචි කර ඇති අයදුම්පත් සංඛ්‍යාව සහ බලපත්‍ර සංසන්දනය කිරීම

මාසය	2022	
	පරීක්ෂා කිරීම්	අවලංගු කල බලපත්‍ර
ජනවාරි	07	00
පෙබරවාරි	03	00
මාර්තු	00	00
අප්‍රේල්	00	00
මැයි	00	00
ජුනි	00	00
ජූලි	00	00
අගෝස්තු	00	00
සැප්තැම්බර්	00	00
ඔක්තෝබර්	00	00
නොවැම්බර්	05	00
දෙසැම්බර්	09	00
එකතුව	**24**	**00**

වගුව 2 : 2022.01.01 සිට 2022.12.31 දක්වා කාලය තුල සිදු කරන ලද පරිශ්‍ර පරීක්ෂා කිරීම් පිළිබඳ විස්තර




රූප සටහන 4 : 2022.01.01 සිට 2022.12.31 දක්වා කාලය තුළ සිදු කරන ලද පරීක්ෂණ පිළිබඳ විස්තර

පුරෝගාමී රසායන ද්‍රව්‍ය ආනයනය හෝ අපනයනය සඳහා නිකුත් කර ඇති බලපත්‍ර, ඒවායේ සංශෝධන සහ අලුත් කිරීම් සඳහා ගාස්තු අය කරනු ලබන්නේ රු.5,000/-, රු.2,000/- සහ රු.4,500/- වශයෙනි. පරිශ්‍රය ලියාපදිංචි කිරීම සඳහා රු.5,000/-ක් අය කරනු ලබන අතර අලෙවි නියෝජිතයන් ලියාපදිංචි කිරීම, ඔවුන්ගේ සංශෝධන සහ අලුත් කිරීම් සඳහා රු.4,000/-, රු.1,500/- සහ රු.3,500/- පිළිවෙලින් අයකරනු ලැබේ. අවසාන පරිශීලකයින් සඳහා ලියාපදිංචි සහතිකය ලියාපදිංචි කිරීම, සංශෝධනය කිරීම සහ අලුත් කිරීම සඳහා පිළිවෙලින් රු.1,500/-, රු.500/- සහ රු.1,000/- අය කෙරේ. 2022.01.01 සිට 2022.12.31 දක්වා කාලය තුළ බලපත්‍ර සහ ලියාපදිංචි සහතික නිකුත් කිරීමෙන් පුරෝගාමී පාලන අධිකාරියේ ආදායම ලෙස රු. 1,354,650ක් උපයා ගන්නා ලදි. අවසාන පරිශීලකයින් ලියාපදිංචි කිරීම සඳහා අය කරන ලද ගාස්තු සහ විස්තර 03 වගුවේ දක්වා ඇත.


මාසය	අවසන් භාවිතා කරන්නන් රු.	මෙලෙන්දන් රු.	ආනයනකරුවන් රු.	පරීක්ෂා රු.	අපනයනකරුවන් රු.	එකතුව රු.
ජනවාරි	49,500.00	35,200.00	50,050.00	11,000.00	00.00	145,750.00
පෙබරවාරි	46,200.00	26,950.00	27,500.00	5,500.00	4,950.00	111,100.00
මාර්තු	44,550.00	7,700.00	37,400.00	11,000.00	00.00	100,650.00
අප්‍රේල්	35,750.00	7,700.00	14,850.00	5,500.00	00.00	63,800.00
මැයි	31,900.00	11,550.00	12,100.00	5,500.00	00.00	61,050.00
ජූනි	31,350.00	11,550.00	17,050.00	00.00	00.00	71,500.00

ජූලි	34,100.00	4,400.00	27,500.00	11,000.00	00.00	77,000.00
අගෝස්තු	56,100.00	19,800.00	44,000.00	5,500.00	00.00	125,400.00
සැප්තැම්බර්	40,700.00	31,350.00	69,850.00	11,000.00	00.00	152,900.00
ඔක්තෝබර්	40,700.00	39,600.00	45,650.00	11,000.00	00.00	136,950.00
නොවැම්බර්	64,350.00	34,650.00	54,450.00	5,500.00	00.00	158,950.00
දෙසැම්බර්	51,700.00	23,650.00	57,750.00	16,500.00	00.00	149,600.00
එකතුව	**526,900.00**	**265,650.00**	**458,150.00**	**99,000.00**	**4,950.00**	**1,354,650.00**


වගුව 03 : විවිධ බලපත්‍ර කාණ්ඩ යටතේ 2022.01.01 සිට 2022.12.31 දක්වා කාලය තුළ පුරෝගාමී පාලන අධිකාරිය විසින් ජනනය කරන ලද ආදායම



රූපය 5: 2022.01.01 සිට 2022.12.31 දක්වා කාලය තුළ මාසික ආදායමේ විචලනය පිළිබඳ විස්තර



රූපය 6: 2022.01.01 සිට 2022.12.31 දක්වා කාලය තුළ විවිධ බලපත්‍ර කාණ්ඩ යටතේ මාසික ආදායමේ විචලනය



රූපය 7: 2022.01.01 සිට 2022.12.31 දක්වා කාලය තුළ විවිධ බලපත්‍ර කාණ්ඩ යටතේ වාර්ෂික ආදායම

11.7.3 පුරෝගාමී පාලන අධිකාරිය විසින් නිකුත් කරන ලද බලපත්‍ර සහ ලියාපදිංචි සහතික නිකුත් කිරීම සඳහා ගාස්තු සමාලෝචනය

ආරම්භයේ සිට වසර එකොළහක් (11) ගාස්තු සංශෝධන කර නොතිබීම, පවතින ගාස්තු අයකිරීමේ ක්‍රමය තුළ පවතින නොගැලපීම්, ආනයනකරුවන්, අපනයනකරුවන්, අලෙවිකරුවන් සහ අවසාන පරිශීලකයින් යන සියලුම කාණ්ඩවලට සමාන ගාස්තු පැනවීම යන කරුණු සලකා බැලීමෙන් අනතුරුව අදාළ අරමුණ කුමක් වුව ද තොග විකුණුම් මට්ටම, සිල්ලර මට්ටම, කුඩා පරිමාණ සහ මහා පරිමාණ අවසන් භාවිතය හෝ ආනයනය සහ අපනයනය යන කරුණු සැලකිල්ලට නොගෙන ප්‍රමාණය, පරීක්ෂණ වියදම්, තොරතුරුවල නිරවද්‍යතාවය තහවුරු කිරීම සඳහා කරන පරීක්ෂා කිරීම්, එහි ඇති රසායනික ද්‍රව්‍ය සත්‍යාපනය කිරීම සඳහා පවත්වනු ලබන නියැදි විශ්ලේෂණ පිරිවැය, දැනට පවතින ගාස්තු ක්‍රමය මගින් අධිකාරියේ පිරිවැය සම්පූර්ණයෙන් අයකර නොගන්නා බව හඳුනාගෙන ඇත. එබැවින්, අත්‍යාවශ්‍ය කර්තව්‍යයක් ලෙස සහ තාක්ෂණික සහ මෙහෙයුම් ක්‍රියාකාරකම්වලට අදාළ අධිකාරියේ වියදම් සම්පූර්ණයෙන් අයකරගැනීම සහතික කිරීම සඳහා, රසායනික විශ්ලේෂණය සහ විෂමතා මඟහරවා ගැනීමේ අරමුණ ඇතිව පුරෝගාමී පාලන අධිකාරියේ බලපත්‍ර සහ ලියාපදිංචි සහතික නිකුත් කිරීම සඳහා සංශෝධිත ගාස්තු 2010 අංක 01 දරන පුරෝගාමී රසායන ද්‍රව්‍ය (නියාමන පියවර) නියෝග සංශෝධන සඳහා අනුමැතිය ලබා ගන්නා ලදි.

11.7.4 පාරිභෝගිකයා සම්බන්ධ තොරතුරු හුවමාරුව සඳහා සුහුරු පුරෝගාමී පාලන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම

2008 අංක 01 දරන මාදක සහ මනෝවර්තක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුතිවල 19 වැනි වගන්තිය ප්‍රකාරව පාරිභෝගිකයා සම්බන්ධ ගැටලු විසඳීමට සහ පුරෝගාමී පාලන අධිකාරියේ සේවාවන් වඩාත් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස කඩිනම් කිරීම සහතික කිරීම සඳහා අධිකාරිය පහත සඳහන් කාර්යයන් ආරම්භ කරන ලදි.

අ. පුරෝගාමී පාලන අධිකාරියේ වෙබ් අඩවිය හරහා මාර්ගගත හමුවීම් වෙන්කරවා ගැනීම, මාර්ගගත බලපත්‍ර තත්ත්ව පරීක්ෂාව, බලපත්‍ර හිමියන්ගේ ලැයිස්තුව සමඟ වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම, බලපත්‍ර අවලංගු කාලසීමාව, පරීක්ෂණ දැනුම්දීම්, මාර්ගගත අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා විකල්ප සහ නීතිය බලාත්මක කිරීමේ බලධාරීන් සඳහා ප්‍රවේශය ඇතුළු තත් කාලීන තොරතුරු හුවමාරු කිරීමේ යාන්ත්‍රණයන් ස්ථාපිත කිරීම, තොරතුරු සත්‍යාපනය කිරීම, ඉල්ලුම්පත්‍ර භාරදීමේ ක්‍රියාපටිපාටිය පිළිබඳ පාරිභෝගිකයන් සඳහා තොතුරු සැපයීම, බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියා පටිපාටිය සහ තොරතුරු ගබඩා කිරීමේ පද්ධතියක් හරහා අනෙකුත් තොරතුරු ලබාදීම.

ආ. බලපත්‍ර හෝ ලියාපදිංචි සහතික නිකුත් කිරීමේ ක්‍රියාවලියේදී අධිකාරිය විසින් තොතුරුවල නිරවද්‍යතාවය තහවුරු කිරීම සඳහා ආනයනකරු, අපනයනකරු, පරිශ්‍ර, අලෙවිකරු සහ අවසාන පරිශීලකයා ඉදිරිපත් කරන අයදුම්පත් සමඟ ඉදිරිපත් කරන ලද පිරික්සුම් ලැයිස්තු පුරෝගාමී රසායන ද්‍රව්‍ය දේශීය නිෂ්පාදනය, වෙළඳාම, බෙදාහැරීම සහ අවසන් භාවිතය ඵලදායී ලෙස අධීක්ෂණය කිරීම සඳහා අයදුම්පත් සමාලෝචනය කර යාවත්කාලීන කරන ලදි.

11.7.5 පුරෝගාමී රසායනික ද්‍රව්‍ය අපසරණය වැළැක්වීමේ ඵලදායී යාන්ත්‍රණයක් සඳහා ජාතික ආයතන අතර සම්බන්ධීකරණය සහ සහයෝගීතාව ශක්තිමත් කිරීම

11.7.5.1 පුරෝගාමී රසායන ද්‍රව්‍ය ආනයනය, අපනයනය සහ ප්‍රතිනැව්ගත කිරීම අධීක්ෂණය කිරීම සහ පාලනය සඳහා ශ්‍රී ලංකා රේගුව සහ පුරෝගාමී පාලන අධිකාරිය අතර සම්බන්ධීකරණ සහ සහයෝගීතා යාන්ත්‍රණයන් ශක්තිමත් කිරීම

11.7.5.1.1 ශ්‍රී ලංකා රේගුව සම සම්බන්ධීකරණයෙන් පුරෝගාමී රසායනික ද්‍රව්‍ය ඵලදායී ලෙස අධීක්ෂණය කිරීම සහතික කිරීම සඳහා පහත ක්‍රියාමාර්ග ගන්නා ලදි.

අ. පුරෝගාමී රසායන ද්‍රව්‍ය ආනයනය සහ අපනයනය ඵලදායි ලෙස අධීක්ෂණය කිරීම සඳහා ශ්‍රී ලංකා රේගුවේ අසිකුඩා පද්ධතිය උපයෝගී කර ගැනීම, අධිකාරිය විසින් අදාළ සියලුම පුරෝගාමී රසායනික ද්‍රව්‍යවල එච්.එස්. කේතයන් ඉදිරිපත් කිරීමත් සමඟ වාර්තා සහ අවදානම් තක්සේරු කිරීමේ වාර්තා පිළියෙළ කිරීම.

ආ. පුරෝගාමී රසායනික ද්‍රව්‍යවලට අදාළ නැව්ගත කිරීම් තත් කාලීන පදනමින් නිෂ්කාශනය කිරීම සඳහා ක්ෂණිකව ප්‍රතිචාර දැක්වීමටත් ප්‍රමාදයන් මඟහරවා ගැනීම සඳහා ත් සහ පුරෝගාමී

පාලන අධිකාරියේ පද්ධතිය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා පැය 24 සේවා දින 7 පුරා ක්‍රියාත්මක වන සන්නිවේදන පද්ධතියක් ස්ථාපිත කිරීම.

ඇ. තත්කාලීන පදනමින් පුරෝගාමී පාලන අධිකාරිය සමඟ ඵලදායී සන්නිවේදනය සහ සම්බන්ධීකරණය සඳහා ශ්‍රී ලංකා රේගුවේ වරාය පාලන ඒකකයේ රේගු අධිකාරීවරයා නම් කිරීම.

ඈ. ඒපිහිඩ්රින් වැනි ඖෂධ ලෙස ආනයනය කරනු ලබන විවිධ එස්. එච් කේත යටතේ සකස් කරන ලද පුරෝගාමී රසායනික අඩංගු පුරෝගාමී රසායන ද්‍රව්‍ය ආනයනය කිරීමේදී අධිකාරිය මුහුණ දෙන අභියෝග ජය ගැනීම සඳහා කටයුතු කිරීම. හයිඩ්‍රොක්ලෝරික් අම්ලය, ඒපිහිඩ්රින් සල්පේට්, නොර්ඒපිහිඩ්රින්, සියුඩෝ ඒපිහිඩ්රින්, අර්ගොමෙට්‍රින සහ අර්ගොට් ඇමින් ජාතික ඖෂධ නියාමන අධිකාරියේ අනුමැතියට යටත්ව, මත්ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා අපසරණය වීම මෙන්ම මත්ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමේ අවදානම හේතුවෙන් මෙතිලිතයිල්කීටෝන් අඩංගු තීන්ත මිශ්‍රණ සහ නයිට්‍රික් අම්ලය, පාලිත රසායනික ද්‍රව්‍ය ලැයිස්තුවට ඇතුළත් කිරීමට යෝජිත වේ.

11.7.5.2 ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව සමඟ පුරෝගාමී පාලන අධිකාරියේ සම්බන්ධීකරණ ක්‍රියාමාර්ග

ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව සමඟ පුරෝගාමී පාලන අධිකාරියේ සම්බන්ධීකරණ ක්‍රියාමාර්ග ස්ථාපිත කිරීම සහ ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව ආනයන බලපත්‍රයේ වලංගු කාලය දිගු කිරීම සහ එහි පුරෝගාමී පාලන අධිකාරියේ අනුමැතිය සහතික කිරීම.

11.7.5.3 සෞඛ්‍ය අමාත්‍යාංශය, අදාළ බලධාරීන් සහ පුරෝගාමී පාලන අධිකාරිය අතර සම්බන්ධීකරණය සහ සහයෝගීතා යාන්ත්‍රණයන් ශක්තිමත් කිරීම

එපිහිඩ්රින් සඳහා විශේෂ සඳහනක් සහිත පූර්වගාමී රසායනික ද්‍රව්‍ය අඩංගු ඖෂධ නිෂ්පාදන අපසරණය වැළැක්වීම සඳහා අධීක්ෂණ යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීමට මූලික ක්‍රියාමාර්ග ගෙන ඇත.

11.7.5.4 මධ්‍යම පරිසර අධිකාරිය සහ පුරෝගාමී පාලන අධිකාරිය අතර සම්බන්ධීකරණ සහ සහයෝගීතා යාන්ත්‍රණ ශක්තිමත් කිරීම.

පරිසර ආරක්ෂණ බලපත්‍රය නිකුත් කිරීමේ තත්ත්වයන් සහ 2010 අංක 1 දරන පුරෝගාමී රසායනික ද්‍රව්‍ය (නියාමන පියවර) නියෝග 20වැනි වගන්තියේ අවශ්‍යතාවක් ලෙස නිර්දේශ නිකුත් කිරීමේ තත්ත්ව නිරීක්ෂණය කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය සහ පුරෝගාමී පාලන අධිකාරිය අතර ශක්තිමත් සම්බන්ධතාවයක් ඇති කිරීමට මූලික ක්‍රියාමාර්ග ගෙන ඇත.

11.7.6 පුරෝගාමී රසායනික ද්‍රව්‍ය ඵලදායී ලෙස අධීක්ෂණය කිරීම සඳහා ජාත්‍යන්තර සම්බන්ධීකරණය සහ සහයෝගීතාව ශක්තිමත් කිරීම

මත්ද්‍රව්‍ය සහ මනෝවර්තක ද්‍රව්‍ය නීති විරෝධී ලෙස නිෂ්පාදනය කිරීම සඳහා පුරෝගාමී රසායන ද්‍රව්‍ය අපසරණය වීම, පුළුල් වෙමින් විවිධාංගීකරණය වෙමින් පවතින නව කෘත්‍රිම ඖෂධ සහ ඖෂධ

වෙළඳපොළේ ව්‍යාප්තිය සම්බන්ධ අබණ්ඩ සහ මතුවෙමින් පවතින අභියෝග සලකා බැලීමේදී ද්විපාර්ශ්වික ශක්තිමත් කිරීම ඉතා වැදගත් වේ. ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය පාලන මණ්ඩලය, එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය පිළිබඳ කාර්යාලය, මත්ද්‍රව්‍ය පිළිබඳ කොමිසම, අනෙකුත් ජාත්‍යන්තර ආයතන සහ සාමාජික රටවල බලයලත් ජාතික අධිකාරීන් හරහා කලාපීය, ජාත්‍යන්තර සම්බන්ධීකරණ සහ සහයෝගිතා යාන්ත්‍රණ ක්‍රියාත්මක කෙරේ.

එබැවින් ද්විපාර්ශවික කලාපීය සහ ජාත්‍යන්තර සහයෝගීතාවය මගින් පුරෝගාමී රසායනික පාලන පියවර ශක්තිමත් කිරීම සහ වාර්තා කිරීම, පූර්ව අනතුරු ඇඟවීම් සහ තොරතුරු හුවමාරු පද්ධති සඳහා ජාතික, කලාපීය සහ ජාත්‍යන්තරව ස්ථාපිත වේදිකා භාවිතය ශක්තිමත් කිරීම, බුද්ධි තොරතුරු හුවමාරු කර ගැනීම, උගත් පාඩම් සහ හොඳම පරිචයන්, තාක්ෂණික සහයෝගීතාව, මූල්‍ය සහ තාක්ෂණික ආධාර වැඩසටහන්, ඒකාබද්ධ විමර්ශන යනාදී සබඳතා ශක්තිමත් කිරීම සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම පහත සඳහන් කරුණු ඇතුළත් අධිකාරියේ රැස්වීම සඳහා ඉදිරිපත් කර ඇත.

1. ශ්‍රී ලාංකීය සන්දර්භයට අදාළ වන පරිදි ජාත්‍යන්තර ගිවිසුම් සමඟ සමපාත වන පරිදි පුරෝගාමී රසායනික ද්‍රව්‍ය පිළිබඳ ජාතික ව්‍යවස්ථාදායක රාමුවේ ක්‍රියාකාරිත්වයට අනුකූල වීම සහතික කිරීම.

   ජාත්‍යන්තර සම්මුතීන් තුනක් මෙන්ම සාක් සම්මුතිය සහ ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය පාලන මණ්ඩලය (INCB), මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලය (UNODC) සහ මත්ද්‍රව්‍ය පිළිබඳ කොමිසම (CND) විසින් නිකුත් කරන ලද සියලුම යෝජනා ඒකාබද්ධ කිරීම. පුරෝගාමී පාලනය සම්බන්ධයෙන් අහිතකර ප්‍රතිවිපාක ආමන්ත්‍රණය කරමින් මත්ද්‍රව්‍ය ගැටලුවට එරෙහිව සටන් කිරීම සඳහා 2008 අංක 01 දරන පනත සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම.

2. ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලව යාවත්කාලීන, ප්‍රමිතිගත, විද්‍යාත්මක සාක්ෂි පදනම් කරගත් තාක්ෂණික ක්‍රියා පටිපාටි යෙදෙන බවට සහතික වීම.


   එබැවින් පුරෝගාමී රසායන ද්‍රව්‍ය පාලනය සම්බන්ධයෙන් INCB සහ UNODC විසින් නිකුත් කරන ලද සියලුම අත්පොත්/ මාර්ගෝපදේශ එකතු කර ඇති අතර අදාළ පරිදි අභ්‍යන්තර ක්‍රියා පටිපාටි යාවත්කාලීන කර ඇත.

3. නීති විරෝධී මත්ද්‍රව්‍ය ජාවාරම් සහ අපයෝජන (ප්‍රාදේශීය සහ ගෝලීය) ප්‍රවණතා රටා නිරීක්ෂණය කිරීම සඳහා තොරතුරු රැස් කිරීම සහතික කිරීම.


පුරෝගාමී රසායනික ද්‍රව්‍යවල සැක කටයුතු ගණුදෙනු හඳුනා ගැනීම සඳහා ශක්තිමත් හවුල්කාරිත්වයක් සහතික කිරීම සඳහා, පුරෝගාමී පාලන අධිකාරිය තාක්ෂණික සහාය සඳහා කලාපීය සහ ජාත්‍යන්තර නියෝජිතායතනවල හවුල්කාරිත්ව වැඩසටහන් සක්‍රියව පවත්වාගෙන යනු ලැබේ. එවැනි එක් වේදිකාවක් වන්නේ මාර්ගගත පූර්ව දැනුම්දීම් පද්ධතියයි. එය 1988 එක්සත් ජාතීන්ගේ (UN) සම්මුතියේ 12වැනි වගන්තියට අනුව අපනයනය කරන රටවලට පුරෝගාමී රසායනික ද්‍රව්‍ය පිළිබඳ විද්‍යුත් පණිවිඩ වශයෙන් දැනුම්දීමට ඉඩ සලසන මාර්ගගත වේදිකාවකි. එමනිසා 2022 වර්ෂය තුළ දැනුම්දීම් 129ක් ලැබී සමාලෝචනය කර ඇති අතර තොරතුරු

සත්‍යාපනය කිරීමේදී හඳුනාගත් විෂමතා හේතුවෙන් නැවිගත කිරීම් 01ක් ආනයනය කිරීමට ප්‍රතික්ෂේප කර ඇත.

මාසය	පූ .අ. වා සංඛ්‍යාව
ජනවාරි	22
පෙබරවාරි	04
මාර්තු	16
අප්‍රේල්	08
මැයි	06
ජූනි	05
ජූලි	08
අගෝස්තු	17
සැප්තැම්බර්	12
ඔක්තෝබර්	07
නොවැම්බර්	10
දෙසැම්බර්	14
එකතුව	**129**



	පූ. අ. වා සංඛ්‍යාව
ප්‍රතික්ෂේප වූ	01
ප්‍රතික්ෂේප නොවූ	128



පුරෝගාමී පාලන අධිකාරිය, පුරෝගාමී රසායනික ද්‍රව්‍ය (නීත්‍යානුකූල සහ නීති විරෝධී භාවිතයෙන්) සම්බන්ධයෙන් තොරතුරු ජාත්‍යන්තර නියෝජිතායතන සමඟ හුවමාරු කිරීමේ බලාත්මක ජාතික අධිකාරිය වේ. පුරෝගාමී පාලන අධිකාරිය, ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය පාලන මණ්ඩලය, අනෙකුත් ජාත්‍යන්තර නියෝජිතායතන සහ වෙනත් රටවල නිසි ජාතික අධිකාරීන් සමඟ වාර්ෂික අවශ්‍යතාවය සහ රසායනික ද්‍රව්‍ය (නීත්‍යානුකූල සහ නීති විරෝධී භාවිතයන්) පිළිබඳ තොරතුරු හුවමාරු කරගෙන ඇත.

මීට අමතරව, ජාත්‍යන්තර සම්මුතීන්ට අනුකූලව රට තුළ පුරෝගාමී රසායනික ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් ජාත්‍යන්තර ප්‍රජාව වඩාත් දැනුවත් කිරීම සහ පුරෝගාමී රසායනික ද්‍රව්‍ය අධික ප්‍රමාණවලින් ගබඩා වීම වළක්වා ගනිමින් පුරෝගාමී රසායන ද්‍රව්‍ය අනිසි ලෙස භාවිතා වීම වැළැක්වීම පිළිබඳව කර්මාන්ත දැනුවත් කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගනී.

ආනයනය කරන රටවලට පූර්ව අපනයන දැනුම්දීම් (PEN) සැපයීමට අමතරව කලාපීය සහ ජාත්‍යන්තර සහයෝගීතාවය පවත්වා ගැනීම සඳහා ජාත්‍යන්තර මට්ටමින් අංශය විසින් පහත සඳහන් කාර්යන් සිදු කරනු ලැබේ.

- පූර්ව අපනයන දැනුම්දීම් සම්බන්ධව පරීක්ෂණ පැවැත්වීම සහ පරීක්ෂණ සඳහා සහය වීම
- ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය පාලන මණ්ඩලය (INCB) සහ වෙනත් රටවල නිසි බලධාරීන් සමඟ තත්කාලීන තොරතුරු හුවමාරුව
- පෝරම සහ වාර්තා ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය පාලන මණ්ඩලය වෙත යොමු කිරීම (උදා:- පෝරමය D)

11.7.7 ඖෂධ පිළිබඳ නීති බලාත්මක කිරීම සහ අනෙකුත් ආයතන සඳහා තාක්ෂණික සහය ලබා දීම

2008 අංක 01 දරන මාදක සහ මනෝවර්තක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනතේ 19 වෙනි වගන්තියට අනුව I වගුවේ සහ II වගුවේ දක්වා ඇති ද්‍රව්‍ය භාවිතයෙන් යම් කිසි මත්ද්‍රව්‍ය හෝ මනෝවර්තක ද්‍රව්‍යයක් නීති විරෝධී ලෙස නිෂ්පාදනය කිරීමේ උත්සාහයන් අධිකාරිය විසින් හඳුනාගෙන සහතික කල යුතුය. පනතේ පළමු උපලේඛනයේ II නිසි ලෙස වාර්තා කර වැරැදිකරුවන්ට දඬුවම් කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. පුරෝගාමී පාලන අධිකාරියේ නිලධාරීන් විසින් සැක කටයුතු ගණුදෙනු හඳුනා ගැනීමේදී මත්ද්‍රව්‍ය නීතිය ක්‍රියාත්මක කරන ආයතනවලට දැනුම් දී නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා සහාය දිය යුතු වේ.

ඒ අනුව එම කාල සීමාව තුළ පහත විමර්ශන සිදු කර ඇත.

විද්‍යාත්මක නිලධාරීන් සහ රසායනික අවි සම්මුතිය පිලිබඳ ජාතික අධිකාරියේ නිලධාරීන් සමග එක්ව 2022.05.03 දින දේවී සමාගමේ හි නිරීක්ෂණ චාරිකාවක් සිදුකර වාර්තාවක් ඉදිරිපත් කරන ලදී.

පරිශ්‍ර පරීක්ෂාවන් වලදී නිලධාරීන් ඔවුන්ගේ විශේෂ අවධානය යොමු කරන්නේ මාර්ගෝපදේශ සපුරා ඇත්දැයි පරීක්ෂා කර බැලීමට සහ පුරෝගාමී රසායනික ද්‍රව්‍ය ආනයනය කරන්නන් විසින් පවත්වාගෙන යනු ලබන පරිශ්‍රයන්හි පුරෝගාමී රසායන ද්‍රව්‍ය අපසරණය වැළැක්වීම සඳහා සුදුසු ආරක්ෂක පියවරයන් අනුගමනය කරනු ලැබේදැයි නිරීක්ෂණය කිරීම පිණිසයි.

11.7.8 එපිහිඩ්‍රින් අඩංගු ඖෂධ අපසරණය වැළැක්වීම

2019 සිට 2020 දක්වා කාලය තුළ අක්බාර් පාමසූටිකල් ආයතනය විසින් ගණුදෙනු කරන ලද එපිහිඩ්‍රින් අපසරණයවීමේ හැකියාව පුරෝගාමී පාලන අධිකාරියේ නිලධාරීන් විසින් විමර්ශනය කරන ලද්දේ වසර 2018 සිට 2019 දක්වා අත්අඩංගුවට ගන්නා ලද මෙතම්පටමයින්/ මෙතම්පටමයින් ආශ්‍රිත අත්අඩංගුවට ගැනීම් සංඛ්‍යාව සහ මෙතම්පටමයින් ප්‍රමාණය සැලකිය යුතු ලෙස වැඩි වීම සැලකිල්ලට ගනිමිනි. ශ්‍රී ලංකා රේගු, ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව, සෞඛ්‍ය අමාත්‍යාංශය, වෛද්‍ය සැපයුම් අංශය සහ ජාතික ඖෂධ නියාමණ අධිකාරිය සමඟ සම්බන්ධීකරණයෙන් එම ලියාපදිංචි නොකල අලෙවිකරුවන්ගේ/ අවසන් පරිශීලකයන්ගේ විකුණුම් තොරතුරු හඳුනාගෙන ඒවා නිරීක්ෂණය කිරීම සඳහා විමර්ශනයන් සිදු කිරීමට නිර්දේශ කරන ලදි.

11.7.9 දත්ත කළමනාකරණ පද්ධතිය සංවර්ධනය කිරීම

ඖෂධ නිෂ්පාදනය සඳහා භාවිතා කරන පුරෝගාමී රසායනික ද්‍රව්‍ය අපසරණය වීම වැළැක්වීම සඳහා පුරෝගාමී රසායනික පාලන ක්ෂේත්‍රයේ වැදගත් වන දත්ත කළමනාකරණ පද්ධතියක් මෙම කාලය තුළ නිර්මාණය කර ඇත.

මෙම දත්ත සමුදාය 2008 අංක 1 දරන මාදක සහ මනෝවර්තක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති සම්මුත පනතේ I වගුවේ සහ II වගුවේ ලැයිස්තුගත කර ඇති පුරෝගාමී රසායනික ද්‍රව්‍ය නිෂ්පාදනය කරන, භාවිතා කරන, ආයනයන කරන සහ අපනයන කරන සමාගම් ලැයිස්තුවකින් සමන්විත වේ. පුරෝගාමී රසායනික ද්‍රව්‍ය ප්‍රමාණයන් නිෂ්පාදනය, ගණුදෙනු කිරීම, භාවිතය, ආනයනය, අපනයනය සහ ඒවායේ ප්‍රමාණයන් සඳහා භාවිතා කරන රසායනික ද්‍රව්‍ය ද දත්ත පදනමට ඇතුලත් කර නිතිපතා යාවත්කාලීන වේ.

සංවර්ධනය කරන ලද දත්ත කළමනාකරණය ප්‍රවණතාව අධ්‍යයනය කිරීමේ දී අරමුණු සහගත විශ්ලේෂණයක් සඳහා භාවිතා කළ හැකි දත්ත සම්පාදනය කිරීමට සහ අවශ්‍ය ස්ථානවල නීතියෙන් ගැලවීමේ මාර්ග අවහිර කිරීමට උපකාරී වන අතර මෙම දත්ත කළමනාකරණයේ ප්‍රධාන උපයෝගීතා පහත දැක්වේ.

- ආනයන/ අපනයන/ භාවිතා කිරීමේ රටා වෙනස් වන අවස්ථාවක දී ගැටළු නිරාකරණය කිරීම
- ලියාපදිංචිය/ බලපත්‍ර ලබා ගැනීමේ විෂය පථය යටතේ සිටින ක්ෂේත්‍රයේ කොටස්කරුවන් හඳුනාගැනීම
- එක් එක් රසායනික ද්‍රව්‍යවල අවශ්‍යතා තක්සේරු කිරීම
- මෙම රසායනික ද්‍රව්‍ය වල නිත්‍යානුකූල වෙළඳාම සඳහා අවශ්‍ය පහසුකම් ලබාදීම

තවද, කොළඹ විශ්වවිද්‍යාලය විසින් ආරම්භ කරන ලද ක්‍රමවේදයක් මෙම කාලසීමාව තුල සමාලෝචනය කර සම්පූර්ණ කර ඇති අතර, එය නිරීක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම යන පැහැදිලි පියවර හයක් අනුගමනය කරමින් සම්පූර්ණ බලපත්‍ර නිකුත් කිරීමේ කාර්යය ප්‍රවාහය ඇතුළු පුරෝගාමී පාලන අධිකාරියේ ක්‍රියාවලීන් ස්වයංක්‍රීයව ස්ථාපිත කිරීම. බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලියේ මෙම පියවරයන් නවීකරණය කිරීමට යෝජනා කර ඇත.

1. අයදුම්පත් ඉදිරිපත් කිරීම
2. අයදුම්පත් සැකසීම
3. අයදුම්පතට අදාළ කාර්ය ප්‍රවාහය සහ තත්ත්ව
4. බලපත්‍ර අයදුම්පත් සඳහා ගෙවීම් ක්‍රම
5. වාර්තා කිරීම
6. අවසරය ලබාදීම

පද්ධති අධ්‍යයනය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායනයට (ICTA) ඉදිරිපත් කර ඇති අතර එහි උපදේශනය යටතේ පිහිටුවීම ආරම්භ කෙරේ. පද්ධති අධ්‍යයනය රේඛීය අමාත්‍යාංශයේ තොරතුරු තාක්ෂණ විශේෂඥයින් විසින් සමාලෝචනය කෙරේ.

පුරෝගාමී පාලන අධිකාරියේ 2021/22 වර්ෂයන්හි භෞතික හා මූල්‍ය ප්‍රගතිය සන්සන්දනාත්මකව ඉදිරිපත් කිරීම

වර්ෂය	භෞතික ප්‍රගතිය	මූල්‍ය ප්‍රගතිය
2021	64.86%	56.8%
2022	66.74%	76.9%

පුරෝගාමී පාලන අංශයේ 2021 වර්ෂයේ භෞතික ප්‍රගතිය 64.86% ක් සහ 2022 වර්ෂයේ භෞතික ප්‍රගතිය 66.74% වශයෙන් ද මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 56.8% ක් සහ 76.9% ක් වශයෙන් 2021 සහ 2022 වර්ෂවලදී දැකගත හැකි විය. මෙම වර්ෂ තුළ රට පුරා කොවිඩ් 19 වසංගතය පැතිරයාම හා රට තුළ පැවති ඉන්ධන අර්බුදය හේතුවෙන් ක්‍රියාකාරී සැලැස්ම අනුව යෝජිත වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී මාර්ගගත ක්‍රම ඔස්සේ කටයුතු සිදු කරන ලදි. ඒ සමගම වරින් වර රට වසා දැමීම හේතුවෙන් පරිශ්‍ර පරීක්ෂාවන් සහ අනෙකුත් ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් සැලසුම් කරන ලද ආකාරයට ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.

අංකය	සහභාගි වූ නිලධාරියාගේ නම	තනතුර	වැඩසටහන	පැවැත් වූ ආයතනය/රට	දිනය
1	ප්‍රදීප් කුමාර කොහොලාන්ගෙදර මහතා	සහකාර අධ්‍යක්ෂ - නිවාරක අධ්‍යාපන හා පුහුණු	Training Workshop on Universal Prevention Curriculum For Substance Use Practitioner (UPC – P)Track 1: Family Based Prevention	ඩුබායි	2022 මැයි 10 සිට මැයි 20 දක්වා
2	ඩබ්.ජී. සුපුන් උදාන මහතා	මත්ද්‍රව්‍ය අධ්‍යාපන හා තොරතුරු සහකාර	Universal Treatment Curriculum Refresher Training and ICAP Examination	ඩුබායි	2022 මැයි 10 සිට මැයි 20 දක්වා
3	ඩී.පී.පී. වීරසිංහ මහත්මිය	සහකාර අධ්‍යක්ෂ - විද්‍යාත්මක පර්යේෂණ	Participation for 3rd International Symposium of forensic Drug Testing Lab Directors.	ඩුබායි	2022 මැයි 11 සිට මැයි 17 දක්වා
4	කේ.එම්. මුතුමාල මහත්මිය	විද්‍යාත්මක නිලධාරී	Participation for 3rd International Symposium of forensic Drug Testing Lab Directors.	ඩුබායි	2022 මැයි 11 සිට මැයි 17 දක්වා
5	එස්.පී. ශ්‍යාම් සඳමාල් මධුහංස මහතා	උපදේශක සහකාර	3rd Global Forum for Youth Leaders on Drug use Prevention (GOFORTH)	ඩුබායි	2022 මැයි 11 සිට මැයි 17 දක්වා

අංකය	සහභාගි වූ නිලධාරියාගේ නම	තනතුර	වැඩසටහන	පැවැත් වූ ආයතනය	දිනය
1	ඒ.ඩබ්.ඒ. කුමාරි මහත්මිය	සහකාර අධ්‍යක්ෂ - පරිපාලන	Performance Management & Setting Key Performance Indicators (KPIs)	Metropolitan Campus	2022.09.09
2	අයි.එන්. හෙට්ටිආරච්චි මහත්මිය	මත්ද්‍රව්‍ය අධ්‍යාපන හා තොරතුරු නිලධාරී	IHRA Diploma	කොළඹ විශ්වවිද්‍යාලය	2022
3	බී.පී.එන්. බුලත්සිංහල මහත්මිය	උපදේශන සහකාර	IHRA Diploma	කොළඹ විශ්වවිද්‍යාලය	2022
4	ඩබ්.වී.බී.එන්. ලක්මාලි මෙනවිය	සහකාර බාහිරසේවා නිලධාරී	IHRA Diploma	කොළඹ විශ්වවිද්‍යාලය	2022
5	සුරංගි වෙලේගෙදර මිය	සහකාර බාහිරසේවා නිලධාරී	IHRA Diploma	කොළඹ විශ්වවිද්‍යාලය	2022

13. විගණන හා කළමනාකරණ කමිටුවේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය මඟින් අනිවාර්යය අවශ්‍යතාවයක් ලෙස විගණනය කරන ආයතනයන්හි විගණන හා කළමනාකරණ කමිටුවක් පිහිටුවීමට 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41(1) වගන්තිය ප්‍රකාරව ප්‍රතිපාදන සලසා ඇත. තවද, කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති 2019.01.12 දිනැති DMA 01 - 2019 දරන චක්‍රලේඛය මඟින් ද විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීමේ අවශ්‍යතාවය සහ කමිටු සංයුතිය සම්බන්ධයෙන් ප්‍රතිපාදන සලසා ඇත.

ඒ අනුව, විගණන හා කළමනාකරණ කමිටුවේ සාමාජිකයින් පත් කිරීම සම්බන්ධයෙන් අදාල මාර්ගෝපදේශ සහ චක්‍රලේඛ නිකුත් කර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් එම කමිටු ක්‍රියාකාරීත්වය තවදුරටත් විධිමත් කර ඇත.

මූල්‍ය හා වත්කම් කළමනාකරණය ඇතුළු ආයතනයේ සියලුම අංශයන් පිළිබඳ කරන ලද විගණනයන් සමාලෝචනය කිරීම මඟින් විගණන හා කළමනාකරණ කමිටුව මෙම ආයතනය සඳහා වෙන් කළ සම්පත් ප්‍රමුඛතා අනුපිළිවෙළට පෙර සකස් කරන ලද සැලසුම්වලට අනුගතව ආයතනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට ප්‍රශස්ථ අයුරින් යොදාගෙන ඇත් ද යන්න තහවුරු කරනු ලබයි.

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයෙහි විගණන හා කළමනාකරණ කමිටුව මහා භාණ්ඩාගාරයේ නියෝජිතයෙකු සහ විධායක නොවන තවත් මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙකුගෙන් සමන්විත වේ. මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය කාර්තුමය වශයෙන් මෙම විගණන කළමනාකරණ රැස්වීම් කැඳවීම සිදු කරනු ලබන අතර විගණන කමිටු සභාපති ලෙස කටයුතු කරනුයේ මහා භාණ්ඩාගාර නියෝජිතයා ය. මීට අමතරව ජාතික විගණන කාර්යාලයේ නිල නියෝජිත සහ රේඛීය අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක මෙම කමිටුවේ නිරීක්ෂකයින් ලෙස සහභාගී වේ.

කාර්යභාරය

ආයතනයේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කර ඒවා සම්පූර්ණ බවටත් ගිණුම්කරණ ප්‍රමිතීන් සහ ප්‍රතිපත්තිවලට අනුකූල වන බවටත් තහවුරු කිරීම සඳහා අවශ්‍ය නිර්දේශ විගණන හා කළමනාකරණ කමිටුව විසින් ලබා දී ඇත.

2022 වර්ෂය සඳහා ආයතනයේ කාර්යභාරය අනුව සහ අභ්‍යන්තර විගණන අංශයේ සම්පත් අනුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කර ඇගයීම් සිදු කරයි. ආයතනයේ අභ්‍යන්තර පාලන පද්ධතිය (Internal Control System) වැඩිදියුණු කිරීම මඟින් එදිනෙදා ආයතන කටයුතුවල අඩුපාඩු අවම කිරීමටත් ආයතනයේ කාර්යයන් සඳහා නියමිත කැලැන්ඩරයක් පවත්වා ගැනීම මඟින් ආයතනයේ කටයුතු නියමිත දිනවලදී සිදු කර ප්‍රමාදයන් වළක්වා ගත යුතු බවත් පෙන්වා දී පසු විපරම් සිදු කර ඇත.

2022 වර්ෂය සඳහා විගණන කළමනාකරණ කමිටු 4ක් පවත්වන ලදි. වාර කිහිපයක් තිස්සේ නිවැරදි නොවී පුනරාවර්තනය වන කරුණු සම්බන්ධයෙන් ගත හැකි විගණන හා කළමනාකරණ ප්‍රතිකර්ම පිළිබඳව අවධානය යොමු කරන ලදි. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ කාර්යයන්/ මෙහෙයුම් සම්බන්ධයෙන් විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් යොමු කර ඇති විගණන විමසුම් සඳහා ලබා දී ඇති පිළිතුරු අනුව අවධාරණය කරනු ලබන ගැටළු පිළිබඳ පසුවිපරම් සිදු කර ඇත.

ආයතනය සඳහා සත්‍ය හා සාධාරණ විගණන මතයක් ලබා ගැනීම සඳහා ආයතනයේ කළමනාකරණ අංශය සහ විගණන අංශය තවදුරටත් ශක්තිමත් කිරීමට අවශ්‍ය කඩිනම් පියවර ගැනීම අවශ්‍ය වේ.

අවදානම් කළමනාකරණය සහ රැස්වීම් වාර්තා/ මණ්ඩලයට වාර්තා කිරීම

විගණන හා කළමනාකරණ කමිටුව අවදානම් කළමනාකරණය සහ සමාලෝචන කමිටුව ලෙස ද ක්‍රියා කරනු ලැබේ.

අනුකූලවීම්

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ගේ අර්ථ දැක්වීම්වලට අනුකූලව අදාල පාර්ශව ලේඛනගත කිරීමේ ක්‍රියා පරිපාටිය, වාර්ෂික පදනමින් ආයතනය විසින් කළ යුතු හෙළිදරව් කිරීම්වලට අදාල ක්‍රියා පරිපාටිය, ආරක්ෂණ සංකල්පයට අනුව අදාල ක්‍රියා පරිපාටීන්, නීති රීති විධාන හා පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හා විශේෂ විධිවිධාන, ආයතනයේ ගිණුම්කරණ රෙගුලාසි අනුව සිදු කළ යුතු හෙළිදරව් කිරීම් ද ඇතුළු කරුණුවල ඵලදායිත්වය සමාලෝචනයට ලක්විය.

2022 වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටුවේ කාර්ය සාධනය

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයෙහි විගණන හා කළමනාකරණ කමිටුව විසින් සමාලෝචිත වර්ෂයේ (2022) ආයතනයේ අභ්‍යන්තර පාලන පද්ධතිය තක්සේරු කර ඇති අතර, එය සියලු ක්‍රියාකාරී ක්ෂේත්‍රවල කාර්යක්ෂමතාව හා ඵලදායීතාව ඉහළ නංවන අතර, නිරීක්ෂණය කරන ලද අපගමනයන් මඟහරවා ගැනීමට අවශ්‍ය මඟ පෙන්වීම් ලබා දෙන ලදි. එපමණක් නොව, අභ්‍යන්තර හා බාහිර විගණන වාර්තා මඟින් ඉස්මතු කර ඇති කරුණු සමාලෝචනය කරන අතරම, අධ්‍යක්ෂ මණ්ඩලයට සුදුසු ප්‍රතිකර්ම යෝජනා කිරීමටත්, අදාල බලධාරීන් සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ගවල ප්‍රගතිය වාර්තා කිරීමටත් පියවර ගන්නා ලදි.

විගණන හා කළමනාකරණ කමිටුවේ කාර්යයන් සහ වගකීම් ඉටු කිරීම සඳහා පහසුකම් සැලසීම වෙනුවෙන් විගණන හා කළමනාකරණ කමිටුවේ සාමාජිකයින්, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයෙහි සභාපති, අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින්, අධ්‍යක්ෂ ජනරාල් ඇතුළු ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයින් දක්වන සහයෝගය හා දායකත්වය ආයතනයේ ප්‍රගමනයට ප්‍රධාන සාධකයක් වනු ඇත.

14. ආදායම් ප්‍රකාශය

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය
2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය

		2022	2021
		රු.	රු.
ආදායම්	**සටහන් අංකය**		
රාජ්‍ය පුනරාවර්ථන ප්‍රදාන	සටහන 1	234,850,000.00	243,944,000.00
වෙනත් ආදායම්	සටහන 2	9,634,530.52	41,568,026.21
ස්ථාවර වත්කම් විකණීමෙන් ලද ලාභය	සටහන 3	(6,601.54)	-
		244,477,928.98	**285,512,026.21**
වියදම්			
පුද්ගල හා පරිපාලන පිරිවැය	සටහන 4	183,529,003.93	177,351,884.47
වෙනත් මෙහෙයුම් පිරිවැය	සටහන 5	35,332,796.50	38,270,600.52
දේශීය/ විදේශීය ආයතන දායකත්වය	සටහන 6	-	330,000.00
නිවාරණ අධ්‍යාපන අංශය පිරිවැය	සටහන 7	2,540,928.32	1,070,275.03
ප්‍රතිකාර හා පුනරුත්ථාපන පිරිවැය	සටහන 8	44,483,063.03	23,284,159.22
පර්යේෂණ අධ්‍යයන පිරිවැය	සටහන 9	977,452.00	1,422,681.96
බාහිරසේවා පිරිවැය	සටහන 10	2,656,407.68	3,257,625.21
රසායනාගාර පිරිවැය	සටහන 11	1,538,032.78	961,112.02
බන්ධනාගාර හා අනිකුත් මධ්‍යස්ථාන පිරිවැය	සටහන 12	52,424.00	49,225.00
මානව සම්පත් සංවර්ධන පිරිවැය	සටහන 13	(77,250.00)	1,149,796.75
මූල්‍ය පිරිවැය	සටහන 14	71,835.00	96,974.00
ක්ෂයවීම්	සටහන 15	21,732,572.95	23,249,642.71
මුළු මෙහෙයුම් පිරිවැය		292,837,266.19	270,493,976.89
අතිරික්තය හෝ හිඟය		**(48,359,337.21)**	**15,018,049.32**

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය
2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය

		2022		2021	
වත්කම්		රු.	රු.	රු.	රු.
ජංගම වත්කම්					
බැංකුවේ ඇති මුදල	සටහන 16	5,190,924.75		27,146,690.30	
තොග	සටහන 17	5,051,689.65		5,332,586.88	
ඉදිරියට කල ගෙවීම්	සටහන 18	1,025,243.81		857,487.13	
ලැබිය යුතු ආදායම්				285,422.31	
අත්තිකාරම්	සටහන 19	1,434,534.50		1,782,059.50	
			12,702,392.71		**35,404,246.12**
ණයගැති - අත්තිකාරම්	සටහන 20	696,812.96		508,812.96	
අයවිය යුතු ආපදා ණය හා උත්සව අත්තිකාරම්	සටහන 21	16,325,989.00		18,213,396.00	
WIP නව ගොඩනැගිල්ල	සටහන 22	18,056,142.20		18,056,142.20	
			35,078,944.16		**36,778,351.16**
ජංගම නොවන වත්කම්					
දේපළ, පිරියත හා උපකරණ	සටහන 23	590,815,390.43	**590,815,390.43**	500,557,663.81	**500,557,663.81**
මුළු වත්කම්			**638,596,727.30**		**572,740,261.09**
හිමිකම් හා වගකීම්					
ජංගම වගකීම්					
ණයහිමියෝ	සටහන 24	154,220.00		144,220.00	
උපචිත වියදම්	සටහන 25	19,733,473.75		10,763,382.12	
රඳවාගත් මුදල්	සටහන 26	196,140.00		196,140.00	
			20,083,833.75		**11,103,742.12**
NNL පරීක්ෂණ - රියදුරු			1,344,441.00		10,000,000.00
ජංගම නොවන වගකීම්					
පාරිතෝෂික වෙන්කිරීම්	සටහන 27	61,069,525.00		58,433,472.50	
ගෙවිය යුතු පාරිතෝෂික	සටහන 27	2,082,650.00	**63,152,175.00**	738,078.75	**59,171,551.25**
හිමිකම්					
රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රදානය	සටහන 28	107,037,946.94		106,737,946.94	
ප්‍රාග්ධන වෙන්කරීම්		65,503,710.68		65,503,710.68	
ප්‍රත්‍යාගණන වෙන්කරීම්		574,231,155.51		463,691,481.79	
අවිනිශ්චිත ගිණුම		185,685.12		480,899.89	
අතිරික්තය/ ඌනතාවය		(192,942,220.70)		(143,949,071.58)	
මුළු හිමිකම්			**554,016,277.55**		**492,464,967.72**
මුළු හිමිකම් හා වගකීම්			**638,596,727.30**		**572,740,261.09**

ගිණුම්වලට අදාල ගිණුම් ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයේ අත්‍යාවශ්‍ය කොටසකි. ආයතනයෙහි මූල්‍ය ප්‍රකාශන ප්‍රකාශයට පත් කරන්නේ දෙසැම්බර් 31වන දිනට රාජ්‍ය කටයුතු පිළිබඳ සත්‍ය හා සාධාරණ අදහසක් ලබා දීමට බව සහතික කරමු. 2022 සහ එහි අතිරික්තය/ (හිඟය) අවසන් වූ වර්ෂය සඳහා මෙම මූල්‍ය ප්‍රකාශයන් රජයේ නීති සහ රෙගුලාසිවලට අනුකූල වේ.

අධ්‍යක්ෂ මූල්‍ය (වැඩබලන)
අ.ඔෆ.පා.ජා.ම

සභාපති/ අධ්‍යක්ෂ ජනරාල්
අ.ඔෆ.පා.ජා.ම

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු 1 සිට 4 දක්වා ඇති මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යාවශ්‍ය කොටසකි. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරයි. මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදි.

මණ්ඩලික සාමාජික
අ.ඔෆ.පා.ජා.ම

මණ්ඩලික සාමාජික
අ.ඔෆ.පා.ජා.ම

16. විශේෂ ගිණුම්කරණ ප්‍රතිපත්තීන්

16.1 සංස්ථාමය තොරතුරු

16.1.1 වසතිය සහ නීත්‍යානුකූලභාවය

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය 1984 අංක 11 දරන පනතින් ශ්‍රී ලංකාව තුළ පිහිටුවනු ලැබූ ව්‍යවස්ථාපිත මණ්ඩලයකි. මෙම ආයතනය අංක 383, කෝට්ටේ පාර, රාජගිරිය යන ලිපිනයෙහි පිහිටා ඇත.

16.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

(සාමාන්‍ය)

16.2.1 සකස් කිරීමේ පදනම

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ඇත. මූල්‍ය ප්‍රකාශන සඳහා බලපානු ලබන උද්ධමන සාධක සඳහා ගැලපුම් කර නොමැත. අදාළ තැන්හි භාවිත කළ විශේෂ ප්‍රතිපත්ති ඉදිරි සටහන්වල පැහැදිලි කර ඇත. මූල්‍ය ප්‍රකාශන උපචිත පදනමට ඉදිරිපත් කර ඇත.

16.2.2 සංසන්දනාත්මක තොරතුරු

ප්‍රවර්ථන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වඩා හොඳින් අවබෝධ කරගැනීම සඳහා පෙර වර්ෂයට අදාළ අවශ්‍ය සංසන්දනාත්මක සංඛ්‍යා ඉදිරිපත් කර තිබේ.

මූල්‍ය ප්‍රකාශනයන්හි අයිතමයන් ඉදිරිපත් කිරීම හෝ ප්‍රතිවර්ගීකරණය කිරීම සංශෝධනය කර ඇතිවිට, වඩා හොඳ ඉදිරිපත් කිරීමක් ලබා දීම පිණිස ප්‍රවර්ථන වර්ෂය සමඟ අනුකූල වන පරිදි සංසන්දනාත්මක අගයන් ද ප්‍රතිවර්ගීකරණය කර ඇත.

16.2.3 දේපළ, පිරියත සහ උපකරණ

දේපළ, පිරියත සහ උපකරණ පිරිවැයට හෝ ප්‍රත්‍යාගණන වටිනාකමෙන් සමුච්චිත ක්ෂය අගය අඩු කර දක්වා ඇත. සින්නක්කර ඉඩම් හැරුණු විට දේපළ, පිරියත සහ උපකරණ සඳහා ක්ෂය අගය වෙන් කිරීම ඒවායේ ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීවිත කාලය තුළ සමාන වාරිකවලින් ලියා හැරීම පිණිස ඒවායේ ආගණනය කළ අගය මත පහත පරිදි ගණනය කරනු ලබයි.

	අනුපාතය (%)
ගොඩනැගිලි සහ ඉදිකිරීම්	5
ගෘහභාණ්ඩ	10
කාර්යාල උපකරණ	20

සවිකිරීම්	20
පුස්තකාල පොත්	25
වාහන	25
මුළුතැන්ගෙයි උපකරණ	20
ගෙවතු වගා උපකරණ	20
රසායනාගාර උපකරණ	20
වෙනත් පිරියත සහ උපකරණ	20

2016 වර්ෂයට පෙර මිලදී ගත් වත්කම් සඳහා සරල මාර්ග ක්‍රමය මත වත්කම් මිලදී ගත් වර්ෂයේදී සම්පූර්ණ වර්ෂය සඳහාම ක්ෂය කිරීම සහ ඉවත් කරන දින වන තුරු ක්ෂය කිරීම් සිදු කරනු ලබන අතර 2016 වර්ෂයේ සිට ඉදිරියට මිලදී ගත් වත්කම් සඳහා මිලදී ගත්/ ඉවත් කරන දිනය මත පදනම්ව ක්ෂය ගණනය කරනු ලැබේ.

මෝටර් වාහන, ප්‍රධාන කාර්යාලයේ ඉඩම සහ ගොඩනැගිලි ප්‍රත්‍යාගණන අගයන් මත දැක්වෙන අතර අනෙකුත් සියලුම වත්කම් වර්ගීකරණ පිරිවැයට දැක්වේ.

තලංගම හා ගාල්ල මධ්‍යස්ථානවල ඉඩම් හා ගොඩනැගිලි අයිතිය සෞඛ්‍ය අමාත්‍යාංශයට අයත් වේ.

ව්‍යාපාරික වටිනාකමක් නොමැති නීති විරෝධී මත්ද්‍රව්‍ය ජාතික මාදක රසායනාගාරය භාරයේ තබාගෙන ඇත්තේ, නීතීය ක්‍රියාත්මක කිරීම අදාළ ආයතන සඳහා පවත්වනු ලබන ධාරිතා ගොඩනැගීමේ වැඩසටහන් සඳහා ප්‍රදර්ශන කටයුතුවලට යොදා ගැනීමටය.

පහත වත්කම් කල්බදු පදනම මත මිලදී ගෙන ඇත.

කල්බදු දේපළ	වටිනාකම රු.	කල්බදු කාලසීමාව
අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය අංක 383, කෝට්ටේ පාර, රාජගිරිය	4,350,000.00	අවුරුදු 99
පිටිපන ඉඩම	4,027,518.00	අවුරුදු 30
හන්දෙස්ස ඉඩම, නුවර	1,893,051.00	-
මාහේන වතුයාය	13,062,750.00	අවුරුදු 30

16.2.4 කල්බදු දේපළ

2016.03.04 සිට 2046.03.03 දක්වා වසර 30ක කාලයක් සඳහා ජනතා වතු සංවර්ධන මණ්ඩලය සමඟ බදු ගිවිසුම අත්සන් කර ඇත. මෙම මුදල තුළ එකතු කළ අගය මත බදු සහ ජාතිය ගොඩනැගීමේ බදු ඇතුළත් නොවන අතර වසර 30ක කුළී ගෙවීම්, මුද්දර ගාස්තු හා නීතීඥ ගාස්තු ඇතුළත් වේ.

පෙර වර්ෂයේ කල්බදු කුලී වසර 5ක් සඳහා ගෙවා ඇති අතර එම අගය වසර පහක් ඇතුළත සරල මාර්ග ක්‍රමය යටතේ ක්ෂය කරනු ලැබේ.

16.2.5 පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන

සේවයේ පළමු වසරින් ආරම්භ වී අවුරුද්දක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද සෑම නිලධාරියෙකුගේම මූල්‍ය වර්ෂයේ අවසන් මස වැටුපෙන් අඩක් මත පදනම්ව ගණනය කරන ලද අගයකට සමානව පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන මෙම මූල්‍ය ප්‍රකාශයන් මඟින් සලසා ඇත. කෙසේ වුවද, 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත යටතේ අඛණ්ඩ වසර 5ක සේවා කාලයක් සම්පූර්ණ කිරීම මත පමණක් නිලධාරියෙකුට පාරිතෝෂික ගෙවනු ලැබීමට හිමිකම් ලබනු ඇත.

16.2.6 වෙළඳ ලැබීම්

වෙළඳ ලැබීම් සටහන් කරනු ලබන්නේ අපේක්ෂිත ලැබිය හැකි වටිනාකමටය. වසර අවසාන වන විට පවතින සියලුම නොපියවූ මුදල් හි සමාලෝචනයක් මත පදනම්ව අඩමාන ලැබීම් සඳහා ඇස්තමේන්තුවක් සකස් කරනු ලබයි. හඳුනාගත් වර්ෂය තුළ දී බොල් ණය කපා හැරේ.

16.2.7 මුදල් සහ මුදල් හා සමාන අයිතම

මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි අරමුණු සඳහා මුදල් හා සමාන අයිතම ලෙස අතැති මුදල්, බැංකු තැන්පතු, බැංකු අයිරාවන් හි ශුද්ධ වටිනාකම අන්තර්ගත වේ. ශේෂ පත්‍රයේ ජංගම බැරකම් තුළ ණය ගැනීම යටතේ බැංකු අයිරාවන් ඇතුළත් කර ඇත.

16.2.8 ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්

ශේෂ පත්‍ර දිනට පසු සියලුම වැදගත් සිදුවීම් සැලකිල්ලට ගෙන මූල්‍ය ප්‍රකාශයෙහි අවශ්‍ය ගැළපීම් සහ හෙළි කිරීම් සිදු කරනු ලබයි.

16.2.9 බැරකම් සහ ප්‍රතිපාදන

ශේෂ පත්‍ර දිනට හඳුනාගත් සියලුම බැරකම් මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුළත් කරනු ලබන අතර පවතින බවට හඳුනාගන්නා ලද එහෙත් මුදල නිවැරදිව නිශ්චය කළ නොහැකි බැරකම් සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන සලසනු ලැබේ.

16.2.10 සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා ප්‍රතිපාදන

සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලයට දායකත්වය ලැබීමට සේවකයන් සුදුසුය. සේවකයන්ගේ දළ වැටුප මත මණ්ඩලය විසින් ඊ.පී.එෆ් සහ ඊ.ටී.එෆ් සඳහා පිළිවෙලින් 12% සහ 3% බැගින් දායකත්වය සපයනු ඇත.

16.2.11 ආදායම

16.2.11.1 පුනරාවර්ථන ස්වරූපයේ ප්‍රතිපාදන

පුනරාවර්ථන වියදම් සඳහා මහා භාණ්ඩාගාරයෙන් මණ්ඩලය වෙත ලද ප්‍රතිපාදන, ආදායම ලෙස හඳුනාගෙන ඇති අතර මණ්ඩලය විසින් උපයාගනු ලබන සියලු ආදායම් වෙනත් ආදායම් යටතේ ආදායම් ප්‍රකාශනවලට සෘජුවම හඳුනාගනී.

16.2.11.2 ප්‍රාග්ධන ස්වරූපයේ ප්‍රතිපාදන

ප්‍රාග්ධන වියදම් සඳහා මහා භාණ්ඩාගාරයෙන් මණ්ඩලය වෙත ලබා දෙන ප්‍රතිපාදන අදාළ වියදම් වාර්තා කිරීම මඟින් අඩුකොට ඇත.

16.2.12 වියදම්

වියදම ඉක්මවූ ආදායම ගණනය කිරීමේ දී මණ්ඩලය පවත්වාගෙන යාම වෙනුවෙන් දරන ලද පුනරාවර්ථන ස්වරූපයේ සියලුම වියදම් ආදායමට අය කරගෙන ඇත.

16.2.13 භාණ්ඩ තොගය

භාණ්ඩ තොගය පිරිවැයට හඳුනාගන්නා අතර පෙර ඇතුළු පෙර පිට ක්‍රමය යටතේ අගය කරනු ලැබේ.

16.2.13.1 ජාතික මාදක රසායනාගාරයේ අනතුරුදායක මත්ද්‍රව්‍ය තොගය

පහත සඳහන් මත්ද්‍රව්‍ය වර්ග හඳුන්වාදීම සඳහා රසායනාගාරයේ පවති.

වර්ගය	ප්‍රමාණය (ග්‍රෑම්)
අබිං	537.33
හෙරොයින්	607.98
ගංජා/ කංසා පැළෑටි ද්‍රව්‍ය	461.60
කොකේන්	463.49
මෙතැම්පිටමින්	0.61
එක්ස්ටසි එම්.ඩී.එම්.ඒ	9.79
බාබිටියුරේට්ස්	0.06
එල්.එස්.ඩි	0.054
සයිලොසින් එන්පිඑස්	5.86
පෙනිතිලැමයින්	0.01
ඉබෝගනීන්	6.96
කාත් පැළෑටි ද්‍රව්‍ය	126.08

16.2.14 ප්‍රත්‍යාගණනය

මණ්ඩලය විසින් මෝටර් රථ සහ රාජගිරියේ ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ ඉඩම සහ ගොඩනැගිල්ල තක්සේරු කර ඇත.

වත්කම් වර්ගය	ප්‍රත්‍යාගණනය කිරීමේ දිනය	ප්‍රත්‍යාගණනය කිරීමේ පාර්ශව	ප්‍රත්‍යාගණන වටිනාකම (රු.)
ඉඩම	2018-03-28	පළාත් තක්සේරුකරු, තක්සේරු දෙපාර්තමේන්තුව	365,000,000.00
ගොඩනැගිලි	2018-03-28	පළාත් තක්සේරුකරු, තක්සේරු දෙපාර්තමේන්තුව	81,418,000.00
මෝටර් රථ	2014-02-19	-	
WP KR 4875			4,200,000.00
WP KF 2801			2,300,000.00
301-9695			1,600,000.00
19-9679			1,000,000.00
64-4315			1,700,000.00
32-4515			2,000,000.00
WP NB 1258			7,000,000.00
129-7344			20,000.00
WP XC 8708			135,000.00
51-7214			1,400,000.00
WP HQ 6503			35,000.00
WP HQ 6505			40,000.00
WP YU 6932			350,000.00
WP YU 6934			350,000.00
WP YU 6938			390,000.00
WP YU 6933			375,000.00
54-0014			1,200,000.00
WP PB 4613			2,500,000.00
WP XC 8705			70,000.00

16.3 ගිණුම්කරණ ප්‍රතිපත්තිය වෙනස් කිරීම

16.3.1 ක්ෂය ප්‍රතිපත්තිය

2016 වර්ෂයේ සිට මිලදී ගත් වත්කම් සඳහා ක්ෂය ක්‍රමය, මිලදී ගත් වර්ෂයේ දී සම්පූර්ණ වර්ෂය සඳහාම ක්ෂය කිරීමේ ක්‍රමයේ සිට මිලදී ගත් වර්ෂයේදී දින පදනම මත ක්ෂය කිරීමේ ක්‍රමයට වෙනස් වේ.

16.4 මුදල් ප්‍රවාහ ප්‍රකාශ

වක්‍ර ක්‍රමය උපයෝගි කරගෙන මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළියෙල කර ඇත. මුදල් හා මුදල් සමාන අයිතම සඳහා මණ්ඩලයේ බැංකු ශේෂයන් අන්තර්ගත වේ.

17. විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No.

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date

සභාපති
අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ **2022** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව **2018** අංක **19** දරන ජාතික විගණන පනතේ **12** වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යටෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න,
විගණකාධිපති

පිටපත : 1. ලේකම්, මහජන ආරක්ෂක අමාත්‍යාංශය
2. ලේකම්, මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

සභාපති
අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 49 ඡේදය ප්‍රකාරව, එක් පන්තියකට අයත් වත්කම් ප්‍රත්‍යාගණනය කරන විට අදාළ වත්කම් පන්තිය එකවර ප්‍රත්‍යාගණනය කළ යුතු වුවද, ඊට පටහැනිව කොටස් වශයෙන් ප්‍රත්‍යාගණනය සිදු කර තිබුණි. ඒ අනුව 2022 දෙසැම්බර් 31 දින වන විට මුළු පිරිවැය රු.130,951,185 ක් වූ ගොඩනැගිලි එහි පිරිවැයටත් මුළු පිරිවැය රු.21,920,729 ක් ගොඩනැගිලි එහි ප්‍රත්‍යාගණනය අගයටත් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශනවල බදු ඉඩම් සම්බන්ධව අනුගමනය කරනු ලබන ගිණුම් ප්‍රතිපත්තිය නව දිගන්තය පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ කල්බදු ඉඩමට අදාළව පමණක් හෙළිදරව් කර තිබුණි. ඒ අනුව බදු ඉඩම් සම්බන්ධයෙන් මණ්ඩලය අනුගමනය කරනු ලබන ගිණුම්කරන ප්‍රතිපත්තිය හෙළිදරව් කර නොතිබුණි.

සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය සෑම වාර්ෂික වාර්තා කරන කාලපරිච්ඡේදයක් අවසන් වන දිනයේ දී සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.43,265,362 ක් වූ මෝටර් වාහන (ජංගම නොවන වත්කම්) සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණු නමුත් තවදුරටත් භාවිතයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 7 හි 42 ඡේදයට පටහැනිව පරිත්‍යාග මත ඉදිකෙරෙමින් පවතින නව දිගන්ත ප්‍රතිකාර පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ ඇස්තමේන්තුගත පිරිවැය රු. 5,816,589 ක් වූ අතර ඉදිකිරීම් කටයුතු සඳහා වැයකර ඇති මුදල රු. 3,598,600 ක් වුවද ගොඩනැඟිල්ල ඉදිකිරීම් පිරිවැය දැක්වීම වෙනුවට ප්‍රත්‍යාගණනය කරන ලද වටිනාකම රු.4,500,000 ක් කෙරිගෙන යන වැඩ යටතේ දක්වා තිබුණි.

(ඉ) 2022 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් ගිණුමේ පැවති රු.1,087,009 ක හර ශේෂය වර්ෂ 20 කට වඩා වැඩි කාලයක සිට වලනය නොවී පවතින අතර එම ශේෂයන් තහවුරු කරගැනීම සඳහා ප්‍රමාණවත් තොරතුරු නොතිබුණි.

(ඊ) මණ්ඩලයේ ගිණුම් වල වර්ෂ 09 කට අධික කාලයක සිට පැවත එන රු.480,899 ක අවිනිශ්චිත ගිණුමේ පවතින ශේෂයන් 2022 වර්ෂයේ දී රු.295,214 ක මුදලක් නිරවුල් කර තිබූ අතර රු.185,685 ක ශේෂයක් තවදුරටත් නිරවුල් නොවී පැවතුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් පොල් ආදායම රු.1,734,826 ක් වූ අතර එය තහවුරු කර ගැනීම සඳහා ආදායම් වාර්තා යාවත්කාලීනව ගිණුම් අංශය විසින් පවත්වා ගෙන ගොස් නොතිබුණි.

(ඌ) පරිත්‍යාග මත ඉදිකෙරෙමින් පවතින නව දිගන්ත ප්‍රතිකාර පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාව ශ්‍රම දායකත්වය වෙනුවෙන් රු.3,132,014 ක පිරිවැයක් ගණනය කර තිබූ අතර මෙය පරිත්‍යාග ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(එ) **UNODC** ගොඩනැල්ල හා නව දිගන්ත ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ද්‍රව්‍ය හා මූල්‍ය පරිත්‍යාග ලැබීම් ලේඛණගත කර තිබුණද ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක11 හි , 97 ඡේදය ට අනුව අත්පත් කරගත් දිනට වූ සාධාරණ අගය මත අයභාරය හඳුනා ගැනීම හා 106 ඡේද ප්‍රකාර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණි.

(ඒ) **පාරිතෝෂික වෙන් කිරීම**

i. වර්තමානය වන විටත් සේවයේ යෙදී සිටින නිලධාරීන් දෙදෙනෙකු වෙනුවෙන් පාරිතෝෂික වෙන්කිරීම රු.694,250ක් උපචිත කර තිබුණි.

ii. නිලධාරීන් 09 දෙනෙකු වෙනුවෙන් ගෙවිය යුතු රු. 6,193,135 ක පාරිතෝෂිත මුදල ජංගම වගකීම් යටතේ සහ ජංගම නොවන වගකීම් යටතේ පාරිතෝෂික වෙන්කිරීම් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ඌණතාවය සහ ජංගම නොවන වගකීම් රු.6,193,135 කින් වැඩියෙන් දැක්වුණි.

iii. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 19 හි 59 ඡේදය ප්‍රකාරව අනාගත සේවක ප්‍රතිලාභ පියවීම සඳහා එම වගකීම්, වට්ටම් පදනමක් මත මැනිය යුතු වුවත් මණ්ඩලය විසින් සේවක පාරිතෝෂික වෙන්කිරීම ගණනය කිරීමේදී මුදලේ වර්තමාන අගය/වට්ටම් ක්‍රමය සැලකිල්ලට ගෙන නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මණ්ඩලයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබාදීමට බලාපොරොත්තු වන මණ්ඩලයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මණ්ඩලයේ 2022 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැතිවිටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මණ්ඩලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(i)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද ඉහත 1.2 (අ), (ඇ), (ඌ) හැර නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීති රීති/විධානයට යොමුව	නිරීක්ෂණය
(අ) 2008 අංක 1 දරණ මාදක ඖෂධ සහ මනෝවර්තක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීම සම්මුනි පනතේ 18 වැනි වගන්තිය සමඟ 31 වන වගන්තිය හා අණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි වගන්තියේ (2) වැනි ඡේදයට අනුව සාදනු ලැබූ නියෝග අංක 1653/7-2010 මැයි 10 දින අතිවිශේෂ ගැසට් පත්‍රය	

	i. නියෝග 5 ඡේද	අධිකාරියේ බලතල කාර්යයන් හා කර්තව්‍යන් ක්‍රියාත්මක කිරීම ,ඉටුකිරීම සහ සිදුකිරීම සඳහා අවශ්‍ය විය හැකි ලේකම්වරයෙකු සහ වෙනත් නිලධරයන් සහ සේවකයන් අධිකාරිය විසින් පත්කරනු ලැබිය යුතු වුවද 2022 වර්ෂය අවසන් වන තුරු අවශ්‍ය වන කාර්යය මණ්ඩලය බඳවා ගැනීම් සිදුකර නොමැති අතර නිලධාරීන් දෙදෙනෙකු පමණක් අනුයුක්ත කර තිබුණි.
	ii. නියෝග 8 ඡේදය හා නියෝග 10 ඡේදය	2008 අංක 1 දරණ මාදක ඖෂධ සහ මනෝවර්තක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනතේ විධිවිධාන වලට යටත්ව අධිකාරිය රැස්වීම්වල කටයුතු කිරීම සම්බන්ධව අනුගමනය කල යුතු වන අතර නියෝග 10 ඡේද ප්‍රකාරව එහි කාර්යයන් පිළිබඳ පුරෝගාමී අධිකාරියේ මණ්ඩලයේ සාමාජිකයන් විසින් සමාලෝචනය සිදු කළ යුතු වුවද එසේ සිදු කර නොතිබුණි.
	iii නියෝග 13 ඡේදය	අධිකාරියේ සමාජිකයින් විසින් අවම වශයෙන් මාස තුනකට වරක්වත් බලපත්‍රලාභියාගේ ලියාපදිංචි කරනු ලැබූ පරිශ්‍රයට පැමිණ උපලේඛණයේ ද්‍රව්‍ය භාවිතා කරගෙන යන්නා වූ ක්‍රියාකාරකම් පිළිබඳව අධික්ෂණය හා ද්‍රව්‍ය ගබඩා කර ඇති ආකාරය බලපත්‍රලාභියා පවත්වාගෙන යන පොත් ලේඛණ සහ වාර්තා පරීක්ෂා කල යුතු වුවත් 2022 වර්ෂයේ පරිශ්‍ර 636 කින් 24 ක් පමණක් පරීක්ෂා කර තිබුණි. තවද පරිශ්‍ර සඳහා බලපත්‍ර ලබා ගැනීමට ලියාපදිංචි වී තිබුණු ආයතන 18 කට බලපත්‍ර ලබා දීමට ස්ථානීය පරීක්ෂාවට යාමට නොහැකි වීම නිසා බලපත්‍ර නිකුත් කිරීමට නොහැකි වී තිබුණි.
(ආ)	2007 අංක 54 දරණ ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපනය) පනතට අනුසාංගිකව නිකුත් කරන ලද 2010 මැයි 10 දිනැති අංක 1653/19 -2010 ගැසට් පත්‍රය	2022 වර්ෂය වන විට පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන 26 ක බලපත්‍ර වලංගු කාලය අවසන් වී තිබූ අතර මධ්‍යස්ථාන වල බලපත්‍ර අලුත් කිරීම සඳහා පවතින අවම ප්‍රමිතීන් තවදුරටත් සංවර්ධනය කිරීමට කාලය ලබා දී තිබුණද 2022 වර්ෂයේ දී කිසිදු මධ්‍යස්ථානයක බලපත්‍ර අලුත් කර නොතිබුණි. මෙම වාර්තාවේ දින වන විට 2023 වර්ෂයට අදාළව බලපත්‍ර 08 ක් පමණක් අලුත් කර තිබුණි.
(ඇ)	ආයතන සංග්‍රහයේ 15.1 ඡේදය හා රාජ්‍ය කොමිෂන් සභා වක්‍රලේඛ 03/2016	සංශෝධිත සේවා ව්‍යවස්ථා හා බඳවා ගනු ලබන නිළධාරීන් වසර 03 ක් ඇතුළත පළමු කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතු වුවත් ආයතනය විසින් 2019 මැයි 26 දින කාර්යක්ෂමතා කඩඉම් විභාගය පවත්වා තිබූ අතර ඉන් පසු විභාග පවත්වා නොතිබුණි. වර්ෂ 03 තුල කාර්යක්ෂමතා කඩඉම් විභාගය සම්පූර්ණ නොකළ නිළධාරීන් 137 ක් ආයතනයේ සේවයේ යෙදී සිටින අතර මෙම නිලධාරීන් සඳහා වාර්ෂිකව වැටුප් වර්ධක ලබා දීමට කටයුතු කර තිබුණි.

(ඇ) 1983අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනතේ 11 කොටසේ

i. 5(1) උප වගන්තිය	මණ්ඩලයේ සේවය අවසන් කරන ලද නිලධාරීන්ට සේවය අවසන් කරන ලද දින සිට දින 30 ක කාලයක් ඇතුලත පාරිතෝෂික ගෙවා අවසන් කල යුතු වුවත් 2022 වර්ෂය තුල දී නිලධාරීන් 09 ට රු.3,010,131 මුදලින් ගෙවා තිබූ අතර ඒ සඳහා ප්‍රමාද කාලය මාස 01 සිට මාස 15 දක්වා කාල පරාසයකට විහිදී තිබුණි. නිලධාරීන් 5 දෙනෙකු සඳහා උපචිත කර තිබූ පාරිතෝෂික වටිනාකම රු.4,281,615 ක් සඳහා 2023 වර්ෂයේ ගෙවීම් සිදු කර තිබූ ප්‍රමාද කාලය මාස 01 සිට 03 දක්වා කාල පරාසයක විහිදී තිබීම මත පනත ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
ii. 5 (2) (1) වන උප වගන්ති	සේවායෝජකයකු වෙත නියම කරන ලද බැඳීම් ඉටු කිරීමට පෙර ඒ සේවා යෝජකයාගේ මරණය සිදු වූ විටෙක, ඔහුගේ නීත්‍යානුකූල නියෝජිතයා විසින් ඒ බැඳීම ඉටු කරනු ලැබිය යුතු වුවද මරණයට පත් සේවකයින් දෙදෙනෙකු සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

මුදල් රෙගුලාසි 880	ආයතනයේ ඇප තැබීමට අවශ්‍ය නිළධාරීන් මණ්ඩලය විසින් හඳුනා ගෙන නොමැති අතර, (612 වැනි අධිකාරය) රජයේ නිළධාරීන්ගේ ඇප ආඥා පනත අනුව ඇප තබා නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් කරුණු හැර ආයතනයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

බලතල, කර්තව්‍ය, කාර්යයන්	නිරීක්ෂණ
(අ) 2007 අංක 54 දරන ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපනය) පිළිබඳ පනතේ	
i. 7 වන වගන්තිය ප්‍රකාරව තුලනික්ෂණ මූල මණ්ඩලයක් පත් කර නොතිබීම.	නීතී ක්ෂේත්‍රයේ විශිෂ්ඨත්වයට පත් තැනැත්තන් අතරින් හෝ අන්තරාදායක ඖෂධ ඇබ්බැහිය හා සම්බන්ධ කායික විද්‍යාත්මක හෝ සමාජ ගැටළු යන පිළිබඳ පලපුරුද්ද හා දැනුම ඇති තැනැත්තන් අතරින් දහදෙනෙකුට නොවැඩි

		තැනැත්තන් සංඛ්‍යාවකින් සමන්විත තුලනික්ෂණ මූල මණ්ඩලයක් පත් කර නොතිබුණි.
ii.	4 (02) සහ (03) යන වගන්ති ප්‍රකාරව මධ්‍යස්ථානයකට ඇතුළු වී අවශ්‍ය යයි සලකන පරික්ෂාවන් සිදුකිරීම	බලය පැවරී ඇති නිළධාරියෙකුට යුක්ති සහගත වේලාවන්හිදී පනත යටතේ බලපත්‍ර දී තිබෙන හෝ නාමෝදිෂ්ඨ යම් ප්‍රතිකාර මධ්‍යස්ථානයකට ඇතුළු වී අවශ්‍ය යයි සලකන පරික්ෂාවන් සිදු කල හැකි වුවද ආයතන 26 න් 2022 වර්ෂයේදී මධ්‍යස්ථාන 16 ක් පමණක් පරික්ෂාවට ලක් කර තිබුණ අතර නියමිත කාලාන්තරීය වාර්තා මඟින් ප්‍රතිකාර මධ්‍යස්ථානයෙහි සාර්ථකත්වය පිළිබඳ තොරතුරු මණ්ඩලයේ අවධානයට යොමු කර නොතිබුණි.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාව අනුව මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 වෙනත් කරුණු

(අ) 2014 අප්‍රේල් 30 දින, රු.4,085,018 ක බදු වටිනාකමකට තිස් අවුරුදු බදු පදනම මත ලබාගෙන ඇති හෝමාගම පිටිපන ඉඩම වසර 8 ක් ගතව තිබියදීත් යොදාගනු ලැබීමට අපේක්ෂිත කාර්යය නිශ්චිතව නාගරික සංවර්ධන අධිකාරිය වෙත දැනුම් නොදීම හේතුවෙන් මෙම ඉඩම ඵලදායී කාර්යයක යොදා ගැනීමකින් තොරව නිෂ්කාර්යව පැවතුණි.

(ආ) මත්ද්‍රව්‍ය භාවිතා කරන පුද්ගලයින් සහ ඔවුන්ගේ පවුල් වල සමාජිකයින් සඳහා අවශ්‍ය උපදේශන සේවාවන් ලබා දීම, අවශ්‍ය මූලික මට්ටමේ මැදිහත්වීම් සිදු කිරීම ,අවශ්‍ය ප්‍රතිකාර සේවාවන් (ප්‍රතිකාර මධ්‍යස්ථාන / මනෝවෛද්‍ය සායන සහ වෙනත් අවශ්‍ය සේවාවන්) වෙත යොමු කිරීම සහ තොරතුරු ලබා දීමේ අරමුණින් 2020 වර්ෂයේ මාර්තු මස අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ ප්‍රධාන කාර්යාල පරිශ්‍රය තුළ 1927 දුරකථන උපදේශන සේවා ඒකකය ආරම්භ කර තිබුණි. සේවා සැපයීමට සිටින නිලධාරීන් සීමිත වීම මත මෙම දුරකථන උපදේශන ඒකකයේ ප්‍රගතිය 2021 වර්ෂයට වඩා 2022 වර්ෂයේදී සියයට 38 කින් අඩු වී තිබීම හේතුවෙන් අපේක්ෂිත අරමුණ ඵලදායී ලෙස ඉටු නොවන බව නිරීක්ෂණය විය.

(ඇ) මණ්ඩලයට අයත් "නව දිගන්ත" ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා පෞද්ගලික ආයතනයකින් රු. 5,000,000 ක පරිත්‍යාග මුදලක් 2021 වර්ෂයේදී ලැබී තිබුණි. ගොඩනැගිල්ල ඉදිකිරීම් කටයුතු සඳහා රු. 8,948,612 ක ඇස්තමේන්තුවක් සකසා තිබූ අතර ඉදිකිරීම් කටයුතු ශ්‍රී ලංකා නාවික හමුදා ශ්‍රම දායකත්වයෙන් සිදු කිරීම වෙනුවෙන් රු.3,132,014 ක් අඩුකර රු. 5,816,589 ක පිරිවැය ඇස්තමේන්තුවක් සකසා තිබුණි. ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා රු. 3,598,600 ක් වැය කර තිබුණද, ඉදිකිරීම් කටයුතු තාවකාලිකව නතර කර තිබුණි. 2022 මාර්තු 25 දින භෞතිකව සිදු කරන ලද පරීක්ෂණ කමිටු වාර්තාව අනුව මිලදී ගත් ද්‍රව්‍ය වලින් රු.1,310,475 ක් වටිනා ද්‍රව්‍ය වැඩ බිමෙහි ඉතිරිව තිබුණි. ඒ අනුව පරිත්‍යාග වශයෙන් ලද මුදල් ආර්ථික හා ඵලදායී ලෙස යොදවා ගෙන නොමැති බව නිරීක්ෂණය විය.තවද, මෙම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් නතර කිරීම නිසා ද්‍රව්‍ය ආධාර වශයෙන් ලැබී තිබූ සිමෙන්ති මළු 100 ක් **UNODC** ආධාර මත ඉදි කෙරෙමින් පවතින ගොඩනැගිල්ලක් වෙත ලබා දීමට මණ්ඩලයේ අනුමැතිය ලබා දී තිබුණි.

(ඇ) 1984 අංක 11 දරන අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩල පනතේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා 374 කින් යුත් කාර්යය මණ්ඩලයක් අනුමත වී තිබුණද 2022 දෙසැම්බර් 31 දිනට නත්‍ය කායීය මණ්ඩලය 225 ක් වූයෙන් එදිනට පුරප්පාඩු සංඛ්‍යාව 149 ක් විය. මේ හේතුවෙන් මණ්ඩලයේ අරමුණු, බලතල හා කාර්යයන් ක්‍රියාත්මක කිරීමේදී බලාපොරොත්තුවන කාර්ය සාධනය ලහා කර ගත නොහැකි වී තිබුණි.

(ඉ) 2022 වර්ෂය සඳහා මණ්ඩලය අනුමත කර තිබූ ක්‍රියාකාරී සැළැස්ම සඳහා අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ ඇති අංශ 07 න් අංශ 03 ක පමණක් භෞතික ප්‍රගතිය විගණනය සඳහා ඉදිරිපත් විය. පර්යේෂණ අංශයේ යෝජිත වැඩ සටහන් 06 න් වැඩසටහන් 03 ක භෞතික ප්‍රගතිය සියයට 50 ක ආසන්නව පැවතුණි.

(ඊ) නීති විරෝධී මත්ද්‍රව්‍ය නිෂ්පාදනය ප්‍රවාහනය, ජාවාරම, විකිණීම සහ භාවිතයට එරෙහිව නීතීය ඵලදායී ලෙස බලාත්මක කිරීම සඳහා ජාතික මාදක රසායනාගාරය ක්‍රියාකාරී සැළැස්මට අනුව භෞතික ප්‍රගතිය පිලිබඳව ඉදිරිපත් කරන ලද දත්තයන්ට අනුව 2022 වර්ෂය කිසිදු ප්‍රගතියක් ලබා ගෙන නොතිබූ යෝජිත වැඩ සටහන් 08 ක් ද සියයට 10 වඩා භෞතික ප්‍රගතියක් ලබා නොගත් යෝජිත වැඩ සටහන් 03 ක් ද විය.

(උ) 2007 අංක 54 දරණ ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර පුනරුත්ථාපනය) පිළිබඳ පනත සංශෝධනය කිරීම සඳහා 2022 ජනවාරි 24 දින පැවති ආමාත්‍ය මණ්බල රැස්වීමේදී අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අමප/21/2279/303/176 ප්‍රකාරව පනතට අදාළ සංශෝධන කටයුතු නිම කිරීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

18. දස වසරක මූල්‍ය උදෘතයන්

අභ්‍යන්තර මූල්‍ය කළමනාකරණය, මූල්‍ය වාර්තාකරණය සහ කළමනාකරණ ක්‍රමවේද සඳහා මෙම අංශය වගකිව යුතුය. පසුගිය වසර දහය පුරා අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ ආදායම්, වියදම්, භාණ්ඩාගාර ප්‍රදාන පහත දැක්වෙන පරිදි සාරාංශ කර දැක්විය හැක.

රජයේ පුනරාවර්ථන හා ප්‍රාග්ධන ප්‍රධාන

	2013 (රු. '000)	2014 (රු. '000)	2015 (රු. '000)	2016 (රු. '000)	2017 (රු. '000)
රජයේ පුනරාවර්ථන ප්‍රධාන	129,407	139,123	170,634	201,401	194,098
රජයේ ප්‍රාග්ධන ප්‍රධාන	18,400	30,000	17,233	20,000	3,500

	2018 (රු. '000)	2019 (රු. '000)	2020 (රු. '000)	2021 (රු. '000)	2022 (රු. '000)
රජයේ පුනරාවර්ථන ප්‍රධාන	208,724	218,522	249,464	243,944	234,850
රජයේ ප්‍රාග්ධන ප්‍රධාන	27,448	14,400	24,917	16,473	300

පසුගිය වසර දහයක ආදායම් හා වියදම් විශ්ලේෂණය

	2013 (රු. '000)	2014 (රු. '000)	2015 (රු. '000)	2016 (රු. '000)	2017 (රු. '000)
නේවාසික සහ ඇතුළත්වීමේ ගාස්තු	2,651	2,156	2,004	2,375	3,750
මත්ද්‍රව්‍ය උපදේශන සහතික පාඨමාලා ආදායම	1,182	2,232	3,564	5,643	5,514
පොල් ආදායම	1,061	1,257	969	805	938
ජාතික මාදක රසායනාගාර ආදායම	313	640	595	660	713
මත්ද්‍රව්‍ය දුර්භාවිත නිවාරණ සහතිකපත්‍ර පාඨමාලාව	-	-	-	-	-
පී සී ඒ ආදායම	-	-	-	-	4,383

	2018 (රු. '000)	2019 (රු. '000)	2020 (රු. '000)	2021 (රු. '000)	2022 (රු. '000)
නේවාසික සහ ඇතුළත්වීමේ ගාස්තු	4,785	3,885	1,976	910	720
මත්ද්‍රව්‍ය උපදේශන සහතික පාඨමාලා ආදායම	5,492	5,391	2,312	1,829	758
පොල් ආදායම	1,718	1,334	1,091	1,681	1,735
ජාතික මාදක රසායනාගාර ආදායම	703	656	431	1,509	1,407
මත්ද්‍රව්‍ය දුර්භාවිත නිවාරණ සහතිකපත්‍ර පාඨමාලාව	-	-	-	595	2,586
පී සී ඒ ආදායම	1,849	1,971	1,361	1,268	1,233

පසුගිය වසර දහයක ආදායම් හා වියදම් විශ්ලේෂණය

	2013 (රු. '000)	2014 (රු. '000)	2015 (රු. '000)	2016 (රු. '000)	2017 (රු. '000)
මුළු ආදායම	139,411	147,355	178,809	224,954	218,036
මුළු වියදම	145,857	163,262	192,920	262,137	252,116
වර්ෂය සඳහා හිඟය	6,447	15,907	14,111	37,183	34,081

	2018 (රු. '000)	2019 (රු. '000)	2020 (රු. '000)	2021 (රු. '000)	2022 (රු. '000)
මුළු ආදායම	226,784	232,579	259,336	285,512	244,478
මුළු වියදම	255,075	270,839	272,034	270,494	292,837
වර්ෂය සඳහා හිඟය	28,292	38,260	12,697	15,018	48,359

19. තිරසාර සංවර්ධන ඉලක්ක පිළිබඳ වාර්තාව

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය තිරසාර සංවර්ධන ඉලක්ක කිහිපයක් (SDG-2030) මත සිය මෙහෙයුම් මෙහෙයවන අතර සෑම දෙපාර්තමේන්තුවක්ම සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, ප්‍රතිඵල ලඟා කර ගැනීමේදී සහ සේවා පුළුල් කිරීමේදී තිරසාර සංවර්ධන ඉලක්ක මත පදනම්ව කටයුතු කරයි.

තිරසාර සංවර්ධන ඉලක්ක අංක 3 - නිරෝගී බව සහ යහපැවැත්ම හා 3.5 - හානිකර ආකාරයට මද්‍යසාර භාවිතය සහ අන්තරායකාරී ඖෂධ භාවිතය වැළැක්වීමේ ක්‍රියාමාර්ග සහ ප්‍රතිකාර ශක්තිමත් කිරීම යටතේ ගුණාත්මක සෞඛ්‍ය සේවාවන් සාක්ෂාත් කර ගැනීමට නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය, ප්‍රතිකාර හා පුනරුත්ථාපන අංශය, බාහිරසේවා අංශය, ජාතික මාදක රසායනාගාරය, නාමෝදිෂ්ඨ හා පෞද්ගලික ප්‍රතිකාර අංශය, පර්යේෂණ අංශය සහ පුරෝගාමී පාලන අධිකාරිය විසින් ඍජුව ක්‍රියා කරයි.

මීට අමතරව, තිරසාර සංවර්ධන ඉලක්ක අතර අංක 5.1 යටතේ තම ආදරණීයයන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය සහ දුරාචාර හැසිරීම හේතුවෙන් කාන්තාවන් වඩාත් ශාරීරික, මානසික, චිත්තවේගීය සහ සංජානන පරිහානියට ගොදුරු වන බව අවබෝධ කරගනිමින් අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය ප්‍රධාන සාක්ෂාත් ඉලක්කයක් ලෙස කාන්තාවන්ට හා ගැහැණු ළමුන්ට එරෙහිව සියලුම ස්ථානයන්හි සිදුවන්නා වූ සියලුම ආකාරයේ වෙනස්කොට සැළකීම් තුරන් කිරීම සඳහා ක්‍රියාත්මක වේ. ඒ අනුව වැඩසටහන් සැළසුම් කිරීමේදී සහ ක්‍රියාත්මක කිරීමේදී සෑමවිටම සමානාත්මතාවයට ගරු කරන අතර කාන්තාවන්ට විශේෂ සැලකිල්ලක් දැක්වීම මෙමගින් සහතික කෙරේ.

තිරසාර සංවර්ධන ඉලක්ක 10.2 - 2030 වන විට වයස, ලිංගිකත්වය, ආබාධිතබව, ජන වර්ගය, ජාතිය, ආගම හෝ ආර්ථික හෝ වෙනත් තත්ත්වයන් පිළිබඳව තැකීමකින් තොරව සියලුදෙනාගේ සමාජ ආර්ථික සහ දේශපාලනික අන්තර්කරණය සවිබලගැන්වීම සහ පළර්ධනය, 10.3 - ප්‍රතිලාභ බේදීයාමේදී සමාන අවස්ථාවන් පැවතීම තහවුරු කිරීම, පවත්නා අසමානතාවන් අවම කිරීම සහ වෙනස්කොට සැලකීමට තුඩුදෙන්නා වූ නීති, ප්‍රතිපත්ති සහ භාවිතාවන් ඉවත් කිරීම සහ මේ සම්බන්ධයෙන් සුදුසු නීති ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග ගැනීම ජාතික මාදක රසායනාගාරය සහ පුරෝගාමී පාලන අධිකාරිය විසින් සලකා බලනු ලබන තවත් ඉලක්කගත විෂයකි. මේ සමඟ ජාතික මාදක රසායනාගාරය මත්ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත ක්ෂේත්‍ර සම්බන්ධ නීතිමය ක්‍රියාමාර්ග ශක්තිමත් කිරීමට සක්‍රීයව කටයුතු කරයි.

තිරසාර සංවර්ධන ඉලක්ක 16.B උපශීර්ෂය තුළ තිරසාර සංවර්ධනය සඳහා වෙනස්කොට සැළකීම වැළැක්වීම සඳහා වූ නීති සහ ප්‍රතිපත්ති ප්‍රවර්ධනය කිරීම හා බලගැන්වීම සඳහා ජාති, ආගම්, කුල, සංස්කෘතිය, වර්ණ, ලිංගිකත්වය වැනි භේදයකින් තොරව මත්ද්‍රව්‍ය නිවාරණය, ප්‍රතිකාර සහ පුනරුත්ථාපන සේවා සැපයීමේදී ලිංගික දිශානතිය, ජනවාර්ගිකත්වය යනාදිය, සේවා සැපයීම, සේවා ලබා ගැනීමේ හැකියාව යනාදී වෙනස්කිරීම්වලට යටත් නොවී සමානාත්මතාවය ආරක්ෂා වන පරිදි කටයුතු කරනු ලබයි.

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය
2022.12.31 අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	වර්ෂ අවසාන 2022.12.31 රු.	වර්ෂ අවසාන 2021.12.31 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම් වෙනුවෙන් මුදල් ප්‍රවාහය		
අතිරික්තය හෝ හිඟය	(48,359,337.21)	15,018,049.32
ගැලපුම්		
ක්ෂයවීම්	21,732,572.95	23,249,642.71
පාරිතෝෂික සඳහා වෙන්කිරීම්	12,278,512.76	4,173,567.50
පෙර වසර ගැලපුම්		(1,380,335.08)
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය	(14,348,251.50)	41,060,924.45
අයවිය යුතු ආපදා ණය හා උත්සව අත්තිකාරම්	1,887,407.00	(4,615,737.00)
WIP නව ගොඩනැගිල්ල		(17,500,000.00)
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්	(12,460,844.50)	18,945,187.45
තොග	280,897.23	(965,293.78)
ඉදිරියට කල ගෙවීම්	(167,756.68)	(493,886.51)
අත්තිකාරම්	-	67,405.00
ලැබිය යුතු ආදායම	285,422.31	1,279,577.69
ණයගැති අත්තිකාරම්	(188,000.00)	-
ණයහිමියෝ	10,000.00	(23,820.00)
උපචිත වියදම්	8,970,091.63	2,450,253.49
ප්‍රත්‍යාගණන සංචිත	-	970,549.41
රඳවාගත් මුදල්	-	(78,319.00)
NNL පරීක්ෂණ - රියදුරු	(8,655,559.00)	10,000,000.00
මෙහෙයුම්වලින් ජනනය වන මුදල්	(11,925,749.01)	32,151,653.75
පාරිතෝෂික ගෙවීම්	(8,297,889.01)	(6,568,437.50)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය	(20,223,638.02)	25,583,216.25
ආයෝජන ක්‍රියාකාරකම් වෙනුවෙන් මුදල් ප්‍රවාහය		
දේපල පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම	(2,032,127.53)	(19,062,979.44)
ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද ලාභය		
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය		
මූල්‍ය ක්‍රියාකාරකම් වෙනුවෙන් මුදල් ප්‍රවාහය		
වර්ෂය තුල ලද ශුද්ධ අරමුදල	300,000.00	16,473,000.00
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය		
මුදල් හා මුදල්වලට සමාන දේවල් ශුද්ධ වෙනස්වීම්	**(21,955,765.55)**	**22,993,236.81**
ආරම්භක මුදල් ශේෂය	**27,146,690.30**	**4,153,453.49**
අවසන් මුදල් ශේෂය	**5,190,924.75**	**27,146,690.30**

පාලක ආයතනයේ අයිතිකරුවන්ට අයත් වේ.						මුළු ශුද්ධ වත්කම්/ හිමිකම්
	දායක ප්‍රාග්ධනය	අනෙකුත් සංචිත	පරිවර්ථන සංචිත	සමුච්චිත අතිරික්තය/ අලාභය	එකතුව	
2019 දෙසැම්බර් ශේෂය	65,348,000.00	462,720,932.38	65,984,610.57	(146,395,634.07)	447,657,908.88	
වර්ෂය තුළ ප්‍රාග්ධන ලැබීම්	24,916,946.94	-	-	-	24,916,946.94	
පෙර වර්ෂ ගැලපුම්	-	-	-	1,506,126.12	1,506,126.12	
වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය/ හිඟය	-	-	-	(12,697,277.87)	(12,697,277.87)	
2020 දෙසැම්බර් ශේෂය	90,264,946.94	462,720,932.38	65,984,610.57	(157,586,785.82)	461,383,704.07	
වර්ෂය තුළ ප්‍රාග්ධන ලැබීම්	16,473,000.00	-	-	-	16,473,000.00	
පෙර වර්ෂ ගැලපුම්	-	-	-	(1,380,335.08)	(1,380,335.08)	
WIP ගොඩනැගිලි තක්සේරුව	-	970,549.41	-	-	-	
වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය/ හිඟය	-	-	-	15,018,049.32	15,018,049.32	
2021 දෙසැම්බර් ශේෂය	106,737,946.94	463,691,481.79	65,984,610.57	(143,949,071.58)	492,464,967.72	
වර්ෂය තුළ ප්‍රාග්ධන ලැබීම්	300,000.00	-	-	-	300,000.00	
පෙර වර්ෂ ගැලපුම්	-	-	-	(633,811.91)	(633,811.91)	
ගොඩනැගිලි තක්සේරුව	-	110,539,673.72	(295,214.77) -	-	(295,214.77) 110,539,673.72	
වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය/ හිඟය	-	-	-	(48,359,337.21)	(48,359,337.21)	
2022 දෙසැම්බර් ශේෂය	107,037,946.94	574,231,155.51	65,689,395.80	(192,942,220.70)	554,016,277.55	

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය
2022.12.31 අවසන් වර්ෂය සඳහා
මූල්‍ය ප්‍රකාශන සටහන්

සටහන 1

රාජ්‍ය පුනරාවර්ථන ප්‍රදාන	2022	2021
	රු.	රු.
ජනවාරි	16,000,000.00	18,200,000.00
පෙබරවාරි	20,000,000.00	26,500,000,00
මාර්තු	21,750,000.00	24,500,000.00
අප්‍රේල්	16,000,000.00	16,000,000.00
මැයි	15,000,000.00	22,000,000.00
ජුනි	26,000,000.00	16,000,000.00
ජූලි	15,000,000.00	16,004,000.00
අගෝස්තු	15,000,000.00	28,700,000.00
සැප්තැම්බර්	21,500,000.00	16,000,000.00
ඔක්තෝබර්	21,500,000.00	14,200,000.00
නොවැම්බර්	24,100,000.00	24,840,000.00
දෙසැම්බර්	23,000,000.00	21,000,000.00
	234,850,000.00	**243,944,000.00**

සටහන 2

වෙනත් ආදායම්	2022	2021
	රු.	රු.
පොල් ආදායම්	1,734,826.50	1,680,819.50
ආපදා ණය හා උත්සව අත්තිකාරම් පොළිය	712,941.60	665,799.71
උපදේශන පාඨමාලා ආදායම්	758,475.00	1,828,950.00
මත්ද්‍රව්‍ය නිවාරණ සහතික පත්‍ර පාඨමාලාව	2,585,500.00	595,000.00
වාහනය මත රජයේ ගාස්තු	5,935.48	6,500.00
වෙනත් ආදායම්	52,178.00	485,744.69
රසායනාගාර ආදායම්	1,406,500.00	1,508,500.00
වැටුප් ආපසු ගෙවීම්	339,073.94	338,729.96
ආපසු නොගෙවනු ලබන ටෙන්ඩර් තැන්පතුව	15,000.00	51,000.00
පුරෝගාමී පාලන අධිකාරියෙන් ලද ආදායම්	1,232,500.00	1,267,500.00
නේවාසික හා පරිපාලන ගාස්තු	720,000.00	910,000.00
පර්යේෂණ පොත් විකුණුම්	11,600.00	1,000.00
වෘත්තිමය අයිතම විකුණුම්	45,000.00	-
පරිත්‍යාග නවදිගන්තය	-	31,079,982.35
අයදුම්පත් ගාස්තු	-	1,148,500.00
සිම්පෝසියම් 2022	15,000.00	
	9,634,530.52	**41,568,026.21**

සටහන 3

ඉවත් කිරීමෙන් ලද ලාභය	2022	2021
	රු.	රු.
ඉවත් කල ස්ථාවර වත්කම් වල පිරිවැය	3,249,498.43	-
ඉවත් කල ස්ථාවර වත්කම් වල සමුච්චිත ක්ෂය	(3,155,466.89)	-
ඉවත් කල ස්ථාවර වත්කම්වලින් විකුණුම් ආදායම	(6,601.54)	-
	6,601.54	**-**

සටහන 4

පුද්ගල හා පරිපාලන පිරිවැය	2022	2021
	රු.	රු.
විගණන හා කළමනාකරණ රැස්වීම් ගාස්තු	128,000.00	120,000.00
මණ්ඩල රැස්වීම් ගාස්තු	738,600.00	797,000.00
සේවා නියුක්ති භාරකාර අරමුදල	3,880,852.21	4,080,916.23
සේවක අර්ථසාධක අරමුදල	15,238,870.78	16,323,663.69
අනු කමිටු රැස්වීම් ගාස්තු	-	152,000.00
අතිකාල දීමනා	3,906,441.31	5,446,365.59
වැටුප් හා වේතන	144,268,570.99	138,252,150.54
සේවා පාරිතෝෂික	12,278,512.76	4,173,567.50
SHE රක්ෂණය	727,794.08	3,638,970.38
ප්‍රවාහනය	634,513.80	2,862,129.32
ගමන් වියදම් - විදේශිය	-	-
ගමන් වියදම් - දේශිය	1,726,848.00	1,505,121.22
	183,529,003.93	**177,351,884.47**

සටහන 5

වෙනත් මෙහෙයුම් පිරිවැය	2022	2021
	රු.	රු.
පුවත්පත් දැන්වීම්	143,802.00	458,474.40
විගණන ගාස්තු	1,000,000.00	1,000,000.00
විදුලි බිල්පත්	4,436,717.42	4,063,538.49
ඉන්ධන	5,452,216.28	5,070,842.80
අන්තර්ජාල සේවා	1,526,605.03	1,511,240.22
සනීපාරක්ෂක සේවා	2,284,325.00	2,469,927.50
අනෙකුත් මධ්‍යස්ථාන කුලී	-	16,000.00
ගොඩනැගිලි අළුත්වැඩියාව	727,501.45	1,532,499.00
මෝටර් රථ අළුත්වැඩියාව	2,511,650.68	3,259,459.97
කාර්යාල උපකරණ අළුත්වැඩියාව	3,000,036.56	2,158,663.89
විවිධ වියදම්, සංග්‍රහ වියදම්	404,120.50	434,836.05
පුවත්පත්, වාරසඟරා හා ප්‍රකාශන	118,620.00	87,710.00
කෘමිනාශක	62,540.00	59,000.00
තැපැල් ගාස්තු	146,748.00	102,069.70
මුද්‍රණ, ලිපිද්‍රව්‍ය හා කාර්යාල උපකරණ	1,708,718.00	3,819,127.49
කුලී හා බදු	408,702.18	489,323.35
ආරක්ෂක වියදම්	8,052,800.00	8,153,000.00
සේවක නිලඇඳුම්	116,000.00	124,000.00
දුරකථන බිල්පත්	1,371,379.34	2,002,124.21
පරිවර්ථන, විමර්ෂණ හා තාක්ෂණ ගාස්තු	166,158.12	206,498.50
ජල සැපයුම්	1,694,155.94	1,252,264.95
	35,332,796.50	**38,270,600.52**

සටහන 6

දේශීය/ විදේශීය ආයතන දායකත්වය	2022	2021
	රු.	රු.
N.G.O.(SLFONGODA) දායකත්වය	-	330,000.00
මත්ද්‍රව්‍ය නීතිය බලාත්මක කිරීමේ ක්‍රියාකාරකම්	-	-
	-	330,000.00

සටහන 7

නිවාරණ අධ්‍යාපන අංශය පිරිවැය	2022	2021
	රු.	රු.
නිවාරණ අධ්‍යාපන හා පුද්ගල දැනුවත් කිරීම්	463,570.00	177,757.98
මත්ද්‍රව්‍ය විරෝධී දින වැඩසටහන	9,340.00	260,555.00
නිවාරණ අධ්‍යාපන ක්ෂේත්‍ර දීමනා	1,086,428.32	542,667.05
මත්ද්‍රව්‍ය නිවාරණ සහතික පත්‍ර පාඨමාලාව - වියදම්	981,590.00	89,295.00
	2,540,928.32	1,070,275.03

සටහන 8

ප්‍රතිකාර හා පුනරුත්ථාපන පිරිවැය	2022	2021
	රු.	රු.
මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය - ආහාර	42,782,779.00	21,514,052.00
මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය - කෑම බීම	-	-
මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය - වෙනත් කෑම බීම	1,507,875.63	1,470,163.61
මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය - බෙහෙත්	106,473.58	101,311.60
මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය - වෛද්‍ය දීමනා	38,750.00	37,500.00
මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය - ක්‍රීඩා අයිතම	-	-
මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය - වෘත්තිමය පුහුණු	-	2,000.00
පසුරැකවරණ වැඩසටහන්	47,184.82	159,132.01
	44,483,063.03	23,284,159.22

සටහන 9

පර්යේෂණ අධ්‍යයන වියදම්	2022	2021
	රු.	රු.
පර්යේෂණ අධ්‍යයනය	899,552.00	903,125.00
මත්ද්‍රව්‍ය උපදේශන සේවා වියදම්	77,900.00	519,556.96
	977,452.00	1,422,681.96

සටහන 10

බාහිර සේවා වියදම	2022	2021
	රු.	රු.
බාහිර සේවා ජංගම වැඩසටහන් සහ වෙනත්	489,837.11	767,744.50
බාහිර සේවා ක්ෂේත්‍ර දීමනා	2,166,570.57	2,489,880.71
	2,656,407.68	3,257,625.21

සටහන 11

ජාතික මාදක රසායනාගාර වියදම්

	2022	2021
	රු.	රු.
රසායනාගාර අවශ්‍යතා සහ රසායනික ද්‍රව්‍ය	1,536,732.78	648,052.02
ජාතික මාදක රසායනාගාර පුහුණු වැඩසටහන්	1,300.00	313,060.00
	1,538,032.78	**961,112.02**

සටහන 12

බන්ධනාගාර සහ වෙනත් ප්‍රතිකාර මධ්‍යස්ථාන

	2022	2021
	රු.	රු.
බන්ධනාගාර සහ වෙනත් ප්‍රතිකාර මධ්‍යස්ථාන	52,424.00	49,225.00
	52,424.00	**49,225.00**

සටහන 13

මානව සම්පත් සංවර්ධන වියදම්

	2022	2021
	රු.	රු.
කාර්ය මණ්ඩල පුහුණු වියදම්	(77,250.00)	935,300.00
කාර්ය මණ්ඩල බඳවාගැනීමේ ගාස්තු	-	214,496.75
	(77,250.00)	**1,149,796.75**

සටහන 14

මූල්‍ය පිරිවැය

	2022	2021
	රු.	රු.
බැංකු ගාස්තු	71,835.00	96,974.00
	71,835.00	**96,974.00**

සටහන 15

ක්ෂයවීම් සහ වෙනත්

	2022	2021
	රු.	රු.
ක්ෂයවීම්	21,732,572.95	23,249,642.71
	21,732,572.95	**23,249,642.71**

සටහන 16

අතැති හා බැංකුවේ මුදල්

	2022	2021
	රු.	රු.
ගිණුම් අංක 1643 ආයතනික ශාඛා ගිණුම	962,731.49	14,423,644.61
ගිණුම් අංක 0003270702 රාජගිරිය ගිණුම	49,660.90	184,010.90
NDDCB ප්‍රතිකාර හා පූනරුත්ථාපන ගිණුම	4,178,532.36	10,776,028.03
ගිණුම් අංක 86774069 රාජගිරිය ගිණුම	-	1,763,006.76
	5,190,924.75	**27,146,690.30**

සටහන 17

තොග

	2022	2021
	රු.	රු.
රසායනික ද්‍රව්‍ය තොගය	2,468,887.14	2,197,593.75
ලිපිද්‍රව්‍ය තොගය	2,582,802.51	3,134,993.13
	5,051,689.65	**5,332,586.88**

සටහන 18

පෙර ගෙවීම්

වාහන රක්ෂණ හා බලපත්‍ර ගාස්තු	2022 රු.	2021 රු.
BAQ - 4028 රක්ෂණ	-	-
BAQ - 4028 බලපත්‍ර	12.66	782.65
BAQ - 4032 රක්ෂණ	-	-
BAQ - 4032 බලපත්‍ර	11.51	716.87
BAQ - 4023 රක්ෂණ	-	-
BAQ - 4023 බලපත්‍ර	11.51	711.50
BAQ - 4037 රක්ෂණ	-	-
BAQ - 4037 බලපත්‍ර	11.51	711.50
BAQ - 4020 රක්ෂණ	-	-
BAQ - 4020 බලපත්‍ර	12.66	12.65
YU - 6932 රක්ෂණ	-	-
YU - 6932 බලපත්‍ර	76.85	863.42
YU - 6933 රක්ෂණ	-	-
YU - 6933 බලපත්‍ර	38.42	863.42
YU - 6934 රක්ෂණ	-	-
YU - 6934 බලපත්‍ර	34.93	784.93
YU - 6938 රක්ෂණ	-	-
YU - 6938 බලපත්‍ර	38.42	859.93
PF - 9007 රක්ෂණ	-	-
PF - 9007 බලපත්‍ර	715.07	9,715.06
51 - 7214 රක්ෂණ	-	-
51 - 7214 බලපත්‍ර	1,676.71	1,676.71
301- 9695 රක්ෂණ	-	-
301- 9695 බලපත්‍ර	895.89	895.89
PB - 4613 රක්ෂණ	-	-
PB - 4613 බලපත්‍ර	7,298.63	7,298.63
19 - 9679 රක්ෂණ	-	-
19 - 9679 බලපත්‍ර	1,940.82	1,940.82
32 - 4515 රක්ෂණ	-	-
32 - 4515 බලපත්‍ර	-	7,013.69

64 - 4315 රක්ෂණ	-	-
64 - 4315 බලපත්‍ර	2,301.37	2,531.50
CAG - 1776 රක්ෂණ	-	-
CAG - 1776 බලපත්‍ර	-	772.60
CAG - 2548 රක්ෂණ	-	-
CAG - 2548 බලපත්‍ර	-	794.52
KF - 2801 රක්ෂණ	-	-
KF - 2801 බලපත්‍ර	2,667.12	2,432.87
KR - 4875 රක්ෂණ	-	-
KR - 4875 බලපත්‍ර	-	3,845.57
XC - 8699 රක්ෂණ	-	-
XC - 8699 බලපත්‍ර	-	653.97
XC - 8708 රක්ෂණ	-	-
XC - 8708 බලපත්‍ර	-	653.97
NB - 1258 රක්ෂණ	-	-
NB - 1258 බලපත්‍ර	6,513.70	6,595.89
NB - 7948 රක්ෂණ	-	-
NB - 7948 බලපත්‍ර	-	3,317.80
වාහන රක්ෂණ	219,494.00	-
කාර්යාල උපකරණ නඩත්තුව		
සිලෝන් බිස්නස් ඇප්ලයන්ස්	15,700.02	-
ගෙස්ටෙට්නර්	2,796.16	4,007.83
මෙට්රෝපොලිටන්	46,285.15	-
ට්‍රේඩ් ප්‍රමෝටර්	71,637.50	-
හේලිස් ඇවෙන්චුරා	566,517.60	69,237.86
සොෆ්විෂන්	39,978.08	-
ඔෆිස්නෙට්වර්ක්	6,983.00	-
බදු හා කුලී	31,594.52	-
ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්	-	219,494.00
2022 මුළු පෙර ගෙවීම්	**1,025,243.81**	**857,487.13**

සටහන 19

අත්තිකාරම්	2022	2021
	රු.	රු.
මත්ද්‍රව්‍ය තොරතුරු පුනරුත්ථාපන පර්යේෂණ	747.00	747.00
ජාතික අධ්‍යාපන ආයතනය	27,725.50	27,725.50
මත්ද්‍රව්‍ය අධ්‍යාපන ආයතනය	4,572.00	4,572.00
ජාතික නිවාස ඉදිකිරීම් ආයතනය	15,000.00	15,000.00
අධ්‍යක්ෂ - ගොඩනැඟිලි දෙපාර්තමේන්තුව	138,800.00	138,800.00
කොළඹ මධ්‍යස්ථානය	1,160,250.00	1,160,250.00
නවදිගන්ත මධ්‍යස්ථානය	-	337,800.00
ඉන්ඩෝසෝල් ප්‍රයිවට් ලිමිටඩ්	6,652.50	6,652.50
බර්නර් මාෂල් පබ්ලිෂර්	4,867.00	4,867.00
ස්කූල් ඔෆ් කෝපරේෂන් පොල්ගොල්ල	-	9,725.00
නියෝජ්‍ය අධ්‍යක්ෂ	1,800.00	1,800.00
මැතිවරණ රාජකාරි	5,617.50	5,617.50
කළමණාකරු- මහනුවර මධ්‍යස්ථානය	32,553.00	32,553.00
කළමණාකරු - නවදිගන්ත මධ්‍යස්ථානය	15,700.00	15,700.00
මුද්‍රණ සංස්ථාව	19,750.00	19,750.00
කළමණාකරු- ගාල්ල මධ්‍යස්ථානය	500.00	500.00
	1,434,534.50	**1,782,059.50**

සටහන 20

ණයගැති - අත්තිකාරම්	2022	2021
	රු.	රු.
දයා බිල්ඩර්ස්		
ඉන්ධන තැන්පතු	100,000.00	25,000.00
විදුලි සංදේශන තැන්පතු		
විදේශීය සහ නව දුරකථන ජාල තැන්පතු	25,250.00	25,250.00
ශ්‍රී ලංකා ටෙලිකොම්		
විදේශීය තැන්පතු	5,000.00	5,000.00
ජී.ඕ.බී.යූ. සිලෝන් ගෑස් කම්පැනි		
සිලින්ඩර් තැන්පතු	750.00	750.00
කලම්බු ගෑස් ඇන්ඩ් වෝටර් කම්පැනි ලිමිටඩ්		
කි.ග්‍රෑම් 40 සිලින්ඩර් තැන්පතු	5,000.00	5,000.00
සිලෝන් ඔක්සිජන් ලිමිටඩ්		
ගෑස් සිලිනඩර් තැන්පතු	38,500.00	38,500.00
ආරක්ෂණ තැන්පතු	3,500.00	3,500.00
බස්නාහිර පළාත් ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය	20,000.00	20,000.00
මහනුවර ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය	6,750.00	6,750.00
දකුණු පළාත් ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය	11,500.00	11,500.00
නවදිගන්තය ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය	20,000.00	20,000.00
ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය		
ජල සැපයුම් තැන්පතු		
මහනුවර ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය	5,000.00	5,000.00
දකුණු පළාත් ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය	1,000.00	1,000.00

<u>හේවාගම් කෝරලයේ බස්නාහිර විවිධ සේවා සමූපකාර සමිතිය</u>		
වියලි සලාක තැන්පතුව	7,500.00	7,500.00
<u>බත්තරමුල්ල විවිධ සේවා සමූපකාර සමිතිය</u>		
තෙල් තැන්පතුව	6,000.00	6,000.00
<u>නුවර විවිධ සේවා සමූපකාර සමිතිය</u>		
වියලි සලාක තැන්පතුව	5,000.00	5,000.00
තෙල් තැන්පතුව	20,000.00	20,000.00
<u>ගාල්ල විවිධ සේවා සමූපකාර සමිතිය</u>		
වියලි සලාක තැන්පතුව හා තෙල් තැන්පතුව	25,000.00	10,000.00
<u>අත්තනගල්ල විවිධ සේවා සමූපකාර සමිතිය</u>		
වියලි සලාක තැන්පතුව	48,000.00	48,000.00
තෙල් තැන්පතුව	102,000.00	4,000.00
<u>නාගරික කොමසාරිස් නුවර</u>		
ගොඩනැගිලි කුලි තැන්පතුව	1,050.00	1,050.00
<u>ශ්‍රී ලංකා නේෂන් අර්බිටේෂන් සෙන්ටර්</u>		
මධ්‍යස්ථාන වෙන්කිරීමේ තැන්පතුව	7,500.00	7,500.00
<u>ඇමරිකන් ප්‍රිමියම් වෝටර් සිස්ටම් (පුද්) සමාගම</u>		
උනුසුම් හා සීතල ජල තැන්පතුව	8,000.00	8,000.00
පෝස්ට් මාස්ටර් ජෙනරල් - ෆ්‍රෑන්කින් මැෂින්	50,000.00	50,000.00
බී.එම්.අයි.සී.එච්. තැන්පතුව	5,000.00	5,000.00
<u>දුරකතන සබඳතා</u>		
ඩයලොග්	5,000.00	5,000.00
මොබිටෙල්	2,000.00	2,000.00
එම්.ටී.එන් නෙට්වර්ක්	3,000.00	3,000.00
එස්.එල්.ටී. අනුරාධපුර පලාත් කාර්යාලය	4,525.20	4,525.20
එස්.එච්.ඊ. ඉන්ෂුවරන්ස්	1,487.76	1,487.76
සොදාන්ස් - ගෑස් සිලින්ඩර්	1,500.00	1,500.00
සිලෝන් ඔක්සිජන් ලිමිටඩ් - සිලින්ඩර් තැන්පතු	152,000.00	152,000.00
	696,812.96	**508,812.96**

<u>සටහන 22</u>	2022	<u>2021</u>
<u>WIP නව ගොඩනැගිලි</u>	<u>රු.</u>	<u>රු.</u>
සත්මහල් ගොඩනැගිල්ල	556,142.20	556,142.20
වෛද්‍ය තාබුගල - නේවාසිකාගාරය	4,500,000.00	4,500,000.00
UNODC	13,000,000.00	13,000,000.00
	18,056,142.20	**18,056,142.20**

පිරිවැය/තක්සේරුකරණය	ඉඩම්	ගොඩනැගිලි	කාර්යාල උපකරණ	ලී බඩු උපකරණ	සවිකිරීම්	රථවාහන	සම්පූර්ණ මුදල
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
2022.01.01 දිනට ආරම්භක ශේෂය	371,048,069.80	152,871,914.07	104,764,735.67	22,164,102.38	19,140,717.87	43,265,362.00	713,254,901.79
එකතු කිරීම් හා ප්‍රත්‍යාගණන	23,600,000.00	78,445,000.00	17,949,084.12	10,628,550.00	6,210,882.77	-	136,833,516.89
ගැළපීම්	1,963,051.00	21,920,729.36	104,764,735.67	22,164,102.67	19,140,717.87	-	169,953,336.28
2022 ඉවත්කිරීම්	-	-	-	-	-	-	-
2022.12.31 දිනට අවසාන ශේෂය	392,685,018.80	209,396,184.71	17,949,084.12	10,628,550.00	6,210,882.77	43,265,362.00	680,135,082.40

ක්ෂයවීම්

2022.01.01 දිනට ආරම්භක ශේෂය	-	63,459,277.39	95,067,752.92	15,231,246.50	15,081,257.46	43,265,362.00	232,104,896.27
2022 ක්ෂය වියදම්	-	8,896,604.39	3,512,954.12	1,062,855.00	1,227,006.69	-	14,699,420.20
ප්‍රත්‍යාගණන හා ඉවත්කිරීම්	-	14,277,163.84	95,067,752.92	15,231,246.50	15,081,257.46	-	139,657,420.72
2022.12.31 දිනට ක්ෂය වෙන් කිරීම්	-	58,078,717.94	3,512,954.12	1,062,855.00	1,227,006.69	43,265,362.00	107,146,895.75
2022.12.31 දිනට අවසාන වටිනාකම	392,685,018.80	151,317,466.77	14,436,130.00	9,565,695.00	4,983,876.08	-	572,988,186.65

පිරිවැය/ තක්සේරුකරණය	පුස්තකාල පොත් රු.	මුළුතැන්ගේ උපකරණ රු.	උද්‍යාන උපකරණ රු.	විද්‍යාගාර උපකරණ රු.	වෙනත් පිරියත හා උපකරණ රු.	කල්බදු දේපළ රු.	මුළු වටිනාකම රු.
2022.01.01 දිනට ආරම්භක ශේෂය	1,484,155.67	512,282.08	238,001.75	44,601,066.82	20,371,308.82	1,013,262,20	68,220,077.34
ප්‍රත්‍යාගණන හා එකතු කිරීම්	-	452,500.00	831,080.00	65,934.00	5,667,806.20	-	7,017,320.20
ඉවත්කිරීම්	-	512,282.08	238,001.75	-	20,371,308.82	-	21,121,592.65
2022.12.31 දිනට අවසාන ශේෂය	1,484,155.67	452,500.00	831,080.00	44,667,000.82	5,667,806.20	1,013,262.20	54,115,804.89

ක්ෂයවීම්							
2022.01.01 දිනට ආරම්භක ශේෂය	1,377,731.12	493,975.56	173,775.05	27,166,274.07	18,889,220.08	897,060.17	48,998,036.05
2022 ක්ෂය වියදම්	100,138.07	90,500.00	166,216.00	5,395,443.87	1,073,712.37	21,525.44	6,847,535.75
ප්‍රත්‍යාගණන හා ඉවත්කිරීම්	-	493,975.56	173,775.05	-	18,889,220.08	-	19,556,970.69
2022.12.31 දිනට අවසාන වෙන් කිරීම්	1,477,869.19	90,500.00	166,216.00	32,561,717.94	1,073,712.37	918,585.61	36,288,601.11
2022.12.31 දිනට ලියා හළ වටිනාකම	6,286.48	362,000.00	664,864.00	12,105,282.88	4,594,093.83	94,676.59	17,827,203.78

පිරිවැය/ තක්සේරුකරණය	මෘදුකාංග රු.
2022.01.01 දිනට ආරම්භක ශේෂය	928,085.00
ප්‍රත්‍යාගණන හා එකතු කිරීම්	-
ඉවත්කිරීම්	-
2022.12.31 දිනට අවසාන ශේෂය	928,085.00

ක්ෂයවීම්	
2022.01.01 දිනට ආරම්භක ශේෂය	742,468.00
2022 ක්ෂය වියදම්	185,617.00
ප්‍රත්‍යාගණන හා ඉවත්කිරීම්	-
2022.12.31 දිනට අවසාන වෙන් කිරීම්	928,085.00
2022.12.31 දිනට ලියා හළ වටිනාකම	-

2022 සඳහා ශුද්ධ වත්කම්	**590,815,390.43**
ක්ෂයවීම්	**21,732,572.95**

සටහන 24

ණයහිමියෝ	2022	2021
	රු.	රු.
සිලෝන් බිස්නස් ඇප්ලයන්ස්	2,220.00	2,220.00
එස්.ඩී.ජී.ආර්.එස් විමලසිංහ	30,000.00	-
රුක්මල් ජයවර්ධන	2,000.00	2,000.00
ටී.ඩී.ආර්.ඩී. ධර්මරත්න	30,000.00	30,000.00
ටී.ජී.ටී.එස්. සුමනරත්න	10,000.00	10,000.00
එච්.එම්.සි.සි. බණ්ඩාර	20,000.00	20,000.00
ජී.යූ. පෙරේරා	-	20,000.00
පී.පී.ඩී.එන්.එස්. මුතුකුමාර	30,000.00	30,000.00
එ.පී.පී.එල්. ගුණරත්න	30,000.00	30,000.00
	154,220.00	**144,220.00**

සටහන 25

උපචිත වියදම්	2022	2021
	රු.	රු.
විගණන ගාස්තු	1,000,000.00	1,000,000.00
බැංකු ගාස්තු	7,935.00	-
මත්ද්‍රව්‍ය උපදේශන පාඨමාලා	14,000.00	-
විදුලි බිල්පත්	387,708.10	74,652.78
FONGODA	-	150,000.00
ඉන්ධන	277,810.00	267,010.00
පාරිතෝෂික දීමනා	6,193,135.00	3,123,650.00
නිවාඩු දින දීමනා	76,314.50	87,745.50
අන්තර්ජාල සේවා	103,833.19	147,942.85
සනීපාරක්ෂක සේවා	188,960.00	195,440.00
මෝටර්රථ අළුත්වැඩියාව	501,440.00	88,630.00
කාර්යාල උපකරණ අළුත්වැඩියාව	423,775.00	366,538.98
ගොඩනැඟිලි අළුත්වැඩියාව	40,600.00	-
පුවත්පත්, වාරසඟරා හා ප්‍රකාශන	19,530.00	6,960.00
බාහිර සේවා ක්ෂේත්‍ර දීමනා	271,107.13	450,904.63
බාහිර සේවා ජංගම වැඩසටහන් සහ වෙනත්	13,730.00	200,538.00
අතිකාල දීමනා	379,435.96	621,001.17
නිවාරණ අධ්‍යාපන ක්ෂේත්‍ර දීමනා	104,428.56	132,976.64
ආරක්ෂක වියදම්	672,000.00	691,600.00
ගෙවිය යුතු මුද්දර ගාස්තු	59,825.00	61,875.00
දුරකථන බිල්පත්	122,116.11	149,670.41
පරිවර්ථන , විමර්ෂණ හා තාක්ෂණික ගාස්තු	4,200.00	-
ප්‍රවාහනය	-	2,650.00
ගමන් වියදම් - දේශීය	315,478.00	244,716.50
පසුරුකවරණ වැඩසටහන්	-	39,462.75
මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය - ආහාර	8,418,375.00	2,430,828.00
මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය - වෛද්‍ය	6,250.00	-
මෝටර් රථ කුලී	-	129,060.00
ජල සැපයුම්	82,098.45	56,990.24
උපයන විට බදු	600.00	4,400.00

මත්ද්‍රව්‍ය නිවාරණ සහතිකපත්‍ර පාඨමාලාව	-	35,195.00
ආපදා ණය	-	2,943.67
වෙනත් වියදම්	45,000.00	-
ගෙවල් කුලී	3,788.75	-
	19,733,473.75	**10,763,382.12**

සටහන 26

රඳවාගත් මුදල්	2022	2021
	රු.	**රු.**
ගාල්ල භෝජනාගාරය ඉදිකිරීම	169,540.00	169,540.00
හැන්ඩිමැන් - බිත්ති තීන්ත	26,600.00	26,600.00
	196,140.00	**196,140.00**

සටහන 28	2022	2021
රජයේ ප්‍රාග්ධන ප්‍රදාන	**රු.**	**රු.**
ඉදිරියට ගෙන ආ ශේෂය	106,737,946.94	90,264,946.94
ජනවාරි	-	-
පෙබරවාරි	-	-
මාර්තු	-	2,900,000.00
අප්‍රේල්	-	-
මැයි	-	-
ජුනි	-	-
ජූලි	-	7,945,000.00
අගෝස්තු	-	-
සැප්තැම්බර්	300,000.00	2,128,000.00
ඔක්තෝබර්	-	
නොවැම්බර්	-	3,500,000.00
දෙසැම්බර්	-	-
	107,037,946.94	**106,737,946.94**

සටහන 30

CV/CA/LOC/GM 01, 2022.04.21 දිනැති ලිපිය අනුව, වත්කම් තක්සේරු දෙපාර්තමේන්තුවෙන් පහත ගොඩනැගිලිවලට වටිනාකම් ලබා දී ඇත.

01. පූජ්‍ය පන්නිල ආනන්ද නාහිමිපානන් - නේවාසිකාගාරය	12,800,000.00
02. වෛද්‍ය තාබූගල - නේවාසිකාගාරය	4,500,000.00
03. UNODC	13,000,000.00

සටහන 31

2022.05.31 දින පැවති අධ්‍යක්ෂක මණ්ඩල රැස්වමේ දී මේ පිළිබඳ සාකච්ඡා කළ අතර 2022.03.16 සිට 2022.09.16 දක්වා ද්විතීය පදනමින් සේවය කළ අධ්‍යක්ෂක ජනරාල්වරියගේ පත්වීම සහා ඇයට හිමි වේතනය සම්බන්ධයෙන් ගැටලුවක් පවතී. මේ සම්බන්ධයෙන් තවදුරටත් කරුණු විමර්ෂණය කිරීමේන් අනතුරුව ඇය අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයෙන් ලබාගෙන ඇති මූල්‍ය ප්‍රතිලාභවල යම් වෙනසක් සිදුවේ නම් එය ඉදිරි මූල්‍ය වාර්තාවල සකස් කළ යතු බවට මණ්ඩලය විසින් අනුමත කරන ලදී.